**323 වන කාණ්ඩය - 03 වන කලාපය**
**தொகுதி 323 - இல. 03**
**Volume 323 - No. 03**

**2025 නොවැම්බර් 18වන අඟහරුවාදා**
**2025 நவம்பர் 18, செவ்வாய்க்கிழமை**
**Tuesday, 18th November, 2025**

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

## නිල වාර්තාව
### அதிகார அறிக்கை
### OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

කාරක සභා අවස්ථාවේ වැඩසටහනට සංශෝධන [තීරුව 423]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන භාෂා ප්‍රවර්ධන වැඩසටහන [තීරුව 423]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 425-437]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

කොළඹ ආරක්ෂක සමුළුව මඟින් සපයන අවස්ථාවන් සැලසුම්සහගතව භාවිත කිරීම [තීරුව 437]

**වරප්‍රසාද:**

2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය [තීරුව 440]

**වරප්‍රසාද යෝජනා:**

වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා 2025 නොවැම්බර් 10 දින කරන ලද ඉල්ලීම [තීරුව 441]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [නවවන වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 103, 222-224, 304, 320, 325 (ආරක්ෂක); ශීර්ෂ 189, 225, 226 (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 442-636]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

குழுநிலை நிகழ்ச்சிநிரலுக்கான திருத்தம் [ப: 423]

பாராளுமன்ற உறுப்பினர்களுக்கான மொழி மேம்பாட்டு நிகழ்ச்சித்திட்டம் [ப: 423]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 425-437]

**தனி அறிவித்தல் மூல வினா:**

கொழும்பு பாதுகாப்பு மாநாடுமூலம் வழங்கப்பட்ட வாய்ப்புகளைத் திட்டமிட்டபடி பயன்படுத்தல் [ப: 437]

**சிறப்புரிமை:**

10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று [ப: 440]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக 2025 நவம்பர் 10ஆம் திகதி விடுக்கப்பட்ட வேண்டுகோள் [ப: 441]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட ஒன்பதாம் நாள்]:**

[தலைப்புக்கள் 103, 222-224, 304, 320, 325 (பாதுகாப்பு); தலைப்புக்கள் 189, 225, 226 (பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 442-636]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Amendment to Committee Stage Programme [Col. 423]

Language Advancement Programme for Members of Parliament [Col. 423]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 425-437]

QUESTION BY PRIVATE NOTICE:

Proactive Utilization of Opportunities Provided by Colombo Security Conclave [Col. 437]

PRIVILEGE:

Remark Made by Hon. Sujeewa Senasinghe on 10.11.2025 [Col. 440]

PRIVILEGE MOTION:

Request Made on 10th November, 2025 to Raise a Question of Privilege [Col. 441]

APPROPRIATION BILL, 2026 – [Ninth Allotted Day]:

Considered in Committee – [Heads 103, 222-224, 304, 320, 325 (Defence); Heads 189, 225, 226 (Public Security and Parliamentary Affairs)] [Cols. 442–636]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 18වන අඟහරුවාදා***
*2025 நவம்பர் 18, செவ்வாய்க்கிழமை*
*Tuesday, 18th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කාරක සභා අවස්ථාවේ වැඩසටහනට සංශෝධන
### குழுநிலை நிகழ்ச்சிநிரலுக்கான திருத்தம்
### AMENDMENT TO COMMITTEE STAGE PROGRAMME

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2026 අයවැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනෙහි කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ සහ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ අමාත්‍යාංශ වැය ශීර්ෂ විවාදයට ගැනීමට නියමිතව තිබූ දින සංශෝධනය කර තිබෙන බැවින් එකී සංශෝධිත දින පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

- 2025 නොවැම්බර් 21 සිකුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 නොවැම්බර් 26 බදාදා දින ද;
- 2025 නොවැම්බර් 26 බදාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 නොවැම්බර් 21 සිකුරාදා දින ද;
- විවාදයට ගැනීමට නියමිත බවත්, එකී සංශෝධන ඇතුළත් ලිපියක පිටපතක් සෑම මන්ත්‍රීවරයෙකුගේම සභා මේසය මත මේ වන විටත් තබා තිබෙන බවත් කාරුණිකව දන්වා සිටිමි.

## II

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන භාෂා ප්‍රවර්ධන වැඩසටහන
### பாராளுமன்ற உறுப்பினர்களுக்கான மொழி மேம்பாட்டு நிகழ்ச்சித்திட்டம்
### LANGUAGE ADVANCEMENT PROGRAMME, FOR MEMBERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් භාෂා ප්‍රවර්ධන වැඩසටහන 2025 යටතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පවත්වනු ලබන සිංහල/දෙමළ භාෂා පුහුණු වැඩසටහනෙහි සමාරම්භක උත්සවය මාගේ ප්‍රධානත්වයෙන් 2025 නොවැම්බර් 18 දින, එනම් අද දින පස්වරු 2.30ට කාරක සභා කාමර අංක 1 හිදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

මෙම සමාරම්භක උත්සවයට සහභාගි වන ලෙස අදාළ පාඨමාලා සඳහා ඉල්ලුම් කර ඇති සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

## III

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்
### MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 නොවැම්බර් 18වන අඟහරුවාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 2හිදී පැවැත්වීමට නියමිත බැවින්, අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලුම සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරමි.

(i) 2025 අංක 04 දරන පරිපූරක ඇස්තමේන්තුව; සහ
(ii) 2025 අංක 05 දරන පරිපූරක ඇස්තමේන්තුව.

මෙම පරිපූරක ඇස්තමේන්තු රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කොළඹ 6, කිරුළපන, මහවෙල පෙදෙස, අංක 43 යන ලිපිනයෙහි පදිංචි ජී.එච්. ජානක කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අනුරාධපුර, ගල්කුලම, අලුත්පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ටී.බී.එස්.ජේ. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -827/2025- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -880/2025- (2), ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1063/2025- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1244/2025- (1), ගරු සුසන්ත කුමාර නවරත්න මහතා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### ප්‍රමිතියෙන් තොර ආහාර සහ පරිභෝජන භාණ්ඩ: අලෙවිය වැළැක්වීම
### தரமற்ற உணவுகள் மற்றும் நுகர்வுப் பொருட்கள்: விற்பனையைத் தடுத்தல்
### SUBSTANDARD FOOD AND CONSUMER GOODS: PREVENTION OF SALE

1431/2025

**5. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) එකම භාණ්ඩය වෙළෙඳ පොළ තුළ විවිධ මිල ගණන් යටතේ අලෙවි කරන බවත්;

(ii) ප්‍රමිතියෙන් තොර ආහාර හා පරිභෝජන භාණ්ඩ වෙළෙඳසැල්වල විකිණීමට ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) පරිභෝජනයට නුසුදුසු ආහාර සහ භාණ්ඩ වෙළෙඳ පොළට නිකුත් කිරීම වැළැක්වීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஒரே பண்டம் சந்தையில் வெவ்வேறு விலைகளில் விற்பனை செய்யப்படுகின்றது என்பதையும்;

(ii) தரமற்ற உணவுகள் மற்றும் நுகர்வுப் பொருட்கள் விற்பனை நிலையங்களில் விற்பனைக்கு உள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) நுகர்வுக்குப் பொருத்தமற்ற உணவுகள் மற்றும் பண்டங்கள் சந்தைக்கு விநியோகிக்கப்படு வதைத் தடுப்பதற்காக வேலைத்திட்ட மொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Is he aware that -

(i) the same commodity is sold at different prices in the market; and

(ii) substandard food and consumer goods are sold in shops?

(b) Will he inform this House -

(i) whether there is a programme to prevent the issuance of food and goods that are unfit for consumption, to the market; and

(ii) if so, what that programme is?

(c) If not, why?

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) වර්තමානයේ පවතින ආර්ථික තත්ත්වයන් හා වෙළෙඳ ක්‍රියාකාරකම් හමුවේ පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහතික කිරීම අප අමාත්‍යාංශයේ මූලික ඉලක්කය වේ. අසාධාරණයට ලක්වන පාරිභෝගිකයන්ගේ පමණක් නොව වෙළෙඳුන්ගේද අයිතිවාසිකම් රැක ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මැදිහත් වේ. 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් භාණ්ඩ හා සමහර විශේෂ සේවා යන අංශ දෙකම පිළිබඳව ක්‍රියා කිරීමේ බලතල අධිකාරිය (පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශය) වෙත පවරා ඇත. වෙළෙඳාම සහ භාණ්ඩ හා සේවාවල මිල විධිමත් කිරීම මඟින් පාරිභෝගිකයන් වඩා හොඳින් ආරක්ෂා කිරීම සහ සාධාරණ වෙළෙඳ පිළිවෙත් හා සීමිත වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව වෙළෙන්දන් හා නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන හෙයින් ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අමාත්‍යාංශය මඟින් ගෙන කටයුතු කරනු ලබයි.

- පරිභෝජනය සඳහා වෙළෙඳ පොළ වෙත නිකුත් කරනු ලබන ආහාරවල ආරක්ෂිතභාවය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආහාර පාලනාධිකාරි ඒකකය - Food Control Administration Unit - මඟින් නියාමනය සිදු කරනු ලබයි. එසේ වුවත්, සමහර වෙළෙඳුන් විසින් ගුණාත්මක බවින් හා ප්‍රමිතියෙන් තොර ආහාර වර්ග අළෙවි කිරීම සිදු කරනු ලබන බව වාර්තා වී ඇත.
- පරිභෝජනයට නුසුදුසු භාණ්ඩ වෙළෙඳ පොළට පැමිණීම වැළැක්වීම සඳහා අප අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ප්‍රමිති අනිවාර්යය කර එවැනි ප්‍රමිතියෙන් තොර භාණ්ඩ අළෙවි කරනු ලබන වෙළෙඳුන් සොයා වැටලීම් සිදු කිරීම සහ ඒ වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.
- එමෙන්ම පාරිභෝගිකයන්ට අළෙවි කරනු ලබන භාණ්ඩවල ගුණාත්මක බව සහ තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට අනුයුක්තව රාජකාරි සිදු කරනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් - PHI - විසින් සිදු කරනු ලබයි.
- පාරිභෝගිකයන් විසින් මිලදී ගනු ලබන භාණ්ඩවල ගුණාත්මකභාවය මෙන්ම භාණ්ඩ ලේබල් කිරීම පිළිබඳ නියාමන කටයුතු - Labelling Regulations - පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් නිරන්තරයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කරමින් පවතී.
- පොල් තෙල්වල ප්‍රමිතිය හා ඇසුරුම් පිළිබඳව, ගෑස්වලට අදාළ අමතර කොටස් හා උපාංගවල ප්‍රමිතිය පිළිබඳව, සබන් ඇසුරුම්වලට අදාළ කරුණු පිළිබඳව සහ පුනර්ජනනීය විදුලි බල්බ - CFL/LED - වලට අදාළ කරුණු පිළිබඳව ගැසට් නිවේදන මේ වන විටත් සකස් කරමින් පවතී.
- රූපලාවණ්‍ය නිෂ්පාදන වන සම පැහැපත් කිරීමේ ආලේපන - skin whitening cream - හා හිසකෙස් ආලේපනවල - hair creamවල - ගුණාත්මකබව, ප්‍රමිතිය හා නීතිමය කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට විශේෂ වූ අධිකාරියක්/ආයතනයක් මේ වන විට ස්ථාපිතව නොමැතිවීම සුවිශේෂ අඩුපාඩුවක්ව පවතී.

  එසේ වුවත්, සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව මේ කරුණු පිළිබඳව මැදිහත් වී අවශ්‍ය සම්බන්ධීකරණයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් සිදු කරමින් පවතී.
- පොලිතින් උර, ආහාර ඇසුරුම් උර, ළදරු කිරි බෝතල් සහ පානීය ජල බෝතල් ආදියෙහි ගුණාත්මකභාවය හා ප්‍රමිතිය සම්බන්ධයෙන් මේ වන විටත් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත.
- වෙළෙඳපොළ තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ විවිධ මිල ගණන් යටතේ අළෙවි වීම නිරීක්ෂණය වී ඇති හෙයින් එවැනි තත්ත්ව වළක්වමින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ අරමුණින් භාණ්ඩ කිහිපයක් සඳහා උපරිම සිල්ලර මිලක්/ උපරිම තොග මිලක් නියම කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත.

  උදාහරණ: සහල්, ටින් මාළු, පානීය ජල බෝතල්.

  තවදුරටත් පාරිභෝගිකයාට සංවේදී වන භාණ්ඩ සඳහා ප්‍රමිතිය අනිවාර්ය කිරීම මඟින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අදාළ ආයතන හා එක්ව අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු අජිත් ගිහාන් මහතා]

රටේ පුරවැසියෝ විධියට අපි කවුරුත් කැමැතියි, වස විසෙන් තොර, හොඳ ගුණාත්මක ආහාර පරිභෝජනය කරන්න. පසුගිය කාලයේ ආසියාවේ වැඩියෙන්ම වස විස සහිත ආහාර පරිභෝජනය කරන රටක් බවට අපේ රට නම් වෙලාත් තිබුණා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කළා, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි ගන්නා ක්‍රියාමාර්ග. නමුත්, අපි දන්නවා සමහර ආහාර සම්බන්ධයෙන් ප්‍රමිතියෙන් යුතුව කටයුතු වෙන්නේ නැහැ කියලා. පොල් තෙල් ගැනත් ඔබතුමා පැහැදිලි කළා. අපි එළවලු සහ පලතුරු ගත්තොත්, ඇත්තටම මේවා harvest කරන්න දින ගණනක් තිබෙනවා.

ඒවාට chemicals යොදනවා, එක එක කෘෂි රසායනික ද්‍රව්‍ය යොදනවා. නමුත් ඊට පෙර මේවා harvest කරන තත්ත්ව තිබෙනවා. මෙවැනි දේවල් සොයා බැලීම සඳහාත් අපි විධිමත් තැනකට එන්න ඕනෑ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. අපි දරුවන්ට හොඳම ආහාර වේලක් දෙන්න උත්සාහ කරද්දී, වෙළෙඳ පොළට එන්නේ කුමන ආහාරද කියන ප්‍රශ්නය තිබෙනවා.

අද පාර දිගට මස් කඩ තිබෙනවා. පරණ විධියටම ඒවායේ මස් ගාත් එල්ලලා තිබෙනවා, උදේ සිට හවස් වෙනකම්ම ඒ මස් ගාත් එල්ලා තිබෙනවා. ඒවායේ ප්‍රමිතිය මොකක්ද? මැස්සෝ වහනවා. ජනතාව ඒ මස් ගෙනිහින් එක එක විධියට පරිභෝජනය කරනවා. එක පැත්තකින්, මේ දේවල් සංචාරක ක්ෂේත්‍රයටත් බලපානවා. සංචාරකයෝ බලාගෙන ඉන්නවා අපිත් මේවාද පරිභෝජනය කරන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් ගිහාන් මහතා**
**(மாண்புமிகு அஜித் கிஹான்)**
(The Hon. Ajith Gihan)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේවා සම්බන්ධව නියාමනයක් අවශ්‍යයි. අපි හොඳ ආහාර වේලක් රටේ ජනතාවට ලබා දෙන්න නම් මේවා නියාමනය කිරීමේ අවශ්‍යතාවක් පවතිනවා. ඔබතුමා පැහැදිලි කළා වාගේම රූපලාවණ්‍ය පැත්ත වෙන්න පුළුවන්, ආහාර වෙන්න පුළුවන්, අනෙකුත් ද්‍රව්‍ය වෙන්න පුළුවන් ඒවා යම් ප්‍රමිතියකට, යම් නියාමනයකට ගේන්න ඕනෑ කියන යෝජනාව අපි ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි සමරසිංහ මහතා**
**(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)**
(The Hon. Upali Samarasingha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න කිහිපයක්ම ඉදිරිපත් කළා. කොහොම වුණත්, ඇත්තටම ඒ සියලු ඉදිරිපත් කිරීම් සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය පැත්තෙන් කියන්න තිබෙන්නේ මෙයයි. දීර්ඝ කාලයක් තිස්සේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සමානව අපේ ආහාර සහ සියලු දේවල් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් හෝ ලෝකයට සමාන පිළිවෙතක් තිබුණේ නැහැ. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි පසුගිය කාලයේ අපේ රටට බාල බෙහෙත් ගෙනාවේ, විෂ සහිත ආහාර ගෙනාවේ. ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේම බොහෝ නිෂ්පාදනවලට සහ ආහාර වර්ගවලට කල් තබා ගැනීම සඳහා ප්‍රමිතියෙන් තොර විවිධ විෂ ද්‍රව්‍ය එකතු කරනවා.

ඒ වාගේම තමයි, ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ බොහෝ නිෂ්පාදන, විශේෂයෙන් ආහාර වර්ග කල් තබා ගැනීම සඳහා ප්‍රමිතියෙන් තොරව විවිධ විෂ ද්‍රව්‍ය එකතු කරනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සමහර කඩවල, විශේෂයෙන්ම මස් වර්ග විකිණීමේදී කිසිම ආරක්ෂාවකින් තොරව සහ පරිසර හිතකාමී නොවන විධියට ඒවා තිබෙන ආකාරය පාරේ යනකොට අපි දකිනවා. ඒ වාගේම විදේශ සංචාරකයින් ඒවා දකිනකොට කිසිම ප්‍රසන්න බවක් ඇති නොවන විධියේ වෙළෙඳ සැල් සහ වෙළෙඳ ව්‍යාපාර තිබෙනවා. දැනට අපි PHI මහත්වරුන් මාර්ගයෙන් මේ කටයුතුවලට මැදිහත් වෙනවා. ඊට අමතරව, අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා ආරක්ෂිත ආහාර සම්බන්ධයෙන් ලබා දී තිබෙන උපදෙස් අනුගමනය කරනවා. නමුත් අපි පොදුවේ ගත්තොත්, මේ කටයුතු සම්බන්ධයෙන් අපේ රටට අලුත් ප්‍රතිපත්තියක්, අලුත් ක්‍රමවේදයක් හදා ගැනීමේ වුවමනාවක් තිබෙනවා. මේ වෙනකොට සෞඛ්‍ය අමාත්‍යාංශයත්, වෙළෙඳ අමාත්‍යාංශයත් එකතු වෙලා ඒ සම්බන්ධයෙන් වන කටයුතුවලට මැදිහත් වෙමින් ඉන්නවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
**(மாண்புமிகு அஜித் கிஹான்)**
(The Hon. Ajith Gihan)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම වෙළෙඳ පොළේ භාණ්ඩවල මිල සාධාරණ නැතිව එක් එක් තත්ත්වයන් මත වෙනස් වෙලා තිබෙනවා. අපි එකම භාණ්ඩයක මිල බැලුවොත්, එක් කඩයක එක් මිලක්; තවත් කඩයක තවත් මිලක්. ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් වුණත් එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. එක් පැත්තකින්, ධීවර ක්ෂේත්‍රයට අදාළ භාණ්ඩ, කෘෂිකර්මයට අදාළ රසායනික ද්‍රව්‍ය වාගේ දේවල් සම්බන්ධවත් මේ තත්ත්වය පවතිනවා. එක brand එකක් නම් එක මිලක් තිබෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් ජනතාව මැසිවිලි නඟනවා. මේ සම්බන්ධවත් යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු උපාලි සමරසිංහ මහතා**
**(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)**
(The Hon. Upali Samarasingha)
ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් සඳහන් කළා වාගේම අපේ රටේ හැම තැනකම වාගේ නිශ්චිත ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් නැතිකම තමයි මෙතැන තිබෙන මූලික කාරණාව.

ඔබතුමා කිව්වා වාගේ සමහර භාණ්ඩ, සමහර නිෂ්පාදන සමාගම්වලට වඩා අඩු මිලට වෙළෙඳ පොළේ තිබෙනවා. ඒ වාගේම සමහර නිෂ්පාදන අඩු මිලට ගත්තත් ඒවායේ ප්‍රමිතියක් නැති බව පෙනෙනවා. මේ වෙනකොට අපේ රටේ මේවා නිරීක්ෂණය කරන්න, නියාමනය කරන්න තිබෙන ආයතන එකතු කර ගනිමින් මේ පිළිබඳව සාකච්ඡා කරමින් සිටිනවා. අපේ රට තුළ, විශේෂයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩවල ප්‍රමිතිය සහ මිල සම්බන්ධයෙන් එක system එකක් ඇති කිරීම සඳහාත්, විදේශීය රටවලින් ලංකාවට ආනයනය කරන භාණ්ඩ සඳහා වෙළෙඳ පොළේ සාධාරණ මිලක් පවත්වාගෙන යාම සඳහාත් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් මේ වනකොට කටයුතු ආරම්භ කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -827/2025- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
**(மாண்புமிகு கயந்த கருணாதிலக்க)**
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## "උරුමය" සින්නක්කර ඔප්පු ප්‍රදානය: මන්මුනෙපත්තු ප්‍රා.ලේ. කොට්ඨාසය
'உருமய' அறுதி உறுதி வழங்குதல்: மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவு
GRANT OF "URUMAYA" FREEHOLD DEEDS: MANMUNAIPATTU DS DIVISION

880/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) එම්.එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "උරුමය" සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට "උරුමය" සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) "උරුමය" සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා "උරුමය" සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019.01.01 தொடக்கம் 2025.03.31 வரை மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் 'உருமய' அறுதி உறுதியைப் பெற்றுக்கொள்வதற்கு விண்ணப்பித்தவர்களின் எண்ணிக்கை மற்றும் அவர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) கடந்த அரசாங்கத்தின் விசேட வேலைத் திட்டத்தின்கீழ் மேற்படி காலப்பகுதியினுள் குறிப்பிட்ட நபர்களுக்கு 'உருமய' அறுதி உறுதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அந்த நபர்களின் எண்ணிக்கை மற்றும் பெயர்கள் யாவை என்பதையும்;

(iv) 'உருமய' அறுதி உறுதியைப் பெற்றுக்கொள்ள விண்ணப்பித்தவர்களில் சிலருக்கு அந்த உறுதிகள் வழங்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(v) ஆமெனில், அந்த நபர்களின் எண்ணிக்கை மற்றும் பெயர்கள் யாவை என்பதையும்;

(vi) அவர்களுக்கு இதுவரை 'உருமய' அறுதி உறுதி வழங்கப்படாததற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of persons who applied for "Urumaya" freehold deeds in the Manmunaipattu DS Division from 01.01.2019 to 31.03.2025 and their names;

(ii) whether "Urumaya" freehold deeds have been granted to the persons referred to above during the above period under a special programme of the then Government;

(iii) if so, the number of such persons and their names;

(iv) whether he is aware that some of the persons who applied for "Urumaya" freehold deeds have not been granted the deeds concerned;

(v) if so, the number of such persons and their names; and

(vi) the reasons for not granting "Urumaya" freehold deeds to them?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :**
*Answer tabled:*

(අ) (i) පුද්ගලයින් සංඛ්‍යාව 422කි. ඔවුන්ගේ නම් ඇමුණුම A හි** සඳහන් වේ.

(ii) ඔව්.

(iii) පුද්ගලයින් සංඛ්‍යාව 77කි. ඔවුන්ගේ නම් ඇමුණුම B හි** සඳහන් වේ.

(iv) ඔව්.

(v) පුද්ගලයින් සංඛ්‍යාව 345කි. ඔවුන්ගේ නම් ඇමුණුම C හි** සඳහන් වේ.

(vi) උරුමය වැඩසටහන යටතේ දීමනාපත්‍ර ලබා දීම තාවකාලිකව නවතා තැබීම හේතුවෙනි.

(ආ) අදාළ නොවේ.

## වර්තමාන රජය යටතේ සහල් ආනයනය: විස්තර
## தற்போதைய அரசாங்கத்தின் கீழான அரிசி இறக்குமதி: விபரம்
## IMPORT OF RICE UNDER PRESENT GOVERNMENT: DETAILS

1063/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිත අබේගුණවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohitha Abeygunawardhana)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්තමාන රජය බලයට පත් වීමෙන් පසු මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය කොපමණද;

(ii) එම සහල් වර්ග කවරේද;

(iii) එම සහල් කිලෝග්‍රෑම් එකක් සඳහා අය කරන ලද බදු මුදල කොපමණද;

(iv) එමඟින් උපයාගෙන ඇති මුළු ආදායම කොපමණද;

(v) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑම් එකක් සඳහා පනවන ලද පාලන මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉදිරියේදී සහල් ආනයනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) සහල් ආනයනය කිරීමෙන් දේශීය වී ගොවියාට සිදු වන බලපෑම කවරේද;

(iii) ඉදිරියේදී සහල් ආනයනය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ජාතික වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

***පුස්තකාලයේ තබා ඇත.**
**நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர், இதுவரை இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்டுள்ள அரிசியின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி அரிசியின் வகைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒரு கிலோகிராம் அரிசிக்கு அறவிடப்பட்ட வரி எவ்வளவு என்பதையும்;

(iv) அதன்மூலம் ஈட்டிக்கொண்டுள்ள மொத்த வருமானம் எவ்வளவு என்பதையும்;

(v) இறக்குமதி செய்யப்பட்ட ஒரு கிலோகிராம் அரிசிக்கு விதிக்கப்பட்ட கட்டுப்பாட்டு விலை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) எதிர்காலத்தில் அரிசி இறக்குமதி செய்வதற்கு எதிர்பார்க்கப்படுகின்றதா என்பதையும்;

(ii) அரிசி இறக்குமதியின் காரணமாக உள்ளூர் நெல் விவசாயிகளுக்கு ஏற்படும் தாக்கங்கள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் அரிசி இறக்குமதியைக் குறைப்பதற்காக நடைமுறைப்படுத்துவதற்கு எதிர்பார்க்கின்ற தேசிய வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) quantity of rice imported to Sri Lanka since the present Government came into power up to now;

(ii) varieties of rice imported;

(iii) amount of tax levied on a kilogramme of imported rice;

(iv) total revenue earned from this tax; and

(v) price ceiling of a kilogramme of imported rice?

(b) Will he also inform this House -

(i) whether it is expected to import rice in the future;

(ii) the impact of rice imports on local paddy farmers; and

(iii) the national course of action that is expected to be implemented in future to minimize rice importation?

(c) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
* Answer tabled:*

(අ) (i) වර්තමාන රජය බලයට පත්වීමෙන්පසු මේ දක්වා (2024.11.18 දින සිට 2025.11.13 දක්වා) ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය ශ්‍රී ලංකා රේගු වාර්තාවලට අනුව සහල් මෙට්‍රික් ටොන් 263,878ක් වේ.

(ii)

| HS Code | Description |
|---|---|
| 1006.30.11 | Basmati (As defined by Department of Agriculture) |
| 1006.30.19 | Other (Raw) |
| 1006.30.21 | Basmati (As defined by Department of Agriculture) |
| 1006.30.29 | Other (Parboiled) |

(iii) මෙසේ ගෙන්වන ලදන එක් එක් සහල් වර්ග කිලෝග්‍රෑම් එකක් සඳහා අය කරන ලද බදු මුදල පහත වගුවෙහි දක්වා ඇත.

| HS Chapter | HS Heading | HS Code | Description | SLS/ ICL | CID | VAT | PAL | CESS | SSCL |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | 10.06 | 1006.30.11 | Basmati (As defined by Department of Agriculture) | | 20% or Rs. 80/kg | 18% | 10.0% | 10% or Rs. 40/kg | 2.5% |
| | | 1006.30.19 | Other (Raw) | L | Rs. 65/kg (Special Commodity Levy - SCL) | | | | |
| | | 1006.30.21 | Basmati (As defined by Department of Agriculture) | | 20% or Rs. 80/kg | 18% | 10.0% | 10% or Rs. 40/kg | 2.5% |
| | | 1006.30.29 | Other (Parboiled) | L | Rs. 65/kg (Special Commodity Levy - SCL) | | | | |

(iv) වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව දක්වා ඇති පරිදි 2024.11.25 දින සිට 2025.10.31 දින දක්වා රේගු සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ගීකරණය වන සහල් ආනයනය මත රජය උපයාගෙන ඇති විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම රුපියල් මිලියන 14,686ක් වේ.

(v) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑම් එකක් සඳහා පනවන ලද පාලන මිල පහතින් දක්වා ඇත.

| ගැසට් නිවේදන අංකය | දිනය | සහල් වර්ගය | කි.ග්‍රෑ. 1 සඳහා පාලන මිල |
|---|---|---|---|
| 2459/12 | 2025.10.21 | කැකුළු | 210.00 |
| | | නාඩු | 220.00 |
| | | සම්බා | 230.00 |
| | | පොන්නි සම්බා - GR 11 | 240.00 |
| | | කිරි පොන්නි/ පාල් පොන්නි | 255.00 |

(ආ) (i) දැනට අපේක්ෂා නොකරයි.

එසේ වුවද, බාස්මතී වැනි විශේෂිත සහල් වර්ග ආනයනය කිරීම සඳහා බාධාවක් නොමැත.

(ii) වෙළෙඳ පොළේ සහල් හිඟයක් ඇතිවන අවස්ථාවන්හී දී පමණක් සහල් ආනයනය සිදු කිරීම පිළිබඳ සලකා බලන බැවින් දේශීය වී ගොවියාට බලපෑමක් සිදු නොවේ.

(iii) කෘෂිකර්ම අමාත්‍යාංශය දක්වන පරිදි,

**1. දැනට ක්‍රියාත්මක වැඩ පිළිවෙළ නව්‍යතාවෙන් යුතුව ශක්තිමත්ව ඉදිරියට සිදු කරගෙන යාම.**

- දැනට හඳුන්වා දී ඇති ඉහළ අස්වනු දෙන වී ප්‍රභේද ප්‍රචලිත කිරීමට අමතරව විශේෂ වෙළෙඳ පොළ සඳහා ආනයනය කරනු ලබන සහල් සඳහා ආදේශක ලෙස සුදුසු ඉහළ ධාන්‍ය ගුණාත්මයෙන් යුතු (බාස්මතී ආකාර හා කිරි සම්බා ආකාරයේ) නව වී ප්‍රභේද නිපදවීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීමත්, ඒ සඳහා අවශ්‍ය වන නව තාක්ෂණයන් ජනනය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අතර,
    - අභිජනන බීජ වී සම්පූර්ණ අවශ්‍යතාවය සැපයීම තුළින් බීජ ගුණය ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීම හා බීජ ගුණාත්මය තහවුරු කිරීම.
    - පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමේ ක්‍රම හඳුන්වා දීම.
    - නව පරම්පරාවේ පොහොර භාවිතය ප්‍රචලිත කිරීම හා පස පරීක්ෂා කර පොහොර යෙදීම මඟින් තවදුරටත් අස්වැන්න ඉහළ නැංවීම.
    - කම්කරු ශ්‍රමය හිඟවීම නිසා සීමා වී ඇති නිෂ්පාදන භූමි යාන්ත්‍රීකරණය මඟින් කාර්යක්ෂමව භාවිත කිරීමට හැකි ක්‍රමවේද හඳුන්වා දීම.
    - ඩ්‍රෝන තාක්ෂණය ඇතුළුව නව තාක්ෂණයන් හඳුන්වාදීම හා භාවිතය ප්‍රචලිත කිරීම ඔස්සේ තරුණයන් වී වගාව සඳහා ආකර්ෂණය කරවීම.
    - යෙදැවුම් පිරිවැය අඩු කිරීම සඳහා රෝග හා පළිබෝධ පාලන ක්‍රමවේද, ජල කළමනාකරණය කාර්යක්ෂම කර ගැනීමේ ක්‍රමවේද, වල් වී පාලනය හා වල් පැළ පාලනය සඳහා කාර්යක්ෂම ක්‍රමවේද හඳුනා ගැනීම වැනි දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

**2. දේශීය වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා "පුනරුදයට අරුණළු" වැඩසටහනට සමගාමීව සිදු කෙරෙන යාය වැඩසටහන**

- ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා 2025/2026 මහ කන්නයේ සිට "පුනරුදයට අරුණළු" ජාතික කෘෂිකර්ම වැඩසටහනට සමගාමීව වී නිෂ්පාදන යාය වැඩසටහන 2028 වර්ෂය දක්වා සැලසුම් කර ඇත. ඒ තුළින් වී නිෂ්පාදනයේ ඵලදායිතාවය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 4.8ක් දක්වා වර්ධනය කර ගැනීමට සැලසුම් කර ඇත.

- වී නිෂ්පාදන යාය වැඩසටහන සඳහා අක්කර 509 බැගින් යුතු යාය 500ක් 2025/26 මහ කන්නයේදී තෝරාගෙන වී අස්වැන්න වැඩි කිරීමට හේතුවන තාක්ෂණික කරුණු 11න් සමන්විත තාක්ෂණික පැකේජයක් මෙම යාය සඳහා ක්‍රියාත්මක කරනු ලබයි. මෙම යාය සංඛ්‍යාව කන්නයෙන් කන්නයට වැඩි කරමින් 2028 වර්ෂය වන විට යාය 5,000 දක්වා වැඩි කර හෙක්ටෙයාර 100,000ක් ආවරණය කිරීමට සැලසුම් කර ඇත. එසේම මෙම යාය තුළ නිෂ්පාදනයේ ඵලදායිතාව 2028 වන විට හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 7ක් ලබා ගැනීමට අපේක්ෂිතය. ඇමුණුම** - යාය සැලැස්ම - බලන්න.

වී නිෂ්පාදන යාය වැඩසටහනට සමගාමීව සිදු කරන ප්‍රවර්ධන කටයුතු මඟින් හා වී වගාවේ තාක්ෂණික පැකේජය භාවිත කිරීම තුළින් පහත පරිදි වී අස්වනු අපේක්ෂා කරනු ලැබේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ආර්. එම්. ජයවර්ධන මහතා]







මෙම නිෂ්පාදන දත්ත අනුව 2026 වර්ෂයේ සහල් අවශ්‍යතාව සපුරා ගැනීමට හැකිවනු ඇත. නමුත්, සහල් පිටි ආශ්‍රිත ආහාර කර්මාන්තය සහ සත්ව ආහාර සඳහා සහල් අවශ්‍යතාව වැඩි වීමේ ප්‍රවණතාවක් පවතින බැවින් තව දුරටත් 2028 වර්ෂය දක්වා වී නිෂ්පාදනය වැඩි කිරීමට සැලසුම් කර ඇත.

3. **ගුණාත්මක හා තත්ත්වයෙන් උසස් බිත්තර වී සුලභතාව ඉහළ නැංවීම.**

- වී ප්‍රභේද ප්‍රචලිත කිරීමේ හා සුලභ කිරීමේ වැඩසටහනක් 2025/26 මහ කන්නයේදී වියළි හා අතරමැදි කලාපවලට හඳුන්වා දී ඇත. එහිදී තෝරාගත් වී ප්‍රභේද 12ක් ගොවි ක්ෂේත්‍රවල අක්කර 1/4 ස්වයං බිත්තර වී ආදර්ශන ලෙස වගා කිරීමසිදු කරයි. 2026 යල කන්නයේදී මෙම ආදර්ශන ප්‍රමාණය දෙගුණයක් දක්වා වැඩි කර එම ප්‍රදේශවල ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කොළඹ ආරක්ෂක සමුළුව මඟින් සපයන අවස්ථාවන් සැලසුම්සහගතව භාවිත කිරීම
### கொழும்பு பாதுகாப்பு மாநாடுமூலம் வழங்கப்பட்ட வாய்ப்புகளைத் திட்டமிட்டபடி பயன்படுத்தல்
### PROACTIVE UTILIZATION OF OPPORTUNITIES PROVIDED BY COLOMBO SECURITY CONCLAVE

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I wish to ask the following Question under Standing Order No. 27(2) from the Hon. Minister of Defence.

The Colombo Security Conclave comprising Sri Lanka, India, the Maldives, Mauritius and Bangladesh has developed into a vital regional architecture dedicated to safeguarding collective security across the Indian Ocean Region. Anchored on five core pillars - maritime safety, counter-terrorism, combating trafficking and transnational crime, cyber security and humanitarian assistance - the Conclave now represents a maturing framework where regional States pool resources, share expertise and jointly respond to emerging security challenges. Its recent institutionalization, including the establishment of the Secretariat in Colombo, marks a significant advancement from periodic consultations to a structured, cooperative security mechanism. It is noteworthy that Malaysia and Indonesia have also expressed interest in joining this regional initiative, further underscoring the Conclave's growing relevance.

Sri Lanka, situated at the heart of key maritime routes, stands to gain substantially through deeper engagement. Membership in the Conclave offers enhanced maritime surveillance, stronger coastal defence and improved interdiction capabilities against narcotics trafficking, human smuggling, illegal fishing and organized criminal networks. Particularly through close cooperation, capacity building and intelligence sharing with India, which has consistently supported Sri Lanka in maritime security, our country can access real-time information, cutting-edge technologies and coordinated operational support, significantly strengthening our ability to detect, deter and disrupt threats across our maritime domain.

At a time when narcotic inflows, cyber intrusions, transnational criminal activity and hybrid threats are rising, Sri Lanka must proactively utilize the full breadth of opportunities provided by the Colombo Security Conclave. I am sure, Sir, that you would understand that, at this moment, Sri Lanka is undergoing all those four threats I mentioned. So, my intention in asking this Question is to propose that we take maximum advantage of this opportunity before us.

Active participation in its working groups and joint task forces, maritime operations and intelligence-sharing platforms would allow Sri Lanka to safeguard its territorial waters, protect its citizens, strengthen internal security and reinforce its role as a responsible and constructive partner in the Indian Ocean. The Conclave, therefore, serves not only as a regional mechanism, but also as a strategic avenue for Sri Lanka to enhance national security through practical cooperation with its trusted partners, especially India.

In this context, I wish to ask the Hon. Minister of Defence the following questions:

1. Can the Minister inform this House what specific initiatives Sri Lanka has undertaken under the Colombo Security Conclave since the signing of the Colombo Security Conclave Charter and the establishment of the Secretariat in Colombo?

I take this opportunity to point out that it benefits Colombo, Sir.

2. What mechanisms currently exist for real-time intelligence sharing, particularly with India, combating narcotics trafficking, human smuggling, illegal fishing and other forms of transnational organized crime?
3. Has Sri Lanka participated in any joint maritime operations, patrols, surveillance missions or coordinated exercises with the Colombo Security Conclave member States, including India, during the last three years? If so, please provide details and further inform this House when and where the next scheduled Colombo Security Conclave meeting, maritime exercise or senior officials' dialogue will take place.
4. What steps are being taken to integrate Colombo Security Conclave technical platforms, information-sharing systems and operational

frameworks into Sri Lanka's national security apparatus, particularly for maritime monitoring and narcotics interdiction?

This is the time that the Government of Sri Lanka is pursuing resolutely in order to achieve that.

5. Has the Government formulated a national strategy or action plan to maximize Sri Lanka's contributions to and benefits from the Conclave's five pillars, particularly in collaboration with India and other member States, relating to counter-terrorism, cyber security and humanitarian assistance?

6. What measures are currently being implemented to expand Sri Lanka's maritime domain awareness, including radar coverage, drone surveillance, electronic monitoring, and coastal intelligence, through the Colombo Security Conclave cooperation and assistance from India? Additionally, which Colombo Security Conclave member State is responsible for appointing the Secretary-General and the Deputy Secretary-General of the Secretariat established in Colombo?

Sir, I am made to understand that Sri Lanka is a beneficiary of the Deputy Secretary-General post. That is one of the reasons why I am pushing for this so that Sri Lanka gets included in its map.

7. Will the Government commit to deepening Sri Lanka's engagement in the Colombo Security Conclave to fully utilize this platform - especially the operational, technological and intelligence cooperation extended by India - to protect our territorial integrity, secure our maritime routes and to curb the inflow of narcotics and transnational criminal activity?

8. Has the Government considered enabling visa-free, visa-on-arrival or fast-track travel facilitation for authorized officials, delegates and technical personnel from Colombo Security Conclave member States attending meetings, training programmes, or joint operations in Sri Lanka and likewise, pursuing reciprocal arrangements for Sri Lankan defence and security officials travelling to Colombo Security Conclave member countries?

Thank you, Sir.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

Hon. Speaker, the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) is about the Colombo Security Conclave. The Government is very well aware of its benefits. The Question contains eight parts. So, I kindly request for a two weeks' time duration to answer the Question.

Thank you, Sir.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I am made to understand that the Colombo Security Conclave is supposed to meet at the end of November or December. So, I hope you would seize the opportunity and maximize gains because, at the moment, all four activities I had mentioned are being pursued by the Government. So, I guess you should take cognizance of that fact and take advantage of it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු නීතිඥ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය.

## වරප්‍රසාද: 2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று
## PRIVILEGE: REMARK MADE BY HON. SUJEEWA SENASINGHE ON 10.11.2025

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මා විසින් වරප්‍රසාද කඩවීම සම්බන්ධව පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 10වන දින ගරු අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා විසින් අය වැය සම්බන්ධව කථා කරන අවස්ථාවේදී මා ඔහුට වම් පසින් අසුන්ගෙන සිටියෙමි.

එතුමා විසින් කථාව සිදු කරන විටදී බැඳුම්කර වංචාව පිළිබඳව පොතක් ලියපු අය පිළිබඳව මතක් කර සිටියදී සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විසින් මේ කියන්නේ තමන් විසින් රචිත "මහ බැංකු බැඳුම්කර නිකුතුවේ ඇත්ත නැත්ත" කෘතිය පිළිබඳව යැයි සිතා කෑ ගැසීමට පටන් ගනු ලැබුවේය. එම අවස්ථාවේදී ගරු කථානායකතුමා විසින් "වාඩි වෙන්නේ නැතිනම් එළියට දමන බව" මන්ත්‍රීතුමාහට ප්‍රකාශ කර සිටීමෙන් පසුව ගරු කථානායකතුමාගෙන් point of Order එකක් ලබා ගෙන අමාත්‍යවරයාට පිළිතුරු දීම වෙනුවට මේ විවාදයට කිසිදු අදාළත්වයක් නොමැතිව සිටි මා වෙත අත දිගු කරමින් "ළඟ ඉන්න මන්ත්‍රීතුමිය ඔතැන වාඩිවෙලා ඉන්න එපා රට අරන් යයි" යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවා.

[ගරු නිතිෂා හිරුනි විජේසිංහ මහත්මිය]

ගරු කථානායකතුමනි, එම අවස්ථාවේදී පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණ හිටියා. ඒ වාගේම තවත් ප්‍රේක්ෂකයන් හිටියා. එම ප්‍රකාශය ඒ වනවිටත් PEO TV ඔස්සේ live විකාශය වූ අතර, පසුව සමාජ මාධ්‍ය ඔස්සේ ද සංසරණය වී තිබුණා. විවාදයට කිසිදු මැදිහත් වීමක් මාගෙන් සිදු නොවී තිබියදී හදිසියේ මා ඉලක්ක කර ගනිමින් සිදු කරන ලද ප්‍රකාශයෙන් මා දැඩි අපහසුතාවට පත් වූ අතර, සුජීව මන්ත්‍රීතුමා විසින් අතීතයේ කළ කී දෑ පදනම් කරගෙන ඇමතිතුමා විසින් කළ ප්‍රකාශය යටපත් කරගන්නට සහ කථානායකතුමා තමන්ව එළියට දමන බවට කළ ප්‍රකාශය වසා ගන්නට මාතෘකාව වෙන අතකට හැරවීමේ අභිලාෂයෙන් මා ඉලක්ක කර ගනිමින් සිදු කරනු ලැබූ ප්‍රකාශය මා දැඩිව හෙළා දකින බව ප්‍රකාශ කර සිටිමි.

ගරු කථානායකතුමනි, අපි මේ දසවන පාර්ලිමේන්තුවට ආවේ මෙරට කාන්තා දේශපාලනයේ හැරවුම් ලක්ෂ්‍යයක් නිරූපණය කරමින් මේ පාර්ලිමේන්තුවේ තිබූ පැරණි කාන්තා දේශපාලන සංස්කෘතීන් ද වෙනස් කරමිනි. මා හොඳින් උසුළු ද දනිමි. විසුළු ද දනිමි. ඒ වාගේම ජඩකමට කියන කථා ද හොඳින් හඳුනමි.

මේ ආකාරයට දිගින් දිගටම කාන්තා මන්ත්‍රීවරියන් ඉලක්ක කරගෙන පාර්ලිමේන්තුව තුළ ද, ඉන් පිටත ද සිදු කරනු ලබන කායික, මානසික සහ වාචික හිංසනයන් හමුවේ මා ඇතුළු ජාතික ජන බලවේගයේ සියලුම මන්ත්‍රීවරියන් කිසිදු විටෙක දෑස් කන් පියා නොසිටින බවත්, හිංසනය දුටු සෑම විටම ඒ වෙනුවෙන් නැඟී සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

ඒ වාගේම ගරු කථානායකතුමනි, පසුගිය දා සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විසින් මා ඉලක්ක කරගෙන සිදු කරනු ලැබූ අවමන් සහගත ප්‍රකාශයෙන් මා අනිසි ලෙස වාචික හිංසනයට ලක් වූ බවත්, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් සමාව අයැදීමක් කළ යුතු බවත්, මා ප්‍රකාශ කර සිටින අතර, මෙම ලිපිය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය ඉදිරි කටයුතු කිරීම සඳහා අදාළ අංශයට යොමු කරමි.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී යෝජනා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTION

### වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා 2025 නොවැම්බර් 10 දින කරන ලද ඉල්ලීම
### சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக 2025 நவம்பர் 10ஆந் திகதி விடுக்கப்பட்ட வேண்டுகோள்
### REQUEST MADE ON 10TH NOVEMBER, 2025 TO RAISE A QUESTION OF PRIVILEGE

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් 2025 නොවැම්බර් 10 දිනැති ලිපිය මඟින් ගරු කථානායකතුමා වෙත යොමු කරන ලද කරුණු, ගරු කථානායකතුමා විසින් 2025 නොවැම්බර් 13 වැනි දින පාර්ලිමේන්තුවේදී ලබා දෙන ලද නියෝගය අනුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - 2026, නවවන වෙන් කළ දිනය - කාරක සභා අවස්ථාව.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බැවින්, 2025 සැප්තැම්බර් 11වන දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය ප්‍රකාරව අපර භාග 6.00 සිට අපර භාග 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාද කිරීමට වෙන් කර ඇති කාලය ද විසර්ජන පනත් කෙටුම්පත කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා සභාවේ අවසරය ඇතිව යොදා ගන්නා බව දැනුම් දීමට කැමැත්තෙමි.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 17] [ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 17] [மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 17th November] [HON. SPEAKER in the Chair.]*

**103 වන ශීර්ෂය.- ආරක්ෂක අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 7,898,000,000

**தலைப்பு 103.- பாதுகாப்பு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 7,898,000,000

HEAD 103.- MINISTER OF DEFENCE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 7,898,000,000

**189 වන ශීර්ෂය.- මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 18,849,000,000

**தலைப்பு 189.- பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 18,849,000,000

HEAD 189.- MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 18,849,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පළමුවන උපලේඛනය, ආරක්ෂක අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 103, 222 සිට 224, 304, 320 සහ 325; මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 189, 225 සහ 226.

සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.30 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.29]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.18 අඟහරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 103, 222 සිට 224, 304, 320, 325, 189, 225 සහ 226 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ඉතා වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂ යටතේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය කියන්නේ අපේ රටේ පවතින වැදගත්ම අමාත්‍යාංශයක්. රටේ ආරක්ෂාව ගැන කථා කරද්දී, අද රටේ ආරක්ෂාව රටේ ආර්ථිකයට කරන බලපෑම ගැනත් විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. නමුත්, මේ ආණ්ඩුව රටේ ආරක්ෂාව කොතරම් වැදගත් ද කියලා, national security රටේ ආර්ථිකයට කොතරම් වැදගත් ද කියලා තීන්දු කරලා කටයුතු කරන ආකාරයක්, ඒක අවබෝධ කරගෙන තිබෙන බවක් අපට පේන්නේ නැහැ. අපට පෙනෙන විධියට නොගැඹුරු මුහුදේ ඇවිදිනවා වාගේ තමයි මේ ආණ්ඩුව රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. පසුගිය කාලයේ, විශේෂයෙන්ම මැතිවරණ වේදිකාවල දුන්නු පොරොන්දු පදනම් කරගෙන මේ රටේ ජාතික ආරක්ෂාව පැත්තකින් තියලා ඒගොල්ලන් අද කටයුතු කරමින් ඉන්නවා.

අපි අවුරුදු 30ක යුද්ධයකින් බැටකාපු ජාතියක්. ජාතියක් කිව්වාම සිංහල ජාතිය විතරක් නොවෙයි, ද්‍රවිඩ ජනතාව, මුස්ලිම් ජනතාව ඇතුළු සියලුම ආගම් අදහන ජනතාව රටේ සමස්ත ජනතාව හැටියට යුද්ධයෙන් බැටකෑවා. හැබැයි, අපට කියන්න බැහැ දැන් යුද්ධය අවසන් කියලා. අපි හිතන වෙලාවක හෝ නොහිතන වෙලාවක හෝ මැතකදී හෝ අනාගතයේ යම් දවසක නැවත අපේ රටේ යුද්ධයක් ඇති වෙන්න පුළුවන්. එහෙම නම් අපි කටයුතු කළ යුත්තේ ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලායි. අපේ රටේ පිහිටීම දිහා බැලුවාම යාපනයේ එළිෆන්ට්පාස් කියන්නේ හරියටම අපේ බෙල්ල වාගේ. අපේ ඔළුවට ලේ ගමන් කරන්නේ, අපේ ස්නායු පද්ධතිය ක්‍රියාත්මක වෙන්නේ බෙල්ල හරහා. ඒ වාගේ තමයි, එළිෆන්ට්පාස් කියන්නේත් අපේ බෙල්ල වාගේ කොටසක්. ඒ වාගේම, පූනරින් සහ අනෙක් පැත්තෙන් මුලතිව් ගත්තාම අපේ උරහිස් දෙක වාගේ.

එතකොට මේ තීරණාත්මක ස්ථානවල අපි ජාතික ආරක්ෂාව සම්බන්ධව කටයුතු කරද්දී, කොහොමද කටයුතු කරන්න ඕනෑ? උතුරේ කොහොමද කටයුතු කරන්නේ? නැඟෙනහිර කොහොමද කටයුතු කරන්නේ? ඒ විතරක් නොවෙයි, කොළඹ, මේ හැම තැනකම. අපි දන්නවා, උතුරේ බරපතළ ඉඩම් ප්‍රශ්නයක් තිබෙන බව. රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා පසුගිය ඡන්ද කාලයේම උතුරේ හිටියේ මම හිතන්නේ; ඔබතුමා දන්නවා, මේ ගැන. ඉඩම් ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, පුද්ගලික ආරක්ෂාවට වඩා අපි ජාතික ආරක්ෂාව ගැන හිතලා මේ ඉඩම් පිළිබඳව තීන්දු තීරණ ගන්න ඕනෑ, ගරු ඇමතිතුමා. මොකද, ජාතික ආරක්ෂාවට එය ඉතාම වැදගත්. ආරක්ෂක මර්මස්ථානවල ඉඩම් තිබෙනවා නම්, ඒවා නැවත ඒ ඉඩම් හිමියන්ට ලබා දීම වෙනුවට විකල්ප ඉඩම් ලබා දෙන්න පුළුවන්. එහෙම නැත්නම් බිමල් රත්නායක අමාත්‍යතුමා, ඒ ඉඩම් වෙනුවට වන්දි ලබා දෙන්න පුළුවන්. ඒ නිසා ජාතික ආරක්ෂාවට වැදගත් ඉඩම් කොටස්, බිම් කොටස් අපේ රටේ ඒ ජාතික ආරක්ෂාව වෙනුවෙන් අප සතුව, රට සතුව එහෙම නැත්නම් ආරක්ෂක හමුදා සතුව තබා ගැනීම තමයි ප්‍රමුඛතාව විය යුත්තේ.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අපට වඩා ආණ්ඩු කරලා තිබෙනවා නේ. එහෙම රජය සතුවම තබා ගත යුතු ඉඩම් පිළිබඳ සාමාන්‍ය යෝජනාවක් අපට ලබා දෙන්න පුළුවන්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමා, මේක තීන්දු කරන්න ඕනෑ, බිමල් රත්නායකවත්, නලින් බණ්ඩාරවත්, එහෙම නැත්නම් අපේ "බංකු බංකු ඇමතිතුමා"වත් නොවෙයි. *[බාධා කිරීමක්]* මේක තීන්දු කරන්න ආරක්ෂාව සම්බන්ධව ඉන්නවා, අපේ රටේ ප්‍රවීණයෝ. ආරක්ෂාව සම්බන්ධයෙන් ඉන්න ඒ ප්‍රවීණයෝ,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමා, මම මේ ඔබතුමාට බාධා කරනවා නොවෙයි. දැනට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ කටයුතු එහෙම නේ, කරගෙන යන්නේ. ඒ ප්‍රවීණයන් තමයි කරන්නේ. ඔබතුමා චෝදනාවක් කරනවා නේ, ඒ වුණාට ඒක හරියට වෙලා නැහැ කියලා.

ඔබතුමන්ලා ආණ්ඩු කර තිබෙන අය නිසා ඔබතුමන්ලා එහෙම හඳුනා ගත් ඉඩම් පිළිබඳ මූලික යෝජනාවක් -පුළුවන් ප්‍රමාණයක්- ලබා දෙන්න. එතකොට අපට පුළුවන් ඒවා ආරක්ෂක ප්‍රවීණයන්ට ලබා දෙන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ඒක තමයි. අපි ආණ්ඩුවේ හිටියා නම් අපි ඕක කරනවා, ඇමතිතුමා. දැන් ඒක කරන්න ඕනෑ, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්. ඒක අමතක වෙලාවත්ද මා දන්නේ නැහැ, බිමල් රත්නායක ඇමතිතුමාට. ආණ්ඩුවේ ඉන්නේ ඔබතුමන්ලා. මම ආරක්ෂක ඇමති කියලා හෝ අපේ ගයන්ත මැතිතුමා අගමැති කියලා හිතාගෙන ද මා දන්නේ නැහැ, ඔබතුමන්ලා කථා කරන්නේ. එහෙම නොවෙයි. ආණ්ඩුවේ ඉන්නේ ඔබතුමන්ලා. ඔබතුමන්ලා ඒක ඉදිරිපත් කරන්න. ඔබතුමන්ලා උතුරේ ඡන්ද ටික ගන්න ඕනෑ නිසා, උතුරේ මිනිසුන් රවටන්න ඉඩම් ටික සේරම දෙනවා කියලා දුන්නු පොරොන්දුව නොවෙයි, ඉටු වෙන්න ඕනෑ. එහිදී නිසි ආකාරයට, රටේ ආරක්ෂාවට ගැටලුවක් නොවන ආකාරයට, ජාතික ආරක්ෂාව තහවුරු වන ආකාරයට, මතු අනාගතයේදී පවා උතුරේ ජනතාවට යුද්ධයක් හිමි නොවන විධියට; යුද්ධයක් නැති රටක් විධියට, උතුරේ යුද්ධයක් නැති සාමකාමී පරිසරයක් ඇති වන තත්ත්වයක් ඇති කරන්න පුළුවන් විධියට ඒ ඉඩම් ටික හඳුනා ගන්න ඕනෑ. ඒකයි මම කියන්නේ. උතුරේ ජනතාවගේ යම් ඉඩම් කොටසක් තිබෙනවා නම්, ඒක ජාතික ආරක්ෂාවට අත්‍යවශ්‍ය නම්, ඒ කෙනාට විකල්ප ඉඩමක් දෙන්න, එම ඉඩමේ වටිනාකමට වඩා දෙගුණයක්, තෙගුණයක් හෝ දෙන්න. ඒ වන්දිය ගන්න එම ජනතාව සූදානම්. අපි කියන්නේ නැහැ, උතුරේ ජනතාවට අසාධාරණයක් කරන්න කියලා. ඒගොල්ලන්ගේ ඉඩම් අතර ජාතික ආරක්ෂාවට වැදගත් මර්මස්ථාන තිබෙනවා නම්, ඔබතුමන්ලා ඒ අයට විකල්ප ඉඩම් ලබා දීමක් හෝ ඒගොල්ලන්ට සතුටු වෙන්න පුළුවන් විධියට, සෑහීමකට පත් වෙන්න පුළුවන් විධියට වන්දි ගෙවීමක් කරන්න. මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ ඒ වාගේ දේවල් ඕනෑ තරම් වෙලා තිබෙනවා.

අපේ රටේ විශාල ව්‍යාපෘති කරද්දී - මහවැලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරද්දී, කොත්මලේ, මොරගහකන්ද, රන්දෙණිගල වාගේ විශාල ව්‍යාපෘති කරද්දී - ඒ පැතිවල මිනිස්සු ගම් පිටින් ඒ ප්‍රදේශ අත් හැරියේ. ඒ මිනිස්සු රටේ වෙනත් දිස්ත්‍රික්කවලට, වෙනත් පළාත්වලට ගියා. එහිදී සිංහල ද, මුස්ලිම් ද, දෙමළ ද කියලා ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, රටේ සංවර්ධනය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ඒ වාගේ අවස්ථාවලදී මිනිස්සු එවැනි කැප කිරීම්, පරිත්‍යාග කිරීම් කර තිබෙනවා. ඒක කරන්න ඕනෑ. ඒක තමයි මෙතැනදී වැදගත් වෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා උතුරට ගිහින් ඡන්ද ගන්න දුන්නු පොරොන්දු අනුව නොවෙයි, රටේ ජාතික ආරක්ෂාව පදනම් කරගෙන අවශ්‍ය තීන්දු, තීරණ ගන්න කියන පණිවුඩය තමයි ඔබතුමන්ලාට දෙන්න තිබෙන්නේ. ඒක කළ යුත්තේ ඔබතුමන්ලායි. ඒ නිසා දේශපාලන පොරොන්දුවලට එහා ගිහින් රටේ ජාතික ආරක්ෂාව පදනම් කරගෙන කටයුතු කරන්න කියලා තමයි මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි, අපේ සෙබළුන් ගැනත් කථා කරන්න ඕනෑ. ඔබතුමන්ලා මැතිවරණ කාලයේ සෙබළුන් ගැන, ඒ වාගේම විශ්‍රාමික සෙබළුන් ගැන පුදුම ආදරයකින් කථා කළා. අපේ විශ්‍රාමික මේජර් ජෙනරාල්තුමා; වර්තමාන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා -එතුමාට නමකුත් තිබෙනවා දැන්, "බංකු බංකු" කියලා - ඇතුළු පිරිස කිඹුල් කඳුළු හෙළුවා, සෙබළුන් ළඟට ගිහිල්ලා. "විසඳුම" ද, මොකක්ද කියලා එකක් ගහගෙන රටේම ඉන්න රණ විරුවන් ගෙන්නලා ඒ අයට පොරොන්දු දුන්නා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම සෙබළු ගැන කථා කරනවා, ඊළඟට. ඒ දුන් පොරොන්දු අද ඉෂ්ට වෙලා තිබෙනවාද? විශාල වශයෙන් මානසික ආතතියකට පත් වෙලා තමයි අද ඒ සෙබළුන් කඳවුරුවල ඉන්නේ.

ඔවුන්ට අවශ්‍ය පහසුකම් නැහැ. ඔවුන්ගේ සතුට නැහැ. ඔවුන්ගේ morale එක නැහැ. ඔවුන් තුළ තමන්ගේ රටට තිබෙන ආදරය ක්‍රමක්‍රමයෙන් -ක්‍රමානුකූලව- ඈත් වෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි ඊයේ පෙරේදා පැවැති "ඉල්මහ විරු සමරුව", ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි. ඒ ඉල්මහ විරු සමරුවේදී, මේ රටේ දෙපාරක් යුද්ධ කරපු, මේ රටේ සෙබළු මරපු, පොලීසියේ අය මරපු "ඉල්මහ විරුවෝ" "මහ විරුවෝ" බවට පත් කළා. ඔබතුමන්ලා ඒ කථාව හොඳට බලන්න. "ඉල්මහ විරුවෝ" "මහ විරුවෝ" වුණා; "රණවිරුවෝ" සෙබළු වුණා. අන්න ඒකයි වුණේ, මේ සැරේ ඉල්මහ විරු සමරුවේදී. රටම විනාශ කරලා, හමුදාවට වෙඩි තියලා, හමුදාවේ අයගේ දෙමව්පියන්ගේ බෙලි කපපු අය "මහ විරුවෝ" බවට වුණා; අපේ විරුවා සෙබළා බවට පත් වුණා. ගරු සභාපතිතුමනි, හරි විධියට නම් මේකට ඔබතුමාටත් ඇඬෙන්න ඕනෑ. මේ රටේ සෙබළුන්ගෙන්, විශ්‍රාමික සෙබළුන්ගෙන් මම අහනවා, ඔබතුමන්ලා මේ ඉල්මහ විරු සමරුවේදී අනුර කුමාර දිසානායක මහත්මයා, ආධ්‍යාත්මික නායක ටිල්වින් සිල්වා මහත්මයා කියපු එක අනුමත කරනවාද කියලා. මේ රට ගිනි තියපු, මේ රට ආර්ථික වශයෙන් අවුරුදු ගණනාවක් පස්සට ඇද දමපු 71 විප්ලවය, 1988-89 විප්ලවය කරපු අය මේ රටේ මහ විරුවෝද? මේ රටේ අවුරුදු 30ක යුද්ධයක් නිමා කරපු, 30,000කට වඩා ජීවිත පරිත්‍යාග කරපු, අතපය නැති කරගෙන, තුවාල කරගෙන, සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුණු අය මහ විරුවෝ නොවෙයි, විරුවෝත් නොවෙයි, "සෙබළු" බවට පත් කරලා තිබෙනවා. ඒක මේ රටේ ජනතාව අනුමත කරනවාද කියලා මම මේ අවස්ථාවේ අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා මටයි, ආරක්ෂක ඇමතිතුමාටයි චක්‍රලේඛය එවන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

එහෙමද? ඔබතුමා දැක්කා නේ? ඒක මගෙන් වුණු ඓතිහාසික වරදක්.

ගරු සභාපතිතුමනි, ඊළඟට ශ්‍රී ලංකා පොලීසිය අරගෙන බලන්න. "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව" කිව්වාට, ශ්‍රී ලංකා පොලීසිය කියලා තමයි කියන්න වෙන්නේ. පොලීසිය භාර ඇමතිතුමා කියන්නේත්, ශ්‍රී ලංකා පොලීසිය කියලායි. ශ්‍රී ලංකා පොලීසිය ගැන මා කථා කරන්න ඕනෑ. මේ පොලිස්පතිවරයා පිළිබඳ ප්‍රශ්නයක් පසුගිය දිනවල කථා වනවා අපි දැක්කා. මොකක්ද ඒ කථාව? පොලිස්පතිවරයා බැනියම් 175,000ක් මිල දී ගැනීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කිහිපයක් කර තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසියට මාස හයකට සැරයක් බැනියම් මිල දී ගන්නවා. දැන් මේ බැනියම් මිල දී ගැනීම සම්බන්ධව කරපු පැමිණිල්ල මොකක්ද? ඒ බැනියම් මිල දී ගැනීමේදී ඒවායේ quality එක නැහැ කියලා එවකට හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයා - පතිනායක මහත්මයා - එය අනුමත කළේ නැහැ.

එතකොට ඒ මිල දී ගැනීම් සම්බන්ධව සිටියේ, එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාව සිටි වර්තමාන

පොලිස්පතිවරයායි. එතුමා සිටියේ logistics අංශය භාරවයි. ඉහත කී පරිදි ඒ මිල දී ගැනීම අනුමත කෙරුණේ නැහැ. ඒ සම්බන්ධව පැමිණිලි කිහිපයක් යනවා. ඒ පැමිණිලි කිහිපයත් එක්ක හඬ පටයකුත් යනවා, ගරු සභාපතිතුමනි. ඊට පස්සේ ඒ සම්බන්ධව පැමිණිල්ලක් යනවා, CID එකට. එතකොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට දීපු හඬ පටය කොහොමද, CID එකට ගියේ? කොහොමද, පොලිස්පතිවරයා අතට ගියේ? ඒ සම්බන්ධව වර්තමාන පොලිස්පතිවරයා මතු කරන්නේ "සංවේදී තොරතුරු එළියට දීම" කියන කාරණයයි. "සංවේදී තොරතුරු එළියට දීම" කියන කාරණය පදනම් කරගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කරපු පැමිණිල්ලේ හඬ පටයක් කොහොමද පොලිස්පතිට යන්නේ; CID එකට යන්නේ? මෙන්න මේකයි තිබෙන බරපතළ ප්‍රශ්නය. මොකක්ද හේතුව? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති නිලධාරි ගීතානි හෙයියන්තුඩුව මහත්මිය තමයි, පොලිස්පතිතුමාගේ බිරිඳ. පළමුවැනියාද, දෙවැනියාද මම දන්නේ නැහැ; අංක පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. එතකොට එහෙම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන පැමිණිලි පිළිබඳව තොරතුරු පොලිස්පතිට හරි එළියට හරි යනවා නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන අපට තිබෙන විශ්වාසය මොකක්ද? එහි CCTVවලින් ගත්තු photos පවා එළියට ගිහිල්ලා තිබෙනවා අපි දැක්කා. පැමිණිලි කරපු බිමල් රුහුණගේ මහත්මයා, සංජය මහවත්ත මහත්මයා කියලා තිබුණා, එතුමන්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන ඒවායෙත් CCTV footages අරගෙන එළියට දීලා කියලා. එතකොට යම්කිසි පුරවැසියෙකුට පුළුවන්ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න, යම් කෙනෙකු සම්බන්ධව? ආණ්ඩුවට සම්බන්ධ කෙනෙක් ගියොත් එහෙම, සුජීව සේනසිංහ තමයි පැමිණිල්ල කළේ කියලා සේරම විස්තර ටික දෙනවා. CID එකට ඒ හඬ පටය දීලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙතැන දි කියනවා,"සංවේදී තොරතුරු එළියට දීම" ලු. මොකක්ද, මේ කියන සංවේදී තොරතුර? බැනියම් 175,000ක් මිල දී ගැනීම. දැන් ඔන්න යට කලිසම් 175,000ක් වුණා නම් ඒක සංවේදී තොරතුරක් වෙන්න තිබුණා, ගරු සභාපතිතුමනි. මොකද, යට කලිසමේ හිල් තිබෙන්න පුළුවන් නේ. දැන් මට හිතෙනවා, ඒ බැනියම්වලත් හිල් තිබුණාදෝ කියලා. මොකද, ඒ බැනියම්වලත් හිල් තිබුණු නිසාද දන්නේ නැහැ නේ, ඒක සංවේදී වුණේ, ගරු සභාපතිතුමනි. මොකද, බැනියම්වල හිල් තිබෙන එකේ පොඩි අප්සට් එකක් තිබෙනවා නේ. සංවේදියි නේ ඇත්තටම. යට කලිසමේ හිල තිබෙන එකත් සංවේදියි. මට නම් ඇඬෙනවා, හිලක් තිබෙන යට කලිසමක් දැක්කොත්. වැනෙනවා නේ ඉතින්. යට කලිසමේ හිල් කථාව දන්නවා නේ. හිල් තිබෙන යට කලිසම් ඇඳපු අය නේ ඔය අපට ඉස්සරහ පැත්තේ ඉන්න 159 දෙනාගෙන් අතිබහුතරය. ඉතින් ඒක සංවේදියි. ඒවා පෙන්වන්න හොඳ නැහැ. යට කලිසමේ හිල් තිබෙන ඒවා පෙන්වන එක සංවේදියි. මට නම් ඇඬෙනවා දැක්කාම. හැබැයි ඒ බැනියමේත් හිල් තිබුණු නිසාද පොලිස්පතිවරයා සංවේදී තොරතුරක් විධියට ඒක දැක්කේ? වර්තමාන පොලිස්පතිවරයා තමයි ඒ බැනියම් අනුමත කළේ. එහෙම නම් -එහෙම හිල් තිබුණා නම්- ලලිත් පතිනායක මහත්මයා කියපු කාරණය ඇත්ත. එතැන ලලිත් පතිනායකද, කවුද හරි කියන එක නොවෙයි බලන්න ඕනෑ. පොලිස්පතිවරයා බලන්න ඕනෑ, කවුද හරි කියන එක නොවෙයි, කුමක්ද හරි කියන එක.

අද මේ පරීක්ෂණ යට ගහන එක නොවෙයි කරන්න ඕනෑ. මේ කියන පැමිණිල්ල සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. මේ හඬ පටයට අදාළ පුද්ගලයන් - බිමල් රුහුණගේ මහත්මයාලා - ඒ හඬ පටය mediaවලට release කරලා තිබුණේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ හඬ පටය leak කළේ පොලිස්පතිවරයා; ඒ හඬ පටය එළියට දැම්මේ, CID එකට දැම්මේ පොලිස්පතිවරයා. එහෙම නම් පොලිස්පතිවරයා ඒ කරලා තිබෙන්නේ බරපතළ වැරැද්දක්. මේක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිය පැමිණිල්ලක්. පැමිණිල්ලට අදාළ පරීක්ෂණය කරන එකයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කරන්න ඕනෑ. එහෙම නැතිව, "මෙහෙම පැමිණිල්ලක් ආවා, පොලිස්පති තමයි මේකේ වගඋත්තරකරු, ඒ නිසා මෙන්න මේක ඔයාට දෙනවා, CID එකට ගිහිල්ලා මේ පැමිණිල්ල දමපු එවුන් අල්ලපියව්" කියන එක නොවෙයි කරන්න ඕනෑ. දැන් බිමල් රුහුණගේලා CID එකට ගෙනාවා. ඔහුගේ ගෙවල් ගාණේ ගිහිල්ලා ඔහුව පරීක්ෂා කළා. ඒ, කුරුණෑගල මනුස්සයෙක්. ඒකද කරන්න ඕනෑ? ගරු ඇමතිතුමනි, රජය විධියට ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ මේකද? මේකටද පුනරුද ආණ්ඩුව ආවේ? ඒ නිසා කරුණාකර මේ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා, සෙව්වන්දිගේ drama එක. නේපාලයේදී සෙව්වන්දි ඇල්ලුවා; අපේ ඕලුගල මහත්මයා සෙව්වන්දි ළඟට ගියා; "ආ ඕලු, ඔයා ආවද?" කියලා ඇහුවා. කෝ ඔයාගේ makeup set එක කියලා ඇහුවා; "පොඩි makeup එකක් දමා ගන්න, අනේ සර්, ඒක මට දෙන්න" කිව්වා. ඒ drama එකේ සේරම අපි දැක්කා නේ. හරියට අර "දෙවෙනි ඉනිම" වාගේ. කෝ, අපේ දිලිත් ජයවීර මහත්මයා සභාවේ ඉන්නවාද? නැහැ නේ. "දෙවෙනි ඉනිම" වාගේ ඒ සේරම අපට පෙන්නුවා. ලංකාවට එනවා; ඊට පස්සේ සෙව්වන්දි බනිස් කෑවා; මොනවාද, මොනවාද ගොඩක් දේවල් වුණා; plane එකේ එන ඒවාත් දැක්කා; සේරම දැක්කා. "සෙව්වන්දියකට පෙම් බැන්දා, ආශා දහසක් රස වින්දා ..." සෙව්වන්දිගේ නාට්‍යය ඔහොම ගියා.

ඊට පස්සේ දිස්නා නිරංජලාගේ නාට්‍යය පටන් ගත්තා විතරයි, මෙන්න සේරම නාට්‍ය ටික තහනම්! එහෙම වෙන්න බැහැ නේ. ඒ කොහොමද වුණේ? සෙව්වන්දිගේ නාට්‍යය වාගේ පෙන්වන්න එපැයි ඒකත්. දිස්නා නිරංජලාගේ මහත්තයා ප්‍රින්සිපල්; හෝටලය තිබෙනවා, අනුරාධපුර කලා වැව ද ඔන්න ඔය කොහේදෝ දිහා. හෝටලයට යනවා පෙන්වන්න ඕනෑ. නිරංජලා ඉන්නවා, පැලියගොඩ **නගර** සභාවේ; නිරංජලා නානවා පෙන්වන්න ඕනෑ; මහත්තයායි, පුතායි අත් අඩංගුවට ගනිද්දි නිරංජලා නෝනා අඬනවා පෙන්වන්න ඕනෑ; පොලීසියට යනවා පෙන්වන්න ඕනෑ. ඒ මුකුත් නැහැ. ඇයි? නිරංජලා නෝනා NPP එකේ මන්ත්‍රීතුමියක්. එතකොට සේරම වැහුවා. වේදිකාවේ lights off වුණා; trip switch එකත් කඩලා දැම්මා; තිරයත් වැහුවා. ඊට පස්සේ ඒක නැහැ; stage එකත් වැහුවා. හෙට අනිද්දා වනකොට stage එකට ගිනි තියයිද දන්නේත් නැහැ.

ඊළඟට ආවා, ටෝනි මොහොමඩ් මහත්මයාගේ නාට්‍යය. ටෝනි මොහොමඩ් මහත්මයා NPP එකේ දෙහිවල ආසන සංවිධායකද කොහේද. 2020 පාර්ලිමේන්තු මැතිවරණයටත් ඉල්ලලා තිබෙනවා. බලනකොට, ටෝනි මොහොමඩ් මහත්මයා NPP එකේ ලොකු කෙරුමෙක්. ලොකු සම්බන්ධකම් තිබෙනවා.

ඒවා මොකුත් පෙන්වූයේ නැහැ. සෙව්වන්දි පෙන්වූවා වාගේ ටෝනි මොහොමඩ් මහත්මයාගේ ආතල් ටික පෙන්වූයේ නැහැ. ඊට පස්සේ තව හාදයෙක් ආවා. "පුවක් දණ්ඩාවේ සනා"ද කොහේද කියලා. මිනිහා ඇල්ලුවා. බලනකොට මිනිහත් NPP එකට බොහොම හිතවත්, සම්බන්ධ, ළඟැඩි කෙනෙක්. අන්තිමට ඒ අල්ලපු Police Narcotics Bureau එකේ SSP හේමාල් ප්‍රසන්න මහත්තයාත් transfer කළා. සෙව්වන්දිගේ කේස් එකට එහෙම ප්‍රචාරය දුන්නා නම් මේවාත් එහෙම වෙන්න එපායැ. ඒවාත් මේ රටට පෙන්වන්න එපායැ. මේක තමයි ඇත්ත බිමල් රත්නායක

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ඇමතිතුමා. ඔබතුමන්ලා කිව්වා, "කිරෙන් දොවලා හෝදලා තමයි ගෙනැල්ලා තිබෙන්නේ. අපි වල් පැළ නැතිව මල් පැළ ටික තමයි හිටෙව්වේ" කියලා. දැන් මල් පැළ අස්සෙන් වල් පැළ එක එක එළියට එනවා නේ. අපි වල් පැළ. කමක් නැහැ, නේද සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා? අපි වල් පැළ කියමුකෝ. දැන් මල් අස්සේ කොහොමද ගංජා මල් මතු වෙන්නේ? වෙන වෙන මල් නේ දැන් මතු වෙන්නේ. ඉලුක් තිබෙනවා, බාදුරා තිබෙනවා, ගංජා තිබෙනවා. මල් පෝච්චිවල ඒ සේරම මල් තිබෙනවා. මේ ටික සුද්ද කරන්නේ කොහොමද කියලා මට පොඩ්ඩක් කියන්නකෝ.

දැන් කන්ටේනර් 300 ගණනක් ආවා. ඒවායේ කුඩු ආවා ලු. කඳානට ගියේ කුඩු කන්ටේනර් නොවෙයි ලු. දැන් මේවාට කවුද වගඋත්තර බඳින්නේ? දැන් අපට ටිල්වින් සිල්වා මහත්තයාට කියන්න වෙන්නේ, "මේවාට උත්තර දෙන්න කියාපිය" කියලා. ටිල්වින් සිල්වා මහත්තයා ඒ දවස්වල කිව්වා නේ, "නැගිටපල්ලා, නැගිටපල්ලා උඹලාගේ කාලය ඇවිල්ලා" කියලා. දැන් මේ ඇවිල්ලා තිබෙන්නේ ටෝනි මොහොමඩ්ලාගේ කාලයද?

ඒ කියන්නේ, NPP එකට හිතවත් කුඩු ව්‍යාපාර කරන අයගේ කාලය ඇවිල්ලා කියලා තමයි ටිල්වින් සිල්වා මහත්තයා කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member you have only two minutes more.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න.

ගරු සභාපතිතුමනි, මේ ඇත්තට මුහුණ දෙන්න ඕනෑ. ඔබතුමන්ලා මේ මන්ත්‍රීවරු 225දෙනාම හොරු කිව්වා. 76 අවුරුදු ශාපය ගැන කිව්වා. දැන් ඔබතුමන්ලාට තේරෙනවා නේ කතන්දරය. ඊයේ පෙරේදා මෙන්න මේ මන්ත්‍රීවරයෙක් ගියා Trincomaleeවලට. "හූ" කියලා එළෙව්වා නේද, හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා? ඊයේ "හූ" කියලා එළෙව්වා. අපි දන්නේ නැහැ, Trincomaleeවල ඒ ප්‍රශ්නය. හැබැයි, පොලීසිය කටයුතු කරපු විධිය වැරදියි. පොලීසියට තිබුණා, ඊට වඩා බොහොම බුද්ධිමත්ව කටයුතු කරන්න. අපි හිතන්නේ නැහැ ඒක එතැනට ආපු SSP මහත්මයා ගත්ත තීන්දුවක්, තීරණයක් විධියට. අපි හිතන හැටියට ආනන්ද විජේපාල ඇමතිතුමාගෙන් හෝ කොහෙන් හරි ලැබුණු නියෝගයක් අනුව තමයි හාමුදුරුවන්වත් තල්ලු කරගෙන, මුතු කුඩයත් තල්ලු කරගෙන, හාමුදුරුවන්ට බැණලා, ගහලා, බුදු පිළිමය උස්සන් ගියේ. අපට ආරංචියි බුදු පිළිමය දාලා තිබෙන්නේත් පොලීසියේ අගු පිලක කියලා. ඒක ඇත්තද නැත්තද දන්නේ නැහැ. ඒ තිබෙන ආරංචිය, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. මට ආරංචියක් ආවා, බුදු පිළිමය අගු පිලක ලු, දාලා තිබුණේ.

උදේ ආයේත් පන්සලට වඩම්මලා. මොකක්ද මේ කතන්දර? මේවා විහිළු නේ ගරු සභාපතිතුමනි. මේ ප්‍රශ්නය මීට වඩා හොඳින් විසඳන්න ක්‍රමයක් තිබුණේ නැද්ද, ස්වාමීන් වහන්සේලාත් එක්ක කථා කරලා? නීති ප්‍රශ්නයක් තිබෙනවා නම් පොලීසියට එන්න කියලා, ප්‍රාදේශීය ලේකම්ලා කැඳවලා මොකක්ද මෙතැන තිබෙන ප්‍රශ්නය කියලා අහන්න තිබුණා නේ. පොලිස් ආරක්ෂාව දෙන්න තිබුණා. ඊට වඩා හොඳට පොලීසියට එතැන සාමය රකින්න තිබුණා, බෞද්ධයෝ විධියට.

අපට පේනවා අද මේ රට ජාතික ආරක්ෂාව මත නොවෙයි මේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රය මත තමයි ක්‍රියාත්මක වෙන්නේ කියලා. මේ අයට දුවන්න වෙලා තිබෙන්නේ එක එක සන්දර්ශනවලින්, ඩ්‍රාමාවලින්. ඒ මත තමයි ජනතාව තෘප්තිමත් කරන්න වෙලා තිබෙන්නේ, චූන් කරන්න වෙලා තිබෙන්නේ. ඒ අනුව තමයි අද ආණ්ඩුව කටයුතු කරමින් යන්නේ කියන එක පේනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කළේ අපේ පොඩි සෙබළු ටිකයි, පොලිස් නිලධාරීන් ටිකයි. අද පොලීසියේ අතිබහුතරයක් ඉන්නේ කලකිරීමෙන්. ශ්‍රී ලංකා පොලීසියට නිලධාරීන් අඩුයි. පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයට තුන්සිය ගාණක් ඉන්න ඕනෑ, ඉන්නේ එකසිය ගාණයි. ඒ ඉන්න අය සමහර වෙලාවට එහාට දුවනවා මෙහාට දුවනවා. අවුරුදු ගණනාවක් තිස්සේ උසස්වීම් නැතිව ඉන්න පොලිස් නිලධාරීන් ඉන්නවා.

මීට මාස කිහිපයකට කලින් OICsලා 147ක් transfer කළා. මාත් පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිවරයා හැටියට ඉඳලා තිබෙනවා. වෙන දා ඒකට Board එකක් තිබුණා. ඒ Board එකෙන් ලකුණු දෙනවා ඒ අයගේ අත්දැකීම්වලට, charge sheets නැති අයට. එහෙම ලකුණු දීලා ඒ ලකුණු මට්ටම අනුව තමයි "A" Grade පොලීසිවලට, "B" Grade පොලීසිවලට සහ "C" Grade පොලීසිවලට දාන්නේ. හැබැයි මේ 147දෙනා කොහොමද දැම්මේ? ඒ මොකුත් බැලුවේ නැහැ. Charge sheets තිබෙනවාද කියලාවත් බැලුවේ නැහැ, දේශපාලන හිතවත්කම් මත හෙංචයියෝ තමයි දැම්මේ.

අද පොලිස් කොමිසමක් නැහැ. 2015-2020 අනුර කුමාර දිසානායක මහත්මයලා, අපි සහයෝගයෙන් එකතු වෙලා හදපු කොමිෂන් සභා ටිකක් තිබුණා, මේ රටේ. ඒවා සැබෑ කොමිෂන් සභා. ඒ කොමිෂන් සභාවලට බලය තිබුණා. අද ඒ කොමිෂන් සභාවල නිලධාරීන් පඹයෝ ගාණට දාලා. තමන්ගේ වුවමනා ඉටු කර ගන්න, තමන්ගේ සේවාව දිගු කර ගන්න අද ඒ නිලධාරීන් පඹයෝ වෙලා. අද පොලිස් කොමිෂන් සභාව හරහා මොකුත් වෙන්නේ නැහැ, OICsලා ඕනෑ ඕනෑ විධියට මාරු කරලා දාලා තිබෙනවා. අද පොලීසිය දුවන්නේ අයාලේ. ඊයේ පෙරේදා, පොලිස්පතිතුමා හිටියේ නැහැ. වැඩ බලන පොලිස්පති මහත්තයෙක් පත් කළා, සංජීව ධර්මරත්න මහත්තයාද කොහේද. සමහර විට මම කියන ඒ නම වැරදි ඇති. එතුමා මොකද කළේ? කලින් හිටියා Senior DIG (Administration) ලෙස පතිනායක මහත්තයා. එයා අයින් කළා. ඊට පස්සේ වැඩ බලන පොලිස්පතිතුමා ම පත්වෙනවා Senior DIG (Administration) විධියට. අනේ, ඒක කරන්න පොලිස්පතිතුමා එනකම් පොඩ්ඩක් ඉන්න කියන්න තිබුණා නේ, ඇමතිතුමා.

පොලිස්පතිතුමා එනකල් පොඩ්ඩක් ඉන්න තිබුණා. එතුමා, එතුමාම පත් කර ගන්නවා. මොනවාද මේ වෙන්නේ? මේ වාගේ දේවල්වලදී ශ්‍රී ලංකා පොලීසිය තුළ ඉන්න Senior DIGsලා, SSPsලාගේ සිට පහළ මට්ටම දක්වා මිනිස්සුන්ගේ විශ්වාසය තහවුරු වෙයිද? ඒ මිනිස්සු වැඩ කරයිද? බොහොම අමාරුවෙන් ඔවුන් වැඩ කරන්නේ. ඒ අයට පඩි වැඩිවීමක් නැහැ. ඔබතුමන්ලා ඡන්දයේදී කිව්වේ මොනවාද? පොලීසිය වෙනම වැටුප් තලයකට ගෙනෙනවා කිව්වා, ජනාධිපතිතුමා. ජනාධිපතිතුමා කිව්වා, පොලීසියේ අය එක එක සන්තෝසම් ගන්නේ, එක එක හොර වැඩ කරන්නේ හොඳ වැටුප් තලයක් නැති නිසා කියලා. ඒ අයට වෙනම වැටුප් තලයකට ගෙනෙනවා කියන එක ඔබතුමන්ලාගේ මැතිවරණ පොරොන්දුවක්. පවුල් පිටින් ඡන්දය දුන්නා. මට ඒක දැන් මතක් වුණේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

පොලීසිය වෙනම වැටුප් තලයකට ගෙනෙනවාය කියපු පොරොන්දුව ඉෂ්ට කරන්නේ කවදාද? ඒක මේ අය වැයේත් නැහැ, ගිය අය වැයේත් නැහැ, ලබන අය වැයෙන් එන බවක් පෙනෙන්නේත් නැහැ. ලබන අය වැයෙන් පසුව මේ ආණ්ඩුවට මොනවා වෙයිද කියලා පෙනෙන්නේත් නැහැ. මොකද, දැන් පාකිස්තානයේ, නේපාලයේ, බංග්ලාදේශයේ Gen Zලා, ඒ අය මේ අය ඇවිල්ලා එකපාරටම ආණ්ඩු පෙරළනවා. *[බාධා කිරීමක්]* අපි නොවෙයි. අපි නොවෙයි ආණ්ඩු පෙරළන්නේ. මම මේ අවදානමක් ගැන කියන්නේ, ජාතික ආරක්ෂාව පිළිබඳව. ඔබතුමන්ලාත් නැහැ අපිත් නැහැ, එදාට. කොහේ හරි ඉන්න මිනිස්සු ටිකක් කඩාගෙන බිඳගෙන එයි, එදාට. බිමල් රත්නායක ඇමතිතුමනි, ඒවාත් බරපතළ ප්‍රශ්න.

ගරු සභාපතිතුමනි, ජාතික ආරක්ෂාව පිළිබඳව තිබෙන මේ බරපතළ ප්‍රශ්නයට දැඩි අවධානය යොමු කරලා තීන්දු තීරණ ගන්න කියා ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ananda Wijepala. You have 20 minutes.

[පූ.භා. 9.54]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු සභාපතිතුමනි, අද මහජන ආරක්ෂක අමාත්‍යාංශයේත්, ආරක්ෂක අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කරුණු දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ 82,000ක් සේවය කරන ශ්‍රී ලංකා පොලීසියත්, 7,000කින් සමන්විත විශේෂ කාර්ය බලකායත්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවත්, පොලිස් ඇකඩමියත්, රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලයත් පවතිනවා. විශේෂයෙන් ඔක්තෝබර් මාසයේ ගැසට් නිවේදනයක් මඟින් සිදු කරන ලද සංශෝධනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවත්, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවත් මේ අමාත්‍යාංශය යටතට පත් වුණා.

ගරු සභාපතිතුමනි, ආර්ථිකය බංකොලොත්භාවයට පත් කරපු රටේ ආර්ථිකය ස්ථාවරත්වයට පත් කළා වාගේම, නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්නත් අපි මේ වෙනකොට ශ්‍රී ලංකා පොලීසිය හැටියටත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැටියටත් සැලකිය යුතු දායකත්වයක් ලබා දීලා තිබෙනවා. මේ රටේ ජනතාව දන්නවා පසුගිය අවුරුද්දක කාලය ඇතුළත විශේෂයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැටියට, ශ්‍රී ලංකා පොලීසිය හැටියට ගත් ක්‍රියාමාර්ග හරහා මේ රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත වෙච්ච හැටි.

සමහර අයට රිදෙනවා. අල්ලස, දූෂණය, වංචාවට සම්බන්ධ වුවන් සම්බන්ධයෙන් විමර්ශන කරන අපේ අතිදක්ෂ විමර්ශන නිලධාරීන්ට අපහාස කරමින් කරුණු ඉදිරිපත් කරන්න සමහර අය පෙළැඹිලා තිබෙනවා, තමන්ට රිදෙනකොට. පොලිස් දෙපාර්තමේන්තුව මොන තත්ත්වයටද ඇද දමලා තිබුණේ කියලා මේ රටේ ජනතාව හොඳින් දන්නවා. මේ රටේ හිටපු පොලිස්පතිතුමෙක් තමයි කිව්වේ, පොලිස් OICsලා 184ක් පත් කරනකොට 182ක්ම පත් කරන්නේ ඒ ප්‍රදේශයේ සංවිධායකවරයා හරහා කියලා. එහෙම තිබුණු පොලිස් දෙපාර්තමේන්තුව අපි දේශපාලනීකරණයෙන් නිදහස් කරගෙන තිබෙනවා. පොලිස් කොමිසම හරහා තමයි පොලීසියේ සියලු මාරුවීම්, බඳවා ගැනීම්, විනය පටිපාටි සියල්ල සිදු කරන්නේ, ගරු සභාපතිතුමනි. මේ පොලිස් කොමිසම පත් වෙලා තිබුණේ පසුගිය ආණ්ඩුව කාලයේ. පොලිස් කොමිසමට කිසිදු දේශපාලන බලපෑමක් අපි කරලා නැහැ; අපේ ආණ්ඩුව කරලාත් නැහැ. පොලිස් කොමිසම විතරක් නොවෙයි, අනෙකුත් කොමිසනුත් ස්වාධීනව කටයුතු කරනවා. ඒ නිසා මේ ස්ථානාධිපතිවරුන් පත් කිරීම් කරන්නේ කාර්ය සාධනය මතයි. ඒ වාගේම ඔවුන් සම්බන්ධයෙන් ඒ පොලිස් දෙපාර්තමේන්තු හරහා ලබා ගන්නා තොරතුරු මතයි. පොලිස් දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත පොලිස් කොමිසම තමයි පත් කිරීම් කරන්නේ. බඳවා ගැනීම්, පත් කිරීම්, විනය පරිපාලන කටයුතු සියල්ල පොලිස් කොමිසම සතුව තමයි තිබෙන්නේ. ඒ නිසා අපි මේ වන විට රජය හැටියට පොලිස් සේවය දේශපාලනීකරණයෙන් නිදහස් කරගෙන තිබෙනවා. පොලිස් සේවය සක්‍රිය කරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා පොලිස් කොස්තාපල්ගේ ඉඳලා පොලිස්පති දක්වා ඇතුළු සියලුදෙනා මේ අවුරුද්ද තුළ කරපු කාර්ය සාධනය වෙනුවෙන් ස්තුතිය පළ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ අයට ස්තුතිය පළ කරන්න අවශ්‍යයි. මොකද, පොලිස් දෙපාර්තමේන්තුව දක්ෂව සක්‍රිය වෙලා තිබෙනවා. මට පැයක්, දෙකක්, තුනක් ලැබෙනවා නම්, මේ අවුරුද්ද ඇතුළත එහි කාර්ය කාර්ය සාධනය ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් කියන්න කැමතියි. පසුගිය දින කිහිපය පුරාම මෙතැනදී කිව්වා, මේ ගත්ත සල්ලි වියදම් කරලා නැහැ, වියදම් කරන්න හැකියාවක් නැහැ කියලා. එහෙම නැහැ, ගරු සභාපතිතුමනි. සමහර කාරණා ගත්තාම මුදල් සියයට සියයක් වියදම් වෙලා තිබෙනවා. සමහර ඒවායේ සියයට 70ක්, සියයට 80ක් වියදම් කරලා තිබෙනවා. සාධනීය තත්ත්වයක් අත්පත් කර දීලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මහජන ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් වෙලා තිබුණා, මේ අවුරුද්දේ රුපියල් මිලියන 624ක්. ඒකෙන් රුපියල් මිලියන 487ක්, නැත්නම් රුපියල් මිලියන 480ක් -සියයට 70.9ක්- මේ වන විට වියදම් කරලා තිබෙනවා. ඉදිරි මාස දෙකක කාලය තුළ ඉතිරි රුපියල් මිලියන 86 වියදම් කරනවා. එතකොට ප්‍රතිශතය 91යි. ඒ නිසා අපි ගත්ත මුදල් සක්‍රිය ලෙස පූර්ණ උපයෝජනයක් සහිතව යොදවලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අංශයක් තිබෙනවා. රුපියල් මිලියන 1,370න් රුපියල් මිලියන 791ක් වියදම් කරලා තිබෙනවා; සියයට 57.7ක් වියදම් කරලා තිබෙනවා. ඉතිරි මාස එකහමාර තුළ රුපියල් මිලියන 162ක බිල් ගෙව්වාම, සියයට 70ක ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය නොවන ලේකම් කාර්යාලයට රුපියල් මිලියන 73ක් වෙන් කර තිබුණා.

එයින් රුපියල් මිලියන 57.8ක් වියදම් කරලා තිබෙනවා. ඉතිරි ඒවායිනුත් රුපියල් මිලියන 12.19ක් ඉදිරි මාස එකහමාර තුළ වියදම් කරනවා. එතකොට එහි ප්‍රගතිය සියයට 95යි.

[ගරු ආනන්ද විජේපාල මහතා]

විශේෂයෙන්ම මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන විශේෂ කාර්ය බලකායට රුපියල් මිලියන 31ක් වෙන් කරලා තිබුණා. මේ වෙනකොට එයින් රුපියල් මිලියන 23ක් වියදම් කරලා තිබෙනවා. එහි සියයට 74.5ක ප්‍රගතියක් තිබෙනවා. ඒ වාගේම Clean Sri Lanka යටතේ ලැබුණු රුපියල් මිලියන 200ක ප්‍රතිපාදනත් සමඟ අන්තරායකර ඖෂධ ජාතික පාලක මණ්ඩලයට සම්පූර්ණයෙන් රුපියල් මිලියන 950ක් වෙන් කරලා තිබුණා. මේ වෙනකොට එයින් රුපියල් මිලියන 354ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් මිලියන 430ක් වියදම් කර පුනරුත්ථාපන මධ්‍යස්ථාන 3ක් අලුත්වැඩියා කරමින් තිබෙනවා. වාහන 3ක් ලබා ගැනීම සඳහා මේ වන විට tenders open කරලා බිල් ගෙවීමට තිබෙනවා. එතැන රුපියල් මිලියන 430ක වැය බරක් දරන්න තිබෙනවා. මේ සියල්ල එකතු වුණාම අපට සියයට 83ක ප්‍රගතියක් අත් පත් කර ගන්න හැකියාව ලැබෙනවා. විශේෂයෙන්ම පොලිස් අභ්‍යාස විද්‍යාලයට රුපියල් මිලියන 142.5ක් වෙන් වෙලා තිබුණා. එයින් රුපියල් මිලියන 101.4ක්, ඒ කියන්නේ සියයට 71ක් වියදම් කරලා තිබෙනවා. තව රුපියල් මිලියන 38ක් මේ මාස දෙක ඇතුළත ගෙව්වාම අපිට සියයට 98ක ප්‍රගතියක් අත් පත් කරගන්න පුළුවන් වෙනවා.

ගරු සභාපතිතුමනි, වැඩිම මුදලක් වෙන් වුණේ ශ්‍රී ලංකා පොලීසියට. ඒ අනුව පුනරාවර්තන වියදම් හැටියට රුපියල් මිලියන 135,350ක් වෙන් වෙලා තිබුණා. එයින් රුපියල් මිලියන 100,000ක් වියදම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 74.6ක් වියදම් කරලා තිබෙනවා. තවත් රුපියල් මිලියන 23,059.6ක් ඉදිරි මාස දෙක තුළ ගෙවීම් කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. එම ගෙවීම අවසන් වෙනකොට අපි සියයට 91ක ප්‍රගතියක් අත් පත් කර ගන්නවා. ඒ අනුව සමස්තයක් විධියට රුපියල් මිලියන 144,300ක් පොලිස් දෙපාර්තමේන්තුවට වියදම් කරන්න අය වැයෙන් වෙන් වෙලා තිබුණා. ඒකෙන් රුපියල් මිලියන 103,357.81ක් වියදම් කරලා සියයට 90ක ප්‍රගතියක් අත් පත් කරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ හරහා අපි පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය යටිතල පහසුකම් සියල්ල සංවර්ධනය කරන්න අවශ්‍ය පියවර අරන් තිබෙනවා. මම දැන් සඳහන් කළ විධියට ප්‍රතිපාදන යොදා ගැනීම නිසා පොලිස් දෙපාර්තමේන්තුව දේශපාලනීකරණයෙන් මුදා ගත්තා වාගේම, ඒ හරහා නිලධාරින් සක්‍රිය වුණා. ඒ වාගේම, පොලිස් දෙපාර්තමේන්තුව හරහා රටේ ජනතාවට සේවය සලසන්නේ කොහොමද කියලා ඔවුන් දන්නවා. මේ වෙනකොට ඔවුන් තමන්ගේ සේවය නිවැරදිවත්, යුක්ති සහගතවත් පැය 24 පුරාම ඉටු කරමින් ඉන්නවා. ඒ අනුව පොලිස් දෙපාර්තමේන්තුව සාධනීය තත්ත්වයක් අත් පත් කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට පොලිස් දෙපාර්තමේන්තුව කෙරෙහි ජනතාවගේ විශ්වාසය යොමු වෙලා තිබෙනවා. රටේ ජනතාව පොලිස් දෙපාර්තමේන්තුව විශ්වාස කරමින් අපරාධ මර්දනයටත්, පාතාල ක්‍රියාකාරකම් මර්දනයටත්, ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිවත් පොලිස් දෙපාර්තමේන්තුවට විශාල වශයෙන් තොරතුරු ලබාදෙන තත්ත්වයක් දක්වා නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා, පොලිස් කොස්තාපල්වරයාගේ සිට පොලිස්පතිවරයා දක්වා සියලුදෙනාම ඒක රාශි වෙලා කරන කාර්යභාරය වෙනුවෙන් මම නැවත නැවතත් ඔවුන්ට ස්තුතිය පළ කරනවා.

මම කලින් කී පරිදි පොලිස් දෙපාර්තමේන්තුව මුදල් වැය කරලා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ නිල නිවාස 186ක් මේ අවුරුද්දේ අලුත්වැඩිය කළා. ඒ වාගේම, Harbour View Residencies ව්‍යාපෘතියේ නිවාස 350ක් පොලිස් නිලධාරින් වෙනුවෙන් ගන්න අපි මේ වෙනකොට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලා, tenders open කරලා ඊට අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ මේ වෙනකොට අපට single cabs 130ක් ලැබෙමින් පවතිනවා. ඒ විතරක් නොවෙයි. ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන single cabs 200ක් මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,200ක් වැය කරනවා. පොලිස් ත්‍යාග අරමුදලින් යතුරු පැදි 750ක් ගන්න අවශ්‍ය කටයුතු සියල්ල අවසන් කරලා, ඉදිරි සතිය හෝ දෙක ඇතුළත එම යතුරු පැදි මිලදී ගන්න කටයුතු කරනවා.

ඒ වාගේම පොලිස් රෝහලේ දැඩි සත්කාර ඒකකය වැඩිදියුණු කරමින් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 36ක් වෙන් කර තිබෙනවා. පොලිස් රෝහලේ නව දන්ත ශල්‍යාගාරය ස්ථාපිත කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 196ක් වෙන් කරලා ඒ කටයුතු කරමින් යනවා. ඒ වාගේම නව අක්ෂි ශල්‍යාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් ඉන්නවා. ගරු සභාපතිතුමනි, පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය සඳහා වෛද්‍ය පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් වෛද්‍යවරු 25දෙනෙක් බඳවා ගැනීමට මේ වෙනකොට අනුමැතිය ලැබිලා, ඒ සඳහා වන ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ අනුව විශේෂඥ වෛද්‍යවරු 5දෙනෙක්, දන්ත ශල්‍ය වෛද්‍යවරු 4දෙනෙක් සහ අනෙකුත් වෛද්‍යවරු 16දෙනෙක් බඳවා ගන්න අවශ්‍ය සියලු පියවර ගන්නවා වාගේම, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කර අවසන් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ වෙනකොට 119 හදිසි ඇමතුම් අංශයට සන්නිවේදන උපකරණ ලෙස දුරකථන පරිගණක 20ක් තමයි යොදාගෙන තිබුණේ. ඒ ප්‍රමාණය 50ක් දක්වා වැඩි කරලා එම සේවාව තවත් විධිමත් කර තිබෙනවා. ඒ වාගේම පොලිස් නිලධාරින්ගේ නිල ඇඳුම් සහ සපත්තු සඳහා ඔවුන්ට දීමනාවක් ලබා දෙන්න ඊයේ කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා.

ඒ අනුව පොලිස් නිලධාරියෙකුට රුපියල් 7,000ක දීමනාවක් ලබා දෙන්න තීන්දු කර තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,100ක් 2025 වර්ෂය සඳහා වෙන් කරලා තිබෙනවා. අපි ලබන සතියේදී ඒ නිලධාරින්ට ඒ දීමනාව ලබා දීමට කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. ඒ නිලධාරින්ට ක්‍රීඩා සපත්තු, ඇඳුම් පැළඳුම් ලබා ගැනීම සඳහාත් යම්කිසි මුදලක් ලබා දෙන්න කැබිනට් මණ්ඩලය ඊයේ තීන්දුවක් ගත්තා. ඒකට ලබන සතියේදී අනුමැතිය ලබා ගන්න හැකියාව ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මම තව කාරණයක් කියන්න කැමැතියි. අපි මේ වර්ෂය තුළ පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් ඇති කළා. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන කොට්ඨාසයකුත් - PCID එක - අපි ස්ථාපිත කළා. දැන් ඒ විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශන සිදු කරමින් පවතිනවා. මේ රටේ ජනයාගේ දේපළ කොල්ලකාලා, කළු සල්ලි හරහා විවිධ දේපළ උත්පාදනය කර ගත් පුද්ගලයින්ට එරෙහිව පැමිණිලි විශාල ප්‍රමාණයක් මේ වනකොට PCID එකට ලැබෙමින් පවතිවනවා. ඒ සියල්ල විමර්ශනය කරන්න අවශ්‍ය පියවර මේ වනකොට අරගෙන තිබෙනවා. ඊට අමතරව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයත් පසුගිය වර්ෂයේදී ස්ථාපිත කළා. මේ රටේ මූල්‍ය අවභාවිත කරපු, අල්ලස, දූෂණය, වංචාවේ යෙදුණු, මහජනයාගේ දේපළ කොල්ලකාපු අයට එරෙහිව සිදු කරනු ලබන විමර්ශන කටයුතු සක්‍රියව සහ ශක්තිමත්ව ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා, ගරු සභාපතිතුමනි. ඒ විතරක් නොවෙයි. අපි මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය - CCIB එක -

ස්ථාපිත කළා. නාරාහේන්පිට කම්කරු මූලස්ථානයේ තමයි ඒ කාර්යාංශය ස්ථාපිත කර තිබෙන්නේ. ඒවා පළාත් මට්ටමින් විමධ්‍යගත කරලා තිබෙනවා. CID එකට පැමිණිල්ලක් දමන්න දැන් කොළඹට එන්න ඕනෑ නැහැ. මොකද, ඒ කාර්යාංශය හරහා පළාත අනුව පැමිණිලි කරන්න හැකියාව තිබෙනවා. අපි ඒ වෙනුවෙනුත් කටයුතු කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පරිගණක අපරාධ පිළිබඳ විමර්ශන පුළුල් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මේ වනකොට පරිගණක අපරාධ විමර්ශන අංශයක් ස්ථාපිතකොට තිබෙනවා. අපි ඉදිරියේදී ඒක කොට්ඨාසයක් - division එකක් - ලෙස පරිවර්තනය කරන්න බලාපොරොත්තු වනවා. පරිගණක අපරාධ විමර්ශන අංශයට දවසකට පරිගණක අපරාධ පැමිණිලි 20ක්, 25ක් පමණ ලැබෙනවා. අපි පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය ස්ථාපිත කිරීමට අවශ්‍ය පදනම මේ වන විට සකස් කර තිබෙනවා. ඒ වාගේම අපි පොලීසියේ යටිතල පහසුකම් සියල්ල සංවර්ධනය කරමින් සිටින්නේ. මෙතැන සඳහන් වුණා, පොලිස් නිලධාරින් සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් සකස් කිරීම ගැන. ගරු සභාපතිතුමනි, පොලිස් නිලධාරින් සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් කමිටුවකුත් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවේ තීන්දුව ලැබුණු ගමන් එම වැටුප් ව්‍යුහය 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ අය වැයෙන් ඒ සඳහාත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපට ඒ පිළිබඳව ලොකු බාධාවක් නැහැ. මම කිව්ව ආකාරයටම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසු ඒ සම්බන්ධව කටයුතු කරන්න අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නවා. ඒ වාගේම මානව සම්පතේ හිඟයක් ද පවතිනවා. විශේෂයෙන් පොලිස් නිලධාරින් 28,000ක අඩුවක් පවතිනවා. ඒ වෙනුවෙන් අපි ක්‍රියාත්මක වෙලා තිබෙනවා. පොලිස් නිලධාරින් 5,000ක් බඳවා ගැනීමට මේ වනකොට සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු ඇමතිතුමනි, උප පොලිස් පරීක්ෂකවරුන් - SI මහත්වරුන් - සියදෙනා බඳවා ගැනීම නවත්වපු එක ගැන ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න, මම ඒ ගැන පැහැදිලි කරන්නම්. මේ වනකොට උප පොලිස් පරීක්ෂකවරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙනවා, පොලිස් කොස්තාපල්වරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙනවා. ඒ වාගේම පොලිස් නිලධාරිනියන් බඳවා ගැනීමට ගැසට් නිවේදන සකස් කරලා තිබෙනවා. ඒ අනුව මේ වර්ෂය තුළ පොලීසියට හැකි තරම් නිලධාරින් ප්‍රමාණයක් බඳවා ගැනීමට අපි කටයුතු කරනවා. මේ වර්ෂය තුළ Police College එකෙන් නිලධාරින් 800කට පමණ පුහුණුවීම් ලබා දීලා තිබෙනවා. පොලිස් රියදුරන් 160දෙනෙකු පුහුණු කරලා තිබෙනවා. Police Colleges 10න් 9ක්ම ඒ සඳහා සූදානම් කරලා තිබෙනවා. මේ වනකොට සම්මුඛ පරීක්ෂණ අවසන් කරලා ඒ තනතුරුවලට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. 2026 වර්ෂය සඳහා නිලධාරින් 5,000ක් බඳවා ගැනීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරි කමිටුවෙන් අනුමැතිය ලැබී තිබෙනවා. ඒ නිසා අපි ඒ නිලධාරින් 5,000 බඳවා ගැනීම ජනවාරි මාසයේදී නැවත ගැසට් කරනවා. ඒ විධියට පවතින මානව සම්පතේ ඌනතාව පියමං කිරීම සඳහා අපි කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි.

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කර තිබෙනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් 10,000ක් පොලීසියට බඳවා ගැනීමට අපි ඉදිරි මාසයක කාලය ඇතුළත කටයුතු කරනවා. ඊට අමතරව පොලීසියට අනුබද්ධ සිවිල් සේවා සඳහා නිලධාරින් බඳවා ගන්නත් කටයුතු කරනවා. ඊට අමතරව නීතිඥවරුන් 150ක් බඳවා ගන්නත් අපි ඉල්ලීමක් කර තිබෙනවා. අපට ඒ සඳහා ළඟදීම අනුමැතිය ලැබෙයි කියා විශ්වාස කරනවා. ඊට අනුබද්ධව පරිගණක ඉංජිනේරුවන් බඳවා ගැනීම සඳහාත් අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒ විධියට අපි පොලිස් දෙපාර්තමේන්තුවේ මානව සම්පත කළමනාකරණය කරලා තිබෙනවා. පොලිස් නිලධාරියෙක්, අභිප්‍රේරණයක් සහිත පොලිස් නිලධාරියෙක් හැටියට කටයුතු කරන්න අවශ්‍යයි. ඒ සඳහා අපි අභිප්‍රේරණයක් සහිත පොලිස් නිලධාරියෙක් නිර්මාණය කරන්නත් අවශ්‍යයි. 2020 පෙබරවාරි මාසයේ ඉඳලා පසුගිය ආණ්ඩු නතර කර තිබූ උසස්වීම් 5,000ක් මේ වනකොට අපි ලබා දෙමින් පවතිනවා. ඒ උසස්වීම් ලබා දීම සියයට 80ක් විතර මේ වනකොට අවසන් කර තිබෙනවා. යම් කෙනෙක් මේ උසස්වීම් ලබා දීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් කළොත්, ඒ පැමිණිලි සියල්ල විභාග කරලා ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්නත් අපි කටයුතු කරනවා. ඊළඟට, විශේෂ කාර්ය බලකායේ නිලධාරින්ට උසස්වීම් ලබා දීමේදී යම් ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා.

ඔවුන්ට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අසාධාරණය නැති කරන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා අධිසේවක පදනම මත විශේෂ කාර්ය බලකායේ පොලිස් පරීක්ෂකවරුන් 350දෙනෙක් වෙනුවෙන් උසස්වීම් ලබා දෙන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. අපි මේ වනකොට භාණ්ඩාගාරයත් එක්ක ඒ පිළිබඳව කථා කරලා තිබෙනවා. විශේෂ කාර්ය බලකායේ නිලධාරින් කරන කැප වීම, මැදිහත් වීම වෙනුවෙන් අපි ඔවුන්ට කෘතඥතාව පළ කරනවා වාගේම ඔවුන්ගේ උසස්වීම් පිළිබඳ ප්‍රශ්නය ඉදිරි සති දෙක තුන ඇතුළත - මේ වර්ෂය ඇතුළත - විසඳා අවසන් කරන්න අපි කටයුතු කරනවා. ඒ අනුව උසස්වීම් පිළිබඳ ප්‍රශ්නයත් අපි මේ වනකොට අදියරෙන් අදියර නිම කරමින් ඉන්නවා. කාර්ය සාධනය මත සහ විභාග ක්‍රම මත ඉදිරියේදී අපි අදාළ බඳවා ගැනීම් කරනවා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. පොලිස් සේවාවට බඳවා ගැනීම සඳහා වූ සුදුසුකම ඉහළ දැමීමට අපි කටයුතු කරනවා. පොලිස් කොස්තාපල් තනතුර සඳහා උසස් පෙළ සමතුන් බඳවා ගන්නත්, උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා උපාධිධාරින් බඳවා ගන්නත්, ඒ වාගේම සහකාර පොලිස් අධිකාරිවරුන් සඳහා උපාධියට අමතරව පශ්චාත් උපාධියක් හරි, පන්ති සාමර්ථයක් හරි නියම කරන්නත් අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්න අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා. පොලිස් සේවාව ප්‍රමිතිගත කරලා උසස් තත්ත්වයක් දක්වා ගෙනෙන්න ඕනෑ. මේ වනකොට අපි ඔවුන්ට ලබා දී තිබෙන දැනුම, ඒ වාගේම තාක්ෂණික හැකියාවන් හරහා ඔවුන් ඉතාම සාධනීය ලෙස විමර්ශන කටයුතු කරනවා. ඕනෑම විමර්ශනයක් සතියක්, දෙකක් ඇතුළත සාර්ථකව අවසන් කරන්න ඔවුන් කටයුතු කරමින් ඉන්නවා. මෙහෙම කටයුතු කරනකොට සමහර අයට රිදිලා තිබෙනවා. ඒ නිසා අපේ නිලධාරින්ට අපහාස කරනවා. අපේ සහකාර පොලිස් අධිකාරි ඕලුගල මහත්මයා ඉතාම දක්ෂ ලෙස ඒ විමර්ශන කටයුතුවල යෙදෙනවා. මේ වනකොට අපි පාතාල ක්‍රියාකාරකම් විශාල වශයෙන් ව්‍යර්ථ කර තිබෙනවා. පාතාල ක්‍රියාකරුවන්ට රතු නිවේදන නිකුත් කර තිබෙනවා. තව රතු නිවේදන 80ක් නිකුත් කරලා ඔවුන් මේ රටට ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර අපි ගන්නවා. රාජ්‍ය තාන්ත්‍රිකවත්, ඒ වාගේම ජාත්‍යන්තර පොලීසිය හරහා ඒකාබද්ධ විමර්ශන තුළිනුත් අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ පාතාල ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පිරිසක්, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධකරුවන් පිරිසක් ඉන්දුනීසියාවෙන් මෙරටට ගෙනාවා. අපි ඔවුන් හරහා තොරතුරු විශාල ප්‍රමාණයක් මේ වනකොට හෙළි කරගෙන තිබෙනවා. ඒ අනුව 2025.08.30 දිනෙන් පසුව ඔවුන් සම්බන්ධ කර ගනිමින් කළ විමර්ශන හරහා මේ වනකොට ටී-56 අවි 7ක්, ටී-81 අවියක්, පිස්තෝල 6ක්, රිවෝල්වර් 9ක්, වෙනත් අවි දෙකක්, උණ්ඩ 909ක් හොයා ගත්තා.

සමහරු අහනවා, සෙව්වන්දි ගෙනැල්ලා මොකක්ද කළේ කියලා. මේ වනකොට අපි ඔවුන් හරහා දේශපාලනඥයන්ගේ සම්බන්ධතා ද අනාවරණය කරගෙන තිබෙනවා. ඒ පිළිබඳව ගැඹුරු විමර්ශනයක් කරන්න අවශ්‍යයි. අපි ඒ කටයුතුත් කරමින් තිබෙනවා. මේ රටේ ජනතාව දන්නවා, පොලිස් සේවාව ක්‍රියාත්මක වන්නේ මොන ආකාරයෙන්ද කියලා. රට තුළ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන්න, මේ රටේ ජනයාට යුක්තිය ගෙනෙන්න, මේ රටේ ජනයාට සාධාරණය ගෙනෙන්න තමයි පොලිස් දෙපාර්තමේන්තුව අපි මෙහෙයවා තිබෙන්නේ. එහෙම නැතිව ඒගොල්ලන් වාගේ අපිත් පොලිස් දෙපාර්තමේන්තුව දේශපාලන කටයුතු සඳහා යොදා ගෙන නැහැ; කිසි ලෙසකින් යොදා ගන්න අදහසකුත් නැහැ. පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැම වෙලාවේම කටයුතු කරන්නේ අපට ලැබුණු ජන වරම අනුවයි. අපි මේ රටට පොරොන්දු වුණා, මේ රටට නීතියේ ආධිපත්‍යය ගෙනෙනවා, මේ රටට යුක්තිය ගෙනෙනවා, මේ රටට සාධාරණත්වය ගෙනෙනවා කියලා. ඒ වෙනුවෙන් තමයි අපි මේ කටයුතු කරමින් ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Minister, you have two more minutes.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක්, දෙකක් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ඇමතිතුමාට තව විනාඩි 5ක කාලයක් ලබා දෙන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
අපි මේ වනකොට "රටම එකට" මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙනවා. ඒකේ ප්‍රධාන කොටස් දෙකක් තිබෙනවා. මේ රටේ මත්ද්‍රව්‍ය සැපයුම් ජාලය අඩපණ කිරීම සඳහාත්, මත්ද්‍රව්‍ය රට තුළට ගලා ඒම අඩපණ කිරීමත් සඳහාත් කටයුතු කරන ත්‍රිවිධ හමුදාවට, විශේෂයෙන් නාවික හමුදාවට මේ වෙලාවේ අපේ කෘතඥතාව පළ කරන්න ඕනෑ. ඒ වාගේම විශේෂ කාර්ය බලකාය ඇතුළු ඒ සියලු අංශ එකතු වෙලා පොලිස් දෙපාර්තමේන්තුවම සක්‍රිය ලෙස දායක වෙමින් සාර්ථක මෙහෙයුම් ක්‍රියාත්මක කර තිබෙනවා. ජනවාරි පළමුවැනි දා සිට මේ දක්වා - ගෙවී ගිය මාස 10ක, 11ක කාලය තුළ - ග්‍රෑම්වලින් නොවෙයි, කිලෝග්‍රෑම්වලින් නොවෙයි, ටොන් 20කට වැඩි මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්න ඒ නිලධාරින් සමත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ග්‍රෑම්වලින් කථා කළේ, කිලෝග්‍රෑම්වලින් කථා කළේ. පසුගිය කාලය පුරාම - අවුරුදු ගණනාවක් - මේ රටේ දේශපාලකයන් සංවිධානාත්මක අපරාධකරුවන් හා සම්බන්ධ වෙමින් කරගෙන ගිය ජාවාරම්වල ප්‍රතිඵලයක් වශයෙන් මේ රට මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක සැපයුම් ජාලයක් බවට පරිවර්තනය වෙලා තිබුණා. ඒ මත්ද්‍රව්‍ය දැන් සක්‍රිය ලෙස අත්අඩංගුවට ගනිමින් ඉන්නවා. ඒ වාගේම මේ රටට මත්ද්‍රව්‍ය සැපයීම මුහුද හරහා සිද්ධ වන සියලු අවස්ථාවලදී ඒ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමට නාවික හමුදාව සක්‍රියව දායක වෙමින් කටයුතු කරමින් ඉන්නවා.

ඒ හින්දා මම මේ වෙලාවේ කියන්න ඕනෑ, මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් යම් සංඛ්‍යාලේඛන ප්‍රමාණයක් තිබෙනවා කියලා. මට ඒ විස්තර කියන්න වෙලාවක් නැහැ, ගරු සභාපතිතුමනි. අපි දැන් මත්ද්‍රව්‍ය ජාලය අඩපණ කිරීම වාගේම මත්ද්‍රව්‍ය ඇති ඉල්ලුම අවම කිරීම සඳහාත් පියවර ගනිමින් ඉන්නවා. ඒ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රතිකාර වැඩසටහන්, පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන් අතරමැදි නිවෙස්වල දින 14ක පුනරුත්ථාපන වැඩසටහනක් දැන් සැලසුම් කර ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මේ වනකොටත් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. හැම දිස්ත්‍රික්කයකම පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා මුදල් වෙන් වෙලා තිබෙනවා. දැනට කුරුණෑගල, මඩකලපුව සහ මාතර යන දිස්ත්‍රික්කවල ඒ මධ්‍යස්ථාන ඉදි කෙරෙමින් පවතිනවා. ඊට අමතරව පුනරුත්ථාපනය සඳහා අතරමැදි නිවෙස් කිහිපයක් ගිය සතියේ ඉඳලා ක්‍රියාත්මක වනවා. ඒ, මිහින්තලය, කල්පිටිය සහ අම්පාර ප්‍රදේශවල. ඒ අනුව පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුම අවම කිරීම සඳහා අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා.

අපි මේ වනකොට ඒ වෙනුවෙන් පළමු තලය විධියට මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සභාව පිහිටුවා තිබෙනවා. එහි සභාපති වන්නේ ගරු ජනාධිපතිතුමා. ඒ හරහා මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් අපි මේ රටට බලය, ශක්තිය සපයනවා. ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවේ ආශීර්වාදය, ආණ්ඩුවේ වුවමනාව අපි පෙන්නුම් කරලා තිබෙනවා, මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කිරීමේ ජාතික වැඩ පිළිවෙළ දියත් කරලා. දෙවැනි තලය විධියට දිස්ත්‍රික් සභාව අපි මේ වනකොට සකස් කරමින් යනවා. තුන්වැනි තලය විධියට ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු අපි හදනවා. අපි ග්‍රාම නිලධාරි මට්ටමට අරන් ගිහිල්ලා මහජන ආරක්ෂක කමිටු 14,000ක් හතරවැනි තලය විධියට මේ වනකොට නිර්මාණය කරලා තිබෙනවා. මේ තල 4 ඔස්සේ මුළු රටම ඒකාබද්ධ ජාලයක් කරමින් මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් අපි කටයුතු කරනවා. අපි මත්ද්‍රව්‍ය රකුසාට එරෙහිව සටන් කරනවා. මේ රටේ අනාගත පරපුර මත්ද්‍රව්‍යවලින් මුදා ගැනීමේ කාර්යය කරනවා කියලා අපි මේ වෙලාවේ මේ සභාවට සහතික වනවා. අපි ඒ සඳහා අවශ්‍ය සියලු පියවර අරන් තිබෙනවා. පොලීසියත්, ත්‍රිවිධ හමුදාවත් දැන් සක්‍රියව එම මෙහෙයුම් ජාලය ක්‍රියාත්මක කරමින් සිටිනවා. මත්ද්‍රව්‍ය ඉල්ලුම අවම කිරීම සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයත්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයත් මේ වනකොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වාගේම මේකට මේ රටේ සමස්ත ජනතාව අපි ඒකාබද්ධ කරගත්තා. විශේෂයෙන් අපේ නායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ ගරුතර මහා සංඝ රත්නය, අනෙකුත් ආගමික නායකතුමන්ලා ඒකාබද්ධ කරමින් ආගමික කමිටුවකුත්, බහුජන සංවිධාන කමිටුවකුත්, මෙහෙයුම් කමිටුවකුත්, මාධ්‍යවේදීන් එකතු කරගත් මාධ්‍ය මෙහෙයුම් කමිටුවකුත්, පුනරුත්ථාපනය සඳහා විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු සියලු ක්ෂේත්‍ර එකතු කරගත් කමිටුවකුත් මේ වනකොට ආරම්භ කරලා මේ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා.

මේ අවස්ථාවේදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පිළිබඳවත් විශේෂයෙන් වචනයක් ප්‍රකාශ කරන්න අවශ්‍යයි. ගරු

සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා, අපි බලයට පත් වනකොට මිනිස්සු passport එකක් ගන්න බැරිව දවස් ගණන් පෝලිම්වල සිටි බව. මාස 7, 8, අවුරුද්ද, අවුරුදු දෙක වැනි කාලයක් තිස්සේ ලක්ෂ ගණන් අයදුම්පත්‍ර කාර්යාලවල හිරවෙලා තිබුණා. අපි මේ වනකොට ඒ පෝලිම් නැති කරලා passport නිකුත් කරලා තිබෙනවා, අවශ්‍ය ප්‍රමාණයට. දෛනිකව passport 4,000ක් නිකුත් කරන මට්ටමට අපි දැන් එම කටයුතු ගෙනැල්ලා තිබෙනවා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ යාපනය ප්‍රාදේශීය කාර්යාලයත් අපි මේ වනකොට ස්ථාපිත කරලා තිබෙනවා. යාපනය ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කළාට පස්සේ passport 5,000කට ආසන්න ප්‍රමාණයක් මේ පසුගිය මාස කිහිපය තුළ යාපනයේ පමණක් නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව passport ප්‍රශ්නය අපි විසඳා අවසන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි e-Passport එක ලබා දෙන්නත් ටෙන්ඩරය open කරලා තිබෙනවා. අපි e-Passport එක තුළින් වඩා හොඳ ප්‍රමිතිගත ගමන් බලපත්‍රයක් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. මේ වනකොට ගුවන් තොටුපළේ e-Gates 4ක් සවි කරලා තිබෙනවා. ඉදිරියේදී ඒවා තාක්ෂණය සහිතව භාවිත කරන්න කටයුතු කරනවා. අපේ විදේශ ඇමතිතුමා ඊයේත් මේ ගැන කිව්වා. ඒ සඳහා වූ ආගමන විගමන පනත අපි මේ වනකොට සකස් කරලා අවසානයි. මේ අය වැය විවාදයෙන් පස්සේ ඒක පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරනවා. ඒ හරහා අපි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සක්‍රියව ක්‍රියාවේ යොදවා තිබෙනවා. ඒ නිලධාරිනුත් සක්‍රියව මේ කාර්යයේ යෙදෙනවා. ඒ වාගේම ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව ලැබිලා තිබෙන අයදුම්පත්‍ර ප්‍රමාණය සලකා බලා ඒ කටයුතු කඩිනමින් අවසන් කරන්නත් අපි මෙහෙයුම් වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මේ වෙනකොට ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ වාගේම මේ රටේ ජනතාවට වඩාත් පහසුවෙන් ගමන් බලපත්‍රයක් ලබා දීමේ කාර්යය වෙනුවෙන් ඔවුන් ඇප කැප වෙලා ඉන්නවා. මේ විධියට ගත්තාම ගරු සභාපතිතුමනි, මේ ආයතන සියල්ල හරහා සක්‍රියව මේ කාර්යය ඉෂ්ට කරන්න අප කටයුතු කරනවා.

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු ආයතන මේ රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙහෙයවා තිබෙනවා. ඒ සඳහා තමයි අපගේ අමාත්‍යාංශයට මේ අය වැයෙන් වෙන් කරන ලද සියලු මුදල් භාවිත කර තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, 2026 වර්ෂයට අදාළව සිදු කරන්න විශාල වැඩ ප්‍රමාණයක් අපි සැලසුම් කර තිබෙනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට විතරක් රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා, පුනරුත්ථාපන මධ්‍යස්ථාන වැඩිදියුණු කරන්න. ඒ නිසා මම මේ අවස්ථාවේදී මේ රටේ සමස්ත ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, තමන්ගේ දරුවා මතට ඇබ්බැහි වෙලා නම් ඔවුන් ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය කිරීම සඳහා මේ මධ්‍යස්ථානවලට ලබා දෙන්න කියලා. ඔවුන් සිරගත කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න කිසිදු හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒකට ප්‍රතිකාරයක් අවශ්‍යයි. ඒ වෙනුවෙන් වැඩකටයුතු කිරීම සඳහා අනාගත වැඩ පිළිවෙළක් අපි හදනවා. 2026 අවුරුද්දේ අපි මුදල් වෙන් කර තිබෙනවා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙනුවෙනුත්, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙනුවෙනුත්. ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශයට 2025 වර්ෂයේ ලැබුණු මුදල්වලින් සියයට 80ක්, 90ක් වැය කරලා එහි ප්‍රතිලාභ ජනතාවට දුන්නා වාගේම 2026 වර්ෂයේදීත් මේ රටේ ජනතාවගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයත්, ඒ යටතේ තිබෙන සියලු ආයතනත් මෙහෙයවනවා කියලා මම ප්‍රතිඥා දෙනවා.

ගරු සභාපතිතුමනි, මට තවත් පොඩි වේලාවක් ලබා දෙන්න, මාදුගොඩ මන්ත්‍රීතුමා යොමු කළ ප්‍රශ්නයක් පිළිබඳව පැහැදිලි කරන්න. පසුගිය කාලයේ උප පොලිස් පරීක්ෂකවරු 100ක් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා වෛද්‍ය පරීක්ෂණත් අවසන් කර තිබුණා. මේ සම්බන්ධයෙන් පැමිණිලි විශාල ප්‍රමාණයක් ආවා. අපි ඒ පිළිබඳව විමර්ශනය කරන්න කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවෙන් දැන් විමර්ශන කටයුතු කරගෙන යනවා. දැනට නිරීක්ෂණය වෙනවා, සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල පිටපත් නොමැතිව ලබා දුන් ලකුණු ප්‍රමාණයක් ගැන. සියල්ලගේම නොවෙයි. මේ පිළිබඳව විමර්ශන අවසන් වෙලා, එහෙම නැත්නම් ඒ කමිටු වාර්තාව ලැබුණාම,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මට විමර්ශන වාර්තාව ලැබී නැහැ. පොලිස්පතිතුමා හරහා මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වෙලා තිබෙනවා කියලා පොලිස්පතිතුමා දැනුම් දුන්නා. සහතිකවල පිටපත් නොමැතිව ලකුණු ලබා දීම පිළිබඳව අද උදෑසන මම විමසීමක් කළා. ඒ නිසා අපට අවශ්‍ය නම් මේ පිළිබඳව නැවත සම්මුඛ පරීක්ෂණයක් කරන්න,- කමිටු වාර්තාවේ නිර්දේශ අනුව තමයි ඒ සඳහා කටයුතු කරන්න පුළුවන් වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

මට මේ වෙලාවේදී අවසාන තීන්දුව ප්‍රකාශ කරන්න බැහැ. ඔබතුමා අහපු නිසා මම මේ කාරණය කියන්නේ. මෙවැනි නිරීක්ෂණයක් දැනට අපට ලැබිලා තිබෙනවා. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් සාධාරණය ඉෂ්ට කරන්න අපි කටයුතු කරනවා. ඒ වෙලාවේදී තෝරා ගත්තත්, අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා නම් අපි ඒ සම්බන්ධයෙන් පියවර ගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 14 minutes.

[පූ.භා. 10.21]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, අපේ ආනන්ද විජේපාල අමාත්‍යතුමා කථා කළා, ජාතික ආරක්ෂාව පිළිබඳව. මම ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, ත්‍රිකුණාමලය ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරයේ සිදු වුණු සිද්ධිය ජාතික ආරක්ෂාවට හිතකර දෙයක්ද, අහිතකර දෙයක්ද කියලා. 1951 වර්ෂයේ තමයි ඒ විහාරස්ථානය ආරම්භ වෙලා තිබෙන්නේ. 2010දී තමයි බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙන්නේ. 2014දී එම විහාරයට පූජා භූමි ඔප්පුව ලැබෙනවා. ඉන්පසුව යම්කිසි අර්බුදයක් නිර්මාණය වෙනවා. ඒ අර්බුදයේදී පොලීසිය බුදු පිළිම ප්‍රවාහනකරුවන් බවට පත් වෙනවා. මොකක්ද ඔබතුමන්ලාට තිබෙන අයිතිය, බුදු පිළිමය ඉවත් කරන්න? වරද තේරුම් අරගෙන ඒ බුදු පිළිමය ආපහු ගෙනැල්ලා තැන්පත් කරලා තිබෙනවා.

විශේෂයෙන් මම මේ කාරණාව මතක් කරන්නේ මේ නිසා. අපි හැමෝම දන්නවා, බුද්ධ ශාසනයට ලැබෙන ප්‍රමුඛස්ථානය වාගේම අනෙකුත් ආගම්වලට ලබා දෙන නිසි ගෞරවය, ඇගැයීම සහ පිළිගැනීම පිළිබඳව. මේ තත්ත්වයන් තුළ වහාම ක්‍රියාත්මක වන පරිදි ජාතික ඒකාග්‍රතා කමිටුවක් - National Integration Committee එකක් - ස්ථාපනය වෙන්නට ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඒක රටේ ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරන්නට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඕනෑ. මේ වාගේ ප්‍රශ්න උද්ගත වුණාම පොලීසිවලට භාර දීලා හරියන්නේ නැහැ. රටේ නායකවරයා වගකීම භාර ගන්නට ඕනෑ, මේ ප්‍රශ්න විසඳන්නට. අපි පිළිගන්නවා, මේවා ලෙහෙසි ප්‍රශ්න නොවෙයි කියලා. මොකද, ඔබතුමන්ලා විශ්වාස කරන්න, සෙසු ආගම්වලට මෙවැනි ගැටලු එනකොට අපි ඒවා පිළිබඳවත් කථා කළ බව. නියම බෞද්ධයින් හැටියට අපි ඒ වෙනුවෙන් කටයුතු කළා. අද බෞද්ධකම විකෘතිභාවයට පත් කරන විවිධ කණ්ඩායම් ඉන්නවා. ඔවුන් බෞද්ධාගම විකෘති කරනවා. ඉතින්, මේ තත්ත්වය තුළ මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, ජාතික ඒකාග්‍රතා කමිටුවක් ස්ථාපනය කරන්න කියන පණිවුඩය කරුණාකරලා ජනාධිපතිතුමාට ලබා දෙන්න කියලා. ගරු කථානායකතුමාත් හිටපු දිස්ත්‍රික්කය නේ, ත්‍රිකුණාමලය.

විවිධ ජන කොට්ඨාසවල විවිධ හැඟීම් තිබෙනවා, විවිධ අභිලාෂ තිබෙනවා. අපි ගිනි නිර්මාණය කරන්නට හොඳ නැහැ, ගින්න නිවන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආරක්ෂක අංශ මේ වාගේ වැඩ කටයුතුවලට ඇඟිලි ගහන්නට පෙර, රටේ ජනාධිපතිතුමා මේ ප්‍රශ්නවලින් පැන යන්නේ නැතුව, මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්නට කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මම යෝජනා කරනවා, අමරපුර මහා නිකායේ මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය ජනාධිපති ලේකම් කාර්යාලයට වඩම්මලා, මේ ප්‍රශ්නයට පාර්ශ්වකරුවන් වී තිබෙන සියලු කණ්ඩායම් ගෙන්වා ගෙන මේ ප්‍රශ්නය විසඳන්න කියලා. ප්‍රශ්නයෙන් පැන යෑම නොවෙයි, නායකත්වය කියන්නේ. මේ ප්‍රශ්නය විසඳන්නට ඕනෑ. ඒ වාගේම, රටේ ප්‍රදේශ ගණනාවක මේ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒවාටත් විධිමත් විසඳුම් ලබා දෙන්නට ඕනෑ. රටේ සාමය, සංහිඳියාව, එකමුතුභාවය, සැබෑ ජනතා ස්වෛරීත්වය හා රටේ නිදහස ශක්තිමත් කරන, සාධනීය ක්‍රියාදාමයන්ට අපේ සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. හැබැයි, පොලීසියට අයිතියක් නැහැ, පන්සල් ඇතුළට ගිහිල්ලා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේලාට ගුටි බැට සංග්‍රහ ලබා දෙන්න. ඒගොල්ලන්ට අයිතියක් නැහැ, පූජා භූමි ඔප්පුවක් තිබෙන තැනක දහම් පාසල් හැදෙන්න ඕනෑද, නැද්ද කියන එක ගැන තීන්දු තීරණ ගන්න. ඒ නිසා මේ ප්‍රශ්නයට වහාම මැදිහත් වෙලා කටයුතු කරන්න.

මම නැවතත් මතක් කරන්න කැමැතියි, මේ ගරු සභාවේදීම හින්දු ආගමික සිද්ධස්ථාන, ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන, ක්‍රිස්තියානි, කතෝලික ආගමික සිද්ධස්ථාන පිළිබඳව මේ වාගේ යම් යම් ප්‍රශ්න උද්ගත වනවිට අපි හිටියේ බොහොම පැහැදිලි ස්ථාවරයක කියන එක. ඒ ස්ථාවරයේ සිටිමින් ගින්නක් නිර්මාණය කරනවා වෙනුවට කලබලකාරී තත්ත්ව සමනය කරගෙන, සම්බුද්ධ ශාසනයට ලබා දිය යුතු උත්තරීතර නීතියේ ප්‍රමුඛස්ථානය ලබා දෙමින්, සෙසු ආගම් සුරක්ෂිත කරන්නට, ඒවාට නිසි තැන, නිසි අගය ලබා දෙන්නට කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට ඕනෑ, අපේ රටේ වීරෝදාර ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ රණ විරුවන් අපේ රටේ භෞමික අඛණ්ඩතාව, ස්වෛරීත්වය, දේශපාලන නිදහස, ඒකීයභාවය සුරක්ෂා කරන්න දැවැන්ත සේවාවක් ඉෂ්ට කළ බව. නමුත්, අද වන විට ආබාධිත රණ විරුවන්ට ප්‍රධානතම වශයෙන් බරපතළ ගැටලු තුනක් තිබෙනවා. අද මේ විවාදයට සවන් දෙන්න ඒ ආබාධිත රණ විරු පවුල් යම් ප්‍රමාණයක් ඇවිල්ලා ඉන්නවා. ඒ අය වෙනුවෙන් මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම 2025 අය වැය යෝජනාවට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2025 මඟින් සියලුම රාජ්‍ය නිලධාරින් හා සන්නද්ධ සේවා නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කරන්නට කටයුතු කළා. ඒක අය වැය යෝජනාවක්. හැබැයි, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 02/2025 මඟින්, ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන්හි, පොලීසිය සහ විශේෂ කාර්ය බලකායේ සේවයේ යෙදී සිට විශ්‍රාම ලැබීමෙන් පසුව වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ලබන විශ්‍රාමික නිලධාරින්ගේ, මියගිය නිලධාරින්ගේ වැන්දඹුවන් සහ වැන්දඹු පුරුෂයන් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සඳහා වූ හිමිකම් නොලබන බව සඳහන් කරමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් සියලුම දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරු වෙත යළිත් චක්‍රලේඛයක් යොමු කරලා, ඒ හිමිකම ප්‍රතික්ෂේප කර තිබෙනවා. පුදුම කෙනෙක් නේ. අය වැයේදී මේ ගැන යෝජනා වෙනවා. අය වැයේදී මේක සම්මත වෙනවා. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා චක්‍රලේඛයක් යවනවා, "මේක අදාළ නැහැ." කියලා. ඔහු රටේ ජනාධිපතිවරයාටත් වඩා ලොකු ද? අන්න ඒක අපි අහන්න කැමැතියි. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා ජනාධිපතිවරයාගේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්නේ කොහොමද? මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් කරුණු විමසීමේදී, අවුරුදු 55 දක්වා රජයෙන් ලැබෙන සියලු දීමනා මෙම පිරිසට හිමිවන බැවින්, විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය සඳහා මේ අය හිමිකම් නොලැබෙන බව සඳහන් කර තිබෙනවා. ජනාධිපති කියනවා, හිමිකම් ලැබෙනවා ලු. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා, ඒවා ලැබෙන්නේ නැහැ කියලා. එතකොට කවුද මේ රටේ ලොකු? ජනාධිපති ද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ද? මෙතැනත් අපට නායකත්වය අවශ්‍යයි. මේක 2025දී සම්මත වූ අය වැය යෝජනාවක්. මේක වහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. 12/86 චක්‍රලේඛය ප්‍රකාරව, වෛද්‍ය හේතූන් මත සිටින සියලුම ආබාධිත සන්නද්ධ සේවා නිලධාරින්ගේ සේවා වැටුප සහ විශ්‍රාම වැටුප විශේෂ වරප්‍රසාදයක් වශයෙන් ලබා දෙනවා. එසේ තිබියදීත්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය අවලංගු කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒක එහෙම වෙන්නේ කොහොමද? ජනාධිපතිතුමාට වැඩිය ලොකුයි, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා. ඒක වහාම නිවැරදි කරන්න කියලා මම ඒ අදාළ ඇමතිවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා.

දෙවැනි ගැටලුව මේකයි. ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ආබාධිත, මිය ගිය රණ විරුවන්ට අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් අනතුරුව ඔවුන්ගේ දෙමව්පියන්ට සහ බිරිඳට ස්ථාවර දීමනාවක් රජය විසින් ලබා දෙනවා. මේ ස්ථාවර දීමනාව සියයට 25ක් දෙමව්පියන්ටත්, සියයට 75ක් බිරින්දෑවරුන්ටත් ලබා දෙනවා. නමුත් අද වන විට සැලකිය යුතු ප්‍රමාණයකට මෙම ස්ථාවර දීමනාව අත්හිටුවා තිබෙනවා. එහෙම අපට තොරතුරු වාර්තා වෙනවා. 2025 වසරේදී වයස අවුරුදු 55 සම්පූර්ණ වූ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ ආබාධිත, මිය ගිය රණ විරුවන්ගේ දෙමව්පියන් හා බිරින්දෑවරුන් සඳහා මෙම ස්ථාවර දීමනාව රජය මඟින් ලබා නොදීමට දැන් කටයුතු කරනවා. එහෙම කරන්න එපා. අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂා වෙලා තිබෙන්නේ, මේ රට ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයෙන් මුදා ගත්තේ ඒ වීරෝදාර රණ විරුවන්. ඒ රණ විරුවන්ට මේ අසාධාරණය කරන්නට එපා.

ඒ විතරක් නොවෙයි, මීට පෙර ක්‍රියාන්විත ප්‍රදේශයේ රාජකාරිවල නිරත වෙමින් සිටි සුනාමි, ගුවන් අනතුරු -කාර්මික දෝෂ- හේතුවෙන් ආතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ රණ විරුවන් සඳහා සියලු හිමිකම් ලබා දුන්නද, මේ වන විට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ආතුරුදහන් වූවන් යළි පැමිණිය හැකි යැයි උපකල්පනය කිරීම මත ආතුරුදහන් වූවන්ගේ දෙමව්පියන්, බිරින්දෑවරුන් සඳහා මෙතෙක් ලබා දුන්නු ස්ථාවර දීමනාව ලබා නොදීමට කටයුතු කරනවා.

විශ්‍රාම ක්ෂේත්‍රය භාර මේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කියන්නකෝ, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ජනාධිපතිගේ පුටුවේ වාඩි වෙන්න කියලා. පුදුම වැඩක් නේ. මෙහෙම තීන්දු ගන්න පුළුවන්ද, රටේ ප්‍රතිපත්තියට විරුද්ධව?

එසේම ක්‍රියාත්මක ප්‍රදේශයේ රාජකාරි කරනු ලැබුවද, අනතුර සිදු වූයේ ක්‍රියාත්මක නොවන ප්‍රදේශයක නම්, වෙනත් හේතූන් මත යැයි පවසමින් ස්ථාවර දීමනාව ලබා නොදීමට රජය කටයුතු කරනවා. උදාහරණයක් වශයෙන්, ක්‍රියාත්මක නොවන ප්‍රදේශවල සිදු වූ ගුවන් අනතුරු, සුනාමි ඒ වාගේම ජේවීපී කලබල කාලයේ සිදුවූ අතුරුදහන් වීම් යන මේ කරුණු කාරණා නිසා මේ දීමනාව දෙන්න බැහැයි කියලා ප්‍රකාශ කරලා තිබෙනවා. අදට ස්ථාවර දීමනාව ලැබෙන අයවලුන් සඳහා ස්ථාවර දීමනාවේ ලැබිය යුතු හිඟ මුදල් පැවතියත් එම හිඟ මුදල් ලබා දීමට රජය පියවර නොගෙන තිබෙනවා.

තුන්වෙනි ගැටලුව මෙකයි. ගරු සභාපතිතුමනි, වයස අවුරුදු 55 ඉක්මවූ පසු වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් වීම හේතුකොටගෙන විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු නොකළ පිරිසක් ඉන්නවා. ඔවුන් ඒ හේතුවෙන් දුබලතා වැටුපටද හිමිකම් ලබන්නේ නැහැ. වෛද්‍ය මණ්ඩලයට යොමු වීමේදී සිදුවූ ප්‍රමාදයන් නිසා; පරිපාලනමය කටයුතු හේතුවෙන් ඇතැම් අවස්ථාවලදී වෛද්‍ය මණ්ඩල වෙත යොමු වීම ප්‍රමාද වීම හේතුවක් කර ගෙන විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය හෝ දුබලතා වැටුප ලබා නොදීම සාධාරණ නැහැ. රණ විරුවන්ට ඒකට ඇත්තටම වග කියන්න බැහැ.

ඒ නිසා ප්‍රගතිශීලීව බලා මේ ගැටලුවටත් විසඳුම ලබා දෙන්නය කියලා අපි මේ අවස්ථාවේදී රජයෙන් ඉල්ලීමක් කරනවා. බොහෝ අවස්ථාවලදී ආබාධිත රණ විරුවන්ගේ ගැටලු, ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා සිදු වෙනවා. නමුත් ඒ බොහෝ සාකච්ඡා සිදු වෙන්නේ විපක්ෂයේ ඉන්නකොට. විපක්ෂයේ ඉන්නකොට හැමෝම යනවා, උද්ඝෝෂණ තිබෙන තැන්වලට.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition, you have two more minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව පොඩි වෙලාවක් ගන්නවා, ගරු සභාපතිතුමනි.

කොටුවටත් ගියා, පසුගිය කාලයේ. එහෙම ගිහින් ඒ අයගේ යෝජනාවලට එකඟ වෙනවා. හැබැයි, බලයට ආපු හැටියේ ඒ සියල්ලක්ම අමතක කරනවා. ඒ නිසා මේ රට, දැය බේරා ගැනීමට ඇස්, ඉස්, මස්, ලේ, අවයව පරිත්‍යාග කරලා, තමන්ගේ පවුල්, තමන්ගේ දූ දරුවන් අමතක කරලා, ඒ අය දෙවැනි තැනට දමලා විශිෂ්ට සේවාවක් කරපු රණ විරුවන්ට; ආබාධිත වෙලා ඉන්න රණ විරුවන්ට ඒ යුතුකම ඉෂ්ට කරන්නය කියලා මා ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, මම සඳහන් කළ කාරණාවලට අදාළ සියලු ලියකියවිලි මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා. මම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ අය වෙනුවෙන් සාධාරණත්වය ඉෂ්ට කරන්නය කියලා.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පොලීසිය භාර ඇමතිතුමා ප්‍රකාශ කළා, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය විනාශ කරන්නට යම් යම් පියවර අරගෙන තිබෙනවාය කියලා. ඒ සාධනීය පියවර සම්බන්ධව අපි හොඳින් දකිනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක කිරීමේදී අර නලින් බණ්ඩාර මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට අපක්ෂපාතීව ඒ දේවල් ක්‍රියාත්මක කරන්න. හැම කාරණාවක් පිළිබඳවම විනිවිදභාවයෙන් කටයුතු කරන්න.

ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, තවත් කාරණයකට. මත් ජාවාරම වාගේම තවත් මහ පිළිකාවක් තිබෙනවා. මොකක්ද, මේ පිළිකාව? ඒ තමයි, Online loan මාෆියාව. ඒක මහ බරපතළ ඛේදවාචකයක්. පසුගිය දවසක අත්තනගල්ල කොට්ඨාසයේ, ගලගෙදර ගම්මානයේ පදිංචිව සිටි ඉමායා සෙව්වන්දි සියදිවි නසා ගත්තා, මේ මාෆියාව නිසා. විවිධ රටවලින් මුදල් අරගෙන මේ රටට ඇවිල්ලා දේශීය හවුල්කරුවන් ඇති කරගෙන අනීතික ක්‍රියාවලියක් අද ක්‍රියාත්මක කරනවා. මේකට තමයි online loan මාෆියාව කියන්නේ. මේ ප්‍රශ්නය පිළිබඳව අපි කථා කළා. නමුත් පැහැදිලි විසඳුමක් නැහැ. කථා කරනකොට, ඒ ආයතන raid කරනවා. හැබැයි, කාලයක් ගත වෙනකොට ඒවා නතර වෙනවා.

බලන්න ඇමතිතුමනි, අර දැරිය සියදිවි නසා ගෙන තිබෙන්නේ මෙගාෆින් ලංකා කියන ආයතනය මෙගාකෑෂ් කියන sub-company එක හරහා ලබා දුන් ණය මුදල් ගෙවා ගන්න බැරුව. දන්නවාද, පොලිය කීයද කියලා? සියයට 500යි! සියයට 500යි ණය පොලිය. මේ මහා ඛේදවාචකයට අපේ රටේ ජනතාව මැදි වෙලා තිබෙනවා. මීට ප්‍රධානතම හේතුව රටේ තිබෙන දුප්පත්කම, නැතිබැරිකම, අතේ ප්‍රමාණවත් පරිදි මුදල් නොතිබීම. ඒ නිසා මම කියන්න කැමැතියි, බොහොම ප්‍රසිද්ධියේම - ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා, විනාඩියකට පොඩ්ඩක් සවන් දෙන්න. MegaFin Lanka, OnCredit, Asage Development Ltd, Armour Solutions, Supermoney, Resplendent Pearls (Pvt.) Ltd, Digital Money, SF Group, AIS IT Consulting Services, Isso Fin, Zong Technologies, ATM Online Technologies, Avatar Fintec Lanka, Embracing Ltd., Ceylontech Lanka, FastRupee Ltd, Fintech Software and AV Business Solutions වැනි ආයතන ගැන බලන්න. ගරු ඇමතිතුමාට මම යෝජනා කරනවා, මේ අනීතික ආයතන raid කරලා මේවා වසා දමන්න කියලා. අපි මීට පෙර මේ ප්‍රශ්නය මතු කළ අවස්ථාවලදී ඒ දේ සිද්ධ කළා. මම යෝජනා කරනවා, මේ අනීතික ආයතන වසා දමන්න කියලා.

ඒ වාගේම මේ අනීතික ආයතන Central Bank එකේ letterhead එක ව්‍යාජ ලෙස හදලා ලියුම් දමලා මේ ණයකරුවන්ව බය කරනවා. දන්නවාද, මොනවාද කරන්නේ කියලා? ලබා ගත් ණය මුදල මොනවා හෝ හේතුවක් නිසා නොගෙව්වොත්, දවසක් හරි ප්‍රමාද වුණොත් ඒගොල්ලන්ගේ photos ඔක්කෝම යවනවා, ඒගොල්ලන් වැඩ කරන ආයතනවලට. *[බාධා කිරීමක්]* මොකක්ද? *[බාධා කිරීමක්]*

අනේ, බිමල් රත්නායක ඇමතිතුමා, මේ වාගේ වැදගත් ප්‍රශ්නයකට ඔය විධියට සමච්චල් කරන්න එපා. ඒ සමච්චල් කිරීම තුළින් ඔබතුමා මොන වාගේ වින්දනයක් ලබනවාද කියලා මම දන්නේ නැහැ. මේක ලක්ෂ ගණනක් මිනිස්සු මුහුණ දෙන ප්‍රශ්නයක්. මේක බිමල් රත්නායක ඇමතිතුමාට විහිළුවක් වුණාට ඒ ලක්ෂ ගණනට විහිළුවක් නොවෙයි. මේක පොඩ්ඩක් අහගන්න. මෙන්න Central Bank එකේ letterhead එක. මේක බොරුවක් නොවෙයි. මම මේ ලේඛනයත් **සභාගත*** කරනවා.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ, ඔබතුමන්ලාට දෝෂාරෝපණය කරනවා නොවෙයි. කුඩුකාරයන් විනාශ කරනවා වාගේම මේ ඔන්ලයින් මාෆියාවත් විනාශ කරන්න. ඒකයි කියන්නේ. ඒ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි මේ සියලුදෙනාට විරුද්ධව කටයුතු කරන්න; මේ අනීතික ආයතන නිර්මාණය වනවාට විරුද්ධව නීති රීති පනවන්න. ඒ සඳහා අපේ පූර්ණ සහයෝගය ලබා දෙන්නම්. ඒ වාගේම ඔබතුමන්ලා විශේෂ බලකායක් ස්ථාපනය කරලා, මේ වැරදි ක්‍රියාව කරගෙන යන එක නතර කරන්න. ඒගොල්ලන් කරන එකම දේ තමයි තර්ජනය කිරීම. Telephone numbers සිය ගණනක් තමන් ළඟ තියාගෙන ඉන්නවා; පවුලේ අයටත් කියනවා. ණය වාරිකයක් නොගෙවන කොට "මේ ගොල්ලන් හොරු" කියලා සමාජයේ ප්‍රසිද්ධ කරනවා. ඒක හරිද? ඒක සාධාරණද? මම ඉල්ලා සිටිනවා, කුඩුකාරයන් විනාශ කරනවා වාගේම මේ අනීතික ඔන්ලයින් මාෆියාවත් විනාශ කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න කියලා. අපේ සහයෝගයත් අපි එයට ලබා දෙන්නම්.

ගරු සභාපතිතුමනි, තව එක කාරණයක් මතක් කරලා මගේ කථාව අවසන් කරන්නම්. දෙසැම්බර් 11, 12, 13 "ශ්‍රී ලංකා දිනය" හැටියට ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. "ශ්‍රී ලංකා දිනය" හැටියට අදහස් කරන්නේ රට තුළ එකමුතුභාවය, සහෝදරත්වය, සංහිඳියාව ගොඩ නඟන එකයි; විවිධ ජන කොට්ඨාසවලට තිබෙන ගැටලු සියල්ල සඳහා විසඳුම් ලබා දෙන එකයි. අපි දන්නවා, මේවාට එක පාරටම විසඳුම් ලබා දෙන්න බැහැ කියලා. අඩුම ගණනේ ඒ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ සඳහා රුපියල් ලක්ෂ 3,000ක් වෙන් කර තිබෙනවා. හැබැයි, ඒ රුපියල් ලක්ෂ 3,000න් මොකක්ද කරන්න හදන්නේ? අද වන විට ඒ රුපියල් ලක්ෂ 3,000 වියදම් කරන්න දින 7 ටෙන්ඩර් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්නේ. ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන්නට ඕනෑ, quality and cost-based selection එකක්. ඒවාට pre-bid meetings තියන්නට ඕනෑ. නමුත් එසේ රුපියල් ලක්ෂ 3,000ක් කැප කරන්නේ මොකටද? Sri Lankan Day එක ක්‍රියාත්මක කරන්න. අපි යෝජනා කරනවා, Sri Lankan Day එක ක්‍රියාත්මක කරන්න වෙන් කරන රුපියල් ලක්ෂ 3,000න් අතුරුදහන් වූවන්ට අදාළව ලබා දෙන්න තිබෙන වන්දි ටික ලබා දෙන්න කියලා; සංහිඳියා ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක කරන්න තිබෙන ක්‍රියාකාරකම්වලට මූල්‍ය ශක්තිය ලබා දෙන්න කියලා.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. සහජීවනය ගැන ලොකුවට කථා කරපු මේ රජයෙන් මම ඉල්ලීමක් කරනවා, රුපියල් ලක්ෂ 3,000ක් නාස්ති කරන්නේ නැතුව මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න, ජාතික ඒකාග්‍රතාව ඇති කරන්න, සංහිඳියාව, සහෝදරත්වය, මිත්‍රශීලීත්වය ප්‍රවර්ධනය කරන්න ඔබ ඒ මුදල යොදවන්න කියලා. එහෙම නැතුව ටෙන්ඩර් ක්‍රමවේද දින 7න් ක්‍රියාත්මක කරලා තමන්ගේ ගජමිතුරන්ට ඒ මුදල් ලබා දීමේ ක්‍රමවේදයෙන් වැළකී සිටින්න.

විශේෂයෙන් "බහුජන බලය" කියන සංවිධානය අපව හමුවෙලා මේ කරුණු කාරණා ඉදිරිපත් කළා. මම ඔබතුමන්ලාට යෝජනා කරනවා, "බහුජන බලය" සංවිධානයත් සමඟ සාකච්ඡා කරලා මේ සිදු වෙන්නට යන අපරාධය පිළිබඳව නිසි පියවර ගන්න කටයුතු කරන්න කියලා.

මට කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු සභාපතිතුමනි, ත්‍රිකුණාමලය නගරයේ සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේදී ඊයේත් අදහස් දැක්වූවා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ පිළිබඳව මේ වන කොට BR 1784/1 PC 25 යටතේ සවිස්තර "බී" වාර්තාවක් මඟින් අධිකරණයට කරුණු වාර්තා කරලා තිබෙනවා. ගරු මහෙස්ත්‍රාත්තුමා විසින් ඊට අදාළ ලියවිලිවල සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කිරීම සඳහා රැස්ව සිටි ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ දායක සභාවේ ප්‍රකාශ සටහන් කරන ලෙස නියෝගයක් නිකුත් කර තිබෙනවා. එම නඩුව 2025.11.26වන දින නැවත කැඳවීමටත්, එතෙක් මෙම ඉදි කරන ලද තාවකාලික ගොඩනැඟිල්ල වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ නැවත වැඩිදියුණු කිරීමක් නොකරන ලෙසටත් නියෝගයක් නිකුත් කර තිබෙනවා.

ඊයේ දිනයේදී සියලු පාර්ශ්වකරුවන්, විශේෂයෙන් අපේ ගරුතර නායක ස්වාමීන් වහන්සේලා, මහජන නියෝජිතයන්, නියෝජ්‍ය පොලිස්පතිතුමා, ඒ වාගේම දායක සභාවේ නිලධාරින් එක්ව සාකච්ඡා කරලා, ඒ පිළිබඳව එකඟතාවන් ඇති කරගෙන තිබෙනවා. ඒ වාගේම වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පැමිණිල්ල සම්බන්ධයෙනුත්, මායිම් සලකුණු කිරීම සම්බන්ධයෙනුත් මැනුම් නියෝග අරගෙන කටයුතු කරන්න දිස්ත්‍රික් ලේකම්තුමා මැදිහත් වෙලා තිබෙනවා. මේ සිද්ධිය දඩමීමා කරගෙන මේ රටේ දේශපාලන වාසි ලබා ගන්න සමහරු කටයුතු කරමින් ඉන්නවා. තවත් කොටසක් මේ සිද්ධිය දඩමීමා කරගෙන ජාතිවාදය අවුස්සන්න, ආගම්වාදය අවුස්සන්න කටයුතු කරමින් ඉන්නවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ කිසිදු පුරවැසියෙකුට අසාධාරණයක් වෙන්න කිසිසේත් ඉඩ කඩ තබන්නේ නැහැ. ජාතිවාදය අවුස්සන්න හෝ එයින් පටු ප්‍රයෝජන ගන්න කිසිදු ඉඩ කඩක් කිසිසේත්ම නැහැ. ඒ වෙනුවෙන් අවශ්‍ය සියලු පියවර ගෙන තිබෙනවා. ඒවාට එරෙහිව කටයුතු කරනවා. ඒක එදාත් කිව්වා; අදත් කියනවා; අනාගතයේදීත් එහෙමයි. ගරු විපක්ෂ නායකතුමනි, අපි ඒ කාරණය සඳහා මැදිහත්වීමක් කර තිබෙනවා. දැනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාමකාමී තත්ත්වයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් නැහැ.

දෙවැනි කාරණය මෙකයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා සඳහන් කළා, විවිධ සමාගම් හරහා online සිදු වන credit ගනුදෙනු පිළිබඳව. මේ සම්බන්ධයෙන් කියනවා නම්, අප මේ වනකොට Online Safety Bill එකට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් නැවත කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කටයුතු දැන් අවසන් අදියරේ තිබෙන්නේ. ඒ වාගේම මම ඉස්සර වෙලා මගේ කථාවේදී සඳහන් කළා, cyber අපරාධ විශාල වශයෙන් වාර්තා වන බව; දවසකට 25ක් විතර වාර්තා වෙනවා. ඒ සඳහා police division එකක් ඇති කරන්න අපි දැන් සැලසුම් කර තිබෙනවා. ඔබතුමා කියපු කාරණය හරි. ඒ වාගේ පැමිණිලි නිරන්තරයෙන් ලැබෙනවා. ලැබෙන පැමිණිලි ප්‍රමාණය අතිවිශාල නිසාම ඒවාට යෙදෙන්න තිබෙන කාලය සීමා වෙලා තිබෙනවා. එහෙත් කිසිදු පැමිණිල්ලක් අතපසු කරලා, පස්සට දමලා නැහැ. ඒවා සම්බන්ධයෙන් අපි අවශ්‍ය කටයුතු කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඊට අමතරව, ඔබතුමා විශ්‍රාමික රණ විරුවන්ගේ වැටුප් සම්බන්ධවත් කාරණයක් මතු කළා. මේ වනකොට කිසිදු විශ්‍රාම වැටුපක් නතර කරලා නැහැ. එහෙත් මේ

දවස්වල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ data base එකේ issue එකක් තිබෙන නිසා එය නතර වීමක් සිදු වෙලා තිබෙනවා. නමුත් file process වීම ආරම්භ වූ වහාම එකී විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කටයුතු කරනවා. මෙතෙක් ලබා දෙන කිසිදු දීමනාවක් හෝ විශ්‍රාම වැටුප හෝ නතර කිරීමක් සිදු වෙලා නැහැ. ඒ සියල්ල සිදු වෙනවා.

ඊට අමතරව, ආබාධිත රණවිරුවන්ගේ ඉල්ලීම් ප්‍රමාණයක් තිබෙනවා. ඒවා සම්බන්ධයෙනුත් ඉදිරියේදී කටයුතු කරනවා. මං හිතන විධියට, අපේ ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි. වග කිව යුතු රජයක් හැටියට අපි මේ සියලු කාරණා පිළිබඳව හොඳින් අවබෝධ කරගෙන, සාකච්ඡා කරලා, අවශ්‍ය විසඳුම් ලබා දෙන්න පියවර ගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. දැන් අර online ණය ලබා ගත්තු අය ඉන්නවා නේ. අපි හැමෝම මේ පාර්ලිමේන්තුවේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරමු, අපි රටටම කියමු, ඒ ලබා ගත්තු ණය, ඒ අනීතික ආයතනවලින් ලබා ගත්තු ණය ගෙවන්න එපා කියලා. මොකද, ගෙවන්න ආයතන නැහැ; ඒවා නීත්‍යනුකූල නැහැ. ඒ නිසා අපි මුළු රටටම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා, ඒ අනීතික online ණය මාෆියා සංවිධානවලින් සියයට 500 ගිනි පොලියට ගත්තු සල්ලි අද ඉඳලා ගෙවන්න එපා කියලා. අපි 225දෙනාම එකඟ වෙමු, ඒ යෝජනාව කරන්න.

ගරු ඇමතිතුමනි, ඊළඟට ඔබතුමා ඉදිරිපත් කළ අනෙක් කාරණය ගැනත් කියන්න ඕනෑ. මම බොරුවට ප්‍රශ්න නිර්මාණය කරනවා නොවෙයි. මම ඒ අදාළ සියලු ලේඛන සභාගත කළා. සුදුසු ආකාරයට ඒ ආබාධිත රණවිරුවන්ගේ සුබසාධන ප්‍රශ්නයත් විසඳන්න.

ගරු සභාපතිතුමනි, ත්‍රිකුණාමලයේ සිද්ධිය නිකම් සිද්ධියක් නොවෙයි. ඒක විහාරස්ථානයක සිද්ධියක්. ඒ සම්බන්ධයෙන් ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ඒ වාගේ සිදුවීම් නොවන්නට ජාතික ඒකාග්‍රතා කමිටුවක් ස්ථාපනය කරන්න කියලායි මා යෝජනා කරන්නේ.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 20 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.46]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු සභාපතිතුමනි, අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් පළ කිරීමට මාහට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ආරක්ෂක අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කෙරෙන මේ සාකච්ඡාවේදී විශේෂයෙන් ජාතික ආරක්ෂාව සම්බන්ධව කරුණු, කාරණා ගෙනහැර දැක්වුවා. ජාතික ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව සම්බන්ධව රටේ අද කිසිම ගැටලුවක් නැහැ.

තිබුණේ හුදු සංවිධානාත්මක අපරාධ කල්ලිවල ආරාවුලක්. ඔවුන් අතර තමයි ඒ ඝට්ටනය තිබුණේ. අප පසුගිය වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්පූර්ණයෙන්ම තහවුරු කර තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය කාලයේ ලංකාව හොඳම සංචාරක ස්ථාන 10න් එකක් හැටියට ලෝකයේ ඒ ආයතනවලින් නම් කළේ.

විශේෂයෙන්ම අපි පසුගිය කාලයේ ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව තහවුරු කරමින් රටේ ජනතාව තුළ විශ්වාසය ගොඩ නඟා තිබෙනවා. වර්ෂයක් තුළ අපි රාජ්‍ය කරපු ආකාරය, ආණ්ඩුව කරපු ආකාරය, ප්‍රජාතාන්ත්‍රික ලෙස ආර්ථික ස්ථාවරත්වය ඇති කරපු ආකාරය ඔබතුමන්ලා දැක්කා. ආර්ථික ස්ථාවරත්වය තහවුරු කර ගැනීම සඳහා ජාතික ආරක්ෂාව අනිවාර්යයෙන් වැදගත් වනවා. ඉන් ප්‍රධානම එකක් වන නීතිය හා සාමය නැවත ස්ථාපිත කර තිබෙනවා. ඔබ සියලුදෙනාම දන්නවා, පැවති රජය, එහෙම නැත්නම් පැවති දේශපාලන පක්ෂ විසින් ගොඩ නඟා ගත්ත ඒ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි, පසුගිය කාලයේ රටේ නීතිය හැටියට ක්‍රියාත්මක වුණේ. අපි ඒක වෙනස් කළා. දේශපාලන සංස්කෘතියත් අපි වෙනස් කළා. මැතිවරණ 3ක් අපි පැවැත්වූවා. පළමුවෙනි මැතිවරණය අවසානයේ බොහෝදෙනා බලාපොරොත්තුව හිටියේ මහා කෝලාහලයක්. ගිහිල්ලා විරුද්ධ පක්ෂවලට ගුටි බැට දීලා, මහා ගින්නක්, මහා ව්‍යසනයක් ඇති කරයි කියලා තමයි බලාපොරොත්තු වුණේ. නමුත්, ඇඟිලි තුඩකින්වත් කිසිදු හානියක් නොවන විධියට අපි ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මහජන ආරක්ෂාව ද, රටේ ආරක්ෂාව ද එක රැයින් තහවුරු කළා, මැතිවරණය අවසානයේදී. පසුගිය රජයන් විසින් එක ජන කොටසක් පාදක කරගෙන තවත් ජන කොටසක් අනතුරේ දාලා හදපු ප්‍රතිපත්තියක් තමයි, ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය විධියට තිබුණේ. මේ රටේ ජාතික ආරක්ෂාවට ආයේ කවදාවත් තර්ජනයක් වෙන්න අපි ඉඩ තියලා නැහැ. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ඒ වාගේම මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඉන්න විශේෂ කාර්ය බලකාය ඇතුළු අපි සියලුදෙනා එකට එකතු

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

වෙලා ඒ කටයුතු සාර්ථකව කරගෙන යනවා. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ජනතාවගේ සමාජයීය අවශ්‍යතා ඇතුළු නොයෙකුත් අවශ්‍යතා අපි සැලකිල්ලට අරගෙන තිබෙන්නේ. ඒවා ජාතික අවශ්‍යතා වශයෙන් පිළිගත යුතු ක්‍රමයක් අවශ්‍ය බව ඉතා හොඳින් අපි අවබෝධ කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ ජාතික ආරක්ෂක කවුන්සලය රැස් වෙලා, ජාතික ආරක්ෂාව සම්බන්ධව අපි කටයුතු කරනවා. පළාතෙන් පළාතට ජන කොටස්වල වෙනස්කම් තිබෙනවා. ඒ ඔක්කොම සැලකිල්ලට ගෙන තමයි අපි ජාතික ආරක්ෂාව තහවුරු කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ආයතන 25ක් තිබෙනවා. ඒ ආයතන 25 තුළ සංවිධාන තිබෙනවා, මධ්‍යස්ථාන තිබෙනවා, සභා තිබෙනවා. එහිදී ජාතික ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරන ත්‍රිවිධ හමුදාව සඳහා රුපියල් බිලියන 407ක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව, අනෙක් ආයතන, සංවිධාන, මධ්‍යස්ථාන, සභා ඔක්කොම එකතු කරලා තමයි රුපියල් බිලියන 455ක වියදමක් යෝජනා කරලා තිබෙන්නේ. ඒකෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට රුපියල් බිලියන 1.8ක්, නාවික හමුදාවට රුපියල් බිලියන 10.8ක් සහ ගුවන් හමුදාවට රුපියල් බිලියන 16.8ක් අපි වෙන් කරගෙන තිබෙනවා. 2025 වසරේ අපේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කරලා තිබුණු රුපියල් මිලියන 60,000ක පමණ ප්‍රමාණයකින් අපි රුපියල් මිලියන 47,000ක ප්‍රමාණයක ප්‍රගතියක්අපි වාර්තා කර තිබෙනවා. සියයට 77කට එහා ප්‍රමාණයක ප්‍රගතියක් අපි තහවුරු කර තිබෙනවා.

ඒ වාගේම අපි අනිවාර්යයෙන්ම ත්‍රිවිධ හමුදාව දේශපාලනයෙන් මුදා ගත්තා.

Hon. Chairman, as we all are aware, political stability and security is mandatory for economic stability. We have had a bad period a few years ago. As you know, our national security was threatened especially with social unrest and the most significant incident which brought devastating effects on national security was the Easter bombings. Change of regimes through non-constitutional methods also happened and besides all, it was massive corruption or mass-scale State-level corruption which was the most threatening factor on the stability of the national economy and on national security as well. So, we, as the Government, believe that we have a major role in the process of nation-building, ensuring security within the nation and achieving its goals and aspirations. When you do not meet or realize people's aspirations, social unrest surfaces. That is what we experienced in the year 2022. So, State security and effective governance are two inter-related factors and are critical for economic stability and progress of the nation.

State security involves the protection of a country's sovereignty, territorial integrity, security of its citizens and institutions as well as protection from external and internal threats. So, we have done it; within a short span of time, over the period of the last 12 months or so, we have proven it. How? The Government is better equipped with people-friendly policies especially to address security challenges and also to respond to threats with confidence and composure by earning public trust. Allocation of resources, including the budget for defence and security, is heavily influenced by governance decisions. Sir, careful allocation of adequate funding and resources for defence and security is most essential for ensuring the protection of the nation.

අපි මේ රටේ සැම ජන කොටසගේම ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජාතික ආරක්ෂක කවුන්සලය සති දෙකකට වරක් රැස්වෙලා, ඒ ජන කොටස්වලින් මතු වන ප්‍රශ්න ඇතුළු ජාතික ප්‍රශ්න සියල්ල සාකච්ඡා කරලා තමයි අපි උපායමාර්ගික වශයෙන් ගන්න තිබෙන තීන්දු තීරණ ගන්නේ.

ගරු සභාපතිතුමනි, අපි සියලුදෙනාම දන්නවා, that we adopted a land-continental strategy many decades ago since we had a crisis up in the North, but, however, now, we are transforming our strategy towards maritime domain awareness. We have identified the importance or the significance of the Indian Ocean region for our economic development and prosperity. සමුද්‍රීය ආරක්ෂාව අපේ ආර්ථිකයට වැදගත් බව රජය විසින් හඳුනාගෙන තිබෙනවා. ශ්‍රී ලංකාව සතු සුවිශේෂී ආර්ථික කලාපයේ - in our Exclusive Economic Zone - සෙවීම්, ගලවා ගැනීම් කලාපය කෙරෙහි විශේෂයෙන්ම අපි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ කියන්නේ, අපේ ආර්ථික ස්ථාවරත්වය වෙනුවෙන් සමුද්‍රීය ආරක්ෂාව, කලාපීය ආරක්ෂාව, ඉන්දියන් සාගර කලාපයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අපි අවධානය යොමු කරලා තිබෙනවා. එහිදී විශේෂයෙන්ම නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිරීක්ෂණ සහ අධීක්ෂණ ධාරිතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අපි අවබෝධ කරගෙන තිබෙනවා.

එම නිසා, ගරු සභාපතිතුමනි, it is maritime domain awareness that is most significant for us. Therefore, we want to integrate our air dimension, the land dimension and the sea dimension to ensure the maritime security domain. ආරක්ෂාකාරී මුහුදු ගමනාගමනයට අවශ්‍ය ආරක්ෂාව සැපයීම, නාවික හමුදාවේ කාර්යයට ඉතා වැදගත් වනවා. ත්‍රිවිධ හමුදාව තාක්ෂණිකව වැඩිදියුණු කිරීමට අපි අවධානය යොමු කර තිබෙනවා. මෙහිදී නාවික හමුදාවේ හැකියාව වැඩිදියුණු කිරීම කෙරෙහි විශේෂයෙන්ම අපි අවධානය යොමු කරලා තිබෙනවා. අපේ උතුරු මුහුදු තීරයේ නීති විරෝධීව - අනීතිකව - මසුන් ඇල්ලීම පිළිබඳවත් අපි අවධානය යොමු කර තිබෙනවා. එහිදී උතුරු මුහුදු තීරයේ පමණක් නොව, නැඟෙනහිර මුහුදු තීරයද අපි සැලකිල්ලට භාජන කරනවා. පසුගිය මාස කිහිපය තුළ නැඟෙනහිර මුහුදු තීරයේ වූ අනීතික -නීති විරෝධී- මසුන් ඇල්ලීම, මසුන් අල්ලන්න කරන හිරිහැර වැළැක්වීම සඳහා අපි වැඩ පිළිවෙළක් යොදලා දැන් ඒවා සැහෙන දුරට අඩු කරලා තිබෙනවා. මෙම ධාරිතාව වැඩිදියුණු කිරීමෙන් නාවික හා ගුවන් හමුදාවේ සමුද්‍රීය නිරීක්ෂණ මෙහෙයුම් කිරීමට හැකියාව ලැබෙනවා. විශේෂයෙන්ම අපේ උතුරු - නැඟෙනහිර මුහුදේ නීති විරෝධී මසුන් ඇල්ලීමේ මුවාවෙන් මත්ද්‍රව්‍ය ජාවාරමත් ඉතා විශාල ලෙස සිද්ධ වනවා. ඒ වෙනුවෙන් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවත්, නාවික හමුදාවත් මෙහෙවර රාශියක් කරනවා. නාවික හමුදාවේ ගැඹුරු මුහුදේ දුරදිග මෙහෙයුම් ඒකක විසින් විශේෂ මෙහෙයුම් රාශියක් කරනවා. ඒ ගැන පසුගිය කාල වකවානුවේ මාධ්‍යයෙන් දැන ගන්න ඇති. අපි ඒවා තහවුරු කළා. ඉතා භාරදූර කාර්යයක ඔවුන් නිතර වෙලා සිටිනවා. නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ ශක්තිය, හැකියාව, තාක්ෂණික හැකියාව තවත් වැඩිදියුණු කිරීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ මම විශේෂයෙන්ම මේ කරුණ ප්‍රකාශ කරන්න ඕනෑ. පසුගිය දින දෙක තුළ අපේ ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මැතිතුමා ත්‍රිවිධ හමුදාවට විශාල චෝදනාවක්

කළා, "රටම එකට" ජාතික මෙහෙයුමට තිබෙන විශාලම බාධාව ත්‍රිවිධ හමුදාව උතුරු, නැඟෙනහිර ස්ථානගත වෙලා තිබීමයි කියලා. ඔවුන් විසින් ලු, මත්ද්‍රව්‍ය ජාවාරම සම්පූර්ණයෙන් මෙහෙයවන්නේ සහ එම කටයුතුවලට උදවු කරන්නේ. ඒ වාගේම දකුණු පළාතේ ඉන්න විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන් මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධයි කියලා එතුමා කිව්වා. මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, මහජන ආරක්ෂක ඇමතිතුමා කිව්වා වාගේම, නාවික හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය කියන සියලු අංශ 2020 ඉඳලා 2025 වන කල් කිලෝග්‍රෑම් දහස් ගණනක් මත්ද්‍රව්‍ය අල්ලලා තිබෙන බව, උතුරු-නැඟෙනහිර මුහුදු තීරයේ සහ ගැඹුරු මුහුදේදී.

ඒ අනුව අනවසර බඩු කිලෝග්‍රෑම් ලක්ෂ ගණනක් අල්ලලා තිබෙනවා, තහනම් බඩු කිලෝග්‍රෑම් ලක්ෂ ගණනක් අල්ලලා තිබෙනවා. අපේ ත්‍රිවිධ හමුදාව ඉතාම ශ්‍රේෂ්ඨ, විශිෂ්ට, විනයගරුක මානුෂීය ත්‍රිවිධ හමුදාවක්; හැම දාම රාජ්‍ය ප්‍රතිපත්ති, රටේ ප්‍රතිපත්ති අනුව වැඩ කටයුතු කරන, වැඩ කටයුතු කරපු ත්‍රිවිධ හමුදාවක්. ඒ අය නීති විරෝධී; අනීතික කිසිම දෙයකට සම්බන්ධ වෙන්නේ නැහැ. එක්කෙනෙක් දෙන්නෙක් සමහරවිට ඒවාට සම්බන්ධ වෙන්න පුළුවන්. නමුත් ඒවා හමුදාව විසින් මෙහෙයවන දේවල් නොවෙයි. විශේෂයෙන් මම මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න ඕනෑ. උතුරු, නැඟෙනහිර සිටින හමුදා ප්‍රමාණය වැඩියි කියලා තිබුණා. එක පුරවැසියෙකුට හමුදා සෙබළුන් දෙදෙනෙක් ඉන්නවා කියලා ගණන් හදලා තිබෙනවා කිව්වා.

මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, උතුරේ කාරයිනිව් කියන ගමේ, එහෙම නැත්නම් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, - ග්‍රාම නිලධාරී වසම් කිහිපයක - පිහිටා ඇති හමුදා කඳවුර ඉවත් කිරීමට එරෙහිව මට පෞද්ගලිකව ලියුමක් එවා තිබෙන බව. ගරු සභාපතිතුමනි, එය ඉවත් කර ගන්න එපා කියලා තිබෙනවා. එය පිහිටා තිබීමෙන් එහි ජීවත් වන දෙමළ ජනතාවට ඉතා ආරක්ෂිත ජීවිතයක් ගත කරන්න පුළුවන් වාතාවරණයක් ගොඩ නැඟිලා තිබෙන බවත්, ඒ හේතුවෙන් හොරකම්, මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය ජාවාරම නැති වෙලා තිබෙන බවටත් 147දෙනෙකු අත්සන් කරලා මට ලියුමක් එවා තිබෙනවා. මම ඒ ලියුම **සභාගත*** කරනවා, බලා ගැනීම සඳහා.

අපේ ත්‍රිවිධ හමුදාව පසුගිය කාල වකවානුවල මහා විශාල කාර්යභාරයක් කළා. දේශය වෙනුවෙන්; දේශය ත්‍රස්තවාදයෙන් මුදා ගැනීම වෙනුවෙන් මහා බිහිසුණු කාර්යයක යෙදිලා, දරුණුතම සටන්වල නියැලිලා එක රැයින් මානුෂීය පියවරවලට පරිවර්තනය වෙච්ච විශිෂ්ට ත්‍රිවිධ හමුදාවක් අපට ඉන්නවා. මානුෂික මානසිකත්වයට පරිවර්තනය වෙලා රටේ පුරවැසියන්ගේ ජන ජීවිතය ආරක්ෂා කර ගැනීමට සහ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සම්බන්ධ වුණු ත්‍රිවිධ හමුදාවක් අපට ඉන්නවා. ඒ වාගේම ගුවන් හමුදාව, නාවික හමුදාව සහ යුද හමුදාව දේශයේ ජනයාගේ ආරක්ෂාව තහවුරු කිරීමට, භෞමික අඛණ්ඩතාව තහවුරු කිරීමට, සුවිශේෂී ආර්ථික කලාපය ආරක්ෂා කිරීමට, හදිසි අවස්ථාවන්ට සහ ව්‍යසනවලට මානුෂීය ආධාර සැපයීමට සහ විශේෂයෙන් ගුවන් හමුදාව ශ්‍රී ලංකාවේ පියාසර කලාපය සහ සාගර කලාපය තුළ සෝදිසි කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම් නිරීක්ෂණය කිරීම සහ නීති විරෝධී මසුන් ඇල්ලීම සම්බන්ධ තොරතුරු අපට ලබා දීමට සෑහෙන වෙහෙසක් දරනවා. නාවික හමුදාව, දුරදිග මෙහෙයුම් සහ විශාල දිවා රාත්‍රී මෙහෙයුම් රාශියක් බුද්ධි අංශ සමඟ සිදු කරනවා. ගුවන් හමුදා, නාවික හමුදා බුද්ධි අංශ රාජ්‍ය බුද්ධි සේවා සමඟ එකතු වෙලා ඒ කටයුතු කරනවා. ඒ අනුව ඉදිරියේදී කළ යුතු ඔවුන්ගේ තාක්ෂණික දියුණුව සඳහා අපේ විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා. මේ අය වැයෙන් වෙන් වුණු මුදල්වලින් ඒ කටයුතු කිරීමට සැලසුම් කරලා තිබෙනවා.

"ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ත්‍රිවිධ හමුදාවේ යන්ත්‍රෝපකරණ, ඉංජිනේරු, ඉදි කිරීම් උපකරණ, ඉන්ධන සහ වැය ද්‍රව්‍ය නඩත්තු කටයුතු සඳහා විශාල මුදලක් වැය වෙනවා. ගුවන් හමුදාව සතු ගුවන් යානා, හෙලිකොප්ටර් යානා ගොඩක් අබලන් වෙලා තිබෙන්නේ, ඒවා පරණයි. Mi-17 හෙලිකොප්ටර් යානා 4ක ප්‍රධාන පිරිවැඩියාව සම්පූර්ණ කරන්න තිබෙනවා. ඒවා ප්‍රතිසංස්කරණය කරලා පියාසර කිරීමේ තත්ත්වයට පත් කරන්න ඕනෑ. ඒ වාගේම Bell 212 යානා තිබෙනවා. ඒවායේ engines repair කරන්න තිබෙනවා. ඒ වාගේම Mi-17, Y-12 යානා ප්‍රවාහන බලඝනය වාගේම, ආපදා කළමනාකරණය සහ සන්නිවේදනය සඳහා ගුවන් හමුදාවේ digital mobile radios වැඩි දියුණු කිරීමට සහ මිලදී ගැනීමට අපි මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ශ්‍රී ලංකා යුද හමුදාව පුළුල් අය වැය ප්‍රතිසංස්කරණ උපාය මාර්ගයන්, සීමිත මූල්‍ය සම්පත් විචක්ෂණශීලිව භාවිත කිරීම සහතික කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කිරීම කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා. පුනරාවර්තන පිරිවැයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් ක්‍රමයෙන් වැඩි කිරීම, දිගු කාලීන ශක්‍යතා සංවර්ධනය සහ ශ්‍රී ලංකා යුද හමුදාව නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරලා තිබෙනවා. 2026දී මූලික පියවර හැටියට අභ්‍යන්තර කටයුතු ඒකකයේ අධීක්ෂණය යටතේ ශුන්‍ය දූෂණය සහ දැඩි මූල්‍ය විනය පිළිපැදීම සිදු කරනවා. 2030 වන විට උපාය මාර්ගික පරිවර්තනයේ මාර්ගෝපදේශ යටතේ ආර්ථික වාසි ලබා ගැනීමටත් කටයුතු කරලා තිබෙනවා. ස්වේච්ඡා බලකාය එහි මුල් රාමුවට ප්‍රතිස්ථාපනය කිරීමෙන් එය උපාය මාර්ගික සංචිතයක් ලෙස ක්‍රියා කිරීමට හමුදාව තුළ හොඳ සම්පත් වෙන් කිරීමට සහ විශේෂීකරණය කිරීමටද කටයුතු කරලා තිබෙනවා.

නාවික හමුදාවේ 2030 උපාය මාර්ගය වෙනුවෙන් දක්වා ඇති අරමුණුවලට අනුකූලව ජාතියේ සමුද්‍රීය දේශසීමා ආරක්ෂා කිරීම සහ ජාතික ජලයෙන් ඔබ්බට මෙහෙයුම් සක්‍රිය කිරීම සඳහා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක භාවිතය සහතික කිරීම සඳහා නාවික හමුදාව එහි නිත්‍ය සහ ස්වේච්ඡා බලකායන්ගේ ප්‍රශස්ත සංයුතිය නිර්ණය කිරීම සැලසුම් කරලා තිබෙනවා. වෙනස් වන ජාතික ආරක්ෂක පරිසරයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව ව්‍යුහාත්මක සංවර්ධනයක් සමඟ පරිණාමය වී ඇති අතර, තාක්ෂණික දියුණුවට සමගාමීව එය තවදුරටත් පරිවර්තනය කරන්න මේ අය වැයෙන් වෙන් කරන ලද මුදල් භාවිතයට ගන්නවා.

2030 ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත අපි විශේෂ කමිටුවක් පත් කරනවා. ඒ අනුව ඉදිරි වර්ෂ 5 ඇතුළත ත්‍රිවිධ හමුදාව ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා, අපේ ජාතික ආරක්ෂාව සහ ජාතික සංවර්ධනයට අනුකූලව.

ඒ වාගේම ඉඩම් මුදා හැරීම ගත්තොත්, මේ වර්ෂයේ අපි උතුරු, නැඟෙනහිර පළාත්වල තිබෙන ඉඩම් අක්කර විශාල ප්‍රමාණයක් මුදා හැර තිබෙනවා. තව මුදා හරින්නත් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, රණ විරුවන් ගැන විශේෂයෙන් සඳහන් කළා, අපේ ගරු විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ තවත් ගරු මන්ත්‍රීවරුනුත්. පසුගිය මාස 10ක් වැනි කාලය තුළ අපි රණ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

විරුවන් ගැන විශේෂයෙන් අවධානය යොමු කළා. මමත් රණ විරුවෙක්, අවුරුදු 35ක් සේවය කරපු. දැන් මම විශ්‍රාමික යුද හමුදා නිලධාරියෙක්. මම දන්නවා, රණ විරුවන්ගේ අවශ්‍යතා, අභිමානය, ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳව. කොහොමද, පසුගිය කාලවල රණ විරුවන්ව පාවිච්චි කළේ? අපි දැන් ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කර තිබෙනවා. ඔවුන්ගේ ආබාධිත, මිය ගිය, වැන්දඹු, අවුරුදු 55න් විශ්‍රාම ගිය අයවලුන්ගේ වැටුප්, ස්ථාවර දීමනා ඇතුළු සියලු දීමනා, ඒ වාගේම ආබාධිත වෙලා නිවාඩු නොලබා නොපැමිණ සිටින සියලුම රණ විරුවන්ගේ ගෙවීම්, විශ්‍රාම වැටුප්, දීමනා, ස්ථාවර දීමනා සියල්ලක්ම සම්බන්ධව අපි විශේෂ කැබිනට් පත්‍රිකාවක් සකස් කරලා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාරයේ වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කර දැන් ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර තිබෙනවා. ඒකෙන් මේ කිසිම රණ විරුවෙකුට ගෙවන විශ්‍රාම වැටුපක්, දීමනාවක් කොහෙත්ම අත්හිටුවා නැහැ. ඒ සම්බන්ධව අපි විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. රණ විරුවන්ට ලැබෙන්න තිබෙන සියලු දීමනා, ස්ථාවර දීමනා, අවුරුදු 55න් විශ්‍රාම ගිය අයගේ, විශේෂයෙන් මිය ගිය රණ විරුවන්ගේ වැන්දඹුවන්ට, මියගිය රණ විරුවන්ගේ දෙමව්පියන්ට ගෙවන්න තිබෙන දීමනා සම්බන්ධයෙන් අපි විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා.

ඒ වාගේම විශ්‍රාමික රණ විරුවන්ට සහ විශ්‍රාම යන්න ඉන්න රණ විරුවන්ට අපි විශේෂ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, "රණවිරු ව්‍යවසායක අභිමන්" යනුවෙන්. වෘත්තීය මට්ටමෙන් ඔවුන්ට තිබෙන හැකියාවන් සැලකිල්ලට ගෙන, ක්ෂේත්‍ර 28ක් තෝරාගෙන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ එකතු වෙලා ඒ කටයුතු කරන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒ අනුව රණ විරුවන් සම්බන්ධව අපි විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ කටයුතු අපි අනිවාර්යයෙන් ඉස්සරහටත් කරනවා. ඒ ගැන අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ සම්බන්ධව අප කටයුතු කළ යුතු ආකාරය අපි හොඳට දන්නවා. විශේෂයෙන් අපේ ජාතික ආරක්ෂාව සම්බන්ධවත් ඉතාම හොඳ දැනුමකින්, බුද්ධියකින්, අවශ්‍යතාවකින්, මේ කලාපයේ තිබෙන ජාතික ආරක්ෂාව පිළිබඳ කරුණුත් සැලකිල්ලට ගෙන අපි කටයුතු කරනවා. ඒ වාගේම ඉදිරියේදී අනිවාර්යයෙන් ජාතික ආරක්ෂාවත් අපි ඉතාම හොඳින් තහවුරු කරන බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Dr.) Elayathamby Srinath. You have 11 minutes.

[මු.ප. 11.08]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தவிசாளர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்தில் பாதுகாப்பு அமைச்சு மற்றும் பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு தொடர்பாக உரையாற்றச் சந்தர்ப்பம் வழங்கியமைக்காக எனது நன்றியையும் வணக்கத்தையும் தெரிவித்துக் கொள்கின்றேன். மிக முக்கியமான இந்த விவாதத்திலே நாங்கள் தமிழ் மக்கள் சார்பாகப் பல விடயங்களை முன்வைக்க வேண்டிய தேவை இருக்கின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கம் பொறுப்பேற்றதிலிருந்து பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு சார்பாகப் பல நல்ல விடயங்களை நீங்கள் செய்கின்றீர்கள். குறிப்பாக, போதைப்பொருள் விவகாரம் மற்றும் பாதாள உலகக் கோஷ்டியினருக்கு எதிரான உங்களுடைய நடவடிக்கைகளை நாங்கள் வரவேற்கின்றோம்; அதற்காக வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கின்றோம்.

அதேநேரம், இந்த ஆண்டிலே நாட்டில் 100க்கும் மேற்பட்ட துப்பாக்கிச்சூட்டுச் சம்பவங்களும் 50க்கும் மேற்பட்ட உயிரிழப்புகளும் நடந்திருந்தும், பாதுகாப்புத் தொடர்பாக நீங்கள் சில விடயங்களிலே விடாப்பிடியாகவும் அசமந்த மாகவும் இருப்பதாகத்தான் தோன்றுகின்றது. மக்கள் பிரதிநிதிகளாகிய எங்களுடைய பாதுகாப்புப் பற்றி பல தடவை நாங்கள் கோரிக்கைகளை முன்வைத்திருந்தும்கூட, அவற்றை நீங்கள் உதாசீனப்படுத்தி இருக்கின்றீர்கள். பாதுகாப்பைக் கேட்கின்றபொழுது, "குற்றச்செயல்களில் ஈடுபடுபவர்கள்தான் பாதுகாப்பைத் தேடுகின்றார்கள்" என்று கூறுகின்றீர்கள். உண்மையாக, சட்டவிரோத நடவடிக்கை களுக்கு எதிராகக் குரல் கொடுக்கவேண்டிய, அதற்காக மக்களுடன் பயணிக்கவேண்டிய பாரிய பொறுப்பைக் கொண்டிருக்கின்ற எங்களுக்குக்கூட பாதுகாப்பு வழங்கப் படுவதற்கான எந்த ஆயத்த நடவடிக்கைகளும் உங்களிடம் இல்லை. மிக முக்கியமாக, சட்டவிரோத மது பாவனை மற்றும் சட்டவிரோத மணல் அகழ்வு மற்றும் சட்டவிரோத மீன்பிடி முதலான விடயங்கள் கட்டுப்பாட்டிலும் இல்லை.

மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அண்மையில் அங்கு பல விடயங்களை மேற்கொள்வதற்காகப் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் வந்திருந்தார். அப்போது நாங்கள்கூட அங்கு முன்னெடுக்கப்படவேண்டிய பல நடவடிக்கைகள் பற்றி தெரிவித்திருந்தோம். ஆனாலும், சிலவற்றைச் செய்ய முடியாமைக்கு ஆளணிப் பற்றாக்குறை முதலான பல விடயங்கள் காரணமாகக் கூறப்பட்டிருந்தது. அங்கு சட்டவிரோத மணல் அகழ்வு மற்றும் சட்டவிரோத மது உற்பத்தி நடவடிக்கைகள் தொடர்ந்தும் நடந்து கொண்டிருக் கின்றன. பிரதேச சபைகளினூடாகப் பல விடயங்களை மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் முன்னெடுக்கின்றபோது, பொலிஸாரின் ஆளணிப் பற்றாக்குறையினால் எமக்குத் தேவையான வசதிகளை வழங்குவதிலே பாரிய நெருக்கடி இருக்கின்றது. ஆகவே, மிக முக்கியமாக நீங்கள் அதற்குத் தேவையான ஆளணி வளத்தைப் பெருக்கிக்கொள்ள வேண்டும். அதற்கு நாங்களும் உதவியாக இருப்போம். இந்த விடயங்களிலே ஈடுபடுத்துவதற்குத் தமிழ்ப் பகுதியிலே பெண் பொலிஸ் அதிகாரிகள் மிகக் குறைவாக இருக்கின்றார்கள். அந்த விடயத்திலும் நீங்கள் முக்கியமாகக் கவனம் செலுத்த வேண்டும். இந்த விடயத்தை மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கூறியபோது, ஆளணியைப் பெற்றுக்கொள்வதில் மிகச் சிரமம் இருப்பதாகப் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் கூறியிருந்தார். ஆகவேதான் மாகாண சபை முறைமையூடாகப் பொலிஸ் அதிகாரம் வழங்கப்பட வேண்டும், அவற்றினூ டாகவும் குற்றச் செயல்களைத் தடுக்கின்ற விடயங்கள் முன்னெடுக்கப்பட வேண்டும் என்பதை நாங்கள் வலியுறுத்திக் கொண்டிருக்கின்றோம்.

இதற்கப்பால், சட்டவிரோத மீன்பிடி என்ற விவகாரத்தைக் கட்டுப்படுத்துவதற்குக் கடற்படையினருக்குத் தேவையான வளம் இருக்கின்றது; அதனுடன் தொடர்பான பல்வேறு செயற்பாடுகளில் ஈடுபடுகின்ற வீரர்கள் இருக்கின்றார்கள்.

அவ்வாறிருக்கையில், அதனை மிக முக்கியமாக ஒரு பொறுப்பான விடயமாகக் கருதிக் கட்டுப்படுத்துவதற்கான நடவடிக்கைகளை முன்னெடுப்பதற்கு இன்னும் ஏன் கால தாமதமாகின்றது? என்ற கேள்வி எழுகின்றது. இந்த அரசு பல சட்டவிரோத நடவடிக்கைகளைக் கட்டுப்படுத்தி வருகின்றது. குறிப்பாக, நீங்கள் எவ்வாறு போதைப்பொருளுக்கு எதிராக மிக இறுக்கமான நடவடிக்கைகளை மிக விரைவாக எடுக்கின்றீர்களோ, அதேபோன்று எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற மண் வளத்தையும் மக்களுடைய ஏனைய வளங்களையும் பாதுகாப்பதற்கான நடவடிக்கைகளை எடுப்பதற்குப் பொலிஸாரின் ஆளணியினரைப் பெருக்கு வதற்கான நடவடிக்கைகள் ஏன் தாமதமாகின்றன அல்லது ஏன் அந்த முயற்சிகள் பாரியளவு வெற்றிபெறாமலே இருக்கின்றன? ஆகவே, இந்த விடயங்களை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டும்.

இதற்கப்பால், எமது மாவட்டம் தொடர்பான பல கோரிக்கைகளை நாங்கள் முன்வைத்திருந்தோம். மிக முக்கியமாக, எங்களுடைய தாண்டியடி மாவீரர் துயிலும் இல்லம் சம்பந்தமாக எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் பேசியிருந்தார்கள். இது ஓர் உணர்வு ரீதியான விடயம்! உண்மையிலே நீங்களும் போராட்டப் பின்புலத்திலே இருந்து வந்தவர்கள். கார்த்திகை வீரர்கள் தினத்தை நீங்கள் மிக விசேடமாக அனுஷ்டித்திருந்தீர்கள்! தமிழ் மக்களும் தங்களுடைய இனத்துக்காகப் போராடிய வீரர்களுக்காக, உறவுகளுக்காக மரியாதை செலுத்துவதும் அதுபோன்றது தான். சில விடயங்களில் நீங்கள் அந்த சுதந்திரத்தைக் கொடுத்திருக்கின்றீர்கள். குறிப்பாக, கடந்த அரசாங்கங் களுடன் ஒப்பிடும்போது, தமது இறந்த உறவினர்களுக்காக அல்லது போராளிகளுக்காக மரியாதை செலுத்துவதற்கான வசதிகள் இப்போது ஏற்படுத்தப்பட்டிருந்தாலும்கூட, மிக முக்கியமாகத் தாண்டியடி மாவீரர் துயிலும் இல்லத்தின் ஐந்து ஏக்கர் காணியில் ஒரு சிறு பகுதியையாவது விடுவிக்க வேண்டுமென மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வந்திருந்தும்கூட, அதற்கான செயற்றிட்டங்கள் ஆரம்பிக்கப் பட்டதற்கான எந்தவித சமிக்ஞையும் கிடைக்கப்பெறவில்லை. அந்த மக்கள் தங்களுடைய பிரதேசத்திலே தங்களுடைய உறவுகளை நினைத்துத் துக்கம் அனுஷ்டிப்பதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்க முடியாதவிடத்திலே, அதை எவ்வாறு எல்லோருக்குமான சம நீதியாக நாங்கள் எடுத்துக்கொள்வது? என்பதை நீங்கள் சிந்திக்க வேண்டும்.

பொலிஸ் திணைக்களத்திற்குரிய விடுதிகள் நகரத்தின் மத்திய பகுதியில் இருக்கின்றன. அவற்றை நகர எல்லைக் குள்ளே வேறு இடத்திற்கு மாற்றுவதன்மூலம் அதை ஓர் அழகான நகரமாகக் கட்டியெழுப்புவதற்குத் தேவையான விடயங்களைச் செய்ய வேண்டுமென்றும் நாங்கள் கோரிக்கை விடுத்திருந்தோம். இதற்கப்பால், மட்டக்களப்பு மாவட்டத்திலே யுள்ள பாதுகாப்புப் படைவீரர்களின் முகாம்கள் அமைந்துள்ள இடங்களை விடுவிப்பது சம்பந்தமாக நீங்கள் நடவடிக்கைகளை எடுத்துக்கொண்டு வந்தாலும், வடக்கு, கிழக்கில் பல இடங்களிலே பாரியளவு படையினர் இன்னும் நிலைகொண்டிருக்கிறார்கள். சில இடங்களிலே இரண்டு பொதுமக்களுக்கு ஓர் இராணுவ வீரர் என்ற அடிப்படையிலே இராணுவ வீரர்கள் குவிக்கப்பட்டிருக்கிறார்கள். தேசியப் பாதுகாப்பு என்பது முக்கியமாக இருக்கின்றபொழுதிலும், மக்களுடைய இயல்பு வாழ்க்கைக்கு அது பாதிப்பாக இருந்துவிடக் கூடாது என்பதுதான் எங்களுடைய எதிர்பார்ப் பாக இருக்கின்றது.

நாட்டின் கட்டுமானத்திற்கு நீங்கள் அவர்களைப் பயன்படுத்தினாலும், மக்களிடமிருந்து எடுக்கப்பட்ட காணிகளை வியாபாரம் செய்வதற்கும் விவசாயம் செய்வதற்கும் அவர்கள் பயன்படுத்திக்கொண்டிருக்கிறார்கள் என்பதை நீங்கள் நன்கு அறிந்திருப்பீர்கள். உதாரணமாக மட்டக்களப்பு பாசிக்குடாப் பகுதியிலே அவர்கள் சிறு கடை நடத்துகிறார்கள்; அந்தக் கடைக்குச் சட்டரீதியற்ற முறையிலே மின்சாரம் வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், அங்குள்ள வேறு கடைகளுக்கு இன்னும் மின்சாரம் வழங்கப்படாத நிலை காணப்படுகின்றது. மேலும் அது சுற்றுலாத் துறை விருத்திக்கான பிரதேசமாக இருக்கின்றது. நாட்டின் தேசியப் பாதுகாப்புக்கும் இடர் நெருக்கடிகளின்போதும் வேலை செய்யவேண்டிய படையினர், ஏன் விவசாயம் செய்வதற்கும் உணவு விடுதி நடத்துவதற்கும் பயன்படுத்தப்பட்டுக் கொண்டிருக்கிறார்கள்? இதனை அவர்களுடைய கௌரவத்திற் குரிய விடயமாகவும் நாங்கள் பார்க்க முடியாது. ஆகவே, இந்த விடயங்களை மிகவும் கருத்திற்கொண்டு அந்த இராணுவ வீரர்களை நாட்டின் கட்டுமானத்திற்கு அல்லது நாட்டின் வளர்ச்சிக்குப் பயன்படுத்திக் கொள்ளுங்கள்! அதைவிடுத்து, மக்களுக்குப் போட்டியாக, மக்களுடைய சிறு தொழில்களுக்கு இடையூறாக மேற்கொள்ளப்படுகின்ற அவர்களுடைய வேலைத் திட்டங்களைத் தடுத்து நிறுத்த வேண்டுமென்று நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

வட, கிழக்குப் பகுதிகளிலே யுத்தம் முடிந்து 16 வருடங்கள் ஆகிவிட்டது. இன்னும் அங்குள்ள இராணுவ முகாம்களை எவ்வாறு ஐதாக்குவது, எவ்வாறு அவற்றை நாட்டிலே சமச்சீராகக் கொண்டுசெல்வது என்ற திட்டம், உங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் பதவியேற்று ஒரு வருடமாகியும் இன்னும் முன்வைக்கப்படவில்லை. அதற்குரிய உங்களுடைய திட்டத்தை முன்வையுங்கள்! தமிழ் மக்கள் உங்களுக்கு நிறைய வாக்குகளை அளித்திருக்கிறார்கள்; உங்களிடம் நம்பிக்கையான செயற்பாடுகளை எதிர்பார்க் கின்றார்கள். தமிழ் மக்கள் அபிவிருத்திக்காக உங்களுக்கு மட்டும் வாக்களிக்கவில்லை. 50 சதவீதத்திற்கும் மேற்பட்ட மக்கள் தமிழ்த் தேசிய உணர்வுடன் வாக்களித்திருக்கிறார்கள். ஆகவே, இந்த விடயங்களிலே அரசு பொறுப்புடனும் நம்பிக்கையூட்டும் விதமாகவும் நடந்துகொள்ள வேண்டுமென்ற ஒரு விண்ணப்பத்தை நான் இங்கு முன்வைக்கின்றேன்.

திருகோணமலையில் நடந்த விடயத்தை நாங்கள் உண்மையாக இனவாதமாகப் பார்க்கவில்லை. ஆனால், அங்கு நீதி சமமாகப் பேணப்படவில்லை. கருணையையும் நல்ல சிந்தனைகளையும் போதிக்க வேண்டிய பௌத்த மதகுரு ஒருவர் பொலிஸ் அதிகாரி ஒருவரின் கன்னத்தில் அறைவதை நாங்கள் 'வீடியோ' ஊடாகப் பார்க்கக்கூடியதாக இருந்தது. இது சம்பந்தமாக என்ன சட்ட நடவடிக்கை எடுக்கப்பட்டிருக்கின்றது? இதற்கு முன்னரும் நாட்டின் பல இடங்களில் இவ்வாறு பௌத்த பிக்குகள் அதிகாரிகளுக்குத் தூஷணை வார்த்தைகளால் ஏசுவதையும் அடிப்பதையும் காணக்கூடியதாக இருந்தது. இவ்வாறான விடயங்களிலே நீங்கள் சட்ட ஆட்சியை உறுதிப்படுத்துபவர்களாக மிக இறுக்கமான நடவடிக்கைகளை எடுக்க வேண்டும். 'சட்டம் அனைவருக்கும் சமம்' என்ற அடிப்படையிலே பல விடயங்களில் நீங்கள் மிக இறுக்கமாக நடவடிக்கை எடுக்கின்றபொழுது, இந்த விடயத்தில் மட்டும் அவ்வாறு நடந்துகொள்ளாமலிருப்பது ஏன்? உங்களின் எதிர்கால வாக்கு வங்கிக்காகவா அல்லது ஒரு மதத்திற்குத்தான் முக்கியத்துவம் என்பதற்காகவா இவ்வாறு நடந்துகொள்கின்றீர்கள் என்பதை நீங்கள் தெளிவாகச் சொல்லவேண்டும். ஏனென்றால், உங்களுடைய ஆட்சியிலே, உங்களுடைய செயற்பாடுகளிலே

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

மக்கள் பாரியளவு நம்பிக்கை வைத்திருக்கிறார்கள். இன்றும் என்னுடைய பல நண்பர்கள் போதைப்பொருளுக்கு எதிராக நீங்கள் எடுக்கும் நடவடிக்கைகளுக்காக என்னிடமே பாராட்டு கிறார்கள்; "உங்களுடைய ஆதரவை அரசாங்கத்திற்குக் கொடுங்கள்!" என்று சொல்கிறார்கள். நாங்களும் அதற்குத் தயாராக இருக்கின்றோம். ஆனால், இவ்வாறான விடயங்கள் சம்பந்தமாக அவர்கள் கேட்கின்றபொழுது, எவ்வாறு நாங்கள் பதிலளிப்பது? இதில் உங்களுடைய நியாயத்தன்மை எங்கே? என்று நாங்கள் கேட்கவேண்டியிருக்கின்றது.

இதற்கப்பால் இன்னும் சில மிக முக்கியமான விடயங்களை நாங்கள் கலந்துரையாட வேண்டியிருக்கின்றது. இந்த விடயங்களிலே மிக முக்கியமானது எதிர்காலத்திலே இனங் களுக்கிடையே ஒரு நல்லுறவான தன்மை உருவாக்கப்பட வேண்டுமென்பதாகும். அதற்கு எல்லோரும் சமமாக மதிக்கப்பட வேண்டும். எங்களைப் பொறுத்தவரையில் நாம் மதத்துக்கும் மத குருமார்களுக்கும் மதிப்பளிக்க வேண்டிய தேவையிருக்கின்றது. கருணையையும் அஹிம்சையையும் போதிக்கின்ற மதகுருமார்களை நாங்கள் வணங்குகின்றோம். ஆனால், நீதி எல்லோருக்கும் சமம் என்றால், அவர்கள் தவறு செய்கின்றபொழுது, அவர்கள் சட்டரீதியற்ற முறையில் நடந்து கொள்கின்றபொழுது, ஏன் அந்த விடயத்தைச் சட்டரீதியாக அணுகாமல் வித்தியாசமான கோணத்தில் பார்க்கின்றீர்கள்? என்பதை நான் இந்த இடத்தில் மிக முக்கியமான கேள்வியாக முன்வைக்க விரும்புகின்றேன்.

அதற்கப்பால், தமிழ் மக்களிடம் இந்த அரசாங்கத்தின்மீது பாரிய எதிர்பார்ப்பு இருக்கின்றது. சொந்த நாட்டில், இராணுவத்தினரால் குண்டுகள் வீசப்பட்டு - கொத்தணிக் குண்டுகள் வீசப்பட்டு - கொல்லப்பட்ட மக்கள் சார்பாகப் பல ஆண்டுகளாக நீதி வேண்டிக் காத்திருக்கின்ற எமது மக்களுக்கு நீதியைப் பெற்றுக் கொடுக்க வேண்டும் என்பதில் நீங்கள் உறுதியாக இருக்க வேண்டும். செம்மணியில் நடைபெற்ற படுகொலைகளுக்குக் காரணமாக இருந்த இராணுவத்தினர் பலருக்கு மேலும் பதவி உயர்வுகளும் சலுகைகளும் வழங்கப்பட்டதாக ஊடகங்களில் வெளியான செய்திகள்மூலம் அறிய முடிந்தது. ஏன் இவற்றை நீதியானதொரு முறையில் பார்க்கவில்லை? இவ்வாறாக நடந்து கொள்வதனால்தான் நாங்கள் சர்வதேச நீதி விசாரணைப் பொறிமுறையைக் கோரவேண்டிய நிர்ப்பந்தத்துக்கு ஆளாகியுள்ளோம். இங்கு நீதியான முறையில் குறித்த விடயங்கள் அணுகப்படல் வேண்டும். கடந்தகால ஆட்சியாளர்கள்மீது உண்மையாகவே எங்களுக்கு நம்பிக்கை இருக்கவில்லை. அந்த ஆட்சியாளர்கள் நிறைய விடயங்களில் தமிழ் மக்களுக்கு அநியாயம் செய்திருக்கின்றார்கள். ஆகவேதான் தமிழ் மக்கள் உங்களுக்கு வாக்களித்திருக்கின்றார்கள்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Hon. Chairman, please give me one minute.

ஆகவே, செம்மணியில் நடைபெற்ற படுகொலைகளாக இருந்தாலும் சரிதான் அல்லது படையினரால் எமது மக்களுக்கு எதிராக மேற்கொள்ளப்பட்ட ஏனைய நடவடிக்கைகளாக இருந்தாலும் சரிதான், திருகோணமலையில் இடம்பெற்ற சம்பவங்களாக இருந்தாலும் சரிதான், நிலங்களை விடுவிக்கின்ற நடவடிக்கைகளாக இருந்தாலும் சரிதான், அவற்றில் உங்களுடைய நீதியான செயற்பாடுகளை எதிர்பார்க்கின்றேன். ஆகவே, எதிர்காலத்தில் ஒரு சிறந்த அரச பொறிமுறையைக் கொண்டுசெல்வதற்கு நாங்கள் எங்களுடைய ஆதரவுகளைத் தரத் தயாராக இருக்கும் வகையில் நீங்கள் உங்களுடைய அரசின் நடவடிக்கைகள் மூலம் எல்லோருக்கும் சமமாக நீதியை வழங்க வேண்டுமென்று கேட்டுக்கொண்டு, உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have 20 minutes.

[පූ.භා. 11.20]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දවසේ විවාදයට ගැනෙන මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේත්, ආරක්ෂක අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම පොලීසිය කියන විෂය ධාරාව සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේදී මම කියන්න කැමතියි, 16වැනි දා ත්‍රිකුණාමලයේ අවාසනාවන්ත සිදුවීමක් වුණු බව. ඒ ගැන අද මාධ්‍යයත් වාර්තා කර තිබෙනවා. "ත්‍රි'මලේ බුදු පිළිමය පොලීසියෙන් යළි වැඩමවයි", "ත්‍රිකුණාමලයේ බුදු පිළිමය පොලීසියෙන් රැගෙන ගියේ වැඩි ආරක්ෂාව සඳහා" යනුවෙන් එම සිදුවීම මාධ්‍යවල වාර්තා කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරය 1951දී තමයි ආරම්භ වෙලා තිබෙන්නේ. මේ විහාරය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙලා තිබෙනවා. 2014 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ විහාරයට දීමනා පත්‍රයක් ලබා දීලාත් තිබෙනවා. මම මේ කරුණු කිව්වේ අපිට ලබා දීලා තිබෙන තොරතුරු අනුවයි.

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මේ සිදුවීම දෙස අපි බලන්න ඕනෑ, ශ්‍රී ලාංකිකයින් හැටියටයි. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී වශයෙන් ජාතීන් ගණනාවකුත්, බෞද්ධ, ඉස්ලාමීය, කිතුනු, හින්දු වාගේ ආගම් අදහන ජනතාවකුත් ජීවත් වෙන රටක් තමයි, අපේ රට. ජාතියේ වගකීම, ජාතියේ අනන්‍යතාව, ආගමේ ආරක්ෂාව, තම ආගම ඇදහීමේ අයිතිය ගැන අපි හැම කෙනෙකු වාගේම රජයත් වගකියන්න ඕනෑ. ඒක බොහොම පැහැදිලියි. අපි හැම ආගමකටම ගරු කරනවා. මම සිංහල, බෞද්ධ. මම හැම ආගමකටම වාගේම හැම ජාතියකටම ගරු කරනවා. හැබැයි, අපේ රට සිංහල, බෞද්ධ රටක්. මම බොහොම විවෘතවයි ඒ ගැන කියන්නේ. මේ රට සිංහල, බෞද්ධ රටක්. මම එහෙම කියන්නේ අනෙක් ජාතීන්ට, ආගම්වලට වෛර කිරීමක් වශයෙන් නොවෙයි. හැබැයි, අපි උපදිනකොට අත් දෙක මිට මොලවා ගෙන එක අතකින් ජාතිය, එක අතකින් ආගම අරගෙනයි එන්නේ. ඒකට අපි ආදරෙයි. ඒ නිසා මේ වාගේ සිදුවීමක් සිදු නොවෙන්න අපි වග බලා ගන්න ඕනෑ. මොකද, ඉතිහාසයේ මෙවැනි සිදුවීම් වෙලා තිබෙනවා. බේරුවල දර්ගා නගරයේ සිදු වෙච්ච සිදුවීමත් මේ වාගේ පුංචි සිද්ධියක්. හැබැයි, ඒ සිද්ධියත් නොහිතපු විධියට මුළු රටටම ව්‍යාප්ත වුණා. ඒ නිසා මේවා ගැන අපි අවබෝධයෙන් යුතුව කටයුතු කරන්න වෙනවා.

දැන් ඇමතිතුමාම පැහැදිලිව කියනවා, ඒ බුදු පිළිමයේ ආරක්ෂාවට තමයි බුදු පිළිමය පොලීසියට අරගෙන ගියේ කියලා. ඒක එහෙම වෙන්න ඇති. හැබැයි, මේ විධියට මේ රටේ සියලු ජාතීන්ට, ආගම්වලට අයත් වන තැන්වල ආරක්ෂාව නැති වෙන්න ගියොත් බුදු පිළිම අරගෙන යන එක නොවෙයි කළ යුත්තේ, ඒ සඳහා ආරක්ෂාව ලබා දීමයි. මෙහෙම වුණොත් අපිට අන්තිමට පොලීසිය පන්සලක් බවට පත් කරන්න වෙනවා. ඔක්කෝම බුදු පිළිම අරගෙන ගිහිල්ලා ආරක්ෂාව දෙන්න කියලා පොලීසියේ තියන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන අපිට වැඩි අවධානයක් යොමු කරන්න සිද්ධ වෙනවා. ජාතීන් අතර හෝ ආගම් අතර යම් ප්‍රශ්නයක් ඇති නොවන විධියට ශ්‍රී ලාංකීය ජාතියක් හැටියට වැඩ කරන්නේ කොහොමද කියන එක ගැනයි අපි කල්පනා කරන්න ඕනෑ.

ඒ වාගේම මම අද විශේෂයෙන් මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඊයේ දවසේත්, දවසේ වෙඩිල්ල පත්තු වෙනවා. කොහේද? මීටියාගොඩ. මීටියාගොඩ වෙඩි තැබීමක් සිදු වෙලා කෙනෙකු මැරෙනවා. එතකොට 2025.01.01 දින සිට මේ දක්වා සිදු වුණු වෙඩි තැබීම් ගණන 106යි, මරණ 54යි, තුවාල ලැබූ අය 53 දෙනෙක්. අපට මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. ඒකට හේතුව, රටක ආරක්ෂාව කියන්නේ රජයක වගකීමක්. වෙඩි තැබීම් එන්න එන්නම වැඩි වෙනවා. තවම මේ අවුරුද්ද අවසන් වෙලා නැහැ. තව මාස එකහමාරක් තිබෙනවා, මේ අවුරුද්ද ගෙවෙන්න. මේ කාලය තුළ සිද්ධ වෙන්නේ මොකක්ද? අපි මහජන ආරක්ෂාව ගැන වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ.

පසුගිය දවසක ප්‍රාදේශීය සභා සභාපතිවරයකු මරා දැම්මා. ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට - විපක්ෂයේ විතරක් නොවෙයි ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන්ටත්- ආරක්ෂාව තිබෙන්න ඕනෑ. මේ මන්ත්‍රීවරු පත්වෙන්නේ අවුරුදු 5කට. බලන්න, ඊයේ දිනයේ බුදු පිළිමය සම්බන්ධ සිද්ධිය සොයා බලන්න පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ගියාම එතුමන්ලාට මොකක්ද කළේ? මිනිස්සු කෑ කෝ ගහලා, බැණලා ඒ අයව එළවා ගත්තා. ආරක්ෂාව තබාගෙන යනවා කියන්නේ, මිනිස්සුන්ට ගහන්න නොවෙයි, මිනිස්සුන්ව එළවන්න නොවෙයි. යම් ආරක්ෂාවක් තිබෙනවා කියන පණිවුඩයත් එක්ක, තත්ත්වය සුබවාදී පැත්තකට පරිවර්තනය වෙන්න පුළුවන්. ඒ නිසා රටේ ජනතාවගේත්, මහජන නියෝජිතයන්ගේත් ආරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න කියලා අපි මතක් කරන්න කැමැතියි. කුමන ක්ෂේත්‍රයක සිටියත් ඒ අයගේ ආරක්ෂාව ගැන සැලකිල්ලක් දැක්විය යුතුයි කියලා අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ වෙනකොට පොලීසියේ නිලධාරින් 82,000ක් පමණ ඉන්නවා. ශ්‍රී ලංකා පොලීසියේ ඉන්න ඉහළ නිලධාරින් විතරක් නොවෙයි, පහළ පන්තියේ නිලධාරින්වත් අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. සමහර අවස්ථාවලදී අපි දකිනවා පහළ පන්තිවල ඉන්න නිලධාරින්ට අවශ්‍ය පහසුකම් නැති බව. සමහර පොලිස් ස්ථාන ඉස්සර කාලයේ හදපු ඒවා. SSP මහත්මයා එනකොට, inspection වෙනකොට තීන්ත ටිකක් ගාලා, මොනවා හරි කරලා අටවා ගන්න එක තමයි හැම දාම කරන්නේ. හැබැයි, වහල ඔළුවට කඩාගෙන වැටෙන්නේ කොයි වෙලාවේද දන්නේ නැහැ. ගොඩක් පොලිස් ස්ථාන එහෙමයි. අන්න ඒ පොලිස් ස්ථානවල අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කරන්න; ඒ පොලිස් ස්ථාන නඩත්තු කරන්න ඕනෑ. ඒ පොලීසිවලට අවශ්‍ය කරන වැසිකිළි කැසිකිළි පහසුකම් වාගේම නිලධාරින්ට අවශ්‍ය කරන පහසුකම් ගැනත් අපි බලන්න ඕනෑ. ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින් ලොකු කැපවීමක් කරනවා. ඔවුන් මේ රටේ මහජන ආරක්ෂාව වෙනුවෙන් ලොකු කැපවීමක් කරනවා. ඒ අතරතුරේ තමන්ගේ වුවමනා ඉටු කරගන්න, ආණ්ඩු සතුටු කරන්න කටයුතු කරන පොලිස් නිලධාරිනුත් අපි දකිනවා. හැබැයි, පහළ නිලධාරින් වැඩි බහුතරයක් තමන්ගේ වගකීම් ඉටු කරන්න කටයුතු කරනවා. ඒ වගකීම ඉටු කරන්න ඔවුන්ට හොඳ මානසික මට්ටමක් තිබෙන්න ඕනෑ. ඒ මානසික මට්ටම හදන්න නම් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම උසස්වීම් පිළිබඳව බලන්න ඕනෑ. ඒ උසස්වීම් කටයුතු සිදු වෙලා තිබෙන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. සමහර නිලධාරින් අවුරුදු 19දී, 20දී පොලීසියට බැඳුණු අය. ඒ අය අවුරුදු 55, 60 වෙනකොට, විශ්‍රාම යද්දී ඒ අයට නිසි උසස්වීම ලැබුණාද, ඔහු බලාපොරොත්තු වෙච්ච දේවල් ලැබුණාද, තමන් කරපු රාජකාරියට ඇගැයීමක් ලැබුණාද කියලා බලන්න ඕනෑ. මේ ක්‍රමය ක්‍රියාත්මක විය යුතුයි.

මම දැක්කා, ගරු ඇමතිතුමා කියනවා, "අපි පොලීසියට දේශපාලන අතගැසීම් කළේ නැහැ" කියලා. හොඳයි. ඒක සද්භාවයෙන් නම් හොඳයි. ඒක සද්භාවයෙන් නම් හොඳයි කියලා කියන්නේ ඇයි? අපිත් ආණ්ඩු කරපු අය. මේ වෙනකොට පොලිස් ස්ථානවල, ස්ථානාධිපතිවරු ඇතුළු සමහර නිලධාරින් ස්ථාන මාරුවීම් කර තිබෙනවා. ඒ ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී ඔබතුමන්ලා කියනවා සේවයේ අවශ්‍යතාව මත, කාර්යක්ෂම සේවයක් මත එය සිදු කරනවා කියලා.

කළුතර දිස්ත්‍රික්කය ගත්තොත්, කළුතර දිස්ත්‍රික්කයේ හිටපු පොලිස් ස්ථානාධිපතිවරු ඔක්කෝම මාරු කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* අන්න, හරි. අන්න, හරි. මම පිළි ගන්නවා. අවුරුදු තුනකට පසුව මාරු වෙන්න ඕනෑ. හැබැයි, අවුරුදු තුනට අඩු අය මාරු වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මම ඔබතුමාට කියන්නේ මේකයි. අපේ කාලවල, අපේ රජයන් වැරැදි කරපු හින්දා නේ මිනිස්සු එළෙව්වේ. අපේ කාලවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා තමන්ගේ කොට්ඨාසයේ ඉන්න OIC තමන්ට ගැළපෙන්නේ නැත්නම් ලියුමකින් තමයි මාරු කළේ. දැන් ලියුම නොවෙයි, දැන් telephone call එකෙන් තමයි මාරු කරන්නේ. ඉස්සර ලියුම. මේ අහන්න, ඇමතිතුමනි. මේවා ඇත්ත. මේවා තිත්තයි. ඉස්සර ලියුමෙන් තමයි මාරු කළේ. විෂය භාර ඇමතිවරයාට ලියුමක් දෙනවා, මේ ස්ථානාධිපතිවරයා හොඳ නැහැ කියලා. ඒක නේ සාක්ෂියක් තිබෙන්නේ. දැන් ඒ වරද තමුන්නාන්සේලා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා ඒක කරන්නේ නැහැ. දුරකථන ඇමතුමෙන් තමයි කියන්නේ "මෙයා ගැළපෙන්නේ නැහැ" කියලා. *[බාධා කිරීමක්]* දුරකථන ඇමතුම් දුන්නා කියලා මම කියන්නේ ගරු ඇමතිතුමනි, ඔබතුමාට එන දුරකථන ඇමතුමක්වත්, වෙන කෙනෙකුට එන දුරකථන ඇමතුමක්වත් නොවෙයි. බොහොම පැහැදිලිව දැන් තිබෙන ක්‍රමවේදය ඒකයි. *[බාධා කිරීමක්]* නැහැ, මේ කරන ක්‍රමවේදය. එම නිසා නිලධාරින් එක්ක මේ ක්‍රමවේදය,-*[බාධා කිරීමක්]* ශ්‍රී ලංකා පොලීසියේ වැඩිපුර ඡන්ද හම්බ වුණේ ඔබතුමන්ලාට.*[බාධා කිරීමක්]* කොමිසම. හරි, හරි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

පොලිස් කොමිසමෙන් තමයි නිලධාරින්ගේ ස්ථාන මාරු කරන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවේදී ඔබතුමා කථා කරන්න. විපක්ෂය හැටියට මම නහන,-*[බාධා කිරීමක්]* මාරු කිරීම් කරන්නේ පොලිස් කොමිසම නම්, පොලිස් කොමිසමෙන් ඒක ඉවත් කරන්න කියලා ඉල්ලීමක් කළේ ඇයි? ඇයි, පොලිස් කොමිසමෙන් ස්ථාන මාරු ගලවන්න උත්සාහ කළේ?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කවුද ඉල්ලීම කළේ? *[බාධා කිරීමක්]* ඒක පොලිස් කොමිසමේ වැඩක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව-

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ මගේ වෙලාව. ඔබතුමා පසුව පිළිතුරු දෙන්න. මම මේ කියන්නේ ඔය කියන සද්භාවය නම් හොඳයි කියලායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආණ්ඩුවේ වුවමනාවට තමයි කරන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔය කියන සද්භාවය නම් හොඳයි. හැබැයි, ඔය සද්භාවය නොවෙයි තිබෙන්නේ කියන එක තමයි පොළොවේ ඇත්ත තත්ත්වය. මේක ගිහිල්ලා පොලීසියෙන් අහන්න. අපි කථා කරන ඒවා ඔක්කෝම මිනිස්සු බලාගෙන නේ ඉන්නේ. මේ ක්‍රියාවලිය ගැනයි අපි කියන්නේ. අවුරුදු තුන නම් ස්ථාන මාරු කරන්න ඕනෑ. ඔහුට විරුද්ධව පැමිණිලි තිබෙනවා නම් ස්ථාන මාරු කරන්න ඕනෑ. ඔහුට විරුද්ධව යම් යම් චෝදනා තිබෙනවා නම් ස්ථාන මාරු කරන්න ඕනෑ. හැබැයි, එහෙම නොවන ස්ථාන මාරුවක් කළොත් විපක්ෂයක් හැටියට අපි දකින්නේ ඒක දේශපාලන වශයෙන් කරපු දෙයක් හැටියටයි. තමුන්නාන්සේලා වාගේම තමයි, අපිත් දේශපාලනය කරපු අය. අපි අවුරුදු විසි ගාණක් මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේයි, විපක්ෂයේයි දෙපැත්තේම හිටපු අය. අත්දැකීම් එක්ක මේ කියන්නේ.

දැන් තමුන්නාන්සේලා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන කර ගෙන යනවා. ඉතාම හොඳයි. ඒක ඉතා හොඳ වැඩසටහනක්. හොඳ වැඩක්. ඉතාම හොඳයි. හැබැයි, මේක ක්‍රියාත්මක කරන්න. ගෙදරක දරුවෙක් අයිස් මත්ද්‍රව්‍යය පාවිච්චි කරනවා නම්, වෙනත් මත්ද්‍රව්‍යයක් පාවිච්චි කරනවා නම් ඒ පවුලම ඉවරයි. ඒ දරුවා විතරක් නොවෙයි, ඒ අම්මා, තාත්තා ඇතුළු ඔක්කෝම සමාජයෙන් කොන් වෙලා ඒ මුළු පවුල් සංස්ථාවම විනාශ වෙනවා. මේක වැළැක්වීම ජාතික වශයෙන්ම කළ යුතු දෙයක්. අපි විපක්ෂයේ හිටියත් හොඳ දේට හොඳයි කියනවා. මේක කරන්න. ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. තමුන්නාන්සේලා අත්දෙක උස්සන්න කිව්වොත්, අත්දෙක උස්සලා අපේ සහයෝගය ලබා දෙනවා. හැබැයි, යම් යම් වෙලාවට දකින යම් යම් මාධ්‍ය සන්දර්ශන නිසා ඔබ අල්ලන විත්තිකරුවාගේ නඩු නිමිත්තට, නඩුවට අයුතු බලපෑමක් වෙනවා කියලයි මම හිතන්නේ. ඇයි? ඔබතුමන්ලා දන්නවා, මත්ද්‍රව්‍ය එක්ක සම්බන්ධකම් තිබෙන අය තමන්ගේ නඩුවලට ප්‍රකෝටි ගණන් තමයි වියදම් කරන්නේ කියන එක. එතකොට මේ මොකක්ද කරන්නේ? මේ, අර නඩුවට අවශ්‍ය කරන සාක්ෂි ටික සපයා දෙන එක කරන්නේ. ඒක නොවෙයි වෙන්න ඕනෑ. මේවා බොහොම හුදෙකලාවෙන්, නීතියේ රැහැනට අවශ්‍ය කරන විධියට හසු කර ගන්න ඕනෑ. ඔවුන් අධිකරණයට ගියාම ඔවුන්ව වැරැදිකරුවන් බවට පත් වෙන්න ඕනෑ, වැරැදි කරලා තිබෙන නිසා. අන්න ඒකයි කළ යුතු වෙන්නේ. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා බලයට පත් වීමට පෙර මේ රටේ සිදු වෙච්ච ඉතාම අවාසනාවන්තම සිදුවීම තමයි පාස්කු ප්‍රහාරය. පාස්කු ප්‍රහාරය නිසා කතෝලික බැතිමතුන් මරණයට පත් වෙලා තිබෙනවා. සමහර අය ආබාධිත වෙලා තවමත් ගෙවල්වලට වෙලා දුක් විඳිනවා.

ඔබතුමන්ලා රජය හැටියට පැහැදිලිව කිව්වා, "අපි අනිවාර්යයෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවා නීතිය ඉදිරියට ගෙනෙනවා, නීතිය ඉදිරියට ගෙනැල්ලා ඔහුට දඬුවම් දෙනවා, මහ මොළකරුවාට දඬුවම් දෙනවා" කියලා. දැන් ඔබතුමන්ලා ආණ්ඩුව භාරගෙන අවුරුද්දයි මාස 2ක් වෙනවා. කෝ, ඒ මහ මොළකරුවා? ඒ මහ මොළකරුවා කොහේද ඉන්නේ? කවුද ඒ ප්‍රහාරයට වග කියන්න ඕනෑ? තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්න කොට තමුන්නාන්සේලාට කරුණු අනාවරණය වෙලා තිබුණා ලු. තමුන්නාන්සේලා කිව්වා, "මේ මේ කරුණු අප ළඟ තිබෙනවා, මේ මේ තොරතුරු තිබෙනවා" කියලා. ගරු සභාපතිතුමනි, එහෙම නම්, දැන් කෝ ඒ මහ මොළකරුවා? අතිඋතුම් කාදිනල් මැල්කම් රංජිත් පියතුමා සාධාරණයක් ඉටුවනකල් බලාපොරොත්තුවෙන් ඉන්නවා. කෝ, ඒ සාධාරණය? ඒ සාධාරණය ඉටු කරන්න. අපිත් බලාගෙන ඉන්නවා, කවුද, ඒ මහ මොළකරුවා කියලා. එදා දේව මෙහෙයට ගිය ඒ අහිංසක අම්මලා, තාත්තලා, දරුවන් බොහෝ දෙනෙකුගේ ජීවිත නැති වුණා. සමහර දරුවන්ට අම්මා නැති වුණා; සමහර දරුවන්ට තාත්තා නැති වුණා; සමහර දෙමාපියන්ට දරුවෝ නැති වුණා. කවුරු, මොන විධියෙන් සැලසුම් කළත්, මේක මහා ජාතික අපරාධයක්. ගම්වල කථාවක් තිබෙනවා නේ, "හෙණ හත ගහනවා" කියලා. මේ අපරාධයට ගැව්ච්ච ගැව්ච්ච හැම කෙනෙකුටම නීතියෙන් කෙසේ වෙතත්, හෙණ හත නම් ගහනවා. අපි ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලා පොරොන්දු වෙච්ච දේ ඉටු කරන්න කියලා. *[බාධා කිරීමක්]* ඇහුණේ නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ගරු ඇමතිතුමනි, ඔබතුමා හිනාවෙන එක නොවෙයි මම බලාපොරොත්තු වෙන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, විෂය භාර ඇමතිතුමා හැටියට ඒ මහ මොළකරුවා කවුද කියලා කියන්න, එයාව අත්අඩංගුවට ගන්න කියලායි. දැන් මම කිව්වා නේ, "ඒ මොකා වුණත් කමක් නැහැ, හෙණ හත ගහනවා" කියලා. ඒකා මොකා වුණත් හෙණ හත ගහන්න ඕනෑ නේ.

තමන් බලයේ ඉන්නකල් හිතනවා, "මේක හරි, මේක හරි" කියලා. ඒකෙන් වැඩක් නැහැ. මම කියන්නේ, මැතිවරණ වේදිකාවේ ඔබතුමන්ලා පොරොන්දු වුණු විධියට, මැතිවරණයේදී ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ලියපු විධියට එම ප්‍රහාරයේ මහ මොළකරුවා පෙන්වන්න කියලායි. අන්න එතකොට රටේ මිනිස්සු කියයි, ඔබේ ආණ්ඩුව යුතුකම ඉටු කරපු ආණ්ඩුවක් කියලා. මේ රටේ සමස්ත කතෝලික ජනතාව විතරක් නොවෙයි, ජාත්‍යන්තරයේ කතෝලික ජනතාව විතරක් නොවෙයි, අනෙකුත් ආගම්වල ජනතාවත් කියන්නේ -බෞද්ධයන් වුණත් අපත් කියන්නේ- මේ වැරැද්ද නිවැරැදි කරන්න කියලායි; එතැන අඩු පාඩුව තිබෙන්නේ කොතැනද කියා පෙන්වන්න කියලායි. දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ නේ. ජනාධිපතිතුමා ඔබතුමන්ලාගේ, තුනෙන් දෙකකට එහා ගිය බලයත් ඔබතුමන්ලාගේ, පළාත් පාලන ආයතනත් ඔබතුමන්ලාගේ. ඕනෑ නම් හෙට අනිද්දාට පළාත් සභා ඡන්දයත් පවත්වන්න. පළාත් සභා නැතත්, පළාත් ආණ්ඩුකාරවරුන් ටික ඔබතුමන්ලාගේ. දැන් මොනවාද අඩු? ඔබතුමන්ලාට පුළුවන්, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න. ඉතින්, ඔබතුමන්ලා ක්‍රියාත්මක වෙන්න. ක්‍රියාත්මක නොවී ඉන්න එපා. ජනතාව ඒ දිහා බලාගෙන ඉන්නවා. එහෙම නොකර ඔබතුමන්ලා කියන්න ගත්තොත්, "අපි ඊළඟ අවුරුද්දේ කරන්නම්; ඊ ළඟ අවුරුද්දේ කරන්නම්" කියලා, ඒක කවදාවත් වෙන්නේ නැහැ. එහෙම වුණොත් බාලගිරි දෝෂය තමයි පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවා හොයා ගන්න එකටත් ඇති වෙන්නේ. ඔබතුමන්ලා මහ මොළකරුවා ගැන සොයන බව කියනවා; "මහ මොළකරු කවුද?" කිය කියා අහමින් ඉන්නවා. එතකොට මේකත් අර බටලන්ද කාරණය වාගේ වෙනවා.

බටලන්ද සිදුවීමට අදාළ කොමිෂන් සභා වාර්තාව පාර්ලිමේන්තුවට ගෙන ආවා. ගෙනැල්ලා විවාදයකුත් කළා. බටලන්ද වධකාගාරය සම්බන්ධ වාර්තාව පාර්ලිමේන්තුවට ගෙනාවා. අපි බලාගෙන හිටියා, ආණ්ඩුව බටලන්ද වධකාගාරය ගැන කථා කරයි, ආණ්ඩුව අනිවාර්යයෙන්ම ඒ වග කිව යුත්තන්ට විරුද්ධව ක්‍රියාත්මක වෙයි, කවුද ඒ බටලන්ද වධකාගාරය නිර්මාණය කළේ, කවුද එතැන සිටියේ, කාවද මැරුවේ, මරන්න උපදෙස් දුන්නේ කවුද ආදි සියල්ල ගැන සොයයි කියලා. ඒ සියල්ල ගැන සොයනවා කිව්වා. කෝ, ඒක කළාද? අද වනතුරුත් නැහැ; අදටත් නැහැ. අපි බලාගෙන සිටියාට ඒක කළේ නැහැ. මෙතැනදී කියනවා වාගේම ඒක කරන්නත් ඕනෑ.

ඊළඟට, බාර් පර්මිට් දුන්නාය කිව්වා. ලබා දී තිබුණු බාර් පර්මිට් 306ක නම් ටික ගෙනැල්ලා අපේ දිස්ත්‍රික්කයේ ඇමතිතුමා ඉදිරිපත් කළා; පොතක් හදලා දුන්නා. මම පාර්ලිමේන්තුවේදී ඇහුවා, "ඇමතිතුමා මේක හොඳයි. ඒ බාර් පර්මිට් නීත්‍යනුකූල නොවේ නම් ඒවාට මොකක්ද කරන්න ඕනෑ? කරුණාකර ඒවා අහෝසි කරන්න" කියලා. මොකක්ද සිද්ධ වුණේ? ඒවා ඔක්කෝම නීත්‍යනුකූලයි කිව්වා. අපි කිව්වා, අඩු ගණනේ ඒවා නිර්දේශ කරපු අය ගැනවත් කියන්න කියලා. ඒ බාර් පර්මිට් ගත්තු අය නම් ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්. කවුරු හරි මන්ත්‍රීවරයෙකු, කවුරු හරි ඇමතිවරයෙකු, කවුරු හරි ආසන සංවිධායකවරයෙකු ඒවා අරගෙන තිබෙනවා නම් ඒ මිනිහාගේ නම හරි කියන්න කිව්වා. ඒක කළේත් නැහැ. ඒ නිසා අපි ඔබතුමන්ලාට බොහොම පැහැදිලිව කියනවා, ඔබ ඔබේ වගකීම් ටික ඉටු කරන්න කියලා. ඒ වගකීම් ඉටු කරන්න කියන හේතුව මොකක්ද? මේ රටේ සමස්ත ජනතාවගෙන් වැඩි බහුතරයක් අප නොව මේ ආණ්ඩුව පත් කර ගත්තේ ඔබතුමන්ලා කියපු ඒ යුතුකම් ටික ඉටු කරවා ගන්නයි. අන්න ඒ යුතුකම් ටික ඉටු කරවා ගන්න තමයි ජනතාව ඒ තීන්දුව ගත්තේ. ඒ යුතුකම් ටික ඉටු කළොත් තමයි ඔබතුමන්ලාට ජනතාවගේ ප්‍රසාදය ලබන්න පුළුවන් වෙන්නේ.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම බොහොම පැහැදිලිව කියනවා, පොලීසියේ සුබසාධනය සම්බන්ධයෙන් යුතුකම් ඉටු කර තිබෙනවා වාගේම, පොලීසියේ සිටින පොඩි මිනිසුන් කෙරෙහි, පොලීසියේ රාළහාමි, සාජන් මහත්මයා, SI මහත්මයා, එතැනින් උඩ සිටින නිලධාරින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න කියලා. ඔවුන් තමයි පාරට වෙලා යුනිෆෝම් එක ඇඳගෙන රාජකාරි කරන්නේ. ඒ අයට සමහර වෙලාවට පැය 12කින්වත් යුනිෆෝම් එක ගලවන්න විධියක් නැහැ, පැය18කින් තමයි ගලවන්නේ.

පොලීසිවලට අලුතින් නිලධාරින් බඳවා ගන්න කටයුතු කරනවා කියලා තමුන්නාන්සේ කිව්වා. බඳවා ගන්න දැන් පුරප්පාඩු තිබෙනවා නේ. බඳවා ගැනීමේ කටයුතු කරනවා නේ. ඒ බඳවා ගැනීම් කරන්න. දැන් තුන්දෙනෙකුගේ රාජකාරි එක් නිලධාරියෙකු කරන තත්ත්වයක් තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, අපට වඩා හොඳට ඔබතුමා ඒ ගැන දන්නවා. ඒ නිසා එම නිලධාරින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලා, ඔවුන්ගෙන් වැඩි සේවාවක් ගන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Mrs.) A.M.M.M. Rathwaththe. You have 10 minutes.

Order, please! The Hon. Kins Nelson will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KINS NELSON took the Chair.*

[පූ.භා. 11.41]

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කර, ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ, අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමට ඉස්සෙල්ලා, වෙනත් කාරණයක් කියන්න මට හිතුණා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි දැන් කරගෙන යන මේ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ වැඩ පිළිවෙළට අත් දෙකම උස්සලා එකඟතාව පළ කරනවා, සහයෝගය ලබා දෙනවා කියලා. අපි ඒ මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි, එතුමන්ලා මේ රටේ රජ කරපු, ආණ්ඩු කරපු කාලයක් තිබුණු බව. ඒ කාලයේ රටේ ජනාධිපතිතුමා ගිහිල්ලා ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බදාගන්න කොට, ඒ අයට උම්මා දෙන කොට ඒ වෙනුවෙන් ඔය වාගේ විරෝධතාව ප්‍රකාශ කරලා ඒ ජාවාරම්කරුවන්ට විරුද්ධව වැඩ කළා නම් අද මේ රටේ මේ විධියට අයිස් ෆැක්ටරි සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නැහැ කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම බලාපොරොත්තු වෙනවා, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිළිබඳව කරුණු ටිකක් ඉදිරිපත් කරන්න. එකට පැවැති ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනය කරමින් සාමකාමී සුරක්ෂිත දේශයක් බිහි කිරීම අරමුණු කර ගනිමින් 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිහිටුවූවා. එම ගැසට් නිවේදනයේ සඳහන් "දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා" යන ශීර්ෂයට අදාළව මෙම අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමාජයට මහා පිළිලයක් වූ, බරක් වූ සංවිධානාත්මක අපරාධ මැඩලීම, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම, කාන්තා හා ළමා අපරාධ නැති කිරීම, අපරාධයකින් උත්පාදිත ධනය රජය සතු කර ගැනීම වැනි විශේෂ කරුණු හේතු කරගෙනයි මෙම අමාත්‍යාංශය ස්ථාපිත කළේ. මෙහිදී ජන ජීවිතය සමඟ සෘජුවම බද්ධ වී ඇති ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ගැන කථා කරනවා නම්, 1965 අංක 16 දරන පොලිස් ආඥාපනතට අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේදී මහ ජනතාවට ගුණාත්මක හා සංවිධානාත්මක සේවාවක් ලබා දීමේ අරමුණින් ශ්‍රී ලංකා පොලීසිය ආරම්භ කළා. වසර 158ක කාලයක් රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමත්, ජීවිත සුරක්ෂිත කිරීමත් වෙනුවෙන් භාරදූර වගකීමක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඉටු කළා. ඒ

[ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය]

වාගේම, මහ ජනතාවගේ සෑම අංශයකම ආරක්ෂාව සහතික කරමින්, සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීමේ පෘථුල වගකීම ශ්‍රී ලංකා පොලීසිය වෙත පැවරිලා තිබෙනවා. පොලිස් ස්ථාන 608කට වැඩි සංඛ්‍යාවක දවසේ පැය 24 පුරාම තම රාජකාරිය වෙනුවෙන් කැප කිරීම් කරමින් අධීක්ෂණ ශ්‍රේණිය, පරීක්ෂණ ශ්‍රේණිය, කනිෂ්ඨ ශ්‍රේණිය යන ශ්‍රේණි නියෝජනය කරමින් 85,000කට අධික පොලිස් නිලධාරින් පිරිසක් රාජකාරියේ නියැළෙනවා. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම හා බැඳුණු, අපරාධ මර්දනය කිරීම හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්දනය, රථවාහන පාලනය, පරිසර ආරක්ෂණය, අපරාධ අවස්ථාවලදී ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්ෂාව යන විශේෂ කාර්යයන් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සතු වෙනවා. මෙවැනි වූ විශාල වපසරියක රාජකාරි කරමින් ගමේ අස්සක් මුල්ලක් නැර, රැයක් දහවලක් නැතුව මහ ජනතාව වෙනුවෙන් රාජකාරි කරන මෙම නිලධාරින්ට අවුරුදු 5ක කාලයක් පුරාවට කිසිම නිල උසස් කිරීමක් ලබා දීලා නැහැ. නමුත් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වී පළමු වර්ෂයේම; ඒ කියන්නේ 2025 වර්ෂයට පමණක් අපි 4,447දෙනෙකු වෙනුවෙන් නිල උසස්වීම් ප්‍රදානය කර තිබෙනවා. ඒ අතර පොලිස් කොස්තාපල් තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුර දක්වා නිල උසස්වීම් ලබා දී තිබෙනවා.

ඒ අතරින්ුත් ස්ථිර පොලිස් පරීක්ෂකවරියන් 4ක්, එක් පොලිස් අධිකාරිවරියක්, උප පොලිස් පරීක්ෂකවරියන් 58ක්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් 23ක්, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් 140ක් ලෙස විශේෂ කරලාම දක්වන්න පුළුවන්. ඒ වාගේම පොලිස් කොස්තාපල් හා රියදුරු තනතුරු වෙනුවෙන් 2025 වර්ෂයට අදාළව 610ක් බඳවා ගැනීම් කර අවසන්. උප පොලිස් පරීක්ෂකවරුන් 100ක් බඳවා ගැනීම වෙනුවෙන් මේ වෙනකොටත් අපි සම්මුඛ පරීක්ෂණ කරමින් පවතිනවා. 2025 වසර වෙනුවෙන් 5,092ක් සහ 2026 වසර වෙනුවෙන් 5,000ක නව බඳවා ගැනීම් සිදු කිරීමට අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය මඟින් දැනටමත් අපට අනුමැතිය ලැබී අවසන්.

පොලිස් නිලධාරින් ගම්මානවල රාජකාරි කිරීමේදී ඔවුන් ඉතා අපහසුතාවට පත් වෙන කරුණක් තමයි, රාජකාරිය සිදු කිරීම වෙනුවෙන් අවශ්‍ය පහසුකම් නොමැතිවීම. අදාළ රාජකාරි ස්ථානයට යන්න වාහන නොමැතිකම. මේ අය පෞද්ගලික රථයෙන් ඒ රාජකාරි ස්ථානයට යන අවස්ථා අපේ ගම්බිම්වලට ආවොත් බලාගන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපි ඉන්දියානු ආධාර යටතේ single cabs 200ක්, යතුරු පැදි 100ක් හා ත්‍රි රෝද රථ 50ක් ගෙන්වීමට දැනටමත් කටයුතු සූදානම් කර අවසන්. ඔවුන්ගේ යටිතල පහසුකම් ඉතා අවම තත්ත්වයෙන් තමයි තිබෙන්නේ. පැය 12ක්, පැය 24ක් රාජකාරිය ඉෂ්ට කරලා විවේකය ලබා ගැනීම සඳහා නිල නිවාසයට ගියාම අවම පහසුකම් යටතේ තමයි ඔවුන්ට ඒ විවේකය ගන්න වෙන්නේ. ඔවුන්ට හොඳ මානසිකත්වයෙන් රැකියාව කරගෙන යන්න අපහසු වෙනවා, විවේකය නැතිව ගියාම. ඒ නිසා ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සමඟ නව නිල නිවාස 189ක් ඉදිකිරීම වෙනුවෙන් දැනටමත් වැඩ ආරම්භ කර අවසානයි. ඒ වාගේම ඔවුන්ගේ නිල ඇඳුම් අවශ්‍යතා වෙනුවෙන් රුපියල් 7,500 සිට රුපියල් 9,000ක් දක්වා මුදල් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 1,200ක් වෙන් කර තිබෙනවා. සපත්තු ලබා ගැනීම වෙනුවෙන් එක් අයෙකුට රුපියල් 7,000ක මුදලක් ලබා දීමට දැනටමත් කටයුතු කර තිබෙනවා. පොලිස් නිලධාරින් විශාල පිරිසකට විදේශ පුහුණුවීම් අවස්ථා ලබා දී තිබෙනවා. මෙය අඛණ්ඩව ඉදිරියටත් සිදු කිරීමට අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රටට, සමාජයට, තරුණ පරම්පරාවට පිළිලයක්, මහා හිසරදයක් වී ඇති මත් උවදුර නැති කිරීම වෙනුවෙන් අපි පසුගිය 30වැනි දා "රටම එකට" ජාතික මෙහෙයුම ආරම්භ කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ව්‍යාපාරය ආරම්භ කිරීමේදී වැඩියෙන්ම කලබල වෙලා ඉන්නේ, අපේ විපක්ෂයේ අය. අපි මත්ද්‍රව්‍ය ටොන් ගණන්වලින් අල්ලනකොට voice-cut මාෆියාව කරගෙන යන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු. මේ රට මත් උවදුරෙන් ගලවා ගැනීමේ ඒ වැයම කවුරු කොහොම කිව්වත් අපි නතර කරන්නේ නැහැ. එය අනිවාර්යයෙන්ම සිද්ධ කරනවා කියලා ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.51]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විසිවන සියවසේ ලොව වඩාත්ම ගෞරවනීය ආරක්ෂක චින්තකයෙකු වන එස්.පී. ජෝර්ජ් එෆ්. කෙනන් මෙසේ පවසනවා:

"තමන් වටා ඇති සියලු අනතුරු සඳහා සූදානම් නොවන ජාතියක්, ඒ ගැන වැටහීමක් නැති ජාතියක් නිසැකවම විනාශය කරා ළඟා වනු ඇත."

ඇත්තටම අපේ රටේ ආණ්ඩුවත් මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න අවශ්‍යයි. මට කලින් කථා කළ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරියත්, ආණ්ඩුව නියෝජනය කරන අනෙක් සියලු අය වාගේම ඉතා පැහැදිලිව පාතාලය, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය උවදුර දේශපාලනීකරණය කළා. මට මතකයි, ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔබ සියලුදෙනා එකතු වෙලා ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට ලොකු උත්සවයක් කළා. ඇත්තටම මේකට දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව සියලුදෙනාම එකතු වෙන්න ඕනෑ නම්, ඔබට ඉස්සෙල්ලාම කරන්න තිබුණේ විපක්ෂයේ අපටත් ආරාධනා කරන එක; විපක්ෂ නායකතුමාට ආරාධනා කරන එක. විපක්ෂය පැත්තකින් තියලා තමුන්නාන්සේලා ඒ වෙලාවේ උනන්දු වුණේ, ඒ වෙලාවේ උත්සාහ කළේ මේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විපක්ෂයට දමන්නයි. විපක්ෂය හින්දා තමයි මත්ද්‍රව්‍ය එන්නේ කියලා තමුන්නාන්සේලා ඉතා පැහැදිලිවම නිතරම දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කළා.

අපේ පොලීසිය භාර අමාත්‍යවරයා, රටේ නායකයා වන ජනාධිපතිවරයා හැම අවස්ථාවකදීම මන්තරය වාගේ කිව්වේ වෙන මොකක්වත් නොවෙයි, "පසුගිය ආණ්ඩුවේ දේශපාලනඥයන් තමයි පාතාලයට සම්බන්ධ. ඒ පාතාලයේ අය එකතු වෙලා තමයි මත්ද්‍රව්‍ය මේ රටේ ප්‍රචලිත කරන්නේ"

කියලායි. එතකොට අපි දිගින් දිගටම කිව්වා, ඒ අය කවුද කියලා නම් කරන්න කියලා. කවුද පාතාලයට සම්බන්ධ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු? මේ අය අපි හැමෝටම ඇඟිල්ල දිගු කරනවා. මේ රටේ ඉන්න ප්‍රධාන අමාත්‍යවරු, රටේ නායකයා, පොලීසිය භාර අමාත්‍යවරයා ඇතුළු තමුන්නාන්සේලා සියලුදෙනා ඉතා වගකීමෙන් කියනවා නම් දේශපාලනඥයන් මේවාට සම්බන්ධයි කියලා, ඒ අය විපක්ෂයේ නම්, ඒ අය කවුද කියලා නම් කරන්න. ඒ අය නීතිය හමුවට ගේන්න. ඒ අයට ලබා දිය හැකි උපරිම දඬුවම් අනිවාර්යයෙන් ලබා දෙන්න. ඒකට කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ. විපක්ෂයේ අපි සියලුදෙනා ඉතා පැහැදිලිව ඊට උපරිම සහයෝගය ලබා දෙනවා. මොකද, අපට මේ රටේ ජීවත් වෙන්න ඕනෑ. අපේ දරුවන්ට මේ රටේ ජීවත් වෙන්න ඕනෑ. කවුරු හෝ මේ වැරැද්දට සහයෝගයක්, ශක්තියක් ලබා දෙනවා නම්, අපි ඒකට විරුද්ධ වෙනවා. එම නිසා අපි ඉල්ලීමක් කරනවා. කරුණාකරලා මේක දේශපාලනීකරණය කරන්න එපා. මේ මත්ද්‍රව්‍ය උවදුර නැති කරන්න තමුන්නාන්සේලා දක්වන උනන්දුවට අපටත් ශක්තියක් ලබා දෙන්න පුළුවන් නම්, සහයෝගයක් ලබා දෙන්න පුළුවන් නම් අපි ලබා දෙනවා. හැබැයි, මේක මාධ්‍ය සංදර්ශනයක් බවට පත් වුණා. මේක විපක්ෂයට කරන චෝදනාවක් වුණා. කොටින්ම කිව්වොත්, පසුගිය කාලයේ කිව්වා දකුණේ දේශපාලනඥයන් මේවාට සම්බන්ධයි කියලා. දකුණේ දේශපාලනඥයන් කවුද කියලා කට ඇරලා කියන්න. මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාට වරප්‍රසාද තිබෙනවා නේ. පාර්ලිමේන්තුවේ කථා කළාට කාටවත් නඩු දමන්න බැහැ නේ. ඒ නිසා හරි තමුන්නාන්සේලා කියන්න, මෙන්න මේ අය තමයි මේවාට සම්බන්ධ කියලා. දැන් ඒ කථා පොඩ්ඩක් නතර වෙලා මාධ්‍යයට යම් ආකාරයක තහංචියක් දැම්මා, අර පෑලියගොඩ නගර සභාවේ මන්ත්‍රීවරියකගේ නිවසේ යම් මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් තිබිලා හසුවුණාම. එතකොට දේශපාලනීකරණය කරන එක පොඩ්ඩක් වෙනස් වුණා. ඊට පසුව දෙහිවල, තඹුත්තේගම තව සිද්ධි සිද්ධ වුණා කිව්වා. දේශපාලන පක්ෂවලත් යම් යම් අය ඉන්න පුළුවන් මේවාට සම්බන්ධ. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. එහෙම පුද්ගලයෙක් දේශපාලන පක්ෂයක ඉන්නවා නම්, ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නයි තිබෙන්නේ. එහෙම නැතිව ඒ පුද්ගලයන් ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද, අහවලාට ටෙලිෆෝන් කෝල් අරගෙන තිබෙනවාද කියන ඒවා නොවෙයි වැදගත් වෙන්නේ. ටෙලිෆෝන් කෝල් ගත්ත කවුරු හෝ ඉන්නවා නම්, ඒ අයටත් නීතිය ක්‍රියාත්මක කරන්න.

ඒ වාගේම මම මේ වෙලාවේ තමුන්නාන්සේලාට විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දැන් අපට පෙනෙනවා, මේ ආණ්ඩුව උත්සාහ කරනවා පොලීසිය දේශපාලනීකරණය කරන්න. පොලිස් කොමිසමටත් යම් යම් බලපෑම් කරනවා කියන එක අපට පැහැදිලියි.

පොලිස් ස්ථානාධිපතිවරුන් ස්ථාන මාරු කිරීම සඳහා පොලිස් කොමිසමට තිබුණු බලය පොලිස් කොමිසමෙන් ඉවත් කරන්න හදන කොට, ඒ පිළිබඳව ඉතා පැහැදිලි විවේචනයක් අපට තිබෙනවා. අනුර කුමාර දිසානායක ජනාධිපති වෙන්න කලින් එතුමා විපක්ෂයේ සිටිද්දී ඒ පිළිබඳව දිගින් දිගටම කථා කළා. පොලිස් කොමිසම ශක්තිමත් කරන්න ඕනෑ කිව්වා. පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ස්ථාන මාරුවීම් ඉතා පැහැදිලිව පොලිස් කොමිසමේ නිර්දේශය අනුව ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන විශ්වාසයෙන් තමයි එතුමා විපක්ෂයේ සිටියදී කථා කළේ. හැබැයි, අද තමුන්නාන්සේලා ආණ්ඩුවට ඇවිල්ලා, පොලිස් කොමිසමේ බලයත් ඉවත් කරන්න හදනවා. ඒක අනීතික දෙයක් නොවෙයි, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල දෙයක් කියලා කියන්න එතැනදී තමුන්නාන්සේලා උත්සාහ කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නොයෙක් දේවල් කරන්න පුළුවන්. විධායක ජනාධිපති ක්‍රමයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන දෙයක් නේ. හැබැයි, තමුන්නාන්සේලා ඇවිල්ලා තිබෙන්නේ, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න නේ. එතකොට ඒක ගැටලුවක් නැද්ද? මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් අඩු පාඩු තිබෙනවා නේ. ඒක නිසා නේ, තමුන්නාන්සේලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්න මේ රටට පොරොන්දු වුණේ. එතකොට ව්‍යවස්ථානුකූලව අනවශ්‍ය දේවලුත් කරන්න හැකියාව තිබෙනවා. ඒ නිසා, කරුණාකරලා පොලීසිය දේශපාලනීකරණය කිරීම, පැලවත්තට ඕනෑ විධියට කටයුතු කරන එක නතර කරන්න. අද අපිට ඉතා පැහැදිලිව ඒ ගැටලුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය පමණක් නොවෙයි, අද හැම රාජ්‍ය ආයතනයක්ම පැලවත්තට ඕනෑ විධියට මෙහෙයවන්න උත්සාහ කරනවා. ඒ විතරක් නොවෙයි. දැන් පැලවත්තට හොඳ ආරක්ෂාවකුත් ලබා දීලා තිබෙනවා. ඔබතුමන්ලාගේ මහ ලේකම්තුමා වන ටිල්වින් සිල්වා මැතිතුමාටත් හොඳ ආරක්ෂාවක් ලබා දීලා තිබෙනවා. ඒක හොඳයි. ඒ ආරක්ෂාව ලබා දෙන්න, ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. හැබැයි, එතකොට මේ විපක්ෂය නියෝජනය කරන මහජන නියෝජිතයන්ට මොකද වෙන්නේ? මෙතුමන්ලා මහජන නියෝජිතයෝ නොවෙයිද? මහජන නියෝජිතයෝ නොවන අයට ආරක්ෂාව දෙනවා නම්, එහෙම නැත්නම් රජයේ ආයතනයක් නොවන පැලවත්ත කාර්යාලය වාගේ තැන්වලට ආරක්ෂාව දෙනවා නම්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ මහජන නියෝජිතයන්ට ආරක්ෂාව දෙන්න බැරි ඇයි? තමුන්නාන්සේලා ඒක අමතක කරලා තිබෙනවා.

අපි ඊයේත් දැක්කා, තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් ත්‍රිකුණාමලයේදී බොහොම අමාරුවෙන් තමයි ගුටි නොකා එළියට පැන්නේ; ජීවිතය බේරා ගත්තේ. එතුමා එතැනට ගියේ යහපත් චේතනාවෙන් වෙන්න පුළුවන්. නමුත්, එතුමාට ආරක්ෂාවක් තිබීම වැදගත්. ඒක වරප්‍රසාදයක්, මහා දෙයක් නොවෙයි. තමුන්නාන්සේලා එදා කරන්නේ නැහැ කියපු ඔක්කොම අද කරලා තිබෙනවා නේ. එදා කිව්වා, වැටුප් ගන්නේ නැහැ කියලා. දැන් වැටුප් ගන්නවා. එදා කිව්වා, නිවාස ගන්නේ නැහැ කියලා. දැන් නිවාස ගන්නවා. එදා කිව්වා, "වාහන එපා, අපි බස් එකේ, කෝච්චියේ යනවා" කියලා. දැන් ඒවාත් ගන්නවා. එපා කියපු දේවල් ඔක්කොම දැන් අරගෙන තිබෙනවා. ඒ නිසා දැන් විපක්ෂයේ අපි කියන දේත් කරන්න. එතකොට තමුන්නාන්සේලාටත් ලජ්ජාවක් නැතිව ඉන්න පුළුවන් නේ. ඉතා පැහැදිලිව මම කියන්න ඕනෑ, ආරක්ෂාව කියන්නේ වරප්‍රසාදයක් නොවෙයි කියන එක. පාතාලයට, කුඩුවලට, මත්ද්‍රව්‍යවලට එරෙහිව, ඒ වාගේම ආණ්ඩුව යම් වැරැද්දක් කරලා තිබෙනවා නම්, ඒ ආණ්ඩුවට විරුද්ධව පාර්ලිමේන්තුවේ නියෝජිතයෙකුට කොන්ද කෙළින් තියාගෙන කථා කරන්න පුළුවන් ශක්තිය ලබා දෙන්න. තමුන්නාන්සේලාට ඕනෑ නැහැ. මම දන්නවා, එදා විපක්ෂයේ සිටිද්දීත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් ආරක්ෂාව ගත්තේ නැති බව. මොකද, එතුමන්ලාට වෙනම ආරක්ෂාව සලසා තිබෙනවා. ලොක්කා යනකොට මෝටර්සයිකල් යනවා. තමුන්නාන්සේලාගේ සන්නද්ධ ව්‍යාපාරවල අත්දැකීම් එක්ක, තමුන්නාන්සේලාට එහෙම ආරක්ෂාව සපයා ගන්න පුළුවන් ඇති. නමුත්, අනෙක් අයට එහෙම නැහැ. අපිට තිබෙනවාද, සන්නද්ධ බළකායක්? නැහැ, ඒක නිසා කිසිසේත්ම මේක වරප්‍රසාදයක් කියලා තමුන්නාන්සේලා හිතන්නවත් එපා.

ඒ වාගේම තමයි බුද්ධි අංශය. අපි බුද්ධි අංශය ආරක්ෂා කරන්න ඕනෑ. ඒ, බුද්ධි අංශවල විස්තර දේශපාලන රැස්වීම්වලදී කියන එක සුදුසු නැහැ.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

එහි යම් අඩුපාඩුවක් තිබෙනවා නම් ඒවා නිවැරදි කිරීම ගැන කිසි ගැටලුවක් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා දේශපාලන වේදිකාවක් ගාණේ, "බුද්ධි අංශයට මෙච්චර වියදම් කළා, මෙයාට මෙච්චර වියදම් කළා" කියලා කියන එක හරිම ළාබාල, බොළඳ ක්‍රියාවක්. ඒ නිසා යම් වැරැද්දක් ගැටලුවක් තිබෙනවා නම්, ඒ පිළිබඳව තමුන්නාන්සේලා අභ්‍යන්තරව සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරව ක්‍රියාත්මක වෙන්න. නමුත්, දේශපාලන වේදිකාවලට මේවා ගෙන යන්න එපා.

විශේෂයෙන්ම මේ කාරණයත් තමුන්නාන්සේලාට මම කියන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, පොලීසිය නවීකරණය කරන්න අවශ්‍යයි. බුද්ධි අංශය නවීකරණය කරන්න අවශ්‍යයි. ඒ වාගේම අද පොලීසියට සාධාරණ නියෝජනයක් ගෙන එන්න ඕනෑ. විශේෂයෙන්ම කාන්තාවන්ට. අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. නමුත්, පොලීසිය තුළ කාන්තා නියෝජනය ඉතා අඩුයි. ඒ වාගේම, පොලීසිය තුළ උසස්වීම් සම්බන්ධයෙන් ලොකු ගැටලු තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නඩු දාලාත් තිබෙනවා කියලා අපිට ආරංචියි. පොලීසියේ තිබෙන මේ ගැටලු සම්බන්ධයෙන්, විශේෂයෙන්ම කාන්තා නියෝජනය පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. ඒක අපට කියන්න පුළුවන් positive discrimination කියන එක. කාන්තාවන්ට වැඩි අවස්ථාවක් ලබා දෙන විධියට තමුන්නාන්සේලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් හොඳයි.

ඒ වාගේම තමයි පොලීසිය තුළ ද්‍රවිඩ, මුස්ලිම් නියෝජනය. අපේ රටේ ජනගහනයට අනුව අපේ පොලීසියට මීට වඩා ද්‍රවිඩ පොලිස් නිලධාරින්, මුස්ලිම් පොලිස් නිලධාරින් සිටිය යුතුයි. ඒකට අවශ්‍ය positive discrimination එක, ඒ අවශ්‍ය ප්‍රමාණය අනුව ඒ ගැන අවධානය යොමු කරන්න තමුන්නාන්සේලාට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. මේ අවස්ථාවේදී අපි ඉතා පැහැදිලිව කියන්නේ මේකයි. අපේ රටේ පොලීසිය දේශපාලනීකරණය කිරීම කරුණාකර අවසන් කරන්න. මේක ශ්‍රී ලංකා පොලීසිය මිස, ජනතා විමුක්ති පෙරමුණේ පොලීසියවත්, එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණට පමණක් සීමා වූ පොලීසියක්වත් නොවෙයි. මේක ශ්‍රී ලංකා පොලීසිය. ඒ ශ්‍රී ලංකා පොලීසියේ ගෞරවය රැක දෙන ආකාරයට කටයුතු කරන්න කියා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.04]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)**
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි විවාද කරන්නේ වැදගත් විෂය පථයක් සම්බන්ධවයි. පොලීසිය ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ආයතන සම්බන්ධයෙන් තමයි අද කථා කරන්නේ. මම ආරම්භයේදීම පොලීසිය භාර ඇමතිවරයාගේ අවධානය යොමු කරවනවා, ත්‍රිකුණාමලයේ ඇති වූ ප්‍රශ්නය පිළිබඳව. මේ සිදුවීම සම්බන්ධයෙන් ක්‍රියා කරපු ආකාරය පිළිබඳව ඔබතුමාගේත් අවධානය යොමු වෙලා ඇති. ඔබතුමා රූප රාමු තුළින් දකින්න ඇති, එම ස්ථානයේ මොනවාද වුණේ කියලා. එහිදී ක්‍රියා කරපු ආකාරය ගැන බලද්දී එතැන professional approach එකක් නැහැ කියලායි මම හිතන්නේ. ඇමතිතුමා දකින්න ඇති, එම ස්ථානයට SSP මහත්මයා ගිහිල්ලා කටයුතු කරපු ආකාරය. එතැන හිටපු ස්වාමීන්වහන්සේලා නීතිය සම්බන්ධයෙන් එතුමාට පහදලා දුන්නා. මේ ගැන නඩු තීන්දුවක් තිබෙන්නේ කොහේද, Coast Conservation and Coastal Resource Management Department එක මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා තිබෙන්නේ කොහේද කියලා අහනවා. SSP මහත්මයා කියනවා, හෙට වෙනකොට අපි මේක ඉවත් කර ගන්නවා කියලා. යුද කාලයේත් එම ප්‍රදේශයේ සිංහල බෞද්ධ ජනතාව විසින් ආරක්ෂා කර ගනිමින් දිගටම පවත්වාගෙන ආපු පන්සලක්, මේක. එවැනි තත්ත්වයක් පවතිද්දි, කිසිම අධිකරණ තීන්දුවක් ලැබිලා නැහැ.

ඇමතිවරයා මේ සභාවට ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා, පිළිම වහන්සේ ආරක්ෂා කරන්නයි අරගෙන ගියේ කියලා. පොලීසිය ඇවිල්ලා කියනවා, 'මේ පිළිම වහන්සේ අපි හෙට වෙනකොට ඉවත් කරනවා' කියලා. ඊට පස්සේ ඊළඟ දවසේ පිළිම වහන්සේ ආපහු පන්සලට වැඩම කරවනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන ආකාරයට හාමුදුරුවෝ දෙනමකට ඉස්පිරිතාලේ ඉන්නම නෙළලා. ස්වාමීන් වහන්සේලාට ගහලා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අනවශ්‍ය ප්‍රශ්නයක් මේ තුළින් නිර්මාණය වෙලා තිබෙනවා. මේක නිරාකරණය කර ගන්න තිබුණා. ප්‍රාදේශීය සභාව ඇතුළු අනෙකුත් ආයතනත් ගෙනැල්ලා කථා කරලා මේ සම්බන්ධයෙන් විසඳුමක් දෙන්න තිබුණා. මහජන කැලඹීමක් ඇතිවෙයි කියලා, මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තමයි පොලීසිය එන්නේ. එතැන කිසිම කැලඹීමක් නැහැ. ස්වාමීන් වහන්සේලා අහනවා, මොකක්ද කැලඹීම කියලා. කොහේද කැලඹීම? මුතුකුඩය කැඩෙන්න ගහපු එක තමයි කැලඹීම. හාමුදුරුවෝ ළඟට එනකොට කිසිම කැලඹීමක් නැහැ; පාර්ශ්ව දෙකක් නැහැ. කොහෙන් හරි පැමිණිල්ලක් ඇති. මේක ඉතාම සාමාන්‍ය දෙයක්. හැබැයි, පොලීසියෙන් විශාල ප්‍රමාණයක් ගෙන්වලා ස්වාමීන් වහන්සේලාට ගහලා තිබෙනවා. මේක සිංහල බෞද්ධ රටක්.

ඒ ගැන අපට කතිකාවක් නැහැ. හැබැයි, මම හිතන විධියට අනෙකුත් ආගම් අදහන අයටත් ආදරෙන් සලකන එක තමයි අපේ බෞද්ධකම කියන්නේ. හමුදාවේ හිටපු, අපේ ජාතික ආරක්ෂාව භාරව ඉන්න ගරු අරුණ ජයසේකර මැතිතුමාත් ඒක පිළිගන්නවා ඇති. එහෙම නේද? ඉස්ලාම් භක්තිකයන්ට මෙන්ම අනෙකුත් සියලු ආගම් අදහන අයට අපි ආදරෙන් සලකන්න ඕනෑ. ඒකට තමයි සිංහල බෞද්ධකම කියන්නේ. එහෙම නැතුව වෙන අයිතියක් ගන්න නොවෙයි. ඒක අපට තිබෙන හොඳ ගතිගුණයක්. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, නමුත් ඔබතුමාට අවස්ථාවක් ලබා දෙන්නේත් නැහැ. ඊයේ හමුදාව නියෝජනය කරමින් ආ අයගෙන් ඔබතුමා ගැන මම ඇහුවා. ඔබතුමාට යම් දැනුමක් තිබෙනවා. අපි අසාධාරණ වෙන්නේ නැහැ. ඔබතුමාට "බංකු-බංකු" කියලා නමක් පටබැඳුණා, ඔබතුමා ඒ වෙලාවේ කිව්ව දේ සම්බන්ධයෙන්. මම හිතන විධියට, අතිශයෝක්තියෙන් ඔබතුමා කථා කළා, ආරක්ෂාව කියන එක එච්චර ලෙහෙසි නැහැ කියලා. එතැනදි වැරදුණාට ඔබතුමාට යම් දැනුමක් තිබෙනවා. ඔබතුමාට හොඳ නමක් තිබෙනවා. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. අපි විපක්ෂයේ හිටියාට, ඔබතුමාට එහෙම පහර ගහන්නේ නැහැ. හැබැයි, ඔබතුමාට කථා කරන්නවත් අවස්ථාවක් දෙන්නේ නැහැ. ඔබතුමා කියනවා, පක්ෂයෙන් කථා කරන්න දෙන්නේ 10දෙනෙකුට, 11දෙනෙකුට, අපට ඒ වාගේ අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ කියලා. නමුත් ඔබතුමාගෙන් හරි උපදෙසක් ගන්න තිබුණා නේ, මේ සම්බන්ධයෙන් දැනුමක්, හැකියාවක් තිබෙන පුද්ගලයෙක් වශයෙන්.

පොලීසිය භාර ඇමතිවරයාගේ ක්‍රියාකලාපය ඇත්තටම බින්දුවයි. එතුමා එක දවසක එකක් කියනවා, තව දවසක තව එකක් කියනවා. විශේෂයෙන්ම මේ පිළිම වහන්සේ ඉවත් කිරීමේ කාරණය සම්බන්ධයෙන් මීට වැඩිය ඔළුව පාවිච්චි කරලා වැඩ කරන්න තිබුණා. එහෙම වැඩ කළා නම්, මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. අර කිව්වා වාගේ ජාතිවාදී ප්‍රශ්නයක් දැන් පැන නැඟෙනවා. පොඩ්ඩ පොඩ්ඩ එහාට මෙහාට අදහස් දැක්වෙනවා. මේක ඇති වෙන්න තිබුණු දෙයක් නොවෙයි. අපි මේ ගැන කථා කරනකොට අපට විරුද්ධව සමහර විට දෙමළ මන්ත්‍රීවරයෙක් කථා කරන්න පුළුවන්. එතකොට ඒ අයත් එක්කත් යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඉතින් මේක කොහේවත් නැති අනවශ්‍ය ප්‍රශ්නයක්. මොකද, මේ ස්ථානයට අදාළව ඔප්පු, අණ පනත්, ඒ වාගේම දීමනා පත්‍ර තිබෙනවා. ඒ හාමුදුරුවෝ නීත්‍යනුකූලව මේ සම්බන්ධයෙන් ඇපැල් අධිකරණයේ නඩුවකුත් දාලා තිබෙනවා. එතකොට මේ කාරණයේදී ඉතාම සන්සුන්ව කටයුතු කරන්න තිබුණා. මේවා එන්නේ කොහෙන්ද? මෙහෙම වෙන්නේ ආගම්වලට ගරු කරන්නේ නැති නිසාද? මේ නායකයින් තුළ ආගම් ගැන තැකීමක් නැති නිසාද? වටගල මහත්තයා මේ ගැන දන්නවා. එතුමා හොඳ නීතිඥයෙක්. *[බාධා කිරීමක්]* උත්තර දෙන්න එපා; උත්තර දෙන්න එපා. ඔබතුමා මගේ දිහා බලපු නිසායි මම ඒක කිව්වේ. මේ ප්‍රශ්නය කළමනාකරණය කරපු ආකාරය ඉතාම වැරදියි. *[බාධා කිරීමක්]* මට උත්තර දීලා හරියන්නේ නැහැ. ජනතාවට උත්තර දෙන්න ඕනෑ. දැන් පාරට ගිහිල්ලා බලන්න, මිනිස්සු මොනවාද කියන්නේ කියලා. මේ යන ක්‍රියාවලිය මොකක්ද? දෙහිවල ප්‍රදේශයේ ඇති වූ සිද්ධියෙන් තමයි මේ ප්‍රශ්නය පටන් ගත්තේ. මේ ප්‍රශ්නයෙන් ඔබතුමන්ලාගේ නිරාගමික මූල බීජය එළියට එනවා. මේ නිසා අනාගතයේ විශාල ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. මෙහිදී පොලීසිය භාර ඇමතිවරයා මොන ආකාරයෙන් ක්‍රියා කරනවාද කියන එක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා එක දවසක එකක් කියනවා, තව දවසක තව එකක් කියනවා. ඒ කියන අදහස් එකිනෙකට ගැළපෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩු ප්‍රශ්නය ගැන කථා කළොත්, ඉස්සෙල්ලාම පහර ගහගෙන ආවේ දේශපාලනඥයන්ට, එතුමාගේ කටේම තිබුණේ දේශපාලනඥයන් මේවාට සම්බන්ධයි කියලා. ඊට පස්සේ දේශපාලනඥයන්ගේ නමක්වත් කිව්වේ නැහැ. අන්තිමටම දේශපාලනයට සම්බන්ධ 6දෙනෙක් අහුවෙනකොට - අන්තිම 6දෙනාම පෝලිමේ මාලිමාවේ අය - පොලිස්පතිවරයා කියනවා, මේක ගැන දැනුවත් කරන්න එපා, මේවා ප්‍රවෘත්තිවලට - newsවලට - දෙන්න එපා කියලා. එහෙම කියලා ගහනවා, චක්‍රලේඛයක්. ඊට පස්සේ පොලීසිය භාර ඇමතිවරයාම කියනවා, එහෙම එකක් නැහැ, ඒ තොරතුරු මාධ්‍යයට දෙන්න පුළුවන් කියලා. ඇත්තටම මේ අය යන්නේ රිවර්ස් න්‍යායේ. මේ ආණ්ඩුව යන්නේ facebook එකේ. Facebook එකේ වැඩිපුර බලන්නේ මොකක්ද කියලා බලනවා, ඒකට පහර ගහනවා. ඒක රිවර්ස් වෙනවා නම්, ඒක රිවර්ස් කරනවා. එහෙම නැත්නම් ඒක කරගෙන යනවා. ඉතින් මේ ආකාරයෙන් තමයි කුඩු සම්බන්ධයෙන් කටයුතු කරන්නේත්. මන්ත්‍රීවරියක් කියනවා මම දැක්කා, කුඩු ජාවාරම අවසන් කරනවා නම්, අපි ඒකට උපරිම සහයෝගය ලබා දෙනවා කියලා. හැබැයි, මේක ඔබතුමන්ලා හොඳට හිතේ තියාගන්න ඕනෑ. වැඩියෙන්ම කුඩු එන්න පටන් ගන්නේ මේ කාලයේ. ඒ, ඔබතුමන්ලාගේ වරදින් නොවෙයි. මේකෙදි transit position එකක් විධියටයි ලංකාව පාවිච්චි වන්නේ. මම ඔබතුමාට එදාත් කිව්වා. කොලොම්බියාවේ, මෙක්සිකෝවේ, ඇමෙරිකාවේ තිබෙන FBI, DEA කියන ඔක්කෝම ආයතන යෙදෙව්වත් සියයට 5යි අහුවෙන්නේ. කුඩු විශාල ප්‍රමාණයක් අහුවෙන්නේ නැහැ. මේ අය පුනරුත්ථාපනය කරන්න ඕනෑ.

මම අනුර කුමාර මහත්තයාගේ කථාවක වීඩියෝ එකක් දැක්කා, එතුමා මේ සම්බන්ධයෙන්ම අදහස් ප්‍රකාශ කරන. එතුමා මේ කුඩු සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂයේ ඉන්නකොට මෙහෙම කියලා තිබෙනවා. අහගන්න.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
*(இவ்வேளையில் ஒலிப்பதிவொன்று ஒலிக்கச் செய்யப்பட்டது.)*
*(At this stage, an audio recording was played.)*

ඔන්න, ජනාධිපතිතුමා විරුද්ධ පක්ෂයේ හිටපු කාලයේ කිව්ව අයිස් නාටකය. නියෝජ්‍ය ඇමතිතුමා හිනාවෙනවා. මේ කථාව තමයි එතුමා විරුද්ධ පක්ෂයේ ඉන්නකොට කිව්වේ, ඔබතුමාගේ අයිස් නාටකය ගැන. දැන් ඔබතුමාට පෞද්ගලිකව අඬගහලා කිව්වාද දන්නේ නැහැ, මොකක්ද මේ නාටකය, මේ නාටකය ඉවරයි කියලා. දැන් ඒකම ආපහු කරනවා. දේශපාලන වශයෙන් වාසියක් ලබා ගන්න, වෙන කිසිම දෙයක් නැති වනකොට අද ආණ්ඩුවට විළි වහගන්න තිබෙන්නේ, පොලීසියයි, CID එකයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමයි.

මෙච්චරයි තිබෙන්නේ. ආණ්ඩුවේ දේශපාලනඥයෙක් සම්බන්ධ නම් ඔබතුමන්ලා සලකන්නේ පූස් පැටවුන්ට වාගේයි. අරුණ ජයසේකර මහත්මයා, ඔබතුමා හමුදාවේ හිටපු හොඳ නිලධාරියෙක් නිසා මේවා ගැන සලකා බලන්න. මේක ඔබතුමාට අදාළ වන්නේ නැහැ. ඒ වුණාට ආණ්ඩුවට සම්බන්ධ අය හොරු ඔප්පු හදනවා නම්, කන්ටේනර් හොරෙන් ගෙනෙනවා නම් මොකක්ද වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩු සම්බන්ධ සිද්ධිය බලන්න. අන්තිම මාසයේ අල්ලපු හයදෙනාම මාලිමාවේ. කන්ටේනර් තුන්සිය ගණනක් එළියට ආවා. අපි දන්නේ නැහැ, ඒවායේ මොනවාද ආවේ කියලා. අර්චුනා මන්ත්‍රීතුමා කියනවා, ඒවායේ ආයුධ තිබුණා කියලා. කොහොමද මේවා ආවේ? මේ සම්බන්ධයෙන් යම් අදහසක් වාර්තාවේ දීලා තිබෙනවා, නීති විරෝධී භාණ්ඩ විශාල ප්‍රමාණයක් මේවායෙන් එන්න ඇති කියලා. ඒ සම්බන්ධයෙන් ගස් බඳින්න එපායැ, ඇමතිවරුන් ගෙනැල්ලා, නිලධාරීන් ගෙනැල්ලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, CID එක ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන්න එපායැ. එතකොට ඉන්නේ බබාලා වගේ නේ. නමුත් අපි කථා කරනකොට ඔබතුමන්ලා අපට පහර ගහනවා. නමුත් කිසිම චෝදනාවක්, කිසිම අපරාධමය වරදක් නැහැ. ඒ වුණාට අපට නඩු දමනවා, CID එකෙන් ඇවිත් ගෙදර වට කරනවා, නැති නාඩගමක් නැහැ. ඒවාට රුපියල් ලක්ෂ 500කට, 1,000කට වැඩිය වියදම් කරනවා. විරුද්ධ පක්ෂයේ අයට නම් එහෙමයි කටයුතු කරන්නේ. නඩු හදනවා. හැබැයි, ආණ්ඩු පක්ෂයේ අය හොර ඔප්පු ලියන ඒවාට විරුද්ධව අධිකරණය ක්‍රියාත්මක කරන්න කිව්වාම, CID එකට අඬ ගහන්නේවත් නැහැ. යම් යම් චෝදනා තිබෙන නිලධාරීන් දෙන්නෙක් තුන්දෙනෙක් සිටියාට, දැන් හුඟක් අය යම් කිසි විධියකට යම් line එකකට යනවා, මේ අන්තිම මාසය, මාස එකහමාර තුළ. අපි බලාපොරොත්තු වනවා, එම නිලධාරීන් කොන්ද කෙළින් තබාගෙන, දේශපාලන ගැත්තන් බවට පත් නොවී කටයුතු කරයි කියලා. මොකද, මේ අය මාරු වෙනවා. ඔය ආණ්ඩු මාරු වෙනවා. තමන්ගේ තනතුරු මාරු වෙනවා. ඒ නිසා නීති විරෝධී වැඩ කරන්න එපා. විශේෂයෙන්ම මම ඒකයි කියන්නේ.

අපි කවදාවත් නීති විරෝධී වැඩ කරලා නැහැ. අපි කෙළින් කථා කරනවා. කොයි නායකයා හිටියත්, මොන ආණ්ඩුවේ හිටියත් අපට ඒ ශක්තිය තිබෙනවා. අපේ තාත්තලාගෙන් ලැබුණු ඒ කොන්ද අපට තිබෙනවා. ආණ්ඩු පක්ෂය - විපක්ෂය විධියට අපි මාරු වුණාට, අපට ඒ ශක්තිය තිබෙනවා. මට පෙනෙනවා, සමහර මන්ත්‍රීවරුන් හිනාවෙනවා. ඒ අයගේ පැටිකිරිය ගත්තොත් එහෙම බලන්න පුළුවන් කොහොමද කියලා. අපි ඒ අය කවුද කියලා දන්නේ නැහැ. බොහෝ වෙලාවට පාපිසි. පාපිසි ගැන අපි දන්නේ නැහැ.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

විශේෂයෙන්ම අපි ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, Clean Sri Lanka වැඩසටහන සම්බන්ධව. Clean Sri Lanka කියලා එකක් පටන් ගත්තා. ඒකට කීයක් වියදම් කළාද? අර අහිංසක මිනිස්සුන්ගේ ත්‍රීවීලර්වලයි, බස්වලයි කැලි ගැලෙව්වා. ඒ මිනිස්සු ආදරයෙන් තමන්ගේ වාහන පාවිච්චි කළේ. ඒ අය කරදරයක් නැති මිනිස්සු. මේ ගැන පොඩ්ඩක් සොයා බලන්න. ඒ අය ත්‍රීවීලර් එක ලස්සනට තියාගන්නයි එහෙම කළේ. ඒකෙන් සමාජයට කිසිම අවහිරයක් නැහැ. මම දැක්කා, ලස්සනට තිබුණු බස්වල කැලි ගලවනවා. ඕකද, රටේ තිබෙන ප්‍රශ්නය? නීතියට වසන්වෙලා ආණ්ඩුවට සම්බන්ධ ව්‍යාපාරිකයෝ, හොරු, මංකොල්ලකාරයෝ කොච්චර ඉන්නවාද? ඔබතුමන්ලා ඔය එක ලොකු ව්‍යාපාරිකයෙක් ඇල්ලුවාද? ලංකාවේ දූෂණය සම්බන්ධයෙන් target කරන්නේම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්; විරුද්ධ පක්ෂයේ දේශපාලනඥයෝ. දැන් රටේ ඉන්න ප්‍රධාන ව්‍යාපාරිකයෝ කොච්චර දූෂණවලට, වංචාවලට සම්බන්ධ වෙලා තිබෙනවාද? නමුත් ඒ එක්කෙනෙක්වත් ඇල්ලුවාද? ඒ ඔක්කෝම අනුර කුමාර මහත්තයාගේ යාළුවෝ. අද ඉන්න ලොකු ව්‍යාපාරිකයන් අනුර කුමාර මහත්තයාගේ යාළුවෝ.

ඊළඟට, මම ජාතික ආරක්ෂාව සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මම හිතන විධියට හමුදාවට තිබෙන්නේ කුඩම්මාගේ සැලකිලි, අරුණ ජයසේකර මැතිතුමනි. මේක ඔබතුමාගේ වරදක් නොවෙයි. අපි අමාරු තැනක ඉන්නේ. මම දන්නවා, රට අමාරු තැනක තිබෙන්නේ කියලා. හැබැයි, අපි හමුදාවට අවශ්‍ය නවීන තාක්ෂණය ලබා දිය යුතුයි. නමුත් ඒ නවීකරණය, ඒ දියුණු තාක්ෂණය අපි ඔවුන්ට දීලා නැහැ. 2009දී යුද්ධය අවසන් වුණා. එදායින් පසුව හමුදාව එතැනමයි. ත්‍රිවිධ හමුදාව එන්න එන්නම පහළට යනවා. මේක ඔබතුමාට තනියෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි.

අපට දිගින් දිගටම පහර වදිනවා, UN resolution එකක් එනකොට. හැබැයි නියෝජ්‍ය ඇමතිතුමනි, ඒකට විරුද්ධ වෙන්න vote එකකටවත් අපට යන්න බැරි වුණා. අපි වෙනුවෙන් කථා කරන්න කවුරුවත් නැහැ. ඒකෙන් අපි නිකම්ම පැරදුණා. අපේ රට වෙනුවෙන් අනෙක් රටවල නායකයන්ට කථා කරන්න අවස්ථාව තිබුණා. හැබැයි, එහෙම කළේ නැහැ. අපි දූෂිත රටක් විධියට හංවඩු ගසා, අපි අන්‍ය ආගමිකයන්ට, අන්‍ය ජාතීන්ට සලකන්නේ නැහැ කියලා, අපි ඒ අයට පහර දුන්නා කියලා එම resolution එක එහෙමම සම්මත වුණා. මොකක්ද, මේ ආණ්ඩුව? එම resolution එකෙන් දැන් අපේ හමුදාවට එන ප්‍රශ්න ගැන බලන්න. බොහෝ ප්‍රශ්නවලට මුහුණපාන්න වනවා. ඔබතුමන්ලා මේ සම්බන්ධව අවධානය යොමු කරන්න. අපේ හමුදාවේ විශාල පිරිසක් සිටිනවා තමයි. එම පිරිස අඩු කර ගන්න ඕනෑ. එහෙම නම් ව්‍යාපාරවලට හමුදාව යොදවන්නේ කොහොමද, පිටරට දේවල් සම්බන්ධයෙන් හමුදාව යොදවන්නේ කොහොමද කියා සොයා බලන්න.

ඒ වාගේම මම එක කාරණයක් පොලිස්පතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබතුමා කියනවා, අපි දේශපාලනය ගැන කථා කරනවා ලු. පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවල යම් යම් සංවිධායකවරුන් තමන් හඳුනන අය පත් කරගන්න ඇති. හැබැයි, මේ ආණ්ඩුවෙන් කරන්නේ මොකක්ද? මේ ආණ්ඩුවෙන් කරන්නේ තනිකරම දේශපාලන පළිගැනීම්වලට පොලීසිය මුර බල්ලෙක් වාගේ පාවිච්චි කරන එක.

"ගෙස්ටාපෝ" ආණ්ඩුවක් වාගේයි ඔබතුමන්ලාත් ආණ්ඩුව කරගෙන යන්නේ. මොකක්ද ඔබතුමන්ලා කරන්නේ? මහේෂි කියන වෛද්‍යවරියව නැති කරලා දැම්මා; ශ්‍රී ජයවර්ධනපුර ඉස්පිරිතාලයේ ඇයට සේවය කරන්න බැරි තරමට නැති කරලා දැම්මා. මොකක්ද එතුමියට තිබුණු චෝදනාව? අවුරුදු 20ක් විතර ඒ unit එක එතුමිය තමයි පවත්වාගෙන ආවේ. හිටපු නාවික හමුදාපතිතුමා අත්අඩංගුවට ගැනීම ගැන උසාවියෙන් බැණලා එළෙව්වා. එතුමා අපේ හිටපු රණවිරුවෙක්. අරුණ ජයසේකර මැතිතුමනි, ඔබතුමා ඒ ගැන මොකක්ද කියන්නේ? ඔබතුමා හමුදාවේ හිටපු පුද්ගලයෙකු වශයෙන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඒ නඩුව සම්බන්ධයෙන් CID එකේ පස්දෙනෙක්ද කොහේද එංගලන්තයට ගිහිල්ලා තිබෙනවා, ඒ ලියුම හරිද කියලා බලාගෙන එන්න. මොකක්ද, මේ කරන්නේ? මෙච්චර දියුණු තාක්ෂණයක් තිබියදී එහාට ලියලා ඒ තොරතුරු ගන්න බැරිද? ඒ වාගේම මම දැක්කා, මේජර් ජනරාල්වරයෙකුට විරුද්ධව චෝදනාවක් කරලා තිබෙනවා. නිධානයක් සම්බන්ධයෙන් කාන්තාවක් මැරුවා කියලා ඔහුව අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මම ඒක ප්‍රවෘත්තිවල දැක්කා. බොඩියකුත් නැහැ. නැති වුණු පුද්ගලයෙකුත් නැහැ. හැබැයි, අත්අඩංගුවට අරගෙන තිබුණා, මාසයක්ද කොහේද. මෙහෙමද පොලීසිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ? තමන්ට ඕනෑ නම් ගහනවා, තමන්ගේ පුද්ගලයෙකු නම් ආරක්ෂා කරනවා. ඉතින්, අපි කියන්නේ මේ ආණ්ඩුවේ නොහැකියාව තුළ රට සංවර්ධනය කරන්න බැහැ කියන එකයි.

අද අමාත්‍යාංශවල වැඩ නැහැ; සංවර්ධනය නැහැ; නිෂ්පාදනය නැහැ; ණය බරින් මිරිකිලා ඉන්නේ. ඒක නිසා තමන්ගේ නිර්වස්ත්‍රය වහගන්න පොලීසියයි, CID එකයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමයි පාවිච්චි කරන්න එපා. ඒක ඒ නිලධාරීන්ට කරන අපහාසයක්. ඒ නිලධාරීන්ට කරන්න දෙයක් නැහැ. CID එකේ ඉන්න සමහර නිලධාරීන් අපට ඇවිල්ලා කියනවා, "අපට කරන්න දෙයක් නැහැ, සර්. ඉතාම අසාධාරණ ලෙස මේ වැඩේ කරනවා. සර්ලාවත් target කරනවා. අපට කියනවා, පුළුවන් තරම් අපහසුතාවට පත් කරන්න කියලා" යනුවෙන්. ඒක නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේක "ගෙස්ටාපෝ" ආණ්ඩුවක් බවට පත් කරන්න එපා කියලා. පොලීසියේ නිලධාරීන් පාවිච්චි කරන්න එපා, තමන්ගේ දේශපාලන මතිමතාන්තර ඉස්සරහට අරගෙන යන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.18]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් මතු කරපු ඇතැම් කාරණා පදනම් විරහිතයි කියලා මම කියන්නම්. මට පෙර කථා කරපු සුජීව මන්ත්‍රීතුමා කිව්වා, "ඇපැල් අධිකරණයේ නඩුවක් තිබෙනවාය කියලා, සම්බුද්ධ ජයන්ති විහාරයට අදාළව. මන්ත්‍රීතුමනි, පුළුවන් නම් ඒ නඩු අංකය හොයලා කියන්නකෝ. මම දන්නා තරමින් නම් එහෙම නඩුවක් නැහැ. උන්වහන්සේ උත්සාහ කරලා තිබෙනවා, නඩුවක් දාන්න. නමුත් අදටත් නඩුවක් දාලා නැහැ. මම මේවා කියන්නත් නොවෙයි හිතාගෙන හිටියේ. ඇත්තටම මේකේ පදනම "බී" වාර්තාවේ හරියටම තිබෙනවා. "බී" වාර්තාවේ තිබෙන්නේ මොකක්ද? ගරු ආනන්ද විජේපාල

අමාත්‍යවරයාත් මේ "බී" වාර්තාව ගැන සඳහන් කළා. නමුත්, ඒකේ තිබෙන හරයාත්මක කාරණා පිළිබඳව ඉදිරිපත් කළාට පස්සේ දැනගන්න පුළුවන්, මොකක්ද ඇත්ත කථාව කියලා. මොකක්ද ඒකේ තිබෙන්නේ? "බලය ලත් මිනින්දෝරු කේ. ශිවානන්දන් මහතා විසින් ලබා දී ඇති පිඹුරුපතට අනුව මායිම් ගල් යොදා මෙම ඉදිකිරීම් ගරු ජනාධිපතිතුමා -මීට කලින්- විසින් ලබා දී ඇති හිමිකම් පත්‍රය අනුව එම ඉඩම් කොටස් සකස් කර ඇත්ද? එසේම එම ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියට අයත් භූමි ප්‍රදේශයක සකස් කර ඇත්ද? එසේ නොමැති නම් එම ඉදිකිරීම වෙරළ ආරක්ෂක අධිකාරියට අයත් භූමි ප්‍රදේශයක සකස් කර ඇත්ද යන්න පරීක්ෂා කර එම හිමිකම් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සාකච්ඡාවක් කරන ලදී" කියලා තමයි ඒකේ තිබෙන්නේ. ඒ අනුව ගරු මන්ත්‍රීතුමනි, *status quo* maintain කරන්න ගරු මහෙස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් කරලා තිබෙනවා. ඒ අනුව තමයි දැන් ඒ සාකච්ඡාව යන්නේ. බුද්ධාගම ඇදලා අරගෙන "බුදු දහම විනාශයි. මාර වැඩේ" කිය කියා මෙතැන කියන එකේ කිසිම පදනමක් නැහැ. මේක ඇතුළේ තිබෙන්නේ බුදු දහම කියන,-

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, මේක ඔබතුමා එක්ක විවාදයක් නොවෙයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මගේ කාලය යන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මගේ නම කිව්ව නිසායි point of Order එකක් ගත්තේ. මට ඒ ගැන කියන්න කාලය දෙන්න. තත්පර 20යි ගන්නේ. ඔබතුමා කියන එක හරි. මේ අර්බුදය ඇති වුණු හින්දා නේ, උසාවියට වාර්තා කළේ. ඊට කලින් court order එකක් ගන්න තිබුණා නේ. නැත්නම් නඩුවක් දාන්න තිබුණා නේ. කිසිම නඩු තීන්දුවක් නැතුව තමයි පොලීසිය 300ක්, 400ක් අරගෙන ගිහිල්ලා එතැන ප්‍රශ්නයක් ඇති කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පැහැදිලියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
සිද්ධියක් නැතුව "බී" වාර්තාවක් නිර්මාණය වෙනවාද, නීතිඥතුමා? සිද්ධියක් එක්ක නේ, "බී" වාර්තාවක් නිර්මාණය වෙන්නේ. එතකොට ඒ සිද්ධියත් එක්ක "බී" වාර්තාවක් නිර්මාණය වෙලා තිබෙනවා. දැන් හැම කථිකයාම පටන් ගන්නේ, "බුද්ධාගම, බුද්ධාගම, මාර වැඩේ. බුද්ධාගම තර්ජනයට ලක් වෙලා" කියලා. මාර කථාවක් නේ.

එතකොට බුද්ධාගම,- *[බාධා කිරීමක්]* අද එතුමා ඇවිල්ලා නැහැ. එතුමා ජනාධිපතිවරණය කාලයේදී කිව්වා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආවොත් බුද්ධාගම විනාශයි,- *[බාධා කිරීමක්]* නැහැ, "එන්නේ නැහැ නේද?" කියලා සභාවෙන් ඇහුවා. "එන්නේ නැහැ නේ වැරදිලාවත්?" කියලා ඇහුවා. හැබැයි, පෙරහැර ගැන, සිල් ගන්න එක ගැන, පන්සල් ගැන මොනවාද නොකිව්වේ? ඒවා ඔක්කෝම බොරු කරලා තිබෙන්නේ, හොඳද? යළි ඒක ඇඳන්න හදනවා දැන් මෙතැනට, බුද්ධාගම ගැන කියලා. මේක බුද්ධාගමත් එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි; කිසිදු ආගමක් එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. විෂය භාර අමාත්‍යවරයා හරියටම කිව්වා, "අපි මේ ප්‍රශ්නය නීත්‍යානුකූලව විසඳන්න ගරු අධිකරණයට භාර දීලා තිබෙනවා" කියලා; එච්චරයි.

දැන් මෙතැනදී කථිකයන් කිහිපදෙනෙක් කිව්වා ස්ථාන මාරු පිළිබඳව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ.(1) අනුව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, ස්ථාන මාරුවලට අදාළව පොලිස්පතිවරයාට තිබෙන බලය මොකක්ද කියන කාරණය. ගරු නීතිපතිතුමා විසින් දැනුම් දීලා තිබෙනවා, ඒක තනතුරක් නොවෙයි, ඊට අදාළ මාරු කිරීම, බලය විතැන් කරන්න පුළුවන් කියලා කොමිෂන් සභාවට. ඉතින් ඒක කොමිෂන් සභාවේ වැඩක්. එතැන දේශපාලනය ගෑවිලා නැහැ. ඉස්සර වෙලා සිද්ධියේදීත් අපි දේශපාලනය ඇඳාගෙන නැහැ. මේ සිද්ධියේදීත් අපි දේශපාලනය ඇඳාගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ප්‍රධාන ආයතන දෙකයි තිබෙන්නේ. එකක් පොලීසිය. අනෙක, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව. දැන් බලන්න, පොලීසියේ ප්‍රධාන තනතුර බේරා ගන්න අපි කොච්චර ප්‍රයත්නයක් දැරුවාද කියලා. ඒවා දේශපාලනීකරණය කරලා, ඉහළටම ගිහිල්ලා තිබුණු ආයතන. පොලිස්පතිකම ගන්න මේ මහජන ආයතනයේ සහාය පතන්න වුණා. පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා තමයි හිටපු පොලිස්පතිවරයා නීතියෙන් ඉවත් කරලා වත්මන් පොලිස්පතිවරයා බලයට ගන්න වුණේ. ඒකට මාස ගණනාවක් ගත වුණා. වැඩබලන පොලිස්පති විධියට තමයි එතුමා වැඩ කළේ. ඊට පස්සේ මොකද වුණේ? ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් ධුරයේ හිටපු කෙනා තවම හිරේ. ඒ මනුස්සයාව දේශපාලනයට බලහත්කාරයෙන් ඇදලා ගත්තා. එහෙම ඇදලා අරගෙන ඒ නීති විරෝධී වැඩේ කෙරෙව්වා. ඒ නීති විරෝධී වැඩේ කරවලා, අදටත් වැඩබලන පාලක ජනරාල්වරයෙක් තමයි අපට උරුම කරලා දීලා තිබෙන්නේ. මෙන්න, දේශපාලනය. අපිද, දේශපාලනය කරන්නේ? ඒ ප්‍රධාන ආයතන දෙකේ මුල් පුරුක් දෙක මුදා ගන්න මාස හතකට වඩා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම මාස හතක් ගත වුණා. අවුරුද්දක කාලයක් වෙනකොට අද මොකක්ද පොලිස් දෙපාර්තමේන්තුවට වෙලා තිබෙන්නේ? වත්මන් පොලිස්පතිවරයා යටතේ, එතුමාගේ නායකත්වය යටතේ අපි 159වැනි පොලිස් දිනය සමරනකොට සමස්ත සමාජය තුළ පොලීසිය සම්බන්ධයෙන් තිබුණු විවේචනය සැලකිය යුතු මට්ටමකට අඩු කරලා, මහ ජනතාව අතර විශ්වාසය තහවුරු කරන්න පුළුවන් මට්ටමට ගෙනාවා. මහ ජනතාව සහ පොලීසිය අතර තිබෙන විශ්වාසය තහවුරු කිරීමට අදාළව අපි පියවර අරගෙන තිබෙනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? "පොලීසිය මාර විධියට දැන් යම් ලයින් එකක යනවා නේ" කියනවා. ඕක තමයි කථාව. පොලීසියට ලොකු වගකීමක් පැවරුවා, ජනාධිපතිවරයා. ඒ, මොකක්ද? මේ රටේ වෙළෙඳාමක් තිබෙනවා.

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

ඒ වෙළෙඳාම තමයි, නීති විරෝධී අවි ගනුදෙනුව සහ මත්ද්‍රව්‍ය වෙළෙඳාම. ඒ නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාලය විසින් සමස්ත ශ්‍රී ලංකාවම වෙළාගෙනයි තිබෙන්නේ. පක්ෂ, පාට භේදයකින් තොරව, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව පාසල් ශිෂ්‍යයාගේ ඉඳලා කවුරුත් ඒ ව්‍යසනයට ගොදුරු වෙමින් තිබුණා. ඒක ලොකු ව්‍යසනයක්. ජනාධිපතිවරයාට ලොකු අභියෝගයක් වුණා, ඒ ව්‍යසනය වළක්වා ගන්නේ කොහොමද කියන එක. පොලිස්පතිවරයාගේ නායකත්වයෙන් යුතුව එතුමාට අද පුළුවන් වෙලා තිබෙනවා, ඒ ජාල හඳුනා ගන්න. ඒකේ මුල තිබුණේ දියවන්නාවේ, පාර්ලිමේන්තුවේ. පාර්ලිමේන්තුවේ තමයි හිස තිබුණේ.

දේශපාලනය නැමති හිස වෙළාගෙන තිබුණා, මත්ද්‍රව්‍ය ජාලය. ඉතිහාසයේ ප්‍රථම වතාවට දේශපාලනය නැමති හිස ඒ තුළින් ගලවා දමන්න අපේ වත්මන් ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා. ඒ සමත් වීම ඇතුළේ තමයි පොලිස්පතිවරයාට හයිය ආවේ මේ වැඩේ කරන්න. මත්ද්‍රව්‍ය නැමති දම්වැලේ ඉහළම පුරුක නතර වුණේ විදේශයේ. "අනේ, කවුරුත් හොයා ගෙන යනවා; එයා ඉන්නේ ඩුබායි, එයා ඉන්නේ නේපාලයේ, එයා ඉන්නේ ඉන්දුනීසියාවේ" කිය කියා පසුගිය ආණ්ඩු මේවා නතර කළා. ඒවායේ පිටුපස්සේ හිටියේ කවුද කියලා අපි දන්නවා. මේ ආසනවල වාඩි වෙලා හිටපු බොහෝ පිරිස් ඒ නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාලය නියෝජනය කළා. ඒකයි මේක වළක්වා ගන්න බැරි වුණේ. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වනකොට අපට පුළුවන් වෙලා තිබෙනවා, ඒ විදේශීය පුරුකට අත තියන්න. "යුක්තිය" මෙහෙයුම, අර මෙහෙයුම, මේ මෙහෙයුම කිය කියා මෙහෙයුම් කළා. ඔක්කොම ඇල්ලුවේ හාල්මැස්සෝ; නිකම් සාමාන්‍ය මිනිස්සු, පාරේ යන මිනිස්සු අල්ලාගෙන ගිහිල්ලා ගාල් කළා. හැබැයි, වත්මන් පොලිස්පතිවරයාට පුළුවන් වෙලා තිබෙනවා, මෙහේ ඉන්න supply ජාලයට අත ගහලා කටයුතු කරන්න. මේකේ තිබෙන්නේ දෙකයි. Supply ජාලය තිබෙනවා; demand එක තිබෙනවා. මේ දෙක නේ තිබෙන්නේ. Supply ජාලය සම්බන්ධයෙන් වත්මන් පොලීසිය අත ගහලා තිබෙනවා. දේශීයව විතරක් නොවෙයි, විදේශීය ජාලයේ ඉන්න අයටත් අත ගහලා තිබෙනවා.

ඇත්තටම හාල්මැස්සෝ තමයි පසුගිය ආණ්ඩුවලින් අත්අඩංගුවට ගත්තේ. නමුත්, අද අපට පුළුවන් වෙලා තිබෙනවා, මත්ද්‍රව්‍ය ජාලයේ ඉන්න මෝරු අත්අඩංගුවට ගන්න. ලංකාවේ මුහුදේ මෝරු විතරක් නොවෙයි, විදේශීයව ඉන්න මෝරුත් අත්අඩංගුවට ගන්න පුළුවන් වෙලා තිබෙනවා. තවම වර්ෂයයි ගත වුණේ. බොහොම බාධක මැද්දේ පොලීසිය මේ වැඩ කරන්නේ; අඩුපාඩුකම් මැද්දේ පොලීසිය මේ වැඩ කරන්නේ. හැබැයි, එහෙම අඩුපාඩුකම් තිබියදීත් වසරක් යනකොට පොලීසිය සමත් වෙලා තිබෙනවා, ජන මනසේ ඇති කරන්න ඇත්තටම මේ වැඩේ කරනවා කියලා.

දැන් මොකක්ද මෙතැන කථා වුණේ? මාර වැඩේ! අපේ අයත් මේවාට සම්බන්ධයි ද කියලා නේ කථා වුණේ. චක්‍රලේඛයක් ගැහුවා ලු, ජාතික ජන බලවේගයේ අය අහු වුණොත් මේක ප්‍රසිද්ධ කරන්න එපැයි කියලා. අනේ, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමා මේ චක්‍රලේඛයේ දිනයයි, සිද්ධියේ දිනයයි අධ්‍යයනය කරලා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි.

එතකොට, චක්‍රලේඛය එළියට ආවේ කවදාද? 2025.10.27වැනි දා. අර සිද්ධිය වුණේ ඊට පස්සේ. අර කාරණාව වුණේ කලින්. මේ කියන්නේ, එදාම චක්‍රලේඛයක් ගැහුවා ලු, මේ සිද්ධිය වළක්වන්න. කරුණු දැනගෙන කථා කරන්න. පොලිස්පතිවරයා චක්‍රලේඛය ගැහුවේ ඇත්ත වශයෙන්ම මේවා සමාජගත කරන එක වැරදි නිසා. ඇතැම් අපරාධකරුවන් මහ ජනතාව අතරින් අල්ලා ගන්න කොට ඒ අය වීඩියෝ කරනවා, ඒක වළක්වන්න අමාරුයි. නමුත්, පොලීසිය විෂය භාර අමාත්‍යවරයාගේ උපදෙස් මත චක්‍රලේඛයක් ගහලා තිබෙනවා, මේවා කරන්න එපා කියලා. එහෙම තමයි. අපේ අවංක අභිලාෂය අනුව මේක වෙන්නේ.

දැන් සිද්ධි කිහිපයක් යනවා නේ; අනුරාධපුර සිද්ධිය ගැන කියනවා; තව තව සිද්ධි කිහිපයක් කියනවා. රටේ ජනාධිපතිවරයාත්, විෂය භාර අමාත්‍යවරයාත්, මමත් දේශපාලනික වශයෙන් මේ එක සිද්ධියකට සම්බන්ධ වෙලා නැහැ; එක සිද්ධියකට උපදෙස් දීලාත් නැහැ. ඒක තමයි මේ රටේ ජනතාව ප්‍රාර්ථනා කරපු එකම ප්‍රාර්ථනාව. නීතිය සැමට එකයි. අපේ වුණත්, ඔයගොල්ලන්ගේ වුණත් එක නීතියක් වෙන්න කියලා තමයි මේ ජන වරම ප්‍රාර්ථනා කළේ. ඒ ප්‍රාර්ථනා කරපු ජන වරමට අනුව අපි වැඩ කරගෙන යනවා. එහෙම පොලීසියක් නේද, තමුන්නාන්සේලා ප්‍රාර්ථනා කළේ? *[බාධා කිරීමක්]* වත්මන් පොලිස්පතිවරයාගෙන් අහලා බලන්න, අපි කිසිදු දේශපාලනික බලපෑමක් මේ සම්බන්ධයෙන් කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මේක හරි පැහැදිලියි. මේකේ වෙලා තිබෙන්නේ මොකක්ද? *[බාධා කිරීමක්]* විෂය භාර අමාත්‍යවරයාටත්, පොලිස්පතිවරයාටත් දැඩි විවේචනයක් එල්ල වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැඩි විවේචනයක් එල්ල වනවා. ඇයි, ඒ විවේචන එල්ල වෙන්නේ? ඔයගොල්ලන්ගේ පැත්තෙන් පදනම් විරහිතව විෂය භාර අමාත්‍යවරයාට පහර ගහනවා. ඇයි? මේ වැඩේ හරියට කරන නිසා. මේ වැඩේ හරියට කරනකොට ඔයගොල්ලන්ට රිදෙනවා. තේරුණාද? *[බාධා කිරීමක්]* පොලිස්පතිවරයාට පදනම් විරහිතව පහර ගහනවා. පොලිස්පතිවරයා මේ වැඩේ හරියට කරනවා; හරියට කරනකොට ඔගොල්ලන්ගේ කට්ටියට රිදෙනවා. ඕන්න කථාව. ඕක තමයි මෙතැන වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු වැඩ කටයුතු නීත්‍යානුකූල ලෙස, දේශපාලන මැදිහත්වීමකින් තොරව අපි කරගෙන යනවා. දේශපාලනයෙන් තොර මැදිහත්වීමක් අපි කරගෙන යන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. මොකක්ද, point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මගේ නම කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි, අවස්ථාව ලබා දුන්නාට. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, දේශපාලනඥයින් සම්බන්ධ වෙන්නේ නැහැ කියලා. හැබැයි, පොලීසිය ක්‍රියාත්මක වෙන්න ඉස්සෙල්ලා උඩින් ජනාධිපතිවරයාගෙන් හරි, මේ දේශපාලන අංශයෙන් හරි යනවා, මෙන්න මේ අයව අත්අඩංගුවට ගන්න කියලා. ඒ පිළිබඳ දැනුවත්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරණය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න. තත්පර 15න් අවසන් කරන්න. දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව නතර කරන්න ඕනෑ නිසා කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි, මම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

දිවා ආහාර විවේකය සඳහා කාරක සභා අවස්ථාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රටේ වැදගත්ම අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා වන මේ මොහොතේ ඒ පිළිබඳව කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

ඊයේ දවසේ ත්‍රිකුණාමලයේ වුණු සිදුවීම සම්බන්ධයෙන් අපි බෙහෙවින් කනගාටු වෙනවා. මොකද, එවැනි සිදුවීම් ලංකාවේ නොවිය යුතුයි කියන තැනයි අප ඉන්නේ. විශේෂයෙන්ම 1988-89 කලබල කාලයේ පන්සල්වල ඉඳගෙන, එහෙම නැත්නම් බුදු පිළිම යට හැංගිලා ජීවිත බේරා ගත්තු කණ්ඩායම් අද ක්‍රියා කරන ආකාරය බැලුවාම පොඩි ප්‍රශ්න සහගත තත්ත්වයකුත් උදා වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, මෙවැනි තත්ත්වයන් ඉදිරියට ඇති නොවේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු ඇමතිතුමා ඊයේ කිව්වා, පොලීසිය ඒ බුදු පිළිමය ඉවත් කළේ ආරක්ෂාවටයි කියලා. කාරණාව මේකයි. අපට ජීවිත තර්ජනයක් තිබුණොත් අපි ගිහින් පොලීසියේ නතර වෙනවාද? එහෙම නැත්නම් වෙනත් කාටහරි තර්ජනයක් තිබුණොත් ඒ තර්ජන තිබෙන කට්ටිය ගිහින් පොලීසියේ නවාතැන් ගන්නවාද? බුදු පිළිමය තිබුණු තැනට ආරක්ෂාව නොදී, බුදු පිළිමය ආරක්ෂා කරන්න කියලා බුදු පිළිමය ගලවලා පොලීසියට අරගෙන යනවා කියන එක මාර පෙනි න්‍යායක්. එය ඉතා විහිළුසහගත කාරණාවක්. බැරි වෙලා හෝ සීගිරිය වාගේ තැනකට තර්ජනයක් ඇති වුණු දාට මෙතුමන්ලා මොන වාගේ පියවරක් ගනීද කියලා අපට හිතෙනවා.

ඒ කෙසේ වෙතත්, ඊයේ දවස වනකොට අම්බලන්ගොඩ මීටියාගොඩ ප්‍රදේශයේත් වෙඩි තැබීමක් සිදු වුණා; වයස අවුරුදු 78ක කාන්තාවක් ඝාතනයට ලක් වුණා. ඊයේ වනකොට ආණ්ඩුවටත් අවුරුද්දයි. ඊයේ පත්තු වුණේ 104වන වෙඩිල්ල; 55වන මරණයයි සිදු වුණේ; 56දෙනෙකුට තුවාල සිදු වෙලා තිබෙනවා. වයස අවුරුදු 78ක කාන්තාවක් තමයි ඊයේ ජීවිතක්ෂයට පත් වුණේ. වෙඩි 104ක් පත්තු වනකොටත් ආණ්ඩුව හැම තිස්සේම සමාජගත කරන දේ තමයි, "මේකෙන් මහජන ආරක්ෂාවට කිසි ප්‍රශ්නයක් නැහැ. මේ වෙන්නේ පාතාල කල්ලි දෙකක් අතර වෙඩි තැබීම්" කියන එක. මහජන ආරක්ෂාවට කිසි ගැටලුවක් නැහැ කියලා නිතරම කියනවා. ඊයේ ඝාතනයට ලක් වුණේ වයස අවුරුදු 78ක කාන්තාවක්. මීට පෙර අපි දැක්කා, ඉතා කුඩා ළමයින් දෙදෙනෙකු ඝාතනය වනවා. මෙලෝ දෙයක් තේරෙන්නේ නැති දරුවන් දෙදෙනෙකු මහ පාරේ ඝාතනය වුණා. ඒ සියලුදෙනාගේ ජීවිත ජීවිත නොවෙයිද? අද ආණ්ඩුව ඒවා බොහොම සැහැල්ලුවට අරගෙන තිබෙනවා. මේ රටේ වෙඩිල්ලක් පත්තු වුණොත්, එහෙම නැත්නම් කාගේ හරි ජීවිතයක් නැති වුණොත්, කොහේ හරි පාතාල කල්ලි දෙකක් අතර වෙඩි හුවමාරු වීමක් විධියට ඒක බොහොම සිල්ලරට දාන්න පුරුදු වෙලා ඉන්නවා. මේ කාරණාවම තමයි වැලිගම ප්‍රාදේශීය සභාවේ ලසන්ත වික්‍රමසේකර සභාපතිතුමා ඝාතනයේදීත් කිව්වේ. ලසන්ත වික්‍රමසේකර මැතිතුමා කියන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී විධියට මැතිවරණයේදී ජනතාවගේ ඡන්දයෙන් වැඩිම ඡන්ද ප්‍රතිශතයකින් පත් වෙලා බහුතර දෙනාගේ කැමැත්ත අනුව වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති වුණු කෙනා. මහජන දිනය දවසේ ප්‍රාදේශීය සභාවටම ඇවිල්ලායි එතුමාව ඝාතනය කළේ. එතුමා ඝාතනය වෙච්ච දවසේම මහජන ආරක්ෂක ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය අපි දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. මොකද, එතුමා කිව්වේ, ජාතික ආරක්ෂාවට කිසි ප්‍රශ්නයක් නැහැ, ඝාතනය වුණේ අපරාධකාරයෙක් කියලායි. එදා එතුමා මෙහිදී එහෙම කිව්වා. ඒ වාගේ මානසිකත්වයක් තියාගෙන මේ රටේ ජනතාවට දෙන පණිවුඩය මොකක්ද? මේ ආණ්ඩුව පත් වුණාට පසුව බොහෝ වෙඩි තැබීම්, ඝාතන සිදු වෙලා තිබෙනවා. ඒ හැම එකක්ම සාධාරණීකරණය කරනවා.

ලසන්ත මැතිතුමාට තිබුණු ලොකුම චෝදනාව මොකක්ද? එතුමා IRC registered අපරාධකාරයෙක් කියලා කිව්වා. එතුමාට දැනට නඩු ටිකක් තිබෙනවා නම්, එතුමා ඒවායේ සැකකරුවෙකු විධියටයි ගැනෙන්නේ. ඒ කියන්නේ, එතුමා වැරැදිකරුවෙකු

[ගරු චතුර ගලප්පත්ති මහතා]

වෙලා නැහැ. IRC registered කියන්නේ කවුද? මාත් පසුව තමයි එය දැන ගත්තේ. එකම ආකාරයේ වැරැදි තුනක් එක ළඟ කරලා තිබුණොත්, ඔහු IRC එකේ register වෙනවා. මා ඒ ගැන සොයා බැලුවා. වෙලා තිබෙන්නේ මේකයි. කුඩා දඩයක් දෙන්න පුළුවන් කාරණා තුනකට සැක පිට අත්අඩංගුවට ගත්තාම, එතුමාට උපදෙස් දීලා තිබෙනවා, ඔය පොඩි දඩය ගෙව්වා නම් ඔය නඩුව ඉවත් වෙනවා කියලා. ඒ උපදෙස අනුව තමයි එතුමා ඒ දඩය ගෙවලා වැරැද්ද පිළිගෙන තිබෙන්නේ. ඒ නිසා තමයි IRC registered වෙලා තිබෙන්නේ. එහෙම නැතුව ඔබතුමන්ලා හංවඩු ගහන විධියට මහා පරිමාණයේ කිසිම දෙයකට නොවෙයි එතුමා IRC registered වෙලා තිබෙන්නේ. හැබැයි, මේ රටේ මිනිසුන්ට එතුමා සම්බන්ධයෙන් ඒත්තු ගැන්වූයේ IRC තුන්වන ශ්‍රේණියේ අපරාධකාරයෙකු විධියටයි. ඔහු වරද පිළිගෙන බොහොම පොඩි දඩයක් ගෙවලා තමයි එම නඩුවෙන් ඉවත් වෙලා තිබෙන්නේ. ඒකේ register වෙලා තිබෙන නිසා තමයි මෙතුමන්ලා මේ හංවඩු ගහන්නේ.

මේ ආණ්ඩුව දැන් දුවන්නේම scriptsවලින්. ඒක දැන් අපට තහවුරු වෙලා ඉවරයි. හොඳම උදාහරණය මොකක්ද? වැලිගම ප්‍රාදේශීය සභාවේ නිලවරණය පැවැත්වෙන වෙලාවේ අපි දැක්කා එම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පැහැර ගත්තා කියන ප්‍රවෘත්තියක්. තනිකරම එදා දවසේ මේ රටේ ප්‍රධානම ප්‍රවෘත්තිය වුණේ වැලිගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පැහැරගෙන තිබෙනවා කියන එකයි. විපක්ෂයේ නොවෙයි, ආණ්ඩුවේ මන්ත්‍රීවරු දෙන්නෙකුයි පැහැර ගත්තාය කියන්නේ. ඒක තමයි එදා රටේ ප්‍රධාන මාතෘකාව වුණේ. ඒ විතරක් නොවෙයි, එදා දවසේ නිලවරණයත් කල් දැම්මා. අද වනකල් මේ ආණ්ඩුවට ඒකට උත්තරයක් නැහැ. ඇයි ඒ? ඒක script එක වැරදුණු තැනක්. ඊළඟට මොකද වුණේ? ආයෙත් නිලවරණය කිට්ටු වුණාම තමන්ගේම මන්ත්‍රීවරයකුගේ නිවසට වෙඩි තබා ගන්නවා. මේ මොහොත වනකල්ම මේ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් ද උත්තර දීලා නැහැ. මේවා තමයි මේ ආණ්ඩුවේ scripts වැරදුණු තැන්. මේක scriptsවලින් දුවන ආණ්ඩුවක් කියන එක අද පැහැදිලියි.

අපි මේ ආණ්ඩුවට චෝදනා කරන්නේ ඇයි? ලසන්ත වික්‍රමසේකර මැතිතුමා අපේක්ෂකයකු විධියට ඔය දෙවෙනි වතාවටයි ඡන්දය ඉල්ලුවේ. ඒ විතරක් නොවෙයි, එතුමා ඒ මැතිවරණයට ඉදිරිපත් වන කොට, නාම යෝජනා දෙන කොට, මන්ත්‍රී ධුරයට පත් වන කොට, එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙන කොට, -සභාපතිවරයා පත් කරන්නත් මාස 2ක් ගත වුණා- සභාපති වෙලාත් මාස 3ක් යනකල්ම වචනයක් කථා නොකළ ආණ්ඩුව එතුමාව අපරාධකාරයෙකු විධියට හංවඩු ගැහුවේ, එතුමා ඝාතනය වුණාට පසුවයි. අපි මේ ආණ්ඩුවට චෝදනා කරන්නේ ඒකයි. අපි ලජ්ජා වෙනවා, මේ ආණ්ඩුව ගැන.

ඒ විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් අපි මේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන අනෙක් කාරණය මේකයි. ලසන්ත සභාපතිතුමාට ජීවිත තර්ජනයක් තිබෙනවා කියලා, එතුමා දිවුරුම් ප්‍රකාශයක් එක්ක පොලිස්පතිතුමාට ලිඛිතව දැනුම් දී තිබුණා. මොකද, එවැනි තර්ජනයක් ගැන අපට කියලා වැඩක් නැහැ නේ. පොලිස්පතිතුමා ඒ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් තමයි අපට ගැටලුව තිබෙන්නේ. මම මේ කාරණාව තවත් විධිමත්ව පැහැදිලි කරන්නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනය අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ඇති සියලුම රාජ්‍ය නිලධාරින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ රජය විසින් විටින් විට නිකුත් කරන චක්‍රලේඛන හා නියෝගවලට යටත් වන බව සඳහන් කරමින් තමයි ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දෙන්නේ. එසේ ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දුන් පසු සියලුම රාජ්‍ය නිලධාරින් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කාර්ය පටිපාටි, රීති සහ වෙනත් තථ්‍ය ක්‍රමවලට යටත් විය යුතුයි. ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXVIII වැනි පරිච්ඡේදයේ 3:8 උප වගන්තියේ මේ විධියට සඳහන් කර තිබෙනවා.

> "මහජනයාගෙන් හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ ලැබෙන ලිපිවලට අප්‍රමාදව පිළිතුරු යැවිය යුතු ය. ලිපියක් ලැබී සතියක් ඇතුළත අවසාන පිළිතුරක් යැවීමට නොහැකි නම් එම කාලය තුළ 108 දරන පොදු ආකෘති පත්‍රයෙන් අතුරු පිළිතුරක් යැවිය යුතු ය. තවදුරටත් ප්‍රමාදවීම නොවැළැක්විය හැකි නම්, කරගෙන යන කටයුතු පිළිබඳව විස්තර හා අවසාන පිළිතුරක් කවදා බලාපොරොත්තු විය හැකි ද යන බව සඳහන් කර වරින් වර අතුරු පිළිතුරු යැවිය යුතු ය."

මෙසේ නොකරන්නේ නම් සෑම රජයේ නිලධාරියෙක්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/92 විධානය අනුව දැඩි විනය තීන්දුවලට යටත් විය යුතු බවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 10/93හි පැහැදිලිව සඳහන් කර තිබෙනවා. ඒ නිසායි අප වර්තමාන පොලිස්පතිවරයාට මේ චෝදනාව එල්ල කරන්නේ. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධ චෝදනාකරුවෙකු විධියට එවකට හිටි පොලිස්පතිවරයාට තිබුණු චෝදනාවම තමයි වර්තමාන පොලිස්පතිවරයාටත් තිබෙන්නේ. ඒ නිසා අපි ජාතික පොලිස් කොමිසමට කියනවා, කරුණාකර වර්තමාන පොලිස්පතිවරයාට විරුද්ධව පියවර ගන්න, විනය ක්‍රියාමාර්ග ගන්න කියලා. අපට කොහෙත්ම විශ්වාසයක් නැහැ මේ ආණ්ඩුව තුළින් ඒ කටයුත්ත සිදු වෙයි කියලා. කෙසේ වුවත්, අපි ඒ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ගවලට යනවා කියන එක අප මේ වෙලාවේ මතක් කර දෙන්න ඕනෑ.

ඊළඟ කාරණාව විධියට, පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කියන්න ඕනෑ. ඔබතුමන්ලා මේ ආණ්ඩු බලය ගත්තේ මේ රටේ මිනිසුන්ට විශාල දේවල් ගැන කියලා; විශාල බලාපොරොත්තු දීලා. ඒවා අතරින් ප්‍රධානම එක තමයි පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉටු කරනවා කියන එක. හැබැයි, මේ ආණ්ඩුව ඇවිල්ලා මේ වන කොට අවුරුද්දක් වෙනවා. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ තොරතුරු මේ රටට හෙළි කරනවා කියලා තමයි බලය ගත්තේ. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ආණ්ඩුව පත් කරන්න එදා දේශපාලන වේදිකාවට නැඟපු ප්‍රධාන දෙදෙනෙකුට අද තනතුරු දීලා තිබෙනවා. රවී සෙනෙවිරත්න මැතිතුමා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ධුරයටත්, ශානි අබේසේකර මැතිතුමා CID එකේ ප්‍රධානියා හැටියටත් පත් කරලා තිබෙනවා. දැන් මේ ආණ්ඩුවට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ඒ නිසා දැන් කිසිම නිදහසට කාරණාවක් නැහැ මේවා පැහැර හරින්න. දැන් ඕනෑවටත් වඩා කාලය අරගෙන තිබෙනවා. ජනාධිපතිතුමාත් වරින් වර ජනතාවට පොරොන්දු දුන්නා මේ තොරතුරු හෙළි කරනවා කියලා. නමුත්, මේ මොහොත වෙනකල් ඒක පැහැර හැරලා තිබෙනවා. අපි රජයට කියනවා, පාස්කු ප්‍රහාරය කවුද කළේ කියන එක කරුණාකර මේ රටට හෙළි කරන්න කියලා.

ඊළඟ කාරණාව ගත්තොත්, මේ රටේ එදා ඉඳන් මේ දක්වා පැවැති විවිධ ආණ්ඩු අතින් වැරදීම් වෙලා තිබෙනවා, හිතා මතා වැරදීම් කරලා තිබෙනවා, විවිධ දූෂණ, වංචා වෙලා තිබෙනවා, මහා පරිමාණයේ අපරාධ වෙලා තිබෙනවා. මම හිතන හැටියට, කලින් රජයන්වලින් සිදු වුණාය කියා ගොඩක් අය කියන ළඟම කාරණාව තමයි, මහ බැංකු කොල්ලය. හැබැයි, තවම තක්සේරු නොකරපු ලොකුම අපරාධය වෙන්න තිබෙන්නේ ඉස්සරහට. කන්ටේනර් 323ක් මේ රට ඇතුළට ආපු එක තමයි මේ රටේ ඉදිරියේදී වෙන්න තිබෙන ලොකුම හානිය කියන එක මම මේ වෙලාවේ කියනවා. කන්ටේනර් 323ක් කියන්නේ අර කිච්චා වාගේ ගිනි පෙට්ටි සයිස් ඒවා නොවෙයි නේ. ඒවා ඕනෑ තැනක

දැකගන්න පුළුවන්. මේ ආණ්ඩුව කාලයේම තමයි කන්ටේනර් දෙකක් මීද්දෙනිය ප්‍රදේශයටද කොහේද ගිහිල්ලා, ඒ කන්ටේනර් දෙකේ අයිස් මත්ද්‍රව්‍යය තිබිලා අහු වුණේ. ඒ සිදුවීමේ කොහේ හෝ කෙළවරක පොහොට්ටුවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඉන්නකොට ආණ්ඩුව මාධ්‍ය පාවිච්චි කළා, අන්න, අතීතයේ ඉඳන් මේවා කරගෙන එනවා කියන්න. නමුත්, දැන් ආණ්ඩුව ඔයගොල්ලන්ගේ. ඒ කන්ටේනර් 323 ලංකාව ඇතුළට ආවේ ඔයගොල්ලන්ගේ ආණ්ඩු කාලයේ. ඒ නිසා කරුණාකර මේ ගැන කරුණු හෙළිදරව් කරන්න. මොකද, මේකෙන් තමයි අනාගතයේදී මේ රටේ වෙන්න තිබෙන ලොකුම හානිය වෙන්නේ. ඒ ගැන තවම කිසිම තක්සේරුවක් කරගන්න හැකියාවක් ලැබිලා නැහැ. කන්ටේනර් දෙකකින් විතරයි අයිස් ලැබුණේ. හිතලා බලන්න, මේ කන්ටේනර් 323 තුළ මොනවා තිබෙන්න පුළුවන්ද කියලා? අර්චුනා මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒවා තුළ ආයුධ තිබෙන්නත් පුළුවන්, මත්ද්‍රව්‍ය තිබෙන්නත් පුළුවන්, නැත්නම් වෙනත් දේවල් තිබෙන්නත් පුළුවන්. මේ ආණ්ඩුවට මෙච්චර බලයක් තිබෙනවා. මන්ත්‍රීවරු 159ක් ඉන්නවා; විධායක ජනාධිපති ඉන්නවා. මේ කන්ටේනර් 323 තුළ මොනවාද තිබෙන්නේ කියන එක කරුණාකරලා පැහැදිලි කරන්න. අඩුම තරමින් මේ ආණ්ඩුවට හැකියාවක් ලැබුණේ නැහැ, ඒ සම්බන්ධ වාර්තාවවත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

විශේෂයෙන් මේ කන්ටේනර් 323 ගැන කියද්දී, බිමල් රත්නායක ඇමතිතුමා මීට කලින් කියපු කාරණාවක් මට මතක් වුණා. මේ අවස්ථාවේ එතුමා සභාවේ නැහැ. නමුත්, එතුමා මේ පාර්ලිමේන්තුවේ මීට කලින් මේ කථාව කිව්වා. දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන ගෙනෙන වෙලාවේ එතුමා විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ට කිව්වා, ඉතාම සංවේදී film එකක් තිබෙනවා "තාරේ සමීන් පර්" කියලා, ඒ film එක බලන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
හොඳයි.

මේ විපක්ෂයේ ඉන්න අය සංවේදී මිනිස්සු නොවෙයි, චිත්‍රපට බලන්නේ නැහැ කියලා අපට චෝදනාවක් කළා. ඉතින්, එතුමාට කියන්න ඕනෑ, අපි "තාරේ සමීන් පර්" film එකත් බැලුවා, එතැනින් පස්සේ සිතාරේ සමීන් පර් film එකත් බලලා තිබෙන්නේ කියලා. හැබැයි, අපි ආණ්ඩුවට කියනවා එක දෙයක්. මේ film එකත් මම හිතන හැටියට පාර්ලිමේන්තුවේ පෙන්වන්න ඕනෑ. නාට්‍යයකුත් පෙන්නුවා නේ, මේ පාර්ලිමේන්තුවේ. කරුණාකර, මේ film එකත් පෙන්වන්න. ඉන්දියාවේ මීට දින කිහිපයකට පෙර තිරගත වුණා "මදරාසි" කියලා දමිළ චිත්‍රපටයක්. ඒ චිත්‍රපටයේ තිබෙන්නේ මොකක්ද? දකුණු ඉන්දියාවේ සාමකාමී බව නැති කරන්න, දේශපාලනයක් නැතිව බලහත්කාරයෙන් පාලන බලය ගන්න අවි ආයුධ කන්ටේනර් 5ක් දකුණු ඉන්දියාවට ගෙනැල්ලා ඒ පාලන බලය ලබා ගන්නා ක්‍රමය ගැනයි ඒ චිත්‍රපටයේ සඳහන් වන්නේ. අද අපට සැකයක් මතුවී තිබෙනවා. එතැන තිබුණේ කන්ටේනර් 5යි. එහි තිබෙනවා ඒගොල්ලන් කොහොමද පාලන බලය ගන්නේ කියලා. ආයුධ 100ක් දකුණු ඉන්දියාවේ තැන් 100කට යවලා විවිධ අපරාධ කරන්න කියලා උපදෙස් දෙනවා. ඒ වාගේ තමයි අද ලංකාවේත් කටයුතු සිද්ධ වෙන්නේ. මේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. ඒ කාලය තුළ වෙඩි තැබීම් 104ක් සිදුවෙලා තිබෙනවා. ඉතින්, ඉන්දියාවේ තිරගත වුණු මේ චිත්‍රපටය හා සමාන දෙයක් තමයි අද ලංකාවේ වෙන්නේ. ඒ නිසා අපේ බිමල් රත්නායක ඇමතිතුමා ඇතුළු මේ සියලුදෙනාට අපි කියනවා ඒ චිත්‍රපටය බලන්න කියලා. ලංකාවට අනාගතයේදී මුහුණ දෙන්න වෙන දේ සම්බන්ධ චිත්‍රපටයක් ඉන්දියාවේ හදලා තිබෙනවා. ඒක බලන්න කියන ආරාධනාව මම මේ වෙලාවේ කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.13]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද මහජන ආරක්ෂක අමාත්‍යාංශයේත්, ආරක්ෂක අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වැය ශීර්ෂ දෙකම වැදගත් වන්නේ ඇයි? පසුගිය කාලයේ අපේ රටේ දේශපාලන වශයෙන් ඝාතන රාශියක් සිද්ධ වුණා. දේශපාලන වශයෙන් සිද්ධ වෙච්ච ඒ ඝාතනය වූ අයට සාධාරණය ඉෂ්ට කරනවා කියලා 2024 ජනාධිපතිවරණයේ දී වර්තමාන ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුව ප්‍රමුඛ ජනාධිපතිතුමා වේදිකාවලදී පොරොන්දු වුණා. ඒ නිසා තමයි මේ වැය ශීර්ෂ දෙකත් අපට වැදගත් වෙන්නේ. එහිදී ප්‍රධාන වශයෙන් එතුමන්ලා කථා කරපු ඒවා තමයි 2019 සිද්ධ වෙච්ච පාස්කු බෝම්බ ප්‍රහාරය, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ප්‍රගීත් එක්නැලිගොඩ, තාජුඩීන්, කීත් නොයාර්, පෝද්දල ජයන්ත වාගේ අයට පහර දීම වැනි සිදුවීම්. ඒවාට නීතිය ඉෂ්ට කරනවා කිව්වා. ඊළඟට තමයි Dr. Shafiට වෙච්ච අසාධාරණය ගැනත් කියලා, ඒකට සම්බන්ධ වෙච්ච අයත් නීතිය ඉදිරියට ගෙනෙනවා කිව්වේ. මේ ආණ්ඩුව ඇවිල්ලා අවුරුද්දක කාලයක් අවසාන වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා එදා ඝාතන 5ක් ගැන කථා කළා. ඒ ඝාතන 5 ගැන එතුමා වේදිකාවල නම් කරලාම කිව්වා, ඒවාට සාධාරණය ඉෂ්ට කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ආණ්ඩුව ඇවිල්ලා අවුරුද්දක් වෙලා තිබෙනවා. තවම ඒ සඳහා ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය ගත්තොත්, අපට පෙනෙනවා තවමත් ඒ සම්බන්ධ නඩු පවරලා නැහැ කියලා. පෝද්දල ජයන්තට පහර දීම සම්බන්ධ විමර්ශනවත් තවම පටන් අරගෙන නැහැ. ඔබතුමන්ලා කිව්වා, තාජුඩීන්ගේ නඩුව සම්බන්ධවත්. සංවිධානාත්මක අපරාධකාරයෙක් ඊයේ පෙරේදා අල්ලාගෙන ඇවිල්ලා ඔබතුමන්ලා ප්‍රකාශ කළා, මෙයා තාජුඩීන්ගේ ඝාතනයට සම්බන්ධයි කියලා. ඒක ඒ දවස්වල මාධ්‍යවල ලොකුවට ගියා. දැන් ඒක නොවෙයි ප්‍රශ්නය.

2016 හයවෙනි මාසයේ 10 වෙනි දා "බී" වාර්තාව ඉදිරිපත් කර 849/3/12 කියන නඩුව, ඒ කියන්නේ තාජුඩීන්ගේ ඝාතනයට අදාළ නඩුවේ දී කොළඹ අතිරේක මහේස්ත්‍රාත් නිශාන්ත පීරිස් මහත්මයා ඉදිරිපිට නාරාහේන්පිට හිටපු අපරාධ පරීක්ෂණ OIC සුමිත් පෙරේරා මහත්මයා පාපෝච්චාරණයක් කර තිබෙනවා. එයා පාපෝච්චාරණය කරන්නේ මොකක්ද? එයා පාපෝච්චාරණයක් කරලා කියනවා, මේ සිද්ධියට අනුර සේනානායක සමඟ එදා කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ රණවීර මහත්තයා සම්බන්ධ වෙලා තමයි මේ ඝාතනය වෙනත් පැත්තකට

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

හරවන්න සාක් කි ගොනු කළේ කියලා. එයා පාපෝච්චාරණයක් කර තිබෙනවා, මහේස්ත්‍රාත් ළඟට ගිහිල්ලා. අනුර සේනානායකගේ උපදෙස් පිට තමයි එදා CCD එකේ හිටපු අධ්‍යක්ෂ රණවීර "B" Report එක හදා තිබෙන්නේ, මේක accident එකක් කියලා. ඒ කාගේ උපදෙස් පිටද? හිටපු DIG අනුර සේනානායක මහත්මයාගේ උපදෙස් පිට. එතකොට දැන් ප්‍රශ්නය මේකයි. ජනාධිපතිතුමා මේවා දන්නේ නැද්ද? මේකට රණවීර සම්බන්ධයි කියලා නාරාහේන්පිට Crime OIC කරපු පාපෝච්චාරණය ජනාධිපතිතුමා දන්නේ නැද්ද? රණවීර දැන් කොහේද ඉන්නේ? රණවීර දැන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක. ජනාධිපතිතුමාගේ භාෂාවෙන්ම කිව්වොත්, පාර රාජ්‍යයේ කොටස්කාරයෝ දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තනතුරුවල ඉන්නවා. ඊළඟට, දූරකථන දත්ත මකපු එක්කෙනා ජනාධිපතිතුමාගේ ඩිජිටල් උපදේශක. ඉතින් කොහොමද ඔබතුමන්ලා තාජුඩීන්ගේ ඝාතකයෝ අල්ලන්නේ? තාජුඩීන්ගේ ඝාතනයට සම්බන්ධ වෙච්ච උදවිය, තාජුඩීන් accident එකකින් මැරුණා කියලා "බී" වාර්තා දාපු උදවිය තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තනතුරුවල තියාගෙන පුළුවන්ද තාජුඩීන්ගේ ඝාතකයෝ අල්ලන්න? ඉතින් මොකක්ද මේ කරන විහිළුව? කවුරුද මේ රවට්ටන්නේ? ඒ අය නිදැල්ලේ ඉන්නවා. හිරේ ඉන්න ඕනෑ මිනිස්සු නිදැල්ලේ ඉන්නවා.

දොස්තර ෂාෆිගේ ප්‍රශ්නයත් ඒ වාගේමයි. ඒක මාර සංවේදී ප්‍රශ්නයක්. මොකද, ජාතිවාදය අවුස්සලා ඒ කාලයේ තිබුණු යහ පාලන ආණ්ඩුව පෙරළන්න දොස්තර ෂාෆිව පාවිච්චි කළා. ඔබතුමන්ලාගේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඇතුළු අපි ඔක්කෝම එදා ඒකට විරුද්ධව කථා කළා. අපි ආණ්ඩු පක්ෂයේ සිටියා, ඔබතුමන්ලා විපක්ෂයේ සිටියා. නමුත්, දොස්තර ෂාෆිට ගෙනාපු බොරුව පරද්දන්න අපි දෙගොල්ලෝම එකම මතයේ සිටියේ. ඒ සඳහා කුමන්ත්‍රණත් කළා නේ. ඇත්තටම ඒ සඳහා කූඨ ලේඛන හදලා, කථාවක් ගෙතුවා. එදා කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිටපු SSP මහත්මයායි, අද Senior DIG වශයෙන් සිටින කිත්සිරි ජයලත් මහත්මයායි තමයි ඒ කුමන්ත්‍රණය කළේ. මේ සඳහා කුමන්ත්‍රණයක් කළා කියලා කියන්නේ මම නොවෙයි. එදා රවී සෙනෙවිරත්න මැතිතුමා CID එකේ DIG හැටියට ශානි එක්කයි, තිසේරා එක්කයි එකතුවෙලා පරීක්ෂණයක් කරලා කුරුණෑගල මහෙස්ත්‍රාත් උසාවියට වාර්තාවක් දුන්නා. ගිය සතියේ මම ඒ වාර්තාව සභාගත කළා. ඒගොල්ලෝ ඒ වාර්තාවෙන් පැහැදිලිව කියනවා, ෂාෆි සම්බන්ධ මේ නාඩගම මහින්ද දිසානායකයි, කිත්සිරි ජයලතුයි එකතු වෙලා කරපු කුමන්ත්‍රණයක් කියලා. තමුන්නාන්සේලා මොකක්ද කළේ? මම හිතන හැටියට රවී සෙනෙවිරත්න මහත්මයා මේ විවාදය බලන්න ඇවිල්ලා මේ වෙලාවේ රාජ්‍ය නිලධාරින්ගේ කුටියට වෙලා අහගෙන ඉන්නවා. මම දන්නේ නැහැ ශානි ඉන්නවාද කියලා. මේ ජාතිවාදී කුමන්ත්‍රණය ඇති කරන්න වැඩ කරපු ප්‍රධානියා වන මහින්ද දිසානායකට ඔබතුමන්ලා DIG විධියට promotion එකක් දුන්නා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
හිරේ නේද ඉන්න ඕනෑ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, හිරේ ඉන්න ඕනෑ මිනිස්සු. කිත්සිරි ජයලත්, Senior DIG. ඉතින් ජනාධිපතිතුමා මොකක්ද මේ කියන්නේ? ජනාධිපතිතුමා පාර රාජ්‍යය, අපරාධ රාජ්‍යය කියලා හැමදාම කියනවා. ඉතින්, අපරාධ රාජ්‍යයේ හිටපු අයට තමුන්නාන්සේලා promotions දෙනවා නේ. අනික් පැත්තෙන් Dr. Shafiගේ පොත release කරනකොට ඒකටත් යනවා. ෂාෆිගේ පොත release කරනකොට එතැනටත් ගිහිල්ලා වාඩිවෙලා ඉන්නවා. ෂාෆිට විතරක් නොවෙයි ඒ අපරාධය කළේ. ඒක මුළු මුස්ලිම් සමාජයටම කරපු අපරාධයක්. මොකද, ඒක නිසා ලංකාවේ හිටපු මුස්ලිම් දොස්තරවරු මෙහේ ඉන්න බැරුව රට දාලා ගියා. ඊළඟට, සිංහල, මුස්ලිම් ජනතාව අතර සැකය, අවිශ්වාසය, වෛරය ඇති කළා. එහෙම සිද්ධියක් ඒක. අද තමුන්නාන්සේලාට ඒක සුළු සිද්ධියක් වෙන්න පුළුවන්. ඒක නිර්මාණය කරපු අයට, ඒක අධ්‍යක්ෂණය කරපු අයට, තමුන්නාන්සේලා promotions දුන්නා. මම දන්නේ නැහැ, ශානියි, රවියි මොකක්ද ඒ ගැන කියන්නේ කියලා. මොකද, ඒගොල්ලන්ගේ වාර්තාවෙන් තමයි මහින්ද දිසානායකයි, කිත්සිරි ජයලතුයි වැරදිකාරයෝ කරලා තිබෙන්නේ. එතුමන්ලා එදා උසාවියට දාපු වාර්තාව අපි අගය කරනවා. 2019දී තමයි CID එකෙන් පරීක්ෂණයක් කරලා ඒ වාර්තාව උසාවියට දැම්මේ. දැන් එතුමන්ලාත් මේ ආණ්ඩුවේ ඉන්නවා. එතුමන්ලා වැරදිකාරයෝ කියපු අයට ආණ්ඩුව promotions දෙනවා. මම දන්නේ නැහැ, රවි සෙනෙවිරත්න කියන දේවල් ආණ්ඩුව අහන්නේ නැද්ද කියලා. මට ආරංචියක් තිබෙනවා, පොලිස්පතිතුමා රවි කියන දේවල් අහන්නේ නැහැ කියලා. දැන් සිදුවන සිද්ධි දිහා බැලුවාම අපට එහෙම දෙයක් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, Dr. Shafi පැමිණිල්ලක් දැම්මා. මොකක්ද ඒ පැමිණිල්ල? 2024.11.07 දින - මේ ආණ්ඩුව ආවාට පස්සේ - පැමිණිල්ලක් දැම්මා, තමන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා. ඒ පැමිණිල්ල තවම විභාග කළේ නැහැ නේ. එතුමා, තමන්ට වෙච්ච අසාධාරණයට, තමන්ට කරපු කෙනෙහිලිකම්වලට විරුද්ධව පැමිණිල්ලක් දැම්මා. 2024.11.07 දින දමපු ඒ පැමිණිල්ල තමුන්නාන්සේලා තවම විභාග කළේ නැහැ. තමුන්නාන්සේලා කථා කරන සාධාරණත්වය, නීතියේ ආධිපත්‍යය, මේ අපරාධ රාජ්‍යය නැති කරන්න ඕනෑ කියන දේවල් නිකම් වචන විතරයි. හැමදාම ලස්සන වචන ටිකක් කියනවා. නමුත්, ඒවා ප්‍රායෝගිකව කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, TID එක ගැන, CID එක ගැන, පලස්තීනය ගැන මම නිතරම කථා කරනවා. කොළඹ නගර සභාවේ ඉන්න, අපේ හිතවත් නාගරික මන්ත්‍රී අර්ෂාඩ් නිසාම්ඩීන් මැතිතුමා කොළඹ නගර සභාවට යෝජනාවක් ගෙනාවා, කොළඹ නගරයේ තිබෙන Sabbat houses වහන්න කියලා. නීති විරෝධී Sabbat houses තිබෙනවා කියලා අගමැතිතුමිය පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. හැබැයි, ඒ යෝජනාව ගෙනාපුවාම, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයෙන් - TID එකෙන් - මන්ත්‍රීතුමාව කැඳවලා අහනවා, එහෙම යෝජනාවක් ගෙනාවේ ඇයි කියලා. කාගේ වුවමනාවට ද ගෙනාවේ කියලා අහනවා. එතුමාගෙන් දිගටම ප්‍රශ්න කරනවා. ලංකාවේ තිබෙන ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පාලනය කරන්නේ මොසාඩ් එකෙන් ද? පලස්තීනය සම්බන්ධව, නැත්නම් පලස්තීනයට පක්ෂව මොකක් හරි දෙයක් කථා කළ ගමන් CID එකයි, TID එකයි එන්න කියනවා. ඒක මොන විළිලැජ්ජා නැති වැඩක්ද? අඩු ගණනේ ඊශ්‍රායලයට සහයෝගය දක්වන ඇමෙරිකාවත් මෙහෙම කරන්නේ නැහැ. ට්‍රම්ප්වත් මෙහෙම කරන්නේ නැහැ. තමුන්නාන්සේලා එක පැත්තකින් කියනවා, "අපි පලස්තීනයේ නිදහස වෙනුවෙන් පෙනී සිටිනවා" කියලා. එහෙම පෙනී සිටින ගමන්, ඊශ්‍රායලයේ නිදහස වෙනුවෙනුත් වෙනම දෙයක් කරගෙන යනවා. ඊශ්‍රායලයට මොකක් හරි කියපු ගමන් පොලීසියට එන්න කියනවා. ඒ දෙබිඩි පිළිවෙත නවත්වන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාරය ගැන කථා කරන්න ඕනෑ. තමුන්නාන්සේලා පසුගිය කාලයේදී පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධව ලොකු

පොරොන්දුවක් දුන්නා. ඒ ගැන අප්‍රේල් 21වැනි දා කියනවා කියලා දින වකවානු පවා කිව්වා. ඒ වාගේම ජනාධිපතිතුමා කිව්වා, රාජ්‍යය විසින් රාජ්‍යය පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ කියලා. මොකද, මේ රාජ්‍යය ඇතුළේ පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච උදවිය ඉන්නවා කියලා ජනාධිපතිතුමා කිව්වා. අපි නම් මීට කලිනුත් දන්නවා, මේක මේ රාජ්‍යය ඇතුළේ සිදුවුණු කුමන්ත්‍රණයක් කියලා. අපි සියලුදෙනා කිව්වා, ඒක කුමන්ත්‍රණයක් කියලා. ඒක කුමන්ත්‍රණයක් කියලා තමුන්නාන්සේලාත් කිව්වා; අපිත් කිව්වා. එදා තිබුණු ආණ්ඩුව පරාජය කිරීමේ යම් කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක්,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට වැඩිපුර වෙලාවක් ගයන්ත මන්ත්‍රීතුමාගේ කාලයෙන් ලැබෙනවා. එතුමා මට වෙලාව ගන්න කිව්වා.

ඒ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ ගැන අපි කවුරුත් කථා කළා. තමුන්නාන්සේලාත් කථා කළා; අපිත් කථා කළා. ඔබතුමන්ලා දරපු ඒ මතය දැන් වෙනස් කරලාද කියලා මම දන්නේ නැහැ. අපි නම් තවම කියනවා, ඒක කුමන්ත්‍රණයක් කියලා. රාජ්‍යය ඇතුළේ රාජ්‍යය පරීක්ෂාවට ලක් කරන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා කියනකොට, එදා කුමන්ත්‍රණකාරයෝ හැටියට වැඩ කරපු, එදා පාස්කු බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වෙච්ච සමහර උදවිය මේ ආණ්ඩුව ඇතුළට රිංගලා ඉන්නවාද කියලා අපි ප්‍රශ්නයක් පැන නැඟුවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 3ක අමතර කාලයක් ලැබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Okay. Thank you.

ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කියපු දින වකවානු ඔක්කෝම දැන් පහුවෙලා තිබෙන්නේ. තවම මහ මොළකරු අල්ලාගන්න බැරිවෙලා තිබෙනවා. අපි නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. එතකොට තමුන්නාන්සේලා කිව්වා, ඒක ගේන්න බැහැ, එහෙම විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න අවශ්‍යතාවක් නැහැ, ඒක නීති විරෝධියි කියලා. එහෙම කියලා තමුන්නාන්සේලා නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාව ආරක්ෂා කළා. අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඒක දේශපාලන කුමන්ත්‍රණයක් කියලා කිව්වේ ඇයි? 2018 ඔක්තෝබර් මාසයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාව, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ව්‍යවස්ථා විරෝධීව අගමැතිවරයා හැටියට පත් කරනවා. එතුමාව අගමැතිවරයා හැටියට පත් කළාම තමුන්නාන්සේලා ඇතුළු අපි ඔක්කෝම ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. එදා ජනතා විමුක්ති පෙරමුණේ හිටපු උදවියත් අපිත් එක්ක ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩු දැම්මා. ඒ නඩුවෙන් අපි දිනුවා. මහින්ද රාජපක්ෂ අගමැති වෙලා හිටපු කාලයේ - එදා ඒ කුමන්ත්‍රණ කාලයේ - නොවැම්බර් 17වැනි දා තමයි අද නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා හැටියට කටයුතු කරන මේජර් ජෙනරාල් අරුණ ජයසේකර මැතිතුමා, නැඟෙනහිර ආරක්ෂක සේනා ආඥාපති හැටියට පත් වුණේ. එතුමා ආඥාපති හැටියට පත්වෙලා හිටපු කාලයේ සහරාන්ගේ ක්‍රියාකාරිත්වය නැඟෙනහිර පළාතේ දිගටම පැවතුණා. ඒ තත්ත්වය එතුමා පත් වෙන්න කලිනුත් තිබුණා, ඊට පසුවත් තිබුණා. ඊළඟට, වවුනතිව්වල පොලීසියේ දෙදෙනෙකුව ඝාතනය කිරීම සිද්ධ වුණෙත් එතුමා නැඟෙනහිර පළාතේ ආරක්ෂක සේනා ආඥාපති හැටියට සිටිද්දී. ඊළඟට, 2019 අප්‍රේල් මාසයේ 26වැනි දා සයින්දමරුදුවල සහරාන්ගේ පවුලේ උදවිය මිය ගිය මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සිද්ධ වුණේත් එතුමා නැඟෙනහිර පළාතේ ආඥාපති හැටියට සිටි කාලයේ. එතුමා යටතේ හිටපු මේජර් සුබසිංහ තමයි එතැනට පළමුවැනි වතාවට ගියේ. ඔහු එතුමා යටතේ හිටියේ. එතුමා යටතේ හිටපු හමුදා ඛණ්ඩය තමයි එතැනට ගියේ. අපි සියලුදෙනා දන්නවා, අද වනකොට සාරා ජෙස්මින් අතුරුදහන් වෙලා කියලා. සාරා ජෙස්මින්ව එතැනින් පැන්නුවා. අද ඒ සම්බන්ධව පරීක්ෂණ කර ගෙන යනවා.

අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා පාර්ලිමේන්තුවේදි කිව්වා, සාරා ජෙස්මින් මැරුණේ නැහැ, ඒ පිළිබඳව සැකයක් තිබෙනවා කියලා. අපිත් කියනවා, සාරා ජෙස්මින් මැරුණේ නැහැ කියලා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වා, සාරා ජෙස්මින් ඉන්දියාවේ ඉන්නවා කියලා. එතකොට මේ සාරා ජෙස්මින්ව පැන්නුවේ කවුද? පැන්නුවේ මේජර් සුබසිංහද? ඒක හොයන්න ඕනෑ. දැන් ආණ්ඩුව කියනවා, ඒක හොයන්න එදා හිටපු හමුදා නිලධාරින්ගෙන් කට උත්තර ගන්නවා කියලා. බුද්ධි අංශයේ අය සම්බන්ධයි කියලා අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමාම පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා. එතුමා යටතේ හිටපු උදවියව අද පරීක්ෂාවට ලක් වෙලා තිබෙනවා. එතුමාත් කට උත්තරයක් දීලා තිබෙනවා. එතකොට එතුමාවත් පරීක්ෂාවට ලක් වෙලා තිබෙනවා. අන්න ඒ නිසා තමයි අපි අහන්නේ එදා බෝම්බය පිපිරෙනකොට ඒ රජයේ කොටස්කාරයෙක් වෙලා හිටපු අරුණ ජයසේකර මැතිතුමා, අද ඒ බෝම්බය ගැන විමර්ශනය කරන ආණ්ඩුවේ ආරක්ෂක නියෝජ්‍ය ඇමති වෙලා සිටිද්දී පරීක්ෂණ කරන්නේ කොහොමද කියලා. ඉතින්, මේ කාරණය ඕනෑම පොඩි ළමයෙකුට තේරෙනවා. ඒ නිසා තමයි එතුමාට අයින් වෙලා මේක කරන්න ඉඩ දෙන්න කියලා අපි කිව්වේ. මම එතුමාට චෝදනා කරන්නේ නැහැ. නමුත්, එතුමා ඒ තනතුරේ රැඳී සිටීම මේ පරීක්ෂණවලට බාධාවක්. මොකද, එතුමාගේ යටතේ සිටින අයව තමයි පරීක්ෂාවට ලක් වෙලා තිබෙන්නේ. එතුමාත් පරීක්ෂාවට ලක් වෙලා ඉන්නවා. ඒ නිසා තමයි කිව්වේ. නමුත්, තමුන්නාන්සේලා ඒකට ඉඩ දෙන්නේ නැතිව කිව්වා, ඉවත් වෙන්න ඕනෑ නැහැ කියලා. ඕනෑ නැත්නම් කමක් නැහැ. අපට තිබෙන සැකය තමයි තමුන්නාන්සේලාත් දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇතුළට රිංගලා ඉන්න යම් යම් කුමන්ත්‍රණකාරයෝ ආරක්ෂා කරනවාද කියන එක. එක පැත්තකින් රණවිරු ආරක්ෂා කරනවා. එක පැත්තකින් මහින්ද දිසානායක ආරක්ෂා කරනවා. අනෙක් පැත්තෙන් තව කවුද, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. එක එක්කෙනාව ගෙන්වා ගන්න දැන් රතු වරෙන්තු ගන්නවා නේ. පිටරටවල ඉන්න පාතාල ලෝකයේ නායකයන්වත් දැන්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගෙනෙනවා. ඒක හොඳ වැඩක්. ඇයි, සාරා ජෙස්මින් පිළිබඳව රතු වරෙන්තුවක් ගන්න බැරි? සාරා ජෙස්මින් තවම ජීවතුන් අතර ඉන්නවා කියලා අපි දෙගොල්ලෝම විශ්වාස කරනවා. එහෙනම් ඇයි, සාරා ජෙස්මින්ට රතු වරෙන්තුව ගන්න බැරි? ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, අපි කියන දේවල් තේරුම් අරගෙන වහාම මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න කියලා. විනිවිදභාවය, නීතියේ ආධිපත්‍යය, සාධාරණත්වය ගෙනෙනවා කියලා තමුන්නාන්සේලා කියනවා. ජනාධිපතිතුමා කියනවා, පාර රාජ්‍යයක හිටපු කොටස්කාරයින්ව අයින් කරනවා කියලා. නමුත්, ආණ්ඩුව පාර රාජ්‍යයේ හිටපු කොටස්කාරයන් එක්ක තවම එක මිටකට ගමන් කරන බව අපට පෙනෙනවා.

බොහොම ස්තුතියි මට කාලය ලබා දුන්නාට, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා උදේ ප්‍රකාශ කළා, ත්‍රිකුණාමලයේ ඒ විහාරයට අදාළව නඩුවක් නැහැ කියලා. මම එතුමාගේ අවධානයට යොමු කරනවා, CA Writ/1099/2025, Rev. Thrikunamalaye Kalyanawansha Thissa Thero, Chief Incumbent, Sri Sambuddha Jayanthi Bodhiraja Temple, Trincomalee. නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් ඔබතුමා මේ නඩුව පිළිබඳව නොදැන සිටීම ඉතාම අභාග්‍යයක්. මේ සම්බන්ධයෙන් නඩුවක් තිබෙනවා. ඔබතුමන්ලා ඒ කාරණය දන්නේ නැතිව තමයි ත්‍රිකුණාමලය පන්සලේ මේ වාගේ විශාල ප්‍රශ්නයක් ඇති කළේ කියන එක මම ඔබතුමාට කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ලුතිනන් කමාන්ඩර් ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.31]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද උදෑසන ඉඳලා විපක්ෂයේ කථාවලට ඇහුම්කන් දෙද්දී මට හිතුණා, මෙච්චර කල් රට පාලනය කළේ අපි ද කියලා. මොකද, පාස්කු ප්‍රහාරය ගැන කථා කළා, තාජුඩීන්ගේ ඝාතනය ගැන කථා කළා. එතකොට ඒගොල්ලන්ට මේ inquiries සිදු කරන්න කාලයක් තිබ්බේ නැද්ද කියලා මට හිතෙනවා. මොකද, අපි රජය භාර අරගෙන අවුරුද්දයි ගත වෙලා තිබෙන්නේ. මේ කාලය තුළ විශාල වැඩ කටයුතු ටිකක් කෙරීගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද උදෑසන ඉඳලා කරන කථා අපි අහගෙන සිටියා. එක්කෝ, රවී සෙනෙවිරත්න මහත්මයා ගැන කථා කරනවා. එහෙම නැත්නම් ශානි අබේසේකර ගැන කථා කරනවා.

පොලිස්පතිතුමාට ප්‍රහාර එල්ල කරන්න බලනවා. ඊට පස්සේ අපේ ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාට ප්‍රහාර එල්ල කරන්න බලනවා. ඊට පස්සේ අපේ මහජන ආරක්ෂක අමාත්‍යතුමාට ප්‍රහාර එල්ල කරන්න බලනවා. මම හිතන විදියට, ඒවා කරලා දැන් වටෙන් යන්නේ, වැඩේ හරියට යනවා කියලාත්, කරපු අයගේ පැත්තට දැන් පත්තු වේගෙන එන්නේ කියලාත් දන්නා නිසා වෙන්න ඇති. ඒ හින්දා දැන් කෑ ගහගෙන, කෑ ගහගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒත් එක්කම මට දැනුණා, පොහොට්ටුවෙන් තියන්න යන නාට්‍යයක් අද උදේ ඉඳන් සජබයෙන් කරේ තියාගෙන යනවා වාගේ එකක්. ගරු විපක්ෂ නායකතුමා මේ අවස්ථාවේ සභාවේ නැති වුණත්, මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මොකද, මේ හදන්නේ එතුමාගේ විපක්ෂ නායකකමත් නැති කරන්නද, කණ්ඩායමක් එකතු වෙලා ඒක අල්ලා ගන්නද දන්නේ නැහැ. මම හිතන විදියට, එතුමාට පක්ෂය ඇතුළේ යම් ගරුත්වයක් ඇති. ඒ හින්දා පොහොට්ටුවේ නාට්‍යය සජබයෙන් කරේ තියාගෙන යන්න හදන්නේ නැතුව විනයවත්ව කථා කරන්න කියලා එතුමා විසින් එතුමාගේ කරීකයින්ව පොඩ්ඩක් දැනුවත් කළා නම් වටිනවා. එතුමා දැනුවත් කළාම පක්ෂයේ අය ඒක අහනවාද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. නමුත් චූට්ටක් හරි එතුමාට ගරුත්වයක් ඇති, එතුමා විපක්ෂ නායකතුමා හින්දා. ඒ හින්දා ඒ ගැන දැනුවත් කරන්න කියලා එතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දින ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයේ දැක්ම වන්නේ, "සැම සුරැකි සාමකාමී දේශයක්" යන්නයි. ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙවර වන්නේ, "භෞමික අඛණ්ඩතාවෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම" යන්නයි. ඒ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා ජාතික ආරක්ෂාව තහවුරු කිරීම, අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම, ඒ සඳහා අවශ්‍ය ඒකාබද්ධ බුද්ධි යන්ත්‍රණයක් විශ්වාසවන්ත සහ කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කිරීම, ආගන්තුක හමුදා සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම, ජාත්‍යන්තර මානුෂීය මෙහෙයුම් සඳහා සහාය ලබා දීම, පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි, පීඩාකාරී ආයුධ, රසායනික අවිවලට අදාළව වගකීම දැරීම, ප්‍රදීපාගාර නඩත්තුව, උදර්පණයට අදාළ කටයුතු සිදු කිරීම, කාලගුණය සහ දේශගුණයට අදාළ සේවා සැපයීම, නාය යෑම් ඇතුළු ආපදා කළමනාකරණය සහ ඊට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම වැනි දේවල් මෙම අමාත්‍යාංශය මඟින් ඉටු කරන ප්‍රමුඛ කාර්යයන් අතරට ගැනෙනවා.

ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශය ආයතන 25කින් සමන්විත වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ කාර්යයන් කරගෙන යන්න 2026 අවුරුද්දේ අය වැය මඟින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත රුපියල් බිලියන 455ක් වෙන්කොට තිබෙනවා. ත්‍රිවිධ හමුදාව ගත්තාම අපේ රටට තිබෙනවා, Exclusive Economic Zone - EEZ - කියන අපට අයත් මුහුදු කලාපයක්; රට වාගේ 8 ගුණයක් විශාල මුහුදු කලාපයක්. ඒ වාගේම රටේ භූමිය වාගේ 27 ගුණයක් විශාල Search and Rescue Region එකක් අපට තිබෙනවා. ඒ තැන්වල ආරක්ෂාව සලසන්නට, ඒ වාගේම ඉන්දියන් සාගර කලාපයේ ආරක්ෂාව, ස්ථාවරත්වය පවත්වාගෙන යන්න නාවික හමුදාවේ නිරීක්ෂණ සහ අධීක්ෂණ ධාරිතාව ශක්තිමත් කරන්න වනවා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිරීක්ෂණ

සහ අධීක්ෂණ ශක්තිය ශක්තිමත් කරන්න වනවා, ඒ වාගේම ශ්‍රී ලංකා යුද හමුදාවේ නිරීක්ෂණ සහ අධීක්ෂණ ශක්තියත් ශක්තිමත් කරන්න වනවා. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා රුපියල් මිලියන 91,710ක් 2026 අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා යුද හමුදාවට රුපියල් මිලයන 229,464ක් වෙන් කරලා තිබෙනවා, රටේ ජාතික ආරක්ෂාව සලස්වන්න සහ අනෙක් වැඩ කටයුතු කරන්න. ඒ වාගේම ගුවන් හමුදාවට රුපියල් මිලියන 74,169ක් වෙන් කරලා තිබෙනවා, රටේ ආරක්ෂාව, නිරීක්ෂණ සහ අධීක්ෂණ කටයුතු කරගෙන යන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒත් එක්කම උදේ ඉඳන් මන්ත්‍රීවරුන් දෙපළක් විතර කියනවා මට ඇහුණා, හමුදාවල ශක්තිය අඩුවෙලා කියලා. ඇත්තටම හමුදාවල ශක්තිය අඩු වුණා තමයි. මොකද, ඒගොල්ලන් රට පාලනය කරපු කාලයේ මානසික ඒකාග්‍රතාවකින් යුතුව ත්‍රිවිධ හමුදාවල වැඩ කරන්න ඒ අයට අවස්ථාව ලැබුණේ නැහැ. ඒ නිසා ඒ කාලයේ හමුදාවල ශක්තිය නැති වෙලා තිබුණා.

ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, පුළුවන් නම් මේ අයට නිවැරදි තොරතුරු ගන්න - වැරදි තොරතුරු ගන්නේ නැතිව - පුළුවන් අවස්ථාවක් හදලා දෙන්න කියලා. එහෙම නැත්නම් වැරදි තොරතුරු අරගෙන වැරදි දේවල්ම තමයි මෙතැන ඇවිල්ලා කියන්නේ. ඒ වාගේම සන්නද්ධ හමුදාවේ සාමාජිකයින්ගේ ගෞරවය, අභිමානය ආරක්ෂා කිරීම සඳහා ජාතික අවශ්‍යතාවක්, හදිසි අවශ්‍යතාවක් ඇති අවස්ථාවලට පමණයි ත්‍රිවිධ හමුදාවේ පුද්ගලයින් - ඒ රණ විරුවන් - ඒ වැඩ කටයුතු සඳහා අපි යොදවන්නේ. එහෙම නැතුව ඉස්සර යෙදෙව්වා වාගේ හැට්ටේ කට්ට ගහන්න, බල්ලෝ බලාගන්න, වැලිකොට්ට ගහන්න, කානු සුද්ද කරන්න ඒ කවුරුවත් යොදා ගන්නේ නැහැ. සිවිල් කටයුතු සඳහා රණ විරුවන් යොදා ගන්නවා නම් අපි යොදා ගන්නේ, - *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මන්ත්‍රීවරුන්ගේ නිවාස ටික හදාගන්න යොදවාගන්න.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ඔබතුමන්ලාගේ කාලයේ යොදවා ගත් ඒවා දැන් මතකයි නේ. ඒ මතක් වෙන ඒවා දැන් කියනවා. අහගෙන ඉන්න බැහැ. මතක් වෙනවා නේ, ඒ කාලයේ ඔවුන් මොනවාටද යොදා ගත්තේ කියලා. අන්න ඒ කාලයේ නම් ත්‍රිවිධ හමුදාවල මානසික ශක්තිය, මානසික ඒකාග්‍රතාව නැති වෙලා හමුදාවල ශක්තිය අඩපණ වෙලා තිබුණා. නමුත්, දැන් නම් එහෙම දේවල් වෙන්නේ නැහැ. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගැන පොඩ්ඩක් හිතලා පුළුවන් නම් වැරදි තොරතුරු නැතුව නිවැරදි තොරතුරු දෙන පිරිසක් ඔවුන්ට හඳුන්වා දෙන්න. එහෙම නැත්නම් හැමදාම වැරදි තොරතුරු ටිකක් හොයා ගෙන මෙතැනට එනවා.

ත්‍රිවිධ හමුදාවේ සේවය කරන අය දේශීය සහ විදේශීය පුහුණු අවස්ථාවලට වැඩි වශයෙන් යොමු කරන්නට මේ වෙද්දි අපි සොයා බලමින් යනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනවා. ඒත් එක්කම එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු සඳහා සහභාගි වීමේ අවස්ථාව ඔවුන්ට ලබා දීමට අවශ්‍ය කටයුතුත් කරගෙන යනවා. ඒ වාගේම 2025 අය වැයෙන් සහ 2026 අය වැයෙන් වැඩි වෙච්ච ඒ වැටුප් වැඩි වීම, වැටුප් වර්ධක ත්‍රිවිධ හමුදාවටත් ලබා දීලා තිබෙනවා.

සමහර අය කථා කරද්දි අපි දැක්කා, ත්‍රිවිධ හමුදාව උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලින් ඉවත් කරන්න ඕනෑ, ඉන්න ප්‍රමාණය වැඩියි කියලා ප්‍රකාශ නිකුත් කරනවා. මගේ අතේ තිබෙනවා, 2025 අවුරුද්දේ උතුරු සහ නැඟෙනහිර පළාත්වල ඉන්න අපේ ජනතාව වෙනුවෙන් - ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් - ශ්‍රී ලකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව කරපු වැඩ කොටස් කිහිපයක් ගැන සඳහන් ලේඛනයක්. මේගොල්ලන් එක එක පක්ෂ, පාට - වර්ණ - දාලා ජාති භේද ඇති කරන්න හැදුවාට, අපේ ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් විරෝදාර ත්‍රිවිධ හමුදාව විසින් ඉටු කරපු ප්‍රජා සත්කාර කිහිපයක් ගත්තොත්, පන්සල්, කෝවිල් ඇතුළු සියලුම ආගමික ස්ථාන, අධ්‍යාපන ආයතන ආදී සියලුම තැන්වලට ප්‍රජා සත්කාර කරලා තිබෙනවා. මේ ලේඛනයේ තිබෙන ඒ ඔක්කෝම මේ වෙලාවේ කියවන්න බැහැ. නිවාස ඉදිකිරීම්, වියළි සලාක මලු ලබා දීම, පාසල් උපකරණ ලබා දීම, තැලසීමියා රෝගීන් සඳහා නික්ෂේපණ යන්ත්‍ර ලබා දීම, ප්‍රති ආශ්‍රැත ජල පෙරන යන්ත්‍ර ලබා දීම වාගේම පල්ලිවල තිබෙන මංගල්‍යයන් -විශේෂයෙන්ම කච්චතිව් දූපතේ තිබෙන වාර්ෂික මංගල්‍යයන්, පලෙයිතිව් දූපතේ තිබෙන වාර්ෂික මංගල්‍යයන්- සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම, ඩෙල්ෆ්ට් දූපතේ පානීය ජලය නැති ජනතාවට පානීය ජල අවශ්‍යතා සැපිරීම, බීමට සුදුසු ජලය නොමැති උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ජනතාවට ප්‍රති ආශ්‍රැත ජල පෙරන යන්ත්‍ර - Reverse Osmosis plants, RO plants - ලබා දීම වාගේ වැඩ කටයුතු කරලා තිබෙනවා. ත්‍රිවිධ හමුදාව ඉන්න එක ඒ පැත්තේ ජනතාවට නම් ලොකු සහනයක්. ඒ ජනතාව අපවත් දන්න හින්දා අපට කථා කරලාත් කියනවා, ත්‍රිවිධ හමුදාව මේ ප්‍රදේශවල ඉන්න ඕනෑය කියලා. හැබැයි, මේ විපක්ෂයට වෙන එන්න තැනක් නැහැ. වංචාව, දූෂණය, නාස්තිය, අවභාවිතාව නවත්වලා, මූල්‍ය කළමනාකරණය කර තිබියදී මුළු ලෝකයම මේ රජය පිළිගෙන තිබෙනවා. මේගොල්ලන්ට එන්න තැනක් නැති හින්දා කොරහේ කිඹුල්ලු දකිනවා වාගේ ජාතිවාදය අවුස්සාගෙන හරි බලයට එන්න බලනවා. එහෙම එන්න බැහැ. මේ රටේ ආදරණීය ජනතාවට අපි කියනවා, මේගොල්ලන් 76 වසරක්ම කළේත් ඕකම තමයි කියලා. ජාතිවාදය අවුස්සලා තමයි බලය ගන්න බැලුවේ. එහෙම බලය ගත්තත් ඒගොල්ලන්ගේ දුවලා, පුතාලා ඒවාට සම්බන්ධ වන්නේ නැහැ. ගමේ අහිංසක අම්මා, අප්පච්චිගේ දුවලා, පුතාලා තමයි ලේ, ඉස් මස්, ඇට පවා දන් දීලා මේ රට සාමකාමී මට්ටමට ගෙනාවේ.

ඒ හින්දා අපි රටේ ජනතාවට කියනවා, ජාතික ආරක්ෂාව ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. මේවා මේගොල්ලන් විටින් විට ගෙනෙන මාතෘකා පමණයි. ඔබ සියලු දෙනා අපේ ශ්‍රී ලාංකික ජනතාව. ආරක්ෂක අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත් වෙලා අපි රජයක් විධියට රටේ සාමය ස්ථාපිත කරලා තිබෙනවා වාගේම ඉදිරියටත් ඒක පවත්වාගෙන යනවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.42]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ජාතික ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී මම කියන්න කැමතියි, රටේ ඉදිරි ගමනට කලාපයේ ආරක්ෂාව වාගේම රටේ පුරවැසියාගේ ආරක්ෂාවත් ඉතාම වැදගත් බව. අපි මේ කාරණය

[ගරු නිතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ආණ්ඩුවට පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අද රටේ පුරවැසියාගේ ආරක්ෂාව පිළිබඳව වාගේම රටේ ජාතික ආරක්ෂාව පිළිබඳවත් යම් චකිතයක් මේ රටේ ජනතාව තුළ තිබෙනවා, මේ රටේ සිදු වෙන සිදුවීම් සම්බන්ධයෙන් වාගේම වෙඩි තැබීම් සම්බන්ධයෙන්. ඒක ඔබතුමන්ලාට අර්ථ කථනය කරන්න පුළුවන් සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් අතර ඇති වෙන අර්බුදයක් කියලා. හැබැයි, සංවිධානාත්මක අපරාධකරුවන්ට නිදැල්ලේ ආයුධ අරගෙන රටේ සැරිසරන්න පුළුවන් නම්, සංවිධානාත්මක අපරාධකරුවන්ට නිදැල්ලේ ආයුධයක් අරගෙන සැරිසරලා තමන්ට ඕනෑ කෙනාට වෙඩි තියලා යන්න පුළුවන් නම්, එක්කෝ ඒක ආණ්ඩුවේ සහයෝගයෙන් වෙන්න ඕනෑ; එහෙම නැත්නම්ආණ්ඩුවේ අනුදැනුම මත වෙන්න ඕනෑ.

රටේ පුරවැසියාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් මතු වෙනවා. අද කලාපයේම අවධානය අන්තවාදය සහ ත්‍රස්තවාදය කියන කාරණයට යොමු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රටේ ජාතික ආරක්ෂාවෙන් රටේ සිටින පුරවැසියාගේ ආරක්ෂාව වාගේම රටක් විධියට අපි ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් සහ දේශපාලනික වශයෙන් කොතරම් ස්ථාවරද කියන කාරණයත් මනින්න පුළුවන්.

අපේ රට බලශක්තියෙන් සුරක්ෂිතද? දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් ගත වෙනවා. රටේ බලශක්ති අර්බුදයකට අපි මුහුණ දුන්නා. ඒ තුළ ජාතික ආරක්ෂාව කඩාගෙන වැටුණා. රිළවෙක් පැන්නාම, වඳුරෙක් පැන්නාම රටේ විදුලිය විසන්ධි වෙනවා නම් බලශක්ති සුරක්ෂිතභාවය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. හැබැයි, ඒකට ඔබතුමන්ලා ගත්ත පිළියම කුමක්ද? ඒ වෙනුවෙන් ඔබ ගත්ත ක්‍රියාමාර්ගය මොකද්ද? අල ගොවියා, ලූනු ගොවියා අසරණ වෙනවා නම්, හාල් ටික, වී ටික පිටින් ගෙනැත් කන්න දෙන සංස්කෘතියක් හදනවා නම්, අල ගොවියාගේ, වී ගොවියාගේ, ලූනු ගොවියාගේ, අර්තාපල් ගොවියාගේ සහ ධීවරයාගේ ආර්ථිකය කඩා වට්ටලා පිටින් ගෙනැත් කන්න දෙන යැපෙන්නන්ගේ ආර්ථිකයක් හදනවා නම්, රටේ කෘෂි කර්මාන්තය කඩා වට්ටනවා නම්, ඒ තුළ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව අපට තිබෙන ආරක්ෂිතභාවය කුමක්ද?

අනෙක් පැත්තෙන් අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල ගැටලු තිබෙනවා. බෙහෙත් හිඟයක් තිබෙනවා. එක පැත්තකින් වෛද්‍යවරුන්ට කියනවා, පෞද්ගලික අංශයෙන් බෙහෙත් ගන්න තුණ්ඩු ලියන්න කියලා. ඒ තුණ්ඩුවට approval එක ගන්න ඉස්පිරිතාලය ඇතුළේ ස්ථාන 5කට යන්න ඕනෑ. ඉස්පිරිතාලේ බෙහෙත් තිබුණා කියලා පැමිණිල්ලක් ආවොත්, මේ ආණ්ඩුවෙන් ගිහින් පරීක්ෂණයක් කරලා වෛද්‍යවරයා අපහසුතාවට පත් කරනවා.

ඒ වාගේම අද පැහැදිලිවම වෛද්‍ය සංගමය විසින් ඔබතුමන්ලාව දැනුවත් කරලා තිබෙනවා, මේ යන ක්‍රමවේදයට ගියොත් ඊළඟ දශකය වෙනකොට රටේ වෛද්‍යවරුන්ගේ හිඟයක් ඇති වෙනවා කියලා. අපි සෞඛ්‍ය පැත්තෙන් සුරක්ෂිත නැත්නම්, බෙහෙත් හේත්වලින් සුරක්ෂිත නැත්නම්, ඔබගේ අසීමිත බදු ප්‍රතිපත්තිය සහ මේ රටේ තිබෙන ගැටලුත් එක්ක අනෙකුත් වෘත්තිකයන් රට හැර යන තැනට පත් වෙලා තිබෙනවා නම්, ඒ පැත්තෙන් ජාතික ආරක්ෂාවට ස්ථාවරත්වයක් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ජාතික ආරක්ෂාව ගැන අවධානය යොමු කරනකොට බංකුවේ තියලා lectures දෙන්න ලැහැස්ති වෙනවා වෙනුවට, පැහැදිලි වැඩ පිළිවෙළක් සහ සැලැස්මක් එක්ක මේ හැම ක්ෂේත්‍රයකින්ම රටේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමේ වගකීම, බලශක්තියෙන්, ආහාරවලින්, රාජ්‍ය සේවයෙන් රට සුරක්ෂිත කිරීමේ වගකීම ඔබතුමන්ලා ඉෂ්ට කරයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම අපි අදටත් විශ්වාස කරනවා, නාවික හමුදාව තවදුරටත් ශක්තිමත් කළ යුතුයි කියලා. අද මුහුදුකරයේ සිදුවෙන සිදුවීම් දෙස බැලුවාම, ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධකරුවන්ගේ තිප්පොළක් බවට අපේ මුහුදුකරය පරිවර්තනය වෙන වෙලාවේ ආණ්ඩුවක් විධියට ඔබ කළ යුත්තේ බොරු චෝදනා හදලා නාවික හමුදාපතිවරයා හිරේ දමන එක නොවෙයි.

ආණ්ඩුවක් විධියට ඔබ කළ යුත්තේ, නාවික හමුදාව තවදුරටත් ශක්තිමත් කරන එක, බුද්ධි අංශ වාර්තා පිළිගන්න එක. බුද්ධි අංශය තවදුරටත් ශක්තිමත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා වරායේ කන්ටේනර් දෙකක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර බුද්ධි අංශ වාර්තාවක් ලැබී තිබියදීත්, ඔබතුමන්ලා ඒවා release කළා. දැනගෙනත් එහෙම කළා. හැබැයි, ඒක කරලා තිබෙන්නේ check කරලා. තවම release කරපු කෙනාගේ නමක් දන්නේත් නැහැ, release කරපු කෙනෙක් අත්අඩංගුවට ගත්තේත් නැහැ, කට උත්තරයක් ලියා ගත්තේත් නැහැ. Check කරන්නේ නැතුව කන්ටේනර් 323ක් එළියට ගියා. දැන් මේ check කරපු දෙක මෙහෙම නම්, check නොකර එළියට දමපු ඒවායේ කොහොම ඇද්ද? හැබැයි, මේවාට වග කියන්නේ කවුද? ඒ වෙලාවේදී නම් වරාය භාර නියෝජ්‍ය ඇමතිවරයා එළියට ඇවිල්ලා කිව්වා, "අපි මේ කන්ටේනර් තිබෙන තැන් දන්නවා. අපි වගකීම භාර ගන්නවා" කියලා. එතකොට මාධ්‍යවේදියෙක් අහනවා, "ඒවායේ මත්ද්‍රව්‍ය, තුවක්කු තිබුණොත්?" කියලා. "ඔව්, ඔව්, ඒ වගකීමත් අපි භාර ගන්නවා" කිව්වා. ඒ වාගේම, අපි ස්තුතිවන්ත වෙනවා, පොලීසිය භාර ඇමතිවරයාට.

මේ මත්ද්‍රව්‍ය වැටලීම් දේශපාලනීකරණය කරන්න ආණ්ඩුව කොතරම් උත්සාහ කළත්, අද අත්අඩංගුවට ගන්නා පුද්ගලයන් හා ඒ අයගේ පසුබිම බැලුවාම, ඒ අය දේශපාලන රැකවරණය ගන්නේ මොන දේශපාලන පක්ෂයෙන්ද කියන එක පැහැදිලි වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මොන පක්ෂයෙන්ද දේශපාලන රැකවරණය ගන්නේ කියන එක පැහැදිලි වෙනවා. හැබැයි, ඒක යට ගහන්න උත්සාහ කරනවා.

විදුහල්පතිවරයෙක් මත්ද්‍රව්‍ය සමඟ අහු වුණා. ඒ ගැන හොයා බලනකොට, ඉස්කෝලේ යන දරුවන්ට "මත්ද්‍රව්‍යයෙන් ඉවත් වෙනු" කිව්වාට විදුහල්පතිවරයා තමයි ඒවා බෙදලා තිබෙන්නේ. ඊළඟට, දෙහිවල සංවිධායකවරයෙක් අහු වුණා. ඔහුගේ දේශපාලන පක්ෂය මොකක්ද? ඔහු මොන පක්ෂයේ ආසන සංවිධායකද? පොහොට්ටුවේ නම් නොවෙයි. ආණ්ඩුවේ, ගුරුවරයාගේ නෝනාත් ආණ්ඩුවේ. එතකොට විශ්වවිද්‍යාල ශිෂ්‍යයා, ඔබේ තරුණ සංවිධානයේ කෙනා? ඔහුගේ අම්මාත් ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක්. ඒ ගුරුවරයා ආරක්ෂක කමිටුවේ සභාපති ලෙස ඉඳලා තිබෙනවා. ඔබතුමන්ලා දරුවන්ව මත්ද්‍රව්‍යයෙන් ඈත් කරන්න කියලා ප්‍රවර්ධනය කරන්න දාලා තිබෙන්නේ හොඳම ව්‍යාපාරිකයා. මත්ද්‍රව්‍ය ව්‍යාපාරය කරන කෙනා, බෙදන කෙනා. හැබැයි, ඔබ චෝදනා කළේ කාටද? ඒ නිසා අපි ආණ්ඩුවට කියන්නේ, නෙළුම් මාවතයි, පැලවත්තයි අතර ලොකු දුරක් නැහැ කියන එකයි. ඒ නිසා target එකක් ගන්නවා නම් හරියට ගන්න, නැත්නම් වැටෙන්නේ ඔබතුමන්ලාගේ කාර්යාලය උඩට. අපිට මෙතැනදී දේශපාලනයක් නැහැ. මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය නවත්වන්න ඕනෑ. ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී කිව්වා, නුවරඑළියේ අයිස් මත්ද්‍රව්‍ය ෆැක්ටරියක් හොයා ගත්තා කියලා. පොලිස් මාධ්‍ය ප්‍රකාශක මහත්මයා කියනවා, "නැහැ, එහෙම

එකක් නැහැ, තවම හොයනවා" කියලා. ඇමතිතුමා දන්නා දේ පොලිස් මාධ්‍ය ප්‍රකාශක දන්නේ නැහැ නේ. එක්කෝ, ඇමතිවරයා බොරු කියනවා, එක්කෝ පොලිස් මාධ්‍ය ප්‍රකාශක බොරු කියනවා. දැන් කෝ, නුවරඑළියේ ෆැක්ටරිය? දැන් නුවරඑළියේ ෆැක්ටරියෙන් ලංකාවටම බෙදා හරිනවා කිව්වා. දැන් ඒ ෆැක්ටරියත් මාලිමාවේද දන්නේ නැහැ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. දැන් ඒ ෆැක්ටරිය අතුරුදන් වෙලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා අපි ආණ්ඩුවට කියන්නේ, කරුණාකරලා අවංකව මේ දේවල් කරන්න කියන එකයි. අපි දන්නවා, ඔබතුමන්ලාට වෙච්ච පොරොන්දු ඉෂ්ට කර ගන්න බැරි වෙනකොට, ඔබතුමන්ලා සමාජයට දීපු, රටට දීපු පොරොන්දු ක්‍රියාත්මක කර ගන්න බැරි වෙනකොට, වෙනත් මාවතකට මේක හරවන්න වාගේම වෙනත් පැත්තකට යන්න උත්සාහ කරන බව. ආණ්ඩුව විසින් මෙහෙයවන සංවිධානාත්මක අපරාධ රටේ ක්‍රියාත්මක වෙනවා. එක් අවස්ථාවක කිව්වා, දවසේ වෙඩිල්ල නැවැත්වුවා කියලා. අන්න, ඊයෙත් වෙඩි තියලා හෝටලයක වැඩ කරපු කාන්තාවක් නැති වෙලා තිබෙනවා. දවසේ වෙඩිල්ල නැවැත්වුවාය කිව්වා. නවත්වන්න පුළුවන් නම්, තියන කෙනාම තමයි නවත්වන්නේ.

එතකොට, මාලිමාවට සම්බන්ධ, ඔබේ ආණ්ඩුවට සම්බන්ධ කෙනෙක් අහු වුණාම, ඒ පුද්ගලයාට DO - Detention Order - එකක් නැහැ. හැබැයි, වෙනත් දේශපාලන පක්ෂවල අය අහු වුණාම, DO ගහලා, මාධ්‍ය සාකච්ඡාවකුත් තියලා, breaking news එකකුත් පළ කරනවා. *[බාධා කිරීමක්]* පුවක් දණ්ඩාවේ සනාට DO එකක් ගැහුවාද? උත්තර දෙන්නකෝ. වැඩිම අයිස් ප්‍රමාණය අහු වුණේ. කෝ, ඔහුට DO එකක් ගැහුවාද? සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේක ආරක්ෂා කරන්න යන්න එපා. ඔබතුමා නීතිඥවරයෙක් නේ. ඒ නිසා ඔබතුමා මේක ආරක්ෂා කරන්න යන්න එපා. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, ඔබතුමා මේක ආරක්ෂා කරන්න. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාට මේක භාර දෙන්න එපා. එතුමා නීතිඥවරයෙක්. එතුමාට ඒක හොඳ නැහැ.

දැන් ඔබතුමන්ලා මේ හැම දෙයක් ගැනම මොකක්ද කියන්නේ? එක පැත්තකින් සාක්කි හදනවා. ඔබතුමන්ලාට අපි චෝදනා කරන්නේත් ඒක නිසා නේ. දේශපාලන වේදිකාවේ හිටපු, ඔබතුමන්ලා වෙනුවෙන් කථා පවත්වපු අය ගෙනැල්ලා පොලීසියේ තනතුරු දුන්නා. දැන් ඒක හරිද? ඔබතුමන්ලාගේ වේදිකාවේ ඉඳලා ගෙනැල්ලා, ඉහළ පුටුවල වාඩි කරවනවා. එහෙම වාඩි කරවලා ඔබට ඕනෑ විධියට ඒ අය මෙහෙයවනවා. ඒක තමයි මේ වෙන්නේ.

දැන් ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ලියුම හොයන්න එංගලන්තයට පස්දෙනෙකු යැව්වා නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ලියුම හොයන්න යැව්වා නේ. දැන් එංගලන්තයට පස්දෙනෙකු යවපු වෙලාවේ කියන්නකෝ, ප්‍රංශයටත් ගිහිල්ලා පාස්කු ඉරිදා ප්‍රහාරයේ document එක ලියපු එක්කෙනාගෙනුත් කට උත්තරයක් ගන්න කියලා. ළඟයි නේ. කෝච්චියේ යන්න පුළුවන් නේ පැයෙන්. ඒ අය එංගලන්තයට විතරක් යවලා ලංකාවට ගේන්නේ ඇයි? අපරාදේ ටිකට් පහ. *[බාධා කිරීමක්]* ඒ කාලයේ. තවමත් එහෙම තමයි, කලබල වෙන්න එපා. අපි වෙලාව ආවාම උත්තර ටික දෙන්නම්. නේද, සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා? රනිල් මහත්මයා හම්බ වෙලා, කථා බහ කරලා, කෝපි බිව්වේ අපිද, ඔයාලාද කියලා තමන්ගේ හිත් දන්නවා නේ. ඒ හින්දා ඒවා ගැන අපි කථා කරන්න ඕනෑ නැහැ. හැබැයි, දැන් එංගලන්තයට ගිය වෙලාවේ අර පාස්කු ඉරිදා ප්‍රහාරයේ document එක ලියපු කෙනාවත් හම්බ වෙන්න කියන්නකෝ. අවුරුදු ගණනක් තිස්සේ ඔබතුමන්ලා,- *[බාධා කිරීමක්]* තාත්තා දීපු උපදෙස් තමයි මම ඔබතුමන්ලාට දෙන්නේ. ඒවා අහගන්න. *[බාධා කිරීමක්]* එයාටත් දෙන්නම්. ඔයාලා අහගන්නකෝ. ඔයාලා හැදෙන්නකෝ දැන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පාපිසි කැලි පාර්ලිමේන්තුවට ආවාම ඕක තමයි වෙන්නේ. ජනාධිපතිතුමා පාපිසි කැලි ටිකක් එවලා එතුමාත් දැන් අමාරුවේ වැටෙන්න යන්නේ. ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සභාවල අය කසිප්පු පෙරලා අහු වුණා. මේ අය හදා ගන්න. ඒ අය මේ වැඩෙන් ඉවත් කරන්න. ඉවත් කරලා රට හදන තැනට ගේන්න. රට හැදෙන තැනට ගෙනැල්ලා තමුන්නාන්සේලා එදා ජනතාවට දීපු පොරොන්දු ටික ඉෂ්ට කරන්න.

ඊළඟට තිබෙනවා, පොලීසිය. පොලීසියේ උසස්වීම්, මාරුවීම් සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙනවා. තනිකර ඔබතුමන්ලාගේ දේශපාලනික න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක වෙන්නේ. ජ්‍යෙෂ්ඨ, දක්ෂ, උසස් පොලිස් නිලධාරින්ව වගකීමක් නැතිව තැන් තැන්වලට දාලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, ඔබතුමාට අවශ්‍ය අයව තනතුරුවලට පත් කර තිබෙනවා. ඔබතුමන්ලා එහෙම දේවල් කරන්නේ නැහැ කියලා නේ බලයට ආවේ. එක තැනක කසිප්පු ළඟ තබාගෙන ඉඳලා අල්ලපු කෙනෙකුට ඇප දුන්නේ නැහැ කියලාත් OIC මහත්තයාව transfer කළා. මම දැක්කා, ඔබතුමන්ලාගේ ඇමතිවරයකු ගිහිල්ලා පොලීසිය ඉස්සරහා මාධ්‍යයට voice-cut එකක් දෙන ගමන් කිව්වා, "ඔව්, අපි පොලිස්පතිටත්, IGPටත්, කථා කරනවා" කියලා. හැබැයි, එදා ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කාලයේ තිබුණු සංස්කෘතිය වෙනස්.

ගරු අමාත්‍යතුමනි, ඊත් එක්කම STF එකේ promotions ගැනත් පොඩ්ඩක් බලන්න. අතිගරු ජනාධිපතිතුමාගේ PSOත් ඒකේ ඉන්නවා. මොකද, STF එකේ අය පොලීසියට ගියාම promotion එක හම්බ වෙනවා. STF එකේ promotion එක වෙන්නේ නැහැ. හැබැයි, අන්තිමට පොලීසියට ගිහිල්ලා කාලයකට පසුව STF එකට ආවාට පස්සේ එයාගේ seniority එකේ ප්‍රශ්නයක් එනවා. ඒ හින්දා ඔබතුමන්ලා ඒවා ගැනත් හොයන්න. පොලීසිය දේශපාලනික වශයෙන් ඔබතුමන්ලාගේ රැස්වීම්වලට සෙනඟ ගේන්නයි, වැඩ කරන්නයි පාවිච්චි කරන්නේ නැතිව, ඔබතුමන්ලා පොලීසියේ සුබසාධනය ගැනත් හොයන්න, ඇමතිතුමා. මොකද, ඒකට ඔබතුමාට වගකීමක් තිබෙනවා.

තවත් පැත්තකින් ඊයේ දිනයේදී ගරු ඇමතිතුමා ත්‍රිකුණාමලයේ වුණු සිද්ධිය ගැන කිව්වා. හාමුදුරුවරුන්ට ගහපු දෙන්නා අත්අඩංගුවට ගන්නවා කිව්වා. නීතිය ක්‍රියාත්මක කරනවා කිව්වා. දැන් බුදු පිළිමය බේරා ගත්තා නේ. බුදු පිළිමය බේරා ගන්න පිළිමය වැඩමෙව්වා. දැන් බලනකොට හාමුදුරුවන්ගෙන් බුදු පිළිමය බේරා ගන්න තමයි පිළිමය පොලීසියට වඩම්මවලා තිබෙන්නේ. හාමුදුරුවරුන්ට දෙන්නෙක් පහරදී තිබෙනවා. හාමුදුරුවරු දෙනම ඉස්පිරිතාලේ - hospital එකේ - ඉන්නේ. එක ස්වාමීන් වහන්සේ නමක් නම් බලෙන් ටිකට් කපලා එව්වා කියලා තමයි අපට ආරංචිය තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ හාමුදුරුවන්ට ගහපු දෙන්නා දැන් අත්අඩංගුවට ගත්තාද? හාමුදුරුවන්ට පහරදීපු දෙන්නා අත්අඩංගුවට ගත්තාද? දැන් ඇමතිතුමාම නේ කියන්නේ, බුදු පිළිමය බේරාගන්න ගියා කියලා.

පොහොට්ටුවේ නාට්‍යය සජබය කරේ තියාගෙන යනවා කියලා එක මන්ත්‍රීවරයෙක් කියනවා මම දැක්කා. නාට්‍යය පොහොට්ටුවේ නම්, කරේ තියාගෙන යන්නේ සජබය නම්, ඒක රඟපාන්නේ ජේවීපී එකෙන්. මොකද, ආණ්ඩුව ඔබතුමන්ලාගේ, අපේ නොවෙයි. පොලීසියෙන් නම් රඟපාන්නේ, පොලීසියෙන් නම් බුදු පිළිමය වඩම්වන්නේ, පොලීසියෙන් නම් බිල්ඩින් එක කඩන්නේ, ඒ වෙනකොටත් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් නම් ලියුම

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දෙන්නේ, ඒත් කියනවා නම් මේක පොහොට්ටුවේ නාට්‍යයක් කියලා, ඒත් කියනවා නම් මේක සජබය කරේ තියාගෙන යනවා කියලා, මතක තියා ගන්න, නාට්‍යය මගේ නම් රඟපාන්නේ ඔබතුමන්ලා බව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව කාලයේ පොලීසියේ SI තනතුර සඳහා 100දෙනෙකු බඳවා ගන්න කටයුතු සකස් කළා. ඔබතුමන්ලා ඒක නැවැත්වූවා ඒ සම්බන්ධයෙන් වාර්තාව එනකම් කියලා. ගරු ඇමතිතුමනි, හැබැයි අපට දැන ගන්න තිබෙනවා, මීට මාස 3කට කලින් ඔබතුමන්ලාට ඒ වාර්තාව දීලා තිබෙනවා කියලා. ඔබතුමන්ලාගේ පක්ෂයේ සිය දෙනෙක් ඒ තැන්වලට දා ගන්න ඕනෑ නම් ඒකට ක්‍රමවේදයක් හදා ගන්න. ඒක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක්. හැබැයි, බොරු කියන්න එපා. මේ ළමයින්ටත් අසාධාරණයක් වෙන්නේ නැතිව ඒ බඳවා ගැනීම් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මහජන ආරක්ෂක ඇමතිතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මීට පැය භාගයකට කලින් මේ සභාවට ඇවිල්ලා තමයි මේ කථා කරන්නේ. මම උදේ මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළා. විශේෂ කාර්ය බලකායේ නිලධාරින්ට යම් අසාධාරණයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනකොටත් අරගෙන තිබෙනවා කියලා මම උදේ පැහැදිලි කළා. ඒ වාගේම, බඳවා ගැනීම් සම්බන්ධයෙනුත් මම මේ සභාවේදී පැහැදිලි කිරීමක් කළා. ඉතින් මෙතුමා විනාඩි 10ක්, 15ක් සභාවේ ඉඳලා, අපි උදේ කියපුවා ගැන නැවත ඇවිල්ලා ප්‍රශ්න කරනවා.

ඒ විතරක් නොවෙයි, පාතාලය ගැන කථා කළා. මත්ද්‍රව්‍ය ගැන කථා කළා. අපි නීතිය සාධාරණව ක්‍රියාවේ යොදවලා තිබෙනවා. මෙතුමන්ලාගේ පාතාල සම්බන්ධතාත් මේ වෙනකොට ඉන්දුනීසියාවෙන් ගෙන ආපු අය හරහා එළි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් විමර්ශනයක් කරමින් ඉන්නවා. තමන්ගේ කාලයේ පාතාලය වර්ධනය කරලා, පෝෂණය කරලා, ඒවා මත පාතාලය පවත්වාගෙන ගිහිල්ලා-*[බාධා කිරීම්]* තමන්ගේ බලය පවත්වාගෙන ගියේ ඒ මත. මේ රටේ කවුරුත් දන්නවා, තමන්ගේ තාත්තා ගිහිල්ලා බදා ගත්තේ කවුද කියලා. මෙතැන ඇවිල්ලා දැන්,-*[බාධා කිරීම්]* ඔබතුමා සම්බන්ධයෙනුත්, ඔබතුමාගේ තිබෙන සබඳතා සම්බන්ධයෙනුත් දැනට විමර්ශනයක්,-*[බාධා කිරීම්]* අපි ඉදිරියේදී කරන්නම්. මේ රටේ දන්නවා, ඕනෑ තරම්. ආයේ අලුතෙන් කියන්න දෙයක් නැහැ. දේශපාලනය පාවිච්චි කරනවා, තමන්ගේ නිරුවත වහ ගන්න. තමන් කාලයක් තිස්සේ පාතාල සම්බන්ධතා පවත්වාගෙන,-*[බාධා කිරීම්]* ඒ සම්බන්ධතා අපි ඉදිරියේදී කියන්නම්. විමර්ශනයක් කරලා කියන්නම්. *[බාධා කිරීම්]* මෙතැන ඇවිල්ලා, නිකම් අනික් අයට ඇඟිල්ල දිගු කරන්න හදන්න එපා. *[බාධා කිරීම්]* මාලිමාවේ කවුරුවත් කුඩු ජාවාරම් කරලා නැහැ. කවුරු හරි මත්ද්‍රව්‍යවලට සම්බන්ධව,-*[බාධා කිරීම්]* කියන්නේ නැහැ. මම කියන්නම්, "ගංජා සුරංග" ගැනත්. සොත්ති උපාලිගේ පුතා කා ගාවද වැඩ කරන්නේ කියලත් කියන්න පුළුවන් මට. සොත්ති උපාලිගේ පුතා කා ගාවද වැඩ කරන්නේ කියලාත් කියන්න පුළුවන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ නිසා මෙතැන මාලිමාවට ඇඟිල්ල දිගු කරන්න හැකියාවක් නැහැ. මේ රටේ ජනතාව හොඳට දන්නවා, මාලිමාව වැඩ කරන්නේ කවුරු වෙනුවෙන්ද කියලා. මේ රටේ ජනතාව වෙනුවෙන්. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ වෙනුවෙන් නොවෙයි. *[බාධා කිරීම්]* ඔබතුමා හැමදාම මෙතැන ඇවිල්ලා, මාලිමාවට ඇඟිල්ල දිගු කරන්න එපා. ඔබතුමන්ලාගේ පැටිකිරිය හොඳට දන්නවා, මේ රටේ මිනිස්සු. මිනිස්සු එළවලා දැම්මේ ඒක තමයි දේශපාලනයෙන්. හරිද? මේ රට නොවෙයි, මුළු ලෝකයම දන්නවා.*[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙතැනට ඇවිල්ලා මඩ ගහන්න උත්සාහ කරනවා. *[බාධා කිරීම්]* සාධාරණ, සාධනීය විවේචනයක් කර ගන්න බැරි වුණාම ඇවිල්ලා මඩ ගහනවා. අපි මේ කාරණාව ඕනෑ නම් ඇත්ත විමර්ශනයක් කරලා ඉදිරිපත් කරන්නම්, ඔබතුමන්ලාගේ,- *[බාධා කිරීම්]* ඒක තමයි කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මෙතැනට ඇවිල්ලා නිලධාරින්ට මඩ ගහනවා; අවංකව වැඩ කරන නිලධාරින්ට මඩ ගහනවා. උදේ ඉඳලා විපක්ෂය කරන්නේ ඒක. සාධනීය විවේචනයක් කර ගන්න බැහැ. නිලධාරින්ට ඇවිල්ලා මෙතැන උත්තර දෙන්න හැකියාවක් නැහැ නේ. අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මහත්තයාට මඩ ගහනවා. ශානි අබේසේකරට මඩ ගහනවා. පොලිස්පතිවරයාට මඩ ගහනවා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එතුමා subject එක භාර ඇමති.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
හැබැයි, කුඩුකාරයෝ, වංචාකාරයෝ අල්ලස, දූෂණය කරන මිනිස්සු විශාල ප්‍රමාණයක් බන්ධනාගාරගත වෙන්න යනකොට, එහෙම නැත්නම් ඒ ගැන විමර්ශන කරනකොට අද මේ විධියට දිගින් දිගටම මඩ ගහනවා.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
Subject එක භාර ඇමති පැහැදිලි කිරීමක් කරනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

මේක තමයි මෙයාලාගේ ක්‍රමය වෙලා තිබෙන්නේ. ඒ හින්දා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ රටේ ජනතාවට දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්න කිසිසේත්ම පසුබට වෙන්නේ නැහැ. ඒ වාගේම ජාතිවාදය, ආගම්වාදයටත් අපි ඉඩකඩ තියන්නේ නැහැ කියන එකත් මේ අවස්ථාවේ නැවත නැවතත් අවධාරණය කරනවා.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு கிட்னன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 2.00]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අය වැය කාරක සභා අවස්ථාවේ ඉතා වැදගත් විවාදයක් සිදු විය යුතු දවසක්.

මගේ දේශපාලන ජීවිතය ඉතාම දිගු දේශපාලන ජීවිතයක්. මම සක්‍රිය දේශපාලනයට මෑත කාලයේ ආවත්, ආණ්ඩු පක්ෂයේ හිතවතුන්, අපේ මිතුරන් දන්නවා, මම ඉතා දීර්ඝ දේශපාලන ඉතිහාසයක් තිබෙන කෙනෙක් බව. මගේ ඒ දීර්ඝ දේශපාලන ඉතිහාසයේ මම සම්පව කටයුතු කරලා තිබෙනවා, මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න බොහෝ දෙනා සමඟ. ඔවුන් එක්ක එකට අපි මැතිවරණවල පෙනී සිට තිබෙනවා. ඒ, හැමදාම අපි විශ්වාස කරපු මේ රට හදන්නට ඕනෑ කියන, හැදෙන්නට ඕනෑ කියන විශ්වාසයෙන්. ඒ වාගේම මේ රටේ දේශපාලන සංස්කෘතිය දිගින් දිගටම අවභාවිත වෙන බව නිරීක්ෂණය කරලා, අපි ඒ ඒ අවස්ථාවල ගත්ත තීරණ නැවත විවරණය කරලා මේ රට නිවැරදි මාර්ගයක ගෙනියන්න නම්, අපි මේ දේශපාලනයට අවතීර්ණ වෙන්න ඕනෑ කියා තීරණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් මේ රටේ සාමාන්‍ය පවුලකින් එන කෙනෙක්. මගේ මව ගුරුවරියක්. මගේ පියා රාජ්‍ය සේවකයෙක්. ඔහු ජූලි වැඩ වර්ජකයෙක්. මට සහෝදරයින් 3දෙනෙක් ඉන්නවා. අපි 4දෙනාම නිදහස් අධ්‍යාපනය ලබා සරසවි 4කට ගියා. එහෙම ගිහිල්ලා අපට මේ රටේ යම් තැනකට එන්න ලැබුණා. ඒ නිසාම මට මේ රටේ ධනයක් උපයන්නට හැකියාව ලැබුණා; ව්‍යවසායකයෙකු වෙන්නට හැකියාව ලැබුණා. ඒ නිසාම මට මගේ හදවත කිව්වා, අපේ මේ රට වෙනුවෙන්, අපේ මේ මව්බිම වෙනුවෙන් යම් කැප කිරීමක් කිරීමට කාලය ඇවිත් තිබෙන බව. එහෙම නැත්නම්, මටත් තිබුණා උපයාගත්තු ධනය ටික හොඳට වියදම් කරගෙන සුඛෝපභෝගීව ජීවත් වෙන්න. හැබැයි, අප මේ දේශපාලනයට ආවේ ඉහතින් කියපු නිර්මල අරමුණත් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම මේ පාර්ලිමේන්තුවේදී සටහන් කර තබනවා, සීතාවක නගර සභාවේදී අද කරපු තුච්ඡ වැඩේ ගැන; අද මේ ආණ්ඩු පක්ෂය කරපු තුච්ඡ වැඩේ ගැන. අපේ ඒ මන්ත්‍රීවරයා - චන්දන මුදුන්කොටුව මන්ත්‍රීවරයා - අහිංසක මනුස්සයෙක්; දුප්පත් මනුස්සයෙක්. ඒ මනුස්සයා සල්ලිවලට අරගෙන අද සීතාවක නගර සභාව හැදුවා. මේකෙන් සටහන් කළේ තුච්ඡ දේශපාලනයයි. *[බාධා කිරීම්]* දේශපාලනය කවදාවත් මේ තත්ත්වයට පත් වෙලා තිබුණේ නැහැ. *[බාධා කිරීම්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද මේ කාරණය කියනවා. ආණ්ඩුවේ ඔබ "හීන්සැරය" කියවන්න; එහි අලියාට කටුස්සාගෙන් වෙච්ච දේ කියවන්න. අපි කුඩා පක්ෂයක් හැටියට දේශපාලනයට ආවාට, මහා විශාල ආත්ම ශක්තියකිනුයි දේශපාලනයේ ඉන්නේ; විශාල දර්ශනයක් එක්කයි ඉන්නේ; මේ රටට අවංක ආදරයකිනුයි ඉන්නේ. මේ වාගේ බලු වැඩ කරන දේශපාලනයක් අපි කවදාවත් බලාපොරොත්තු වුණේ නැහැ, මේ ආණ්ඩුවෙන්.

මේ රටේ මිනිස්සු ඡන්දය දුන්නේ මාලිමාවට නොවෙයි. මේ රටේ මිනිස්සු ඡන්දය දුන්නේ ඒ වෙලාවේ තිබුණු දේශපාලන සංස්කෘතියේ නිවැරදි කිරීමක් අවශ්‍යයි කියා හිතපු නිසා. නමුත් අද ඔබ මොකක්ද කරන්නේ? තුන්වරක් පැරදුණු සීතාවක නගර සභාවේ බලය හදාගෙන තිබෙන්නේ කොහොමද? මම ගිය සති අන්තයේත් ඒ මන්ත්‍රීවරයාත් එක්කයි හිටියේ. සභාපතිතුමාගේ කාර් එකෙන් ගෙනැල්ලා තිබෙනවා; පොලිස් ආරක්ෂාව දීලා තිබෙනවා. මේ වාගේ තුට්ටු දෙකේ වැඩ කරන පක්ෂයක්, ආණ්ඩුවක් තමයි අද තිබෙන්නේ. මේකද, කරන්න හදන වෙනස? මේකද, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කරන්න හදන වෙනස? නිර්මල දේශපාලනයක් ගැන කියාගෙනයි ආවේ. අර මිනිසුන්ට අම්මා මුත්තා නැති වෙන්න බැණ බැණ ඉන්නේ. මේකද, හරි වැඩේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවතත් මේ කාරණය කියනවා. මොවුනුත් හොඳට දන්නවා මා ගැන; හොඳටම දන්නවා මා ගැන. මම නැවත මතක් කර දෙනවා, කොයි විධියේ, කොයි මර්දනයක් ආවත්, අපි තව තවත් ජවය වැඩි කරලා, ලැබෙන පළමුවෙනි මොහොතේම මේ මාලිමා ආණ්ඩුව ගෙදර යවන්න කටයුතු කරන බව. ඒ සඳහා කරන්න තිබෙන මොනම කැප කිරීම වුණත් කරනවා. අද ඔබ ඒක සටහන් කර තබා ගන්න, ඔබේ කොහේ හරි තැනක. ඒ ගැන සටහන් කර තබාගන්න. *[බාධා කිරීම්]* තුට්ටු දෙකේ වැඩ කරලා ආයෙත් කථා කරන්න එපා. අඩුම ගණනේ කට වහගෙන කථාව අහගෙන ඉන්න, කථාව කරන්න දෙන්න. තුට්ටු දෙකේ වැඩයි කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉන්නේ මෙවැනි දුර්වල පිරිසක්. ඔවුන්ගේ නායකතුමාම කියපු හැටියට, අත්වැඩ දෙන්න ආපු අය බාස්ලා වෙලා. ඔවුන්ගේ නායකතුමාම කියපු හැටියට, මේ පාපිසි. මේ හැසිරීමම මොකක්ද? මම එකක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ ජනතාව හරිම සවිඥානකයි. ඔවුන් මොවුන්ට ඡන්දය දෙන්න ගත් තීරණයත් සවිඥානකයි. මම ඒක කියන්නට ඕනෑ. හැබැයි, අද මොවුන් ඒ ජනතාවට ප්‍රතික්‍රියා දක්වන ආකාරයට ජනතාව පෙරළා ප්‍රතික්‍රියා දක්වන්නේ ඔය වාගේ නොවෙයි. අන්න ඒක මතක තබා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මම හදවතින්ම කථා කරන්න ඕනෑ. අද ජාතික

[ගරු දිලිත් ජයවීර මහතා]

ආරක්ෂාව හැම අතින්ම පහළට වැටී තිබෙනවා. ඒ ගැන මම මීට අවුරුද්දකට කලින් මගේ පළමුවෙනි කථාවේදීත් කිව්වා. ජාතික ආරක්ෂාව පිළිබඳව මීට වඩා අවධානය යොමු කරන්න කියලා මම එදා කිව්වා. දැන් අපට පැහැදිලියි, ජාතික ආරක්ෂාව පිළිබඳව මොවුන් අවධානයක් යොමු නොකරන්නේම, මොවුන් අර රූකඩ ක්‍රියාවලියේ කොටසක් හැටියට කටයුතු කරමින් අපට බලපෑම් කරන සියලු බලවේග ශක්තිමත් කිරීම සඳහා අපේ රටේ ජාතික ආරක්ෂාව හිතාමතාම දුර්වල කරන නිසා බව.

අපේ හමුදාවල ඉන්න සොල්දාදුවන්ට මොකක්ද ඔබ කරලා තිබෙන්නේ? ඔවුන් හැම පැත්තෙන්ම මානසිකව වැටෙන ආකාරයටයි කටයුතු කරලා තිබෙන්නේ. අපේ රටේ මානව සම්පත යුද්ධ හමුදාවේ තිබෙන තුවක්කු නොවෙයි; ගුවන් හමුදාවේ තිබෙන ගුවන් යානා නොවෙයි; නාවික හමුදාවේ තිබෙන නැව් නොවෙයි. ඒවායේ ඉන්න මිනිස්සුයි මේ රට ආරක්ෂා කර ගන්නේ. තමන්ට අද ආරක්ෂා කර ගන්නට රටක් නැහැ කියා ඔවුන්ට හිතෙන තරමටම මොවුන් ජාතික අභිමානය, අපේ රටට ඇති ආදරය නැති කරනවා; අපේ රටට ඇති ගෞරවය නැති කරනවා; මේ රට කෙරෙහි ඇති විශ්වාසය නැති කරනවා. එතකොට ඔවුන් පෙනී සිටින්නේ කවුරු වෙනුවෙන්ද? මා සඳහන් කරන්නට ඕනෑ, මේ රටේ ජාතික ආරක්ෂාව දුර්වල වූ හැම අවස්ථාවකදීම මේ රට ඇද වැටුණු බව.

විශේෂයෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාරය එල්ල වුණේ අපේ බුද්ධි තොරතුරු රැස් කිරීම දුර්වල කරපු නිසා. ඒ වැටුණු වැටිල්ලෙන් අදටත් අපට නැඟිටින්න බැරි වෙලා තිබෙනවා. ආර්ථිකය බොහෝ ක්ෂේත්‍රවලින් ගොඩ ගන්න අපට බැරි වෙලා තිබෙනවා; අපේ රට ගොඩ ගන්න බැරි වෙලා තිබෙනවා. නැවතත් අපේ රට හිතාමතාම විනාශය කරා ඇදගෙන යනවා, ජාතික ආරක්ෂාව දුර්වල කිරීම මඟින්. මම මේක වගකීමෙන් කියන්නේ. මට පාර්ලිමේන්තු වරප්‍රසාද තිබුණත් මේ රටේ ඒ සංවේදී තොරතුරු ප්‍රසිද්ධ සභාවක මම පාවිච්චි කරන්නේ නැහැ. මම දැනුවත්වයි කියන්නේ. මම ඔවුන් ඇසුරු කරලායි කියන්නේ. මම ඔවුන් එක්ක කථා කරලායි කියන්නේ. අද ත්‍රිවිධ හමුදාවේ ඉන්න ඉහළ පෙළේ නිලධාරින්ගේ ඉඳලා පහළ නිලධාරින් දක්වා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් දක්වන මතය මම හොඳට දැනගෙනයි කියන්නේ. ඔවුන් අද දුර්වල කරලා තිබෙනවා. ඔවුන්ට ඔවුන්ගේ ඒ විශ්වාසය නැති කරලා තිබෙනවා. ඒ තුළ මේ රටේ සැබෑ ජාතික ආරක්ෂාවක් බලාපොරොත්තු වෙන්න අපට බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා ඉල්ලා සිටින්නේ, නැවත නැවතත් ඉල්ලා සිටින්නේ, මේ රටට යම් හෝ ආදරයක් තිබෙනවා නම්, අපේ මව් බිමට වෙන්න යන දේ ගැන හිතන්න කියලායි; ඔබට කිරි දුන්නු ඔබගේ මව්ට ආදරයක් තිබෙනවා නම් ඒ ප්‍රමාණයට හරි, අඩුම ගණනේ පොඩ්ඩක් හරි හිතන්න කියලායි. හොර රහසේ ගිවිසුම් අත්සන් කරමින් ඒවා එළිදරව් නොකරමින් මේ රට අද බරපතළ විධියට එළියට විවෘත කරලා තිබෙනවා, ඕනෑම කෙනෙකුට මේක ඇතුළේ නාඩගමක් නටන්නට. ඒ නිසා නුදුරු දිනයක අප මුහුණ දීමට නියමිත අන්න ඒ ජාතික ආරක්ෂාවේ තර්ජනය ගැන මොහොතක් හරි හිතන්න. මෙහි කවුරුන් හෝ දේශප්‍රේමියෙකු ඉන්නවා නම් ඒ ගැන හිතලා ගන්න පුළුවන් මොනවා හරි ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම් ගන්න. අපේ ඇමතිතුමා රණවිරුවෙක්, දැන් සොල්දාදුවෙක් වුණාට. මෙතැන ඉන්නවා තවත් රණවිරුවෝ, දැන් සොල්දාදුවෝ වුණාට. එතුමන්ලාට අදිටනක් තිබුණා. කාලයක් අධිෂ්ඨානය සහිතව කටයුතු කරගෙන ගියා. අපි බොහොම අමාරුවෙන් "අපි වෙනුවෙන් අපි" කියලා ගොඩනඟපු රණ විරුවන්ගේ අභිමානය, ධෛර්යය සම්පූර්ණයෙන් බිඳ දමලා තිබෙනවා. ඒ නිසා මා කියන්නේ මේකේ ඉන්න කවුරු හරි මේ රටට ආදරයක් තිබෙනවා නම්, මේ රට වෙනුවෙන් යම්කිසි හැඟීමක් හෝ තිබෙනවා නම්, නැවත හිතන්න කියලායි. අපේ හමුදාවන්ගේ බලය, ශක්තිය දැන් අඩු කරගෙන යනවා; නැවත බඳවා ගැනීම් අඩු වෙමින් යනවා.

අද මම ඔබට අභියෝගයක් කරනවා. දැන්වීමක් දාලා බලන්න, ඔබගේ හමුදාවන්ට මිනිසුන් බැඳෙන්න එනවාද කියලා. එන්නේ නැහැ. එන්නේ නැත්තේ ඇයි? ඒ අයට විශ්වාසයක් නැහැ. විශ්වාසය කඩ කරලා. මේ රට වෙනුවෙන් පෙනී හිටපු සියලු රණ විරුවන් දංගෙඩියට දක්කාගෙන යන ඕනෑම විදේශ බලවේගයක් එක්ක එකතු වෙලා හැම එකකටම අත ඔසවලා එනවා. මෙවර ජිනීවාවලදී අප කවදාවත් නොකරපු විධියේ කටයුත්තක් කරලා තිබෙනවා. එහිදී අපි ඡන්දයක් ඉල්ලුවේත් නැහැ. රට පාවා දීලායි තිබෙන්නේ. ඉතින් එසේ රට පාවා දීලා තිබියදී අපේ රණවිරුවෝ ඉස්සරහට එයිද? තමන්ගේ ජීවිතය ගැන ඔවුන්ට විශ්වාසයක් නැහැ. ඔවුන් තමන්ගේ තුවක්කු පත්තු කරයිද? යුද්ධ හමුදාවට බැඳෙයිද? ඔවුන් තුවක්කු බිම තියාගෙන ඉඳීවි. මොකද, ඔවුන්ට විශ්වාසයක් නැහැ, ඔවුන් රැක ගනීවි කියලා, ඔවුන්ගේ ඉහළින් ඉන්න මේ ආණ්ඩුව. ඒ නිසා දැන් ඔවුන් හැම දාම බලන්නේ ආරක්ෂාකාරීව පැත්තකට වෙලා ඉන්නයි.

අද මේ රටේ බුද්ධි තොරතුරු රැස් කරන ඒ බුද්ධි නිලධාරින් අවමය කරලා නිකම් ඉන්නවා. අප ඔවුන් සමඟ සමීපව ඇසුරු කරපු නිසා අපි දන්නවා, ඔවුන් එදා අපේ රට වෙනුවෙන් මොන තරම් කැප කිරීමක් කළාද කියලා. මොන තරම් කැපකිරීමක් කරලාද, ඔවුන් එදා බුද්ධි තොරතුරු රැස් කළේ. අද එහෙම වෙනවාද?

ආණ්ඩුව අද නත්තල් කියලා හිතාගෙන ඉන්නවා. මොකද, එක එක රටවල නත්තල් සීයලා මේ අයට එක එක toys ගෙනැල්ලා දීලා තිබෙනවා. ඒවා තියාගෙන බෝල මිරික මිරිකා ඉන්නවා. ඒ අතරතුරේ ළඟදීම දිනයක අපේ මව්බිම වෙත මහා කුමන්ත්‍රණයක් එල්ල වෙනවා එල්ල වෙනවාමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනාට, මේ මව්බිමේ ඉපදුණු, මව්බිමට ණයගැති, මේ මව්බිමෙන්ම කාලා බීලා වැඩුණු අපට යන එන මං නැති වෙන තැනට පත් කරනවා. ඒ නිසා තමයි ජාතික ආරක්ෂාව කියන විෂයය ගැන මම එදාත් කිව්වේ; අදත් කියනවා. ඒ කියන දේ මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත වෙන්නට ඕනෑ. එතකොට කවදා හරි දවසක මට කියන්න පුළුවන්, මම මේ මව්බිම වෙනුවෙන් මගේ යුතුකම කළා, මේ පාර්ලිමේන්තුවට එන්න මට ඡන්දය දුන් කවුරු හරි වෙනුවෙන් මගේ යුතුකම ඉටු කළා කියලා. හැබැයි, මේගොල්ලන්ට ඡන්දය දුන්න, අර "අදිටන" කියාගෙන පස්සෙන් ගිය රණවිරුවෝ අද අප හොයාගෙන එනවා. ඒ මිනිසුන්ගේ සුබසාධන සියල්ල අද කපා දමලා. ඒ මිනිසුන්ගේ වැන්දඹුවන්ට ලැබෙන පහසුකම් සියල්ල නැති කරලා. ඔවුන්ට ලැබිය යුතු වැටුප් වර්ධක නැති කරලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාලිමා රජය කටයුතු කරන්නේ සම්පූර්ණයෙන්ම මේ අපේ මව්බිමට එරෙහිව කියලා නැවතත් ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.13]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රාසජනක ජවනිකාවකින් පස්සේ මට අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද ආරක්ෂක අමාත්‍යාංශයේත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී විපක්ෂය පැත්තෙන් සැහෙන ගෝරනාඩු ටිකක් මේ සභාව තුළ කරනවා අපි දැක්කා. ඒ ගෝරනාඩු කරපු අය කවුද? අපි දැක්කා, පසුගිය කාලය තිස්සේ ඒ අය කන්ටේනර්වලට මුවා වෙලා හිටියා. ඒ වාගේම අදත්, ඊයේත් අපේ බුදුරජාණන් වහන්සේට, බුදු පිළිමයට මුවා වෙලා ඉන්නවා. හැබැයි අපි එකක් කියනවා, බුදු පිළිමයට මුවා වෙලා, කන්ටේනර්වලට මුවා වෙලා ඔබතුමන්ලාගේ වංචා දූෂණ, හොරකම් මැරකම්, අපරාධ වහගන්න බැහැ. ඒ විතරක් නොවෙයි. අර වතු සේවකයන්ට රුපියල් 200ක් දෙන එකට විරුද්ධව වැඩ කරපු එක වහගන්නත් බැහැ. දැන් කොළේ ඉරාගෙන, ඇඟේ හලාගෙන. ඒ විතරක් නොවෙයි. මට මතක් වෙනවා, ගලේ පහරපු බළලාගේ කථාව. මාධ්‍ය ප්‍රකාශක තෙමේ ඊයේ challenge කරනවා. කවුද මේ? අසූචි වළක බැහැගෙන අපට challenge කරනවා. ඉතින් අපි කියන්න ඕනෑ ඒගොල්ලන්ට හැමදාම මේවාට මුවා වෙලා ඉන්න බැහැ. මේ රටේ ජනතාව ඇත්ත, සත්‍යය දන්නවා.

ඒ විතරක් නොවෙයි. දැන් කියනවා "මදරාසි"ද මොකක්ද චිත්‍රපටය බලන්න කියලා. ඔබතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ මේ රටේ රඟ දක්වපු චිත්‍රපටය ගැන රටේ ජනතාව දන්නවා. ඒ නිසා තමයි පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 21වැනි දා ඒ පක්ෂ දෙකම කුජීත කරලා, එකට තියලා පරද්දලා, මාලිමාවේ අප ජයග්‍රහණය කෙරෙව්වේ. ඒ නිසා ඔය චිත්‍රපට ගැන කියන්න එන්න එපා අපට. අපි හොඳට චිත්‍රපට රස විඳින්නත් දන්නවා, නාට්‍ය රස විඳින්නත් දන්නවා, ගීත රස විඳින්නත් දන්නවා. දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපි කලාවට ඉතාම හොඳින් සංවේදී මිනිස්සු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද දැන් අපට මේ උපදෙස් දෙන්නේ? කවුද අපට පොලීසිය ගැන උපදෙස් දෙන්නේ? එතුමා දැන් හිටියා නම් හොඳයි. හැමදාම කථා කරලා පැනලා දුවනවා, නාමල් රාජපක්ෂ. මට මතක විධියට සී.ඩී. වික්‍රමරත්න පොලිස්පති කාලයේ පොලිස් ස්ථානාධිපතිවරු 182දෙනෙකුගෙන් 180දෙනෙක්ම දේශපාලන වුවමනාවට පොලීසිවලට පත් කරපු මහත්වරු තමයි ඒ. නේද, මාදුගොඩ මන්ත්‍රීතුමා? ඔබතුමා සද්ද නැතුව ඉන්න. මොකද, ඔබතුමා අහිංසකයි නේ. එහෙම කරපු අය තමයි අද අපට ඇවිල්ලා උපදෙස් දෙන්නේ, මේ පත්කිරීම් ගැන. මම ඒ ගැන වෙනම කියන්නම්.

ඒ විතරක් නොවෙයි. කලින් කථා කළ මන්ත්‍රීවරු කියපු, මම උත්තර දීගෙන යන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. කිව්වා, සල්ලිවලට ගත්තා කියලා තුච්ඡ විධියට. මොකක්ද වෙලා තිබෙන්නේ? මම මේ කථාවට කලින් හොයලා බැලුවා මොකද වෙලා තිබෙන්නේ කියලා. මේ වෙනකොට මේ රටේ ප්‍රාදේශීය සභාවල ඉතාම නිහීන කුමන්ත්‍රණයක් දියත් කරමින් තිබෙනවා, සුන්බුන් විපක්ෂය එකතු වෙලා. මොකක්ද කරන්නේ? ලබන වසර තමයි අපේ පළමු අය වැය ඉදිරිපත් වන වසර, ඒ පළාත් පාලන ආයතනවල.

ඒ පළාත් පාලන ආයතන ගොඩ නැඟීම ඉලක්ක කරගෙන ඉතාම හොඳ සංවර්ධන සැලසුම් දියත් කරමින් ඒ ප්‍රදේශවල සංවර්ධන වැඩ කටයුතු ටික කරගෙන යමින් තිබෙනවා. හැබැයි, දැන් මොකක්ද කරන්නේ? සුන්බුන් විපක්ෂය එකතු වෙලා ඒ අය වැය පරද්දනවා. මේ විරුද්ධ වෙන්නේ කාටද? විරුද්ධ වන්නේ ඒ ප්‍රදේශවල ජනතාවට. පළාත් පාලන ආයතන මෙතෙක් කල් වංචා, දූෂණවලින් පිරිලා තිබුණා. ඒකෙන් මුදාගෙන අපි ඒ ආයතන නිවැරදි දිසාවට මෙහෙයවනකොට අද ඒකට විරුද්ධයි. බොහොම හොඳයි, විරුද්ධ වෙන්න. අපි යමු ඡන්දයකට. අපි යමු ඒ ආයතනවල පළාත් පාලන ඡන්දයකට. අපි බලා ගනිමු, එතකොට මොකද වෙන්නේ කියලා.

ඒ විතරක් නොවෙයි, මේ කාරණයත් මට කියන්න ඕනෑ. දැන් ඒගොල්ලන් බුදු පිළිමවලට මුවා වෙලා ඉන්නකොට මම දැක්කා, ප්‍රවෘත්තියක්. මොකක්ද? ඒක අපේ හදවතට දැනුණු ප්‍රවෘත්තියක්. Leg-spinner කෙනෙක් වෙච්ච විජයකාන්ත් වියස්කාන්ත් කියන අපේ දමිළ ජාතික සහෝදරයා අද අපේ Sri Lankan Cricket Team එකට තෝරාගෙන තිබෙනවා. ඔහු T20I Squad එකට කැඳවලා තිබෙනවා. නමුත් මේගොල්ලන් ජාතිවාදයෙන් තවදුරටත් රට හදන්න යනවා, ජාතිවාදයෙන් තවදුරටත් රට ඉස්සරහට ගෙනියන්න යනවා.

ඒ වාගේම කිව්වා, ජාතික ආරක්ෂාවට තර්ජන වෙලා ලු. මම හිතන විධියට, තමුන්නාන්සේලා මේ අය වැය කියවලා නැහැ. කොහොමටත් මේ විපක්ෂයේ ගොඩක් අය, අය වැය කියවලා නැහැ නේ. අය වැය නොකියවලා ඇවිල්ලා තමන්ගේ දේශපාලන වුවමනාවට එක එක ඒවා දොඩවනවා.

මේ අය වැයෙන් ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් බිලියන 407ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒකෙන් වැඩිම මුදලක් වන රුපියල් බිලියන 10.5ක් නාවික හමුදාවටත්, රුපියල් බිලියන 16.8ක් ගුවන් හමුදාවටත් වෙන් කරලා තිබෙනවා. ඇයි ඒ? ඒ ජාතික ආරක්ෂාව වෙනුවෙන්. ඒ හරහා නාවික හමුදාවත්, ගුවන් හමුදාවත් ශක්තිමත් කරන්න ඕනෑ කරන බර තබා තිබෙනවා, මේ අය වැය ඇතුළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට උපදෙස් දෙන මහත්වරු කවුද? එක්කෙනෙක්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කැඳවනකොට නයා දෂ්ට කරපු කෙනා. අනෙක් අය, වාහන එකලස් කරලා පොලිසියෙන් හොයන්න ගෙදරට යනකොට පාර්ලිමේන්තු එන්නේත් නැතිව කට්ටි පැනපු අය. ඒගොල්ලන් තමයි දැන් අපට උපදෙස් දෙන්නේ. එහෙම නැත්නම්, මහ බැංකු වංචාවට සම්බන්ධ වෙලා ඒක ඇත්ත ද, නැත්ත ද කියලා පොත් ලියපු අය. මහ බැංකු වංචාවේදී Perpetual Treasuries එක්ක telephone calls 64ක් ගත්ත අය. එහා පැත්තේ ඉන්නවා එක මන්ත්‍රී කෙනෙක්. මම ඒ නම කියන්නේ නැතිව මේක කියන්නේ. මොකද, නම කියපු ගමන් අපේ කාලය කනවා. අපේ කාලය විතරක් නොවෙයි, රටේ ජනතාවගේ බදු මුදලින් දුවන මේ පාර්ලිමේන්තුවේ කාලයත් කනවා. ඒ නිසා මම නම කියන්නේ නැහැ. එක්කෙනෙක් ඉන්නවා, telephone calls 64ක් අරගෙන! මොකෝ "I love you" කියන්න telephone calls දුන්නාද, Perpetual Treasuries එකේ අර්ජුන් ඇලෝසියස්ට? ඒ, මගේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රී කෙනෙක්. එහෙම අය තමයි දැන් ඇවිල්ලා ආරක්ෂක අමාත්‍යාංශයේ, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙලාවේ අපට උපදෙස් දෙන්නේ.

තව කෙනෙක් ඉන්නවා. එයා කවුද? ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ණය අරගෙන රුපියල් ලක්ෂ හාරසිය හැටහතයි පනස්අටදහස් හාරසිය දොළහක් පොලු තියපු කෙනා. එහෙම පොලු තියලා, අද කුලියාපිටියේ උසාවියේ නඩුවක් තිබෙනවා. ඕනෑ නම් මට ඒ නඩු අංකයත් කියන්න පුළුවන්. ඒගොල්ලන් තමයි අද ඇවිල්ලා ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරනකොට අපි කටයුතු කරන්න ඕනෑ කොහොමද කියලා අපට උපදෙස් දෙන්නේ. අපට කවුරුත් උපදෙස් දෙන්න ඕනෑ නැහැ. අපි ඉතා නිවැරදිව, මෙතෙක් බිඳ වට්ටලා තිබුණු පොලීසිය, මෙතෙක් නන්නත්තාර කරලා තිබුණු පොලීසිය, හමුදාව නිවැරදි දිසාවට මෙහෙයවමින් මේ රටේ ජාතික ආරක්ෂාව ඇති කර තිබෙනවා. අපි මහජන ආරක්ෂාව ඇතුළු මේ සියලු කටයුතු ටික ඉතාම නිවැරදිව ඉටු කරමින් යනවා.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, නිලධාරින් 85,000කට අධික පොලීසිය, 6,343ක් වෙච්ච සිවිල් නිලධාරින් -මේ සියලුදෙනා- වෙනුවෙන් අපි පොලිස් දෙපාර්තමේන්තුව ඉතාම නිවැරදි ලෙස මෙහෙයවමින් තිබෙන බව. මේ රටේ මහජන සාමය, යහ පැවැත්ම වෙනුවෙන් මේ රටේ පොලීසිය ඉතා හොඳ වෘත්තිකභාවයක් සහිත පොලීසියක් බවට පත් කරන්න ඕනෑකම අපට තිබෙනවා. ඒ වෙනුවෙන් වැඩසටහන් රැසක් අපි දියත් කර තිබෙනවා, අපරාධ මර්දනය කරන්න, මත්ද්‍රව්‍ය නිවාරණය කරන්න.

තමන්ගේ ආරක්ෂාවට පූලම්පිටියේ අමරේ පිටුපස්සෙන් තියාගෙන කටයුතු කරපු මහත්වරු, බන්ධනාගාරයට ගිහිල්ලා, "අමරේ මම, එළියට එන්න" කියලා පණිවුඩ යවපු තාත්තලාගේ පුත්තු අද එනවා අපට මහජන ආරක්ෂාව ගැන පාඩම් කියා දෙන්න. ඇහුවා, කවුද බදා ගත්තේ කියලා. කවුරුවත් නොවෙයි, නිමල් ලාන්සා. බදා ගත්තේ එයා.  ඒකයි මගේ කථාවේදී කියන්නේ. එදා නිමල් ලාන්සා මත්ද්‍රව්‍ය එක්ක මීගමුවේදී අහුවෙනකොට මහින්ද රාජපක්ෂ හෙලිකොප්ටරයෙන් ගිහිල්ලා එයා බදා ගත්තා. එහෙම නැත්නම්, නැහැ කියන්න.

එහෙම කටයුතු කරපු මහත්වරු අද එනවා, අපට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් චෝදනා කරන්න. ඔව්, අපේ පක්ෂයට සම්බන්ධ සමහරු අහු වුණා. පැලියගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීතුමියත් අපේ පක්ෂයේ. එයාගේ මහත්තයා අහු වුණා. ඔහු ගුරුවරයෙක්. නීතිය ක්‍රියාත්මක කළා, අත්අඩංගුවට ගත්තා. මම හිතන විධියට ඔහු තවමත් ඇතුළේ. කිසිවෙක් නීතියට උඩින් නැහැ. සියල්ල නීතියට යටින්. කවුරුවත් ආරක්ෂා කරන්නේ නැහැ. නම කවුද මම දන්නේ නැහැ. පුවක් දණ්ඩාවේ කවුද කියලා කිව්වා නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඊගොල්ලන්ගේ ගෝලයෝ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඊගොල්ලන්ගේ කට්ටිය වෙන්න ඇති. ඊගොල්ලන්ගේ ගෝලයෝ ගැන කියමින්, අපි ආරක්ෂා කරනවා ලු. මම කලින් දවසකත් කිව්වා. ඊගොල්ලන්ගේ කන්ටේනර් අපි නිදහස් කරලා, ඒකේ තිබුණු ඒවා අරගෙන ගිහින් පොහොට්ටුවේ මන්ත්‍රීගේ ඉඩමේ වළලනවා. එහෙම බලාගෙන ගියාම මාර ආණ්ඩුවක් නේ.

ඒ විතරක් නොවෙයි, අද අපි මත්ද්‍රව්‍ය උවදුර මැඩලීමට ක්‍රියා කරනවා. ඔයගොල්ලෝ හැම දාම මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් ආරක්ෂා කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට ආරක්ෂාව දුන්නා. අද ඒක සහමුලින් බිඳලා තිබෙනවා. ඒ සම්බන්ධය අද බිඳ වට්ටලා තිබෙනවා. අපි එක දෙයක් සහතික වනවා. "රටම එකට" ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කරනවා.  අපි එය අවසන් කරන්නේ මේ රට සහමුලින් මත්ද්‍රව්‍යයෙන් මුදා ගත්ත දවසට කියලා අපි සහතික වනවා. ඒ වෙනුවෙන් අද ඉතා හොඳින් පොලීසිය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඇයි? ඔවුන්ට අද නිවැරදි නායකත්වයක් ලැබෙනවා. අද මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්නකොට, අනුරාධපුරයෙන් ගුරුවරයා අත්අඩංගුවට ගන්නකොට, නිදහස් කරන්න කියලා මෙහෙන් call එක යන්නේ නැහැ. තරාතිරම නොබලා දඩුවම් කරනවා. කොතැනත් එහෙමයි. කවුරු වුණත් එහෙමයි. අද ටොන් ගණන් අහු වෙනවා. අපේ ඉදිරි කරීකයන් ඒක අවධාරණය කරයි.

ඒ විතරක් නොවෙයි. දූෂණ මර්දනය වෙනුවෙන්, රථවාහන පාලනය, පරිසර ආරක්ෂණය සහ විශේෂයෙන්ම ආපදා කළමනාකරණ අවස්ථාවලදී පොලීසිය ඉතා හොඳින් අපට සහයෝගය ලබා දීලා තිබෙනවා. මහත්වරු කථා කළා උසස්වීම් ගැන. අද පොලිස් දෙපාර්තමේන්තුවේ උසස්වීම් ලබා දීලා තිබෙනවා. 2020 සිට නොදීපු උසස්වීම් 4,487ක් ලබා දීලා තිබෙනවා. වෙලාව මදි නිසා මම කිහිපයක් විතරක් කියන්නම්. කාන්තා නියෝජ්‍ය පොලිස්පතිවරු 04ක් පත් කරලා තිබෙනවා; උසස්වීම් ලබා දීලා තිබෙනවා. නියෝජ්‍ය පොලිස්පතිවරු 32ක්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් අධිකාරිවරු 23ක්, ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරු 02ක්, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරු 140ක්, කාන්තා සහකාර පොලිස් අධිකාරිවරු 03ක්, කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂකවරු 09ක්, පොලිස් පරීක්ෂකවරු 634ක්, කාන්තා පොලිස් පරීක්ෂකවරු 71ක් වශයෙන් අපි ගෙවුණු 2020න් පස්සේ උසස්වීම් ලබා නොදුන් 4,487කට උසස්වීම් ලබා දීලා තිබෙනවා. මෙම වසරේ පොලීසියට 5,092ක් බඳවා ගැනීම් කරලා තිබෙනවා. ලබන වසරට 5,000ක් බඳවා ගන්න අවශ්‍ය කටයුතු සිදු කරමින් තිබෙනවා. විශේෂයෙන්ම දමිළ ජාතික පොලිස් නිලධාරින් බඳවා ගන්න අපි කටයුතු කරමින් තිබෙනවා. එය අත්‍යවශ්‍ය කටයුත්තක්. මොකද, එම ප්‍රදේශවල වැඩ කරන්න ගියාම, විශේෂයෙන්ම දමිළ ජනතාව එක්ක වැඩ කරන්න ගියාම දමිළ ජාතික පොලිස් නිලධාරින්ගේ අවශ්‍යතාව තිබෙනවා. ඒකට ඕනෑ කරන කටයුතු කරමින් තිබෙනවා. වාහන අවශ්‍ය ප්‍රමාණයට මිලදී ගනිමින් තිබෙනවා. නිල නිවාස අලුත්වැඩියා කරමින් තිබෙනවා. අලුත් නිල නිවාස හදන්න  ඕනෑ කරන පසුබිම නිර්මාණය කරමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා කළ අපරාධ හොයන්න තනි පොලීසියකට බැහැ. අන්න එම නිසා පොලීසියේ ව්‍යුහාත්මක වෙනස්වීම් කරමින් තිබෙනවා. FCID එක ශක්තිමත් කරලා, PCID එක කියලා අලුත් අංශයක් හදලා, මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය - CCIB - කියලා අලුත් අංශයක් හදලා තිබෙනවා. මේ ආදී අලුත් අංශ නිර්මාණය කරමින් එම අංශවලට අවශ්‍ය කරන පහසුකම් ටික, බලතල ටික ලබා දෙමින් අපි අද ඉතා නිවැරදිව පොලීසිය  මෙහෙයවමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගොඩක් අය ඇහුවා නේ, නීති විරෝධී වත්කම් උපයා ගැනීම් ගැන. මේ වනකොට රාජ්‍ය නිලධාරින් 61ක්, දේශපාලනඥයන් 30ක් සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් උපයා ගැනීමට එරෙහිව කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. සැප්තැම්බර් 21වන දායින් පස්සේ කෝටි 70කට වැඩිය නීති විරෝධී ලෙස උපයා ගත්ත වත්කම් අපි රාජ සන්තක කරලා තිබෙනවා. අනෙක් එක තමයි, විමර්ශන ගැන දිගින් දිගටම අහනවා. ඔව්, FCID එකේ දැනට විමර්ශන 283ක් සිදු කෙරෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමර්ශන 42ක ලිපිගොනු වහලා තිබුණේ. වහලා තිබුණු, යට ගහලා තිබුණු විමර්ශන 42ක් නැවත උඩට අරගෙන තිබෙනවා. ඒවාට අදාළ විමර්ශන සිදු කරමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2020 - 2024 කාලය තුළ ගිං- නිල්වලා, නාමල්ගේ අම්මාගේ සිරිලිය ගිණුම, ඒ වගේම Ceylon Petroleum Corporation  එකේ සිදු වුණු වංචා සහ ග්‍රීක බැඳුම්කර කියන සියල්ලට අදාළව විමර්ශන අද ඉදිරියට යමින් තිබෙනවා.

ඉතින් කලබල වෙන එක අහන්න දෙයක් නැහැ; චෝදනා කරන එක අහන්න දෙයක් නැහැ. ගරු සභාවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්නවා අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා, පොලිස්පතිතුමා ඇතුළු අනෙකුත් නිලධාරින්. ඒ අයට චෝදනා කරනවා; ඒ අයගේ නම් කිය කියා චෝදනා කරනවා. චෝදනා කරන එක සාධාරණයි; ඒගොල්ලන්ගේ පැත්තෙන් ඒක සාධාරණයි. ඇයි? මේගොල්ලන්ට චෝදනා නොකරනවා නම් කාටද චෝදනා කරන්නේ? වංචනිකයන්ට, දූෂිතයන්ට, අපරාධකරුවන්ට එරෙහිව නීතිය හරියට අකුරටම ක්‍රියාත්මක කරන මේ මහත්වරුන්ට විරුද්ධව චෝදනා කරන්නේ නැත්නම් කාටද චෝදනා කරන්නේ? තම තමන්ට ඕනෑ විධියට නීතිය නමපු දේශබන්දුලාට එරෙහිවද, ඒගොල්ලන්ට ඕනෑ විධියට නීතිය නමපු අනුර සේනානායකලාට එරෙහිවද චෝදනා කරන්නේ? මිය ගිය අයගේ නම් කියන්න හොඳ නැහැ. නමුත්, එහෙම තමයි එදා නීතිය ක්‍රියාත්මක වුණේ. තමන්ට ඕනෑ ඕනෑ විධියට නීතිය නැමුවා. හැබැයි අද පොලීසියේ ඉහළ නිලධාරින්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් නීතිය නිවැරදිව අකුරට ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ නිසා දැන් අපෙන් අහනවා ලසන්ත ඝාතනයට මොකද වුණේ කියලා. CID එකේ යට ගහලා තිබුණු විමර්ශන 5ක්, වහලා තිබුණු විමර්ශන 5ක් අද එළියට ඇවිල්ලා තිබෙනවා; අනුරාධපුර ත්‍රිපුද්ගල ඝාතනය, ළමුන් 11දෙනා පැහැරගෙන යාම, නීති විරෝධී ගමන් බලපත්‍ර 20ක් ළඟ තබා ගැනීම, එයට සම්බන්ධ දෙදෙනෙක් නිදහස් කිරීම ඇතුළු විමර්ශන 5ක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේ විමර්ශන දැන් එළියට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ලසන්ත, තාජුඩීන් ඝාතන විමර්ශන දැන් ඉදිරියට යනවා. කලබල වෙන්නේ නැතිව ඉන්න. ඒකයි මේ අය කලබල වෙලා ඉන්නේ. තමන් දන්නවා තමන් පසුපස මේවා එනවා කියලා. එක්නැලිගොඩ ඝාතනය සම්බන්ධයෙන් නඩු දාලා ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් පත් කරලා තිබෙනවා. උපාලි තෙන්නකෝන් නඩුව යනවා. ඒ විතරක් නොවෙයි. කීත් නොයාර් විමර්ශනය නීතිපතිට යොමු කරලා තිබෙනවා. පොලීසියේ විශාල ප්‍රමාණයකට මේ කටයුතු පහසු කරන්න ඕනෑ කරන විධියට අවශ්‍ය කරන දේශීය සහ විදේශීය පුහුණුවීම් ලබාදෙමින් තිබෙනවා. අද පොලීසියේ 400කට වැඩි පිරිසකට විනය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ආණ්ඩුව; අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයත්, ආරක්ෂක අමාත්‍යාංශයත් මේ රටේ ජාතික ආරක්ෂාව නිවැරදිව ඉදිරියට ගෙන යමින්, මහජන ආරක්ෂාව තහවුරු කරමින්, රට නිවැරදි දිශාවට ගෙන යමින්, නීතිය අකුරට ක්‍රියාත්මක කරගෙන යනකොට සුන්බුන් විපක්ෂය කලබල වෙලා තිබෙනවා. කලබල වෙන හැමෝම දිහා බැලුවොත් අපට පෙනෙන්න තිබෙනවා, ඒගොල්ලන්ටත් මොනවා හරි ටිකක් තිබෙනවා කියන එක. හැමෝටම මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා. හැමෝම කුමන හෝ අපරාධයකට, වංචාවකට සම්බන්ධයි. ඒ නිසා තමයි අද කලබල වෙලා ඉන්නේ. කමක් නැහැ, ඇති තරම් කලබල වෙන්න. අපි අපේ වැඩේ හරියට, අකුරට, තිතට ඉදිරියට කරගෙන යනවා. රටේ ජනතාව අපේ දෙවුර මත පටවපු ඒ වගකීම අපි නිසි ලෙස ඉටු කරනවා කියන සහතිකය ලබා දෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.29]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் பாதுகாப்பு அமைச்சு மற்றும் பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு ஆகியவற்றின் நிதியொதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே பேசுவதில் மட்டற்ற மகிழ்ச்சியடைகின்றேன். அதுபோல, நீங்கள் தலைமைவகிக்கின்ற சந்தர்ப்பத்திலே முதன்முதலில் உரையாற்றச் சந்தர்ப்பம் கிடைத்தமைக்கும் சந்தோஷமடைகின்றேன். அரசாங்கம் மலையக மக்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்திலே நல்ல செய்தியைச் சொல்லியிருக்கின்றது; அதற்கு நான் இந்த அரசாங்கத்தை வாழ்த்துகிறேன். இருந்தாலும்கூட பாதுகாப்பு அமைச்சு என்ற அடிப்படையிலே அதற்குப் பல கோடி ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. எதற்காகப் பாதுகாப்புக்காகப் பல கோடி ரூபாய் ஒதுக்கப்பட்டது என்பதற்கு அமைச்சர் அவர்கள் தங்களுடைய நியாயப் பிரமாணத்தை எடுத்துக் கூறினார். ஆனாலும் நாங்கள் அதனை ஏற்றுக்கொள்ளக்கூடிய நிலை இல்லை என்பதை இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய வடக்கு மாகாணத்தில் ஒவ்வோர் இராணுவ முகாமும் அமைக்கப்படுகின்றபொழுதும் பல ஏக்கர் காணிகளை அவர்கள் அபகரிக்கின்றார்கள். உதாரணமாக, சன்னாரை எடுத்துக்கொண்டால், அது training camp என்ற அடிப்படையிலே பல ஏக்கர் காணியை அந்த இராணுவ முகாம் கொண்டிருக்கின்றது. அங்கிருக்கின்ற பொதுமக்கள் அங்குள்ள குளத்திலே மீன் பிடிக்கச் செல்வது தடுக்கப்பட்டிருக்கின்றது. அங்குள்ள மக்கள் காணி இல்லாமல் திண்டாடிக் கொண்டிருக்கிறார்கள். அதேபோல், மெனிக்பாம் என்பது 3 இலட்சம் பேரைத் தாங்கிய, காலங்காலமாக ஒரு farm ஆகக் காணப்பட்ட பிரதேசம். அதனை இப்போது இராணுவம் கைப்பற்றியிருக்கின்றது.

இவ்வாறு முல்லைத்தீவு போன்ற பிரதேசங்களிலும் எங்களுடைய மக்களின் பல ஏக்கர் கணக்கான காணிகளை அபகரித்து, இராணுவத்தினர் வருமானம் ஈட்டுகின்ற செயல்களிலே ஈடுபட்டிருக்கிறார்கள் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். உதாரணமாக, மெனிக்பாம் முகாமின் அருகாமையில் இருக்கின்ற வீதியில் ஒரு கிலோமீற்றர் தூரத்துக்கு இராணுவத்தினர் மிளகாயைக் காயவைத்திருந்த காட்சியை நான் நேரடியாகப் பார்த்திருப்பது அதற்குச் சாட்சியம். போர்க் காலத்தில் மெனிக்பாமில் உள்ள மக்களுடைய நிலங்களை அபகரித்ததுடன், மக்களின் கால்நடைகளையும் இராணுவத்தினர் தங்கள் வசப்படுத்திக்

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

கொண்டனர். A-9 பாதையால் போகும்போது, பிரதானமான இடங்களில் அவர்கள் சாப்பாட்டுக் கடைகளை வைத்திருப் பதையும் முடி வெட்டும் கடைகளை வைத்திருப்பதையும் காணலாம். இவ்வாறு எங்களது மக்களின் பல ஏக்கர் காணிகளை அபகரித்துத் தம்வசப்படுத்தி வருமானம் ஈட்டுகின்றார்கள்.

இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் இராணுவம் உட்பட முப்படைகளுக்கும் இவ்வளவு பெருந்தொகையான நிதி ஒதுக்கப்படுகின்றது. அப்படியாயின், இராணுவத்தினர் ஈட்டுகின்ற வருமானத்தை என்ன செய்கின்றார்கள்? அதற் குரிய கணக்கைக் காட்ட முடியுமா? எங்களது மக்களுடைய கால்நடைகள்மூலமும் வேளாண்மை நிலங்களைப் பயன்படுத்தி மரக்கறித் தோட்டங்களையும் முந்திரிகைத் தோட்டங்களையும் செய்வதன்மூலமும் இராணுவத்துக்குக் கிடைக்கின்ற வருமானம் எங்கே போய்ச் சேர்கின்றது என்பதை விளக்க முடியுமா? ஒவ்வொரு முறையும் காணிகள் பிடிக்கப் படும்போது, மக்கள் அந்தக் காணிகளின் உறுதிகளோடு நின்று போராடியிருக்கின்றார்கள். தங்களுடைய சொந்தக் காணி களுக்காகப் போராடுகின்ற மக்களை எங்களுடைய தேசத்தில் இன்றைக்கும் பார்க்க முடியும். ஆகவே, இராணுவத்தினர் உட்பட முப்படைகளாலும் எங்களுடைய மக்களின் காணிகள் எதற்காக அபகரிக்கப்படுகின்றன என்பதைச் சொல்ல வேண்டும்.

படையினர் வசமிருந்த சில காணிகளை மாண்புமிகு சனாதிபதி அவர்கள் விடுவித்திருக்கிறார். ஆனால், நான் சனாதிபதி அவர்களிடம் முன்வைக்கின்ற கோரிக்கை என்னவென்றால், தயவுசெய்து இராணுவத்தினர் வசமிருக் கின்ற மக்களுடைய காணிகளை முழுமையாக விடுவிப்புச் செய்யுங்கள்! என்பதாகும். ஏனென்றால், எங்களுடைய மக்கள் உங்கள்மீது - இந்த அரசாங்கத்தின்மீதென்று நான் சொல்லவில்லை - பாரிய நம்பிக்கை வைத்திருக்கின்றார்கள். சனாதிபதி அவர்கள் இதனைச் செய்வார் என்ற நம்பிக்கையோடு எங்களுடைய மக்கள் இருக்கின்றார்கள். இராணுவ முகாம்கள் அமைந்திருக்கின்ற அரசாங்கக் காணிகளை விடுவிக்குமாறு நான் கேட்கவில்லை. அந்தப் பண்ணைகளை மக்களுக்குக் கொடுங்கள்! அவர்களின் கால்நடைகளை ஒப்படையுங்கள்! எதற்காக இராணுவத் தினருக்கு வருமானம் ஈட்டுகின்ற கடைகள்? நான் இங்கு குறிப்பிட்டதுபோல A-9 பாதையில் முக்கியமான இடங்களில் இராணுவம் நடாத்துகின்ற சாப்பாட்டுக் கடைகளின் வருமானம் யாருக்குச் செல்கின்றது? ஆகவே, இதைக் கவனத்திலெடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாகும்.

மன்னார் மாவட்டத்தின் பாலத்துக்கு அருகாமையில் உள்ள ஒரிடத்தில் சோதனை என்ற பெயரிலே இராணுவம் முகாமிட்டு இருக்கின்றது. சோதனைச் சாவடிகள் தேவை! இல்லை என்று சொல்லவில்லை. போதைப்பொருள் கடத்தல்களைப் பிடிப்பதற் காகச் சோதனைச் சாவடிகள் தேவை! ஆனால், அந்தச் சோதனைச் சாவடியைத் தள்ளாடிக்குக் கொண்டு செல்லுங்கள்; அந்த நிலத்தை மக்கள் பாவனைக்கு விடுவியுங்கள் என்று கேட்கின்றோம். அங்கு நகர சபை நடைபாதையை அமைத்திருக்கின்றது. சிறுவர்கள் விளையாடக்கூடிய வாய்ப்புகளை அங்கு உருவாக்க முடியும். ஆகவே, அந்தச் சோதனைச் சாவடியைத் தள்ளாடியிலே உள்ள பெரிய campஇற்கு முன்னால் அமைத்தீர்கள் என்றால், அது எல்லா விதத்திலும் மக்களுக்கு உதவியாக இருக்கும். ஆகவே, இந்தப் பாலத்துக்கு அருகில் இருக்கும் சோதனைச் சாவடியை நகர்த்தி வேறு இடத்துக்குக் கொண்டுசெல்லுங்கள் என்ற வேண்டுகோளை மாண்புமிகு சனாதிபதி அவர்களிடம் விடுக்கிறேன். அவ்வாறு செய்தால், உண்மையில் அப்பகுதி அந்த மக்களுடைய பாவனைக்கு உகந்ததாக இருக்கு மென்பதை இச்சந்தர்ப்பத்திலே கூறிக் கொள்கின்றேன்.

எங்களுடைய மக்கள் சனாதிபதி அவர்கள்மீது நம்பிக்கை வைத்திருக்கின்ற அதேவேளையில், இப்படியான செயல் களினால் போர் இல்லாத சூழ்நிலையிலும், துப்பாக்கிச் சத்தம் இல்லாத ஒரு போருக்குள் இருப்பது போன்ற ஒரு நெருக்கடியை உணர்ந்து கொண்டிருக்கிறார்கள். இந்த அரசாங்கம் இராணுவத்துக்குக் கூடுதலான நிதியை ஒதுக்கியிருப்பது ஒரு பக்கம் இருந்தாலும், அங்கே வருமானம் ஈட்டுகின்ற, பயனடைகின்ற பணத்தை இராணுவம் என்ன செய்கின்றதென்ற கேள்வியை நான் மீண்டும் இந்தச் சபையிலே கேட்க விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொதுமக்கள் பாதுகாப்புக்கு இருக்கின்ற பொலிஸார் சம்பந்த மாகச் சில கருத்துகளைக் கூறலாமென நினைக்கின்றேன். உண்மையிலேயே இப்போது பொலிஸாரிடம் மாற்றம் காணப்படுகின்றது. மக்கள் பிரதிநிதியாக - MPஆக - இருந்தாலும் அனைவரையும் சரிசமமாகப் பார்க்கின்ற வகையில் பொலிஸாருடைய சிந்தனை மாறியிருக்கின்றது; நான் அதை வரவேற்கின்றேன். வழியில் என்னைச் சோதித்தார்கள், Identity cardஐக் கேட்டார்கள். அது நல்லது! இந்த நாட்டிலே எல்லோரும் சமம் எனப் பொலிஸார் எண்ணுவது சரியான விடயமாக இருக்கின்றது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன். ஆகவே, பொலிஸாருடைய அந்த மாற்றத்தை நல்ல முறையிலே பயன்படுத்தினால், உண்மையிலேயே இந்தப் போதைவஸ்து ஒழிப்பு விடயத்தை மிகத் திறமையாகச் செய்யலாம். நாங்களும் அதற்கு ஒத்துழைக்கத் தயாராக இருக்கிறோம். உண்மையிலேயே பொலிஸார் ஊடாக அந்தப் பணியைத் திடமாகச் செய்கின்ற இந்த அரசாங்கத்தின் செயற்பாட்டை நான் வரவேற்கிறேன். அது தொடர வேண்டும்; எமது இளைஞர்கள் இந்தப் போதைவஸ்திலிருந்து காப்பாற்றப்பட வேண்டும்.

இதனுடன் தொடர்புபட்டதாக ஒரு விடயத்தை நான் கௌரவ அமைச்சர் அவர்களிடம் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். மன்னாரிலே இருக்கின்ற பொலிஸ் நிலையம் மிக மோசமான சூழ்நிலையிலே இருக்கின்றது. அங்கேயுள்ள கட்டிடங்கள் பழுதடைந்திருக்கின்றன. அந்தக் காவல் நிலையத்தில் இருப்பவர்கள் திறமையாக வேலை செய்யக் கூடியவர்களாக இருந்தாலும்கூட, கட்டிடங்கள் பழைமை வாய்ந்ததாக, வசதிகளற்றதாக இருப்பதோடு, toilet pitகூட பாவனைக்கு உகந்ததல்ல என நகர சபையால் சொல்லப்பட்டிருக்கிறது. அங்கு டெங்கு நுளம்புகள் உருவாக வாய்ப்பிருக்கின்றது. ஆகவே, நீங்கள் இதில் கவனம் செலுத்த வேண்டுமென இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

அடுத்து, online வியாபார மாபியா பற்றி சொல்ல வேண்டும். கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் அதுபற்றி மிகத் தெளிவாக எடுத்துச் சொன்னார். இதனால் எங்களுடைய கிராமப்புற மக்கள் மிகவும் ஏமாற்றப்பட்டுக் கொண்டிருக்கிறார்கள். ஆகவே, போதைவஸ்து ஒழிப்பு நடவடிக்கைகள் எப்படி முன்னெடுக்கப்படுகிறதோ அதேபோன்று, இந்த online மாபியா ஒழிப்பு முயற்சிகளை முன்னெடுப்பதிலும் இந்த அரசாங்கம் கவனத்தைச் செலுத்த வேண்டும். நான் ஓர் உதாரணத்தை இங்கே சொல்கிறேன்;

Food court என்று அழைக்கப்படும் ஒரு நிறுவனத்தின் பெயரைச் சொல்லி, ஓர் ஏழை மீனவக் குடும்பத்தவரிடமிருந்து ஐம்பது இலட்சம் ரூபாயை அபகரித்திருக்கிறார்கள்; அவர்கள் ஏமாற்றப்பட்டிருக்கிறார்கள். தேவன்பிட்டி என்ற இடத்திலே யுள்ள கிரோணி என்ற குடும்பஸ்தர் 50 இலட்சம் ரூபாய் ஏமாற்றப்பட்ட நிலையில், இன்றைக்குத் தற்கொலை செய்கின்ற அளவுக்கு ஒரு சூழலை இந்த online மாபியாக்கள் உருவாக்கியிருக்கின்றன. எனவே, அதிலே அரசாங்கம் தனது கவனத்தைச் செலுத்த வேண்டும் என்று இச்சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டை நல்ல முறையிலே வளப்படுத்த வேண்டு மாக இருந்தால், இந்த நாட்டின் இளைஞர்களுடைய எதிர்காலத்தைச் சிறந்த முறையில் நிர்ணயம் செய்ய வேண்டுமாக இருந்தால், இந்த நாட்டைப் பொருளாதார ரீதியாக உயர்த்த வேண்டுமாக இருந்தால், நான் ஏற்கெனவே சொன்னதுபோல, பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கினாலே ஒழிய, இந்த நாட்டிலே எந்தவொரு நன்மையும் நிகழக்கூடிய வாய்ப்பு இருக்காது என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் ஒழிக்கப்பட்டால், நிச்சயமாக எங்களுடைய பொருளாதாரத்தை மேம்படுத்துகின்ற செயற்பாடுகளை நாங்கள் காண முடியும். பயங்கரவாதத் தடைச் சட்டத்தை ஒழித்தாக வேண்டும் என்பதை நாங்கள் தொடர்ந்து வலியுறுத்தி வருகின்றோம். அதனை ஒழிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்படும் என்று அரசாங்கம் சொன்னாலும்கூட, அது எந்தளவிலே இருக்கிறது என்பதும், எந்த வருடத்திலே நடைபெறும் என்பதும் சந்தேகமாக இருக்கிறது.

ஆகவே, நான் மீண்டும் வலியுறுத்துவது, பாதுகாப்புக்கான செலவினங்களை அரசாங்கம் குறைத்துக்கொள்ள வேண்டும்; இராணுவத்தினர் ஈட்டுகின்ற வருமானங்கள் எங்கு செல்கின்றன என்பதைக் கண்டுபிடிக்க வேண்டும் என்றுதான். பல்லாயிரம் ஏக்கர் கணக்கான நிலத்தைத் தன்னகத்தே கொண்டதாக எல்லைகள் நிர்ணயிக்கப்பட்டிருக்கின்ற முகாம்களின் மக்களுக்குரிய நிலங்கள் ஒப்படைக்கப்பட வேண்டும். யுத்தம் இல்லாத சூழ்நிலையில் இந்த முகாம்களிலே ஏன் இத்தனை ஆயிரம் இராணுவத்தினர் இருக்கிறார்கள் என்பது பிரச்சினைக்குரிய கேள்வியாகவே இருக்கிறது. இவ்வளவு ஏக்கர் காணியிலே எதற்காக அவர்கள் முகாமிட்டிருக்கின்றார்கள் என்ற சந்தேகம் எழுகிறது. அங்கு இராணுவத்தினரே தமக்கு வருமானம் ஈட்டக்கூடிய வாய்ப்பை, சூழலை உருவாக்கினால், ஏன் பாதுகாப்புச் செலவினத்துக்கு இவ்வளவு தொகையை நீங்கள் ஒதுக்க வேண்டிய நிலை ஏற்படுகிறது? என்ற கேள்வியை நான் கேட்க விரும்புகின்றேன். ஆகவே, முப்படைகளும் எங்களுடைய மக்களின் காணிகளைத் தொடர்ந்தும் அபகரிக்கின்ற சூழ்நிலையை நீங்கள் மாற்ற வேண்டும்.

அடுத்ததாக, இன்று அரசாங்கம் சொல்லுகின்றது, உண்மையிலே தங்களிடம் இனவாதம், மதவாதம் இல்லை என்று. ஆனால், சில இடங்களிலே பௌத்த மத எச்சங்களைக் கொண்டுபோய் வைத்துவிட்டு, பௌத்த மத அடையாளங் களைக் கொண்ட தொல்பொருள் இடங்களைத் தாங்கள் கண்டுபிடித்ததாகச் சொல்லி, அது பௌத்த மதத்தைச் சார்ந்த இடம் என்று அங்கு புத்தர் சிலைகளை வைப்பதற்காகத்தான் இந்தத் தொல்லியல் திணைக்களம் இருக்கிறதா? என்ற கேள்வியை நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். என்னைப் பொறுத்தமட்டில் இனவாதம், மதவாதம் இல்லாத ஓர் அரசாங்கம் என்ற கொள்கையோடு இருப்பதாக அது சொன்னாலும், மதவாதத்தைப் பற்றவைப்பதற்கு ஒரு சிறிய குச்சி போதும்! அது விரைவிலே பற்றிக்கொண்டு பாரிய நெருப்புப் பிளம்பாக மாறுகின்ற ஒரு வாய்ப்புக்கு இந்த அரசாங்கம் ஒருபோதும் இடமளிக்க முடியாது! ஆகவே, சரிசமமான அந்தஸ்தை எல்லோருக்கும் கொடுக்க வேண்டும் என்று கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ සහ පසුගිය දින කිහිපය තුළ මේ කාරණය සන්නිවේදනය වුණා. අපේ ආරක්ෂක අමාත්‍යාංශය, ඇමෙරිකා එක්සත් ජනපදයේ මොන්ටානා ජාතික ආරක්ෂක බලකාය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙරළාරක්ෂක බලකාය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. ඒ කටයුත්ත සිද්ධ වුණේ 2025 නොවැම්බර් 14වැනි දා. ඒ සම්බන්ධ කාරණා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා කිව්වා. එම අවබෝධතා ගිවිසුම දැන් මා ළඟ තිබෙනවා, අපේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරලා. මේ ගිවිසුම අත්සන් කළේ 2025 නොවැම්බර් 14වැනි දා. අපි විනිවිදභාවයකින් යුතුව, ඉතාම පැහැදිලිව, කැබිනට් අනුමැතියත් අරගෙන, නීති උපදේශනත් අරගෙන තමයි ඒ අවබෝධතා ගිවිසුම අත්සන් කළේ. ඒ අවබෝධතා ගිවිසුම මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ඕනෑම කෙනෙකුට ඒ සම්බන්ධව විශ්ලේෂණයක් කර කරුණු කාරණා දැනගැනීමට පුළුවන්.

බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள்! உங்களுக்கு 14 நிமிடங்கள் உண்டு.

[2.45 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, you can take the comments I make on these two Ministries - the Ministry of Defence and the Ministry of Public Security and Parliamentary Affairs - in two possible ways. You can take it in a constructive way, where we list out certain issues that are real. Those are issues that are faced by a certain section of this country; those are issues that, if you do not address, are going to create another issue with regard to

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

the legitimacy of this country in respect of that section of the country. If you take the Tamil people I represent, we raise certain issues, expecting the Government of the day to take note of those issues and rectify those because they go to the very core of the legitimacy of this country, as far as the Tamil people are concerned. So, you can take it in that way, in the way where we are trying to be constructive. It is an emotional matter, naturally. You can either do away with all those emotions and take it in a positive, constructive way or you can go down the path of complete denial, complete refusal and put the blame on the Tamils, making it out that the Tamils are against the State and that they want Sri Lanka, in some way, to lose or fail. So, you can take it in either of those two ways. But, I am going to say what I believe has to be said, Sir.

If I take the Ministry of Defence and if I am to be honest, as far as the Tamil people are concerned, it is the most hated Ministry, not only under this Government, but under previous governments as well; it is the single most hated Ministry under the State structure. Why is it?

It is because that single Ministry has been the cause for all the suffering that the Tamil people face, not only during the war, but even 16 years after the war. So, what are you going to do about it?

The Hon. Deputy Minister of Defence, in his opening remarks, referred to certain comments I had made previously with regard to the military's involvement in spreading drugs in the North and the East. I stand by what I said. It is not just me - if the Hon. Deputy Minister of Defence comes to Jaffna and attends the District Coordinating Committee Meetings there, where there are military officials and the Jaffna Command when these matters are spoken of, he himself would get to know that - but starting from the Governors who are appointed by Presidents, everyone would agree that the police and the military work hand in hand in that. When complaints about propagating drugs come in, all those who are found to be peddlers of drugs, when they are chased by the people, go into military camps and hide there. Then, when people try to make complaints to the police, the police refuse to accept them. We have made complaints, thereafter, to the Human Rights Commission that the police are refusing to accept complaints. That is one; that is the reality. You can deny it, if you want. But, if you deny it to us, what that means is that you only come across as being part and parcel of the past, that you are no different. That is the reality. If you want to be credible, then stop denying it and deal with it, and you have our cooperation because it is our people who are affected by it. So, you will have our fullest cooperation, if you go down that path. But, if you try to do what you did this morning by simply denying it, then you are only going to add to the suspicion that the people already have against the Ministry of Defence, the Ministry of Public Security and the Police.

Then, just another simple logical issue. The Hon. Deputy Minister of Defence and another JVP Member, who is a retired military officer, I guess, said what a great service that the military, the Navy and the Air Force are doing in the North and the East.

I think that comment was made because I had made reference to the ratio of the presence of the military establishment in the North and the East. In Jaffna, it is 1:14; in the Vanni, it is 1:2. So, with such an immense presence, to justify that, the Government benchers got up and said what a great service the military - the Army, the Navy and the Air Force - are doing there.

Now, let us talk about drugs; let us simply take up the drug issue. The Navy is everywhere along the coast of the North and the East; every kilometre, you have a checkpoint of the Navy. I challenge you to go to the coast of the North and the East and see. Every kilometre or if not, maximum every two kilometres, you will have a checkpoint of the Navy or some camp. They all are illegally occupying private land, but they are there. Never have they been present in this way even during the war because the LTTE was in control of the larger areas. It is only after the war that the Navy, the Army and the Air Force have such a massive presence in those areas. And, it is also only after the war that drugs have become such a menace in the North and the East. How do you explain that? It is only after the war. Actually, during the war when the LTTE had a presence, there was no drug issue in the North and the East, not even in Government-controlled areas because the LTTE had a presence even in Government-controlled areas and those drug traffickers were frightened. So, even though the counter-insurgency strategy of the Governments of the day was to propagate drugs, they could not find people to do it. How is it then that today, 16 years after the war, the drug issue in the North and the East has reached unimaginable heights? How is it? Therefore, if you try to deny that, Hon. Ministers, you only add to the suspicion that we already have. So, this is the reality, you cannot deny it.That military presence of 1:14 and 1:2 that I was talking about are the official figures. We all know what a massive intelligence presence you all have there. So, the denial that the military has no involvement in this curse of drugs is an absolute lie and it will never be accepted! You can deny it as much as you want.

The other issue is this. For accountability to seriously happen in this country, if you want the Tamil people to accept that Sri Lanka does not mean only Sinhala Buddhists, that it does not mean that it is only for the Sinhalese and what their intentions for Sri Lanka are, then you must accept that there were very serious crimes that took place during the war. As far as I am concerned, it was genocide. It was genocide, I am making that allegation. Now, what you are going to do about it? The fact of the matter is, you have such a massive presence and these crimes had taken place. I am not the only one who is talking about those crimes, but the whole world is talking about those. Do you want every member of the military, all the three forces, to be suspect of those crimes? Do you all not want to clear your names, if you were not actually involved in it? Is it not in your own interest and in the interest of this country that you clear your names? And, how are you going to clear your names? I know that all of them are not like that because all the evidence of genocide, the crimes against humanity

and the war crimes which came out, came out through the military because there are people of conscience who could not bear the way in which the military behaved. They leaked those out; they took recordings. That is how the evidence went out. That is how, today, the Sri Lankan military and the Navy are being accused of such heinous crimes, because there were right-thinking people who said, "No, this is not the way a decent military or a decent military establishment must behave".

But, I cannot see the difference between those persons who thought correctly and those violators, and it is not just me who cannot, but also the entire world. When General Sarath Fonseka was a Member of this House in the previous Parliament, on numerous occasions, whenever the Vote of the Ministry of Defence was discussed, he would stand up and say that there are over 50 very senior officers at the highest of ranks who have travel bans on them. They are unable to go abroad because they are on some list; not only them, but their families are also on the list. So, do you all not want to clear your names? Is this a legacy you want to keep? If that is to be done, the military must stop opposing a genuine international inquiry because that is the only real genuine way that this curse of the past war could be put to rest, where the guilty are found guilty, the people would know who did what and those who did the worst are punished. You had punished the LTTE; summarily, you had destroyed them. There were no trials and you executed them. You had already given your judgment, not before a court of law, but you decided that they all must die and you killed them. That is what happened. But, it is not only them, in trying to kill them, you killed the people as well. That is why I say it is genocide. So, now, it is your name that must be cleared; it is only you and there is nobody else. You - the Sri Lankan State and its military structure - are the only accused party today who have not been tried and you cannot try yourselves. It is the military and the police that must agree to an international investigation, if you are to clear your names. So, for as long as the Government does not agree to that, Sir, they are no different from the previous governments who were very clearly complicit in all those crimes.

Now, the issue is this. Why is there a conflict of interest? Why the JVP would worry about dealing with this in the way we say they must deal with it is because of their own complicity. The Mahinda Rajapaksa Government could not mobilize people for a war. All they could do was talk about a racist war; their rhetoric was racist.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் நிறைவடைகின்றது.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir.

So, they wanted somebody else who could go and make a credible case for war, to mobilize the war. And, it was the JVP who did that; it was their former comrade Wimal Weerawansa, Anura Kumara Dissanayake and many of the other frontbenchers who went around from military camp to military camp mobilizing the military and the South. So, you might be feeling guilty that you mobilized the public and the military to, ultimately, do the crimes that were done, but if you want to clear your own names, that change must start with you. If you genuinely want to make the Tamil people believe that you are not part of the past of Sri Lanka, that you are not the JVP of that time - we will not forgive you for that - because this is not a war time and your attitudes are different, then you must deal with those issues that I have raised. And, I am telling you again with responsibility and I appeal to you, do not take the comments that we, the Tamil Members from the benches opposite, make with regard to the Ministry of Defence and the Ministry of Public Security and Parliamentary Affairs as something simply to find fault with you.

We are saying it because if you do not deal with it, these two Ministries would be the singularly most important Ministries which would constantly call us to question the legitimacy of the Sri Lankan State.

Thank you.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Hon. Presiding Member, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
Thank you, Hon. Presiding Member.

Sir, the allegation made by the Hon. G.G. Ponnambalam with regard to the Tri-forces' involvement in criminal activities in the North and the East, I, again, categorically deny and reject. I kindly request you, Hon. Member, to be specific about those incidents and those involved so that we could take action against them. And, those who had been involved, we have identified and have taken action against them. I am very confident that the Tri-forces work responsibly towards the national security perspectives and objectives and they are very disciplined, dedicated and committed to national security including the North and the East.

And, yes, there are certain lands that are still being used by the military. This morning, I tabled the number of acres of land that had been used by the military and have now been released. The lands that are being used now are very important to us strategically and securitywise. We have listed out the lands that we would be able to release in the months to come and by next year.

Thank you, Sir.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, ඔබතුමා පොලීසියට එරෙහිව ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් නිශ්චිතව පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා නම් අපට ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්න පුළුවන්. Generally කිව්වාම අපට ඒ පිළිබඳව විමර්ශනයක් කරන්න අපහසුයි. ඔබතුමා නිශ්චිතව ඒ කාරණා ඉදිරිපත් කරනවා නම් ඒවා පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න අපට පුළුවන්; ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්නත් හැකියාව තිබෙනවා. දැනට අපට එවැනි කිසිදු පැමිණිල්ලක් ලැබිලා නැහැ.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு 30 செக்கன்கள் மாத்திரம் தரலாம். இந்த விடயத்தை விவாதத் துக்கு உட்படுத்த வேண்டிய அவசியமில்லை.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I do not want to reply to the Deputy Minister of Defence; it is a lost cause. But, Hon. Minister, to tell you just one incident, it involves former Member of Parliament Selvarajah Kajendren, who was assaulted in Trincomalee. The videos of the assault went viral. The people who assaulted him in Thampalakamam were the same people who were behaving as thugs, two days ago in Trincomalee; they were the same people. Those people were caught.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, ர்ர்க்கப்பட

நன்றி!

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir. The Hon. Minister asked for specifics and I am giving him those.

So, those people were identified, they were arrested and the police eventually produced them in court. That very same day, the ASP went to the High Court and asked that they all be released on bail because, otherwise, there would be riots.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, நேரத்தைக் கருத்திற் கொண்டு உங்களுடைய கருத்தைச் சுருக்கமாகக் கூறி முடிக்கவும்.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
An Hon. Member was assaulted, the police arrested the suspects, produced them in court and they were remanded. Then, it was the very same ASP who went to the High Court and said that they all must be released, or otherwise, there would be riots. And, they were released! That is just one example. - *[Interruption.]* So, I cannot list them, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, இந்த விடயத்தை விவாதத்துக்கு உட்படுத்த வேண்டிய அவசியமில்லை என்று நினைக்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කාලය කළමනාකරණය නොකිරීම හේතුවෙන් ගන්නා කාලය ඒ අදාළ පාර්ශ්වයේ කාලයෙන් අඩු කරන්න. ආණ්ඩු පක්ෂය පැත්තෙන් ඒ වෙලාව අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ செல்லத்தம்பி திலகநாதன் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உண்டு.

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Committee Stage Discussion එකේදී අදාළ ඇමතිවරුන් පිළිතුරු සැපයීම පාර්ලිමේන්තුවේ සාමාන්‍ය සම්ප්‍රදායයි. ඒක එම ඇමතිවරුන් දෙදෙනාට තිබෙන අයිතියක්. ඒක මන්ත්‍රීවරුන්ට හෝ අනෙක් ඇමතිවරුන්ට තිබෙන අයිතියක් නොවෙයි. විෂය භාර ඇමතිවරුන් දෙදෙනාට ඒ අයිතිය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිහිප වතාවක්ම ඒ මන්ත්‍රීතුමාට කිව්වා, "කථාව නතර කරන්න, නතර කරන්න" කියලා. එතුමා කථාව නතර කරන්නේ නැත්නම්, ඔබතුමා ඊළඟ පියවරට යන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair and THE HON. IMRAN MAHAROOF took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உரையாற்றுங்கள்!

[பி.ப. 3.05]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் பாதுகாப்பு அமைச்சு, பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

இந்தச் சபையில் இதுவரை நேரமும் இந்த அமைச்சுகள் தொடர்பில் பல்வேறு கருத்துகள் தெரிவிக்கப்பட்டன. நான் வன்னிப் பிரதேசத்தைச் சேர்ந்தவன் என்ற வகையில், இங்கு குறிப்பிடப்பட்ட பல்வேறு கருத்துகள் எலும்பில்லா நாக்கினால் சொல்லப்பட்ட பொய்கள் என்றே நினைக்கின்றேன். எனக்கு முன்பு பேசிய உறுப்பினர் குறிப்பிட்ட விடயம் உண்மை யிலேயே எனக்கு மன வேதனை அளிக்கின்றது. அதாவது, வடக்கிலுள்ள இராணுவத்தினரும் கடற்படையினரும் விமானப்படையினரும் போதைப்பொருள் கடத்தலில் ஈடுபடுவதாக அவர் குறிப்பிட்டிருந்தார். நான் அந்தப் பிரதேசத்தைச் சேர்ந்தவன் என்ற வகையிலும், அந்த மக்களுடன் ஒன்றாக வாழுகின்றவன் என்ற வகையிலும், அந்த மக்களுடன் பழகுகின்றவன் என்ற வகையிலும், அவ்வாறான எந்தவித தகவலும் எனக்குக் கிடைக்கவில்லை. நான் நினைக்கின்றேன், அந்த உறுப்பினர் வன்னிப் பிரதேசத்துக்கு வந்து பல வருடங்களாகி இருக்கலாம் என்று.

இவ்வாறு ஆதாரமற்ற கூற்றுகளைத் தெரிவிக்கும்போது, அங்குள்ள இராணுவத்தினரது, கடற்படையினரது, விமானப்படையினரது குடும்பத்தினருக்கு எவ்வாறான மன உளைச்சல் ஏற்படும் என்பதை அவர் நினைத்துக்கூட பார்க்கவில்லை. அவர் famousஆன ஒரு சட்டத்தரணி ஆவார். உண்மையிலேயே அவர் வடக்கு மாகாண இளைஞர்களைப் பாதுகாக்க வேண்டுமென நினைத்திருந்தால், அவர் தெரிவித்த போதைப்பொருள் கடத்தல்காரர்களைக் கைதுசெய்து, சட்டத்தின் முன் நிறுத்துவதற்கு நடவடிக்கை எடுத்திருக்க வேண்டும். ஆகவே, இந்த உயரிய சபையில் இவ்வாறாக முப்படையினரையும் குற்றஞ்சாட்டவேண்டிய தேவையில்லை. மேலும், முல்லைத்தீவில் ஒவ்வொரு கிலோமீற்றருக்கும் இடையில் ஒரு Navy checkpoint இருப்பதாக அவர் குறிப்பிட்டு இருந்தார். முல்லைத்தீவு மாவட்டத்தில் 70 கிலோமீற்றர் நீளமான கடற்கரையே உள்ளது. அந்தக் கடற்கரையில் மூன்றேமூன்று கடற்படைத் தளங்கள்தான் காணப்படுகின்றன. அவற்றில் உள்ளவர்கள் பல்வேறுபட்ட வழிகளில் அங்குள்ள மீனவர்களுக்கு உதவி செய்கின்றார்கள். குறிப்பாக, தடை செய்யப்பட்ட மீன்பிடி முறைகளைக் கட்டுப்படுத்துவதற்கும் போதைப்பொருள் போன்றவற்றை இலங்கைக்குக் கொண்டு வருவதைத் தடுப்பதற்கும் அவர்கள் உண்மையிலேயே பாடுபடுகின்றார்கள்.

முல்லைத்தீவு மாவட்டமானது விசாலமான ஒரு மாவட்டமாகும். அங்கு மக்கள் பரந்து வாழ்கின்றார்கள். அப்படிப்பட்ட இடத்தில் கடந்த காலத்தில் இராணுவ முகாம்கள் பெருமளவில் அமைக்கப்பட்டு இருந்தன. எமது அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், பெருமளவு முகாம்கள் அகற்றப்பட்டிருக்கின்றன. குறிப்பாக, ஒட்டுசுட்டான், மண்ணாங்கண்டல், முத்தையன்கட்டு, மல்லாவி போன்ற இடங்களிலிருந்த முகாம்கள் அகற்றப்பட்டு, அக்காணிகள் மக்களிடம் கையளிக்கப்பட்டன. அதேபோல, கடந்த காலத்தில் புதுக்குடியிருப்புப் பிரதேசத்தில் விடுதலைப் புலிகளின் மருத்துவமனையாக இயங்கிய 'பொன்னம்பலம் மருத்துவ மனை' அதன் உரிமையாளரிடம் கையளிக்கப்பட்டது. இவ்வாறு பல நிலங்கள் எமது அரசாங்கத்தால் படிப்படியாகக் கையளிக்கப்பட்டு வருகின்றன.

கடந்த ஆட்சிக் காலத்தில் பெருமளவு வன்னி இளைஞர்கள் போதைப்பொருள் பாவனைக்கு உட்பட்டிருந்தார்கள். உண்மையிலேயே கடந்த அரசாங்க காலங்களில்தான் போதைப்பொருட்கள் அறிமுகப்படுத்தப்பட்டன. ஆனால், எமது அரசாங்க காலத்தில் போதைப்பொருள் கடத்தல் காரர்கள் கைது செய்யப்படுகின்றார்கள். அதுமாத்திரமன்றி, போதைப்பொருள் புனர்வாழ்வு மையம் ஒன்றையும் ஒட்டிசுட்டானில் அமைக்கவுள்ளது. கடந்த காலத்தில் போதைப்பொருளுக்கு அடிமையானவர்கள், தற்போது எமது அரசாங்க காலத்தில் போதைப்பொருளைப் பெற்றுக்கொள்ள முடியாமல் இருப்பதால், அவர்களுடைய உடல் நிலை மிக மோசமாகக் காணப்படுகின்றது. அவ்வாறானவர்களுக்குப் புனர்வாழ்வு அளிப்பதற்காகவே நாங்கள் புனர்வாழ்வு மையம் ஒன்றை அமைக்கவுள்ளோம்.

மேலும், வடக்கிலுள்ள பொலிஸ் நிலையங்களில் பல்வேறுபட்ட குறைபாடுகள் காணப்படுகின்றன. குறிப்பாக, ஆளணிப் பற்றாக்குறை காணப்படுகின்றது. எமது அரசாங்கமானது முல்லைத்தீவு மாவட்டம் உட்பட பல பகுதிகளுக்கு தமிழ் மொழி பேசும் பொலிசாரை நியமிப்பதற்கு நடவடிக்கை எடுத்துள்ளது. அதுமாத்திரமன்றி, வடக்கு, கிழக்கிலுள்ள பொலிஸ் நிலையங்களுக்குப் புதிதாக வாகனங் களையும் கொள்வனவு செய்துள்ளது. அதேவேளை, இந்திய அரசாங்கத்தின் நிதியுதவியுடன் 130 single cabஐயும் கொள்வனவு செய்துள்ளது.

வடக்கில் வாழ்கின்ற மக்களுக்கு எமது அரசாங்கம் பல்வேறுபட்ட நன்மைகளைச் செய்து வருகின்றது. கௌரவ அடைக்கலநாதன் அவர்கள் தெரிவித்திருந்தார், மெனிக்பாமில் செத்தல் மிளகாய் காய்ந்துகொண்டு இருப்பதாக. உண்மையிலே இது செத்தல் மிளகாய் season அல்ல. இது மழை காலம்! எனவே, அவர் இந்தச் சபையில் பொய் கூறிவிட்டுச் சென்றிருக்கிறார் என்பதை நான் மனவருத்தத்துடன் தெரிவித்துக் கொள்கின்றேன். எமது அரசாங்கத்தின்மீது பல்வேறுபட்ட குற்றச்சாட்டுகளைச் சுமத்து கின்றார்கள். கடந்த காலத்தில் ஏற்பட்ட பிரச்சினைகளிலிருந்து

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

மீண்டு, மக்கள் இயல்பு வாழ்க்கைக்குச் சென்றுகொண்டு இருக்கின்ற இந்த நேரத்தில், அரசாங்கத்தின்மீது குற்றம் சுமத்தி, மக்களின் உளவியலைப் பாதிக்கக்கூடிய வகையிலான கருத்துகளை இவர்கள் தெரிவித்துக்கொண்டு இருக்கின்றார்கள் என்பதை நான் இங்கு கூற விரும்புகின்றேன்.

சிவில் பாதுகாப்புத் திணைக்களமானது, முல்லைத்தீவு மாவட்டத்தில் வாழ்கின்ற மக்களுக்குப் பல்வேறுபட்ட உதவிகளைச் செய்கின்றது. குறிப்பாக, அத்திணைக்களத்தால் பணிக்கு அமர்த்தப்பட்டுள்ள உத்தியோகத்தர்கள், பாலர் பாடசாலைகளில் சிறுவர்களுக்கு கல்வி புகட்டிக்கொண்டு இருக்கின்றார்கள். உண்மையிலே பாலர் பாடசாலைகளிலே ஆசிரியர்களுக்குப் பற்றாக்குறை நிலவுகின்றது. இவ்வாறான சந்தர்ப்பத்தில், சிவில் பாதுகாப்புத் திணைக்களம் தேவையான பயிற்சிகளை அளித்து, அவர்களைப் பாலர் பாடசாலைகளில் ஆசிரியர்களாக நியமித்து, சிறுவர்களுடைய எதிர்காலத்தைக் கருத்திற்கொண்டு சேவை ஆற்றுகின்றது என்பதை நான் இந்தத் தருணத்தில் தெரிவித்து விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.15]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහජනතාවගේ ආරක්ෂාව සහ ජාතික ආරක්ෂාව සම්බන්ධවයි අද අපි කථා කරන්නේ. ජාතික ආරක්ෂාවට, මහජන ආරක්ෂාවට ස්වාධීන පොලීසියක් ඕනෑ. ස්වාධීන පොලීසියක් ඕනෑ නිසා තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් ස්වාධීන ජාතික පොලිස් කොමිෂන් සභාවක් ස්ථාපිත කළේ. මේ ආණ්ඩුව පොලීසියේ ස්වාධීනත්වයට ඇඟිලි ගහලා අද මොකක්ද කර තිබෙන්නේ?

මට මතකයි, ජනාධිපතිවරයා එක්තරා රැස්වීමකදී පොලිස් කොමිසමට තර්ජනය කරපු ආකාරය. ජනාධිපතිතුමාගේ ඒ තර්ජනයෙන් පස්සේ පොලීසියේ ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම් සහ මාරුවීම් පොලිස්පතිතුමාට භාර දීලා තිබෙනවා. පොලිස්පති ඉන්නේ මහජන ආරක්ෂක ඇමතිවරයා යටතේ. අද පොලීසියේ තිබෙන ස්වාධීනත්වය නැත්තටම නැතිවෙලා තිබෙනවා. පසුගිය කාලයේ පොලිස් ස්ථානාධිපතිවරු පත් කරද්දී කිසිම පරීක්ෂණයක්, විභාගයක් නැතිව පොලිස්පතිවරයාට ඕනෑ අය පත් කළා. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට ඕනෑ අය පත් කළා. අද අපට පොලීසියේ ස්වාධීනත්වය සම්බන්ධව, මේ රටේ ආරක්ෂාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. අපට ආරංචියි, පොලීසියේ උසස්වීම් ලබා දීමේ අයිතියත් පොලිස්පතිවරයාට ලබා දෙන්න හදනවා කියලා. මේක ලොකු ප්‍රශ්නයක්. ඒකෙන් බැට කන්නේ ජනතාව.

අනෙක් කාරණය තමයි සිවිල් ආරක්ෂක කමිටු. අපි මේ රටේ ඉතිහාසය පුරා දැකපු දෙයක් තමයි, ගමේ ආරක්ෂාවට මහජනතාවගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටුවක් පත් කරන එක. මේ කමිටුව පත් කරද්දී හැම ග්‍රාම නිලධාරි වසමකටම පොලීසියේ රාළහාමි කෙනෙක්, සාජන් කෙනෙක් පත් කරනවා. ඒ අය පත් කරලා, ගමේ ස්වාධීන සංගම් එකතු කරගෙන, ගමේ ඉන්න ජනතාව එකතු කරගෙන, ගමේ හාමුදුරුවෝ ගෙන්වලා සිවිල් ආරක්ෂක කමිටු පත් කළා. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අද අනීතික විධියට, ගමේ තිබෙන ඒ ස්වාධීන සිවිල් ආරක්ෂක කමිටුවට පුද්ගලයන් පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම පොලීසියේ ස්ථානාධිපතිතුමාට නම් ලැයිස්තු යවනවා. ඊට පස්සේ එතුමා ඒ අය පත් කරනවා. JVP cadre එකේ අය තමයි අද සිවිල් ආරක්ෂක කමිටුවේ ඉන්නේ. මෙන්න, ගමේ පොලීසියේ ස්වාධීනත්වය, නීතියේ ස්වාධීනත්වය නැති කරලා තිබෙන විධිය. අපි ආණ්ඩුවෙන් අහනවා ඔබතුමන්ලා මේවාද කියාගෙන ආවේ කියලා. අද ඒ කමිටුවල ඉන්නේ කවුද? අද ගමේ කමිටුවේ ඉන්නේ JVP cadre එකේ අය. මා ළඟ ලැයිස්තුවක් තිබෙනවා. 1988-89 කැරැල්ලේදී පොලීසියේ රාළහාමිලා 342 දෙනෙකු මරලා තිබෙනවා, JVP එකෙන්. මා ළඟ ලැයිස්තුව තිබෙනවා. ඒ cadre එකේ ඉන්න අය තමයි සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති. පොලීසියේ රාළහාමිලා පාරට දමලා තිබෙනවා. ඒ රාළහාමිලා පාර පරීක්ෂා කරනවා. තමුන්නාන්සේලා ගමේ බලය වක්‍රව තමන්ගේ දේශපාලන යන්ත්‍රණයට අරගෙන තිබෙනවා. මේක රටේ අනාගතය පිළිබඳව තිබෙන භයානක ප්‍රශ්නයක්.

ඒ විතරක් නොවෙයි. මහජන ආරක්ෂාව සම්බන්ධව අද මෙතැන ලොකුවට කථා කරනවා. අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති හැටියට පත් වුණාට පස්සේ ප්‍රසිද්ධියේ වෙඩි තැබීම් 114ක් වෙලා තිබෙනවා. ඒකෙන් 63දෙනෙකු පසුගිය අවුරුද්ද තුළ මැරිලා තිබෙනවා. මම මහජන ආරක්ෂකතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. මා ළඟ ලැයිස්තුවක් තිබෙනවා.

2014දී මේ වාගේ මැරිලා තිබෙන්නේ 51යි; 2016දී 58යි; 2017දී 42යි. මේ ආණ්ඩුවේ පළමුවැනි අවුරුද්ද ඇතුළත රටේ ආරක්ෂාව කොහොමද කිව්වොත්, ප්‍රසිද්ධියේ ගිහිල්ලා 63දෙනෙකුව මරනවා. මහජන ආරක්ෂක ඇමති මොනවාද කියන්නේ? අපේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා මැරුවාම මරණ පරීක්ෂණය කරන්නත් ඉස්සෙල්ලා පොලීසිය භාර ඇමතිවරයා කියනවා, එතුමා පාතාල කල්ලියකට අයිතියි ලු. මෙහෙම ඇමතිවරු අපි දැකලා නැහැ. ජනාධිපතිතුමා බලයට ඇවිල්ලා කිව්වා, "අපි පාතාලය මර්දනය කරනවා" කියලා. 2017දී 42යි මරලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ පළමුවෙනි අවුරුද්දේම 63දෙනෙකු මරා දමා තිබෙනවා. මෙන්න, රටේ ජාතික ආරක්ෂාවට වෙලා තිබෙන දේ.

ඊළඟට මම මත්ද්‍රව්‍ය ගැන කථා කරන්නම්. මත්ද්‍රව්‍ය පාලනය කරන්න ඕනෑ. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ, කිසිම තර්කයක් නැහැ. මේ රටේ තරුණ තරුණියෝ මත්ද්‍රව්‍ය උවදුරෙන් ගොඩ ගන්න ඕනෑ. ආණ්ඩුව කථා කරන්නේ හරියට පසුගිය කාලයේ මත්ද්‍රව්‍ය පාලනයක් තිබුණේ නැහැ වාගේ. මම බැලුවා පසුගිය කාලයේ සංඛ්‍යාලේඛන. 2019 අගෝස්තු 7වෙනි දා වෙනකොට, - අපේ ආණ්ඩුව තිබියදී- හෙරොයින් කිලෝ 1,110ක් අල්ලලා තිබෙනවා. 2021දී කිලෝ 1,629යි; 2022දී කිලෝ 1,677යි. තමුන්නාන්සේලාගේ සංදර්ශනවල, ප්‍රවෘත්තිවල විධියට කිලෝ 5,000ක්වත් අල්ලලා ඇති කියලා මම හිතුවා. ඇමතිතුමා කිව්වා ටොන් 20ක් අල්ලලා තිබෙනවා කියලා, අද උදේ කිව්වේ. මෙන්න, ආණ්ඩුවේම සංඛ්‍යාලේඛන තිබෙනවා. ඔක්තෝබර් මාසයේ අන්තිම වෙනකොට අල්ලලා තිබෙන්නේ කිලෝ 1,481යි.

ගංජා කිලෝ 14,194යි. මම කියන්න කැමැතියි, 2013දී විතරක් ගංජා කිලෝ 81,800ක් අල්ලා තිබෙන බව. අනෙක් එක,

කොකේන්. කොකේන් බොන්නේ බොහොම සල්ලි තිබෙන උදවිය. 2016දී කොකේන් කිලෝ 1,568ක් අල්ලලා තිබෙනවා; 2017දී කිලෝ 220යි; මේ අවුරුද්දටම අල්ලා තිබෙන්නේ කිලෝ 32යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොකේන් ගහන්නේ සල්ලිකාරයෝ. සල්ලිකාරයෝ ගොඩක් ඉන්නේ ආණ්ඩුවත් එක්ක නේ, ව්‍යාපාර කරන්න. කොකේන් තමයි ගණන් වැඩිම මත්ද්‍රව්‍යය. මේ අවුරුද්දේ අල්ලා තිබෙන්නේ කිලෝ 32යි. ඒ නිසා තමයි අපි දිගින් දිගටම කිව්වේ, මාධ්‍ය සන්දර්ශන තියනවා කියලා. ඇයි, මේවා නිශ්ශබ්දව අල්ලන්න බැරි? අපේ ආණ්ඩුව කාලයේ අපි නිශ්ශබ්දව ඇල්ලුවා. අද රටේ තරුණ තරුණියන් ලක්ෂ 5කට වඩා මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්නවා. ඒ සංඛ්‍යාව දවසින් දවස වැඩි වෙනවා. ගමකට ගිහින් අපි ඇහුවොත් කියනවා, 'අපේ ගමේ මත්ද්‍රව්‍ය තිබෙනවා' කියලා. කථාවට, සන්දර්ශනවලට සීමා වෙන්නේ නැතිව, කරුණාකර මේ මත්ද්‍රව්‍ය පාලනය කරන්න කියලා අපි ඉල්ලනවා. මම ඇමතිතුමාට අභියෝග කරනවා. ටොන් 20ක් -කිලෝ 20,000ක්- අල්ලන්න ඕනෑ, ඇමතිතුමනි. එහෙම එකක් නැහැ.

මා ළඟ තිබෙනවා පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයෙන් ලබා ගත් ලේඛනයක්. ඒකට අනුව, 2014දී නම් ගංජා විතරක් ටොන් 80ක් අල්ලා තිබෙනවා. මේකට අපි විරුද්ධ නැහැ. අද මේවා අල්ලාගෙන යනකොට තමුන්නාන්සේලාගේ පක්ෂයේ පස්දෙනෙක් දැනටමත් මේවාට මාට්ටු වෙලා තිබෙනවා. නිකම් අය නොවෙයි. මම ඒ අයගේ නම් කියන්නේ නැහැ. ඒක එච්චර හොඳ නැහැ. එක් කෙනෙක්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියකගේ ස්වාමි පුරුෂයා. ඔහු කවුද? විදුහල්පතිවරයෙක්. ඔහු කොස්ගොඩ සුජීගේ නෑයෙක්. දෙවැනි කෙනා, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ මන්ත්‍රීවරියකගේ පුතෙක්. ඔන්න, තමුන්නාන්සේලාගේ පක්ෂයේ සද්දේ එකපාරම අඩු වුණා. ඒ විතරක් නොවෙයි, තවත් කෙනෙක් ඉන්නවා. ඒ තමයි, තමුන්නාන්සේලාගේ පක්ෂයට හොඳට වැඩ කරපු හම්බන්තොට දිස්ත්‍රික්කයේ "සනා" කියලා පුද්ගලයෙක්. පොලිසියට අපි ස්තුතිවන්ත වෙනවා. මේක ආණ්ඩුවේ කෙරුමක් නොවෙයි. පාට, පක්ෂ බලන්නේ නැතිව මේ අය අල්ලා තිබෙනවා.

දෙහිවල, තව එකක්. දෙහිවල තමුන්නාන්සේලාගේ සංවිධායක කෙනෙක් මහා පරිමාණයෙන් මේක කළා. මම පාර්ලිමේන්තුවේ නම කියන්න කැමති නැහැ. ඒ විතරක් නොවෙයි, ජේවීපී සංවිධායකගේ පුතෙක්. ඔහු මත්ද්‍රව්‍ය විරෝධී කමිටුවේ සභාපති. මේ විධියට දැනට තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් 5දෙනෙක් මේ සම්බන්ධව අල්ලලා තිබෙනවා. කසිප්පුකාරයෙක් අහු වුණාම තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක් - මම නම කියන්නේ නැහැ - පොලිසියේ OICට තර්ජනය කර තිබෙනවා. අපි අහනවා, මෙහෙමද රට හදන්න ආවේ කියලා. තමුන්නාන්සේලා සාධාරණ සමාජයක් හදන්න ආපු පුද්ගලයෝ. මම හිතන විධියට, අද තමුන්නාන්සේලාගේ කට්ටියම මේවාට සම්බන්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි පාස්කු ඉරිදා සිද්ධිය. අපි දන්නවා, 2019 ජනාධිපතිවරණයෙන් තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ආවේ කියන එක. 2024දී තමයි අනුර කුමාර දිසානායක මැතිතුමා බලයට ආවේ. ඒ, පාස්කු ඉරිදා ප්‍රහාරයට මුවා වෙලා. මට මතකයි, 2019දී ජාතික ආරක්ෂාව ගැන කිව්වා. තමුන්නාන්සේලා එදා කිව්වා, "මේ අයව ඇල්ලුවේ නැහැ, රාජපක්ෂ ආණ්ඩුව; රනිල් රාජපක්ෂ ආණ්ඩුව. අපිට මේ අයව අල්ලන්න අවස්ථාව දෙන්න" කියලා. මට මතකයි යහ පාලන ආණ්ඩුවේ මුල් මාස තුන ඇතුළත විතරක් 700 ගණනක් ඇල්ලුවා. ඒ විතරක් නොවෙයි. බෝම්බ පුපුරපු ස්ථාන 16ම SP කෙනෙක් යටතේ පරීක්ෂා කළා. 2020දී ඒවා අහෝසි කළා. ගරු මැල්කම් කාදිනල් රංජිත් පියතුමාත්, කතෝලික ජනතාවත් හිතුවා ජේවීපී ආණ්ඩුව ඇවිල්ලා මේක කරයි කියලා. මොකක්ද, අන්තිමට වුණේ? ජනාධිපතිවරයා පසුගිය අප්‍රේල් මාසයේ කිව්වා, "මේකේ මහ මොළකරු කවුද කියලා අපි රටේ ජනතාවට කියනවා" කියලා. දැන් ඊළඟ වසරේ අප්‍රේල් 21වන දාටත් කිට්ටු වෙනවා. මේ රටේ ජනතාවට ඒ ගැන ඇත්ත හෙළි කරන්න. අපි අහන්නේ මේකයි. ස්විට්සර්ලන්තයේ, එංගලන්තයේ මේකේ සාක්ෂිකාරයෝ, වූදිතයෝ ඉන්නවා කියලා තමුන්නාන්සේලා කිව්වා. පිටරට සිටින, කුඩු ව්‍යාපාරයේ මහ අය ගෙන්වන්න පුළුවන් නම්, මේ රටේ ජනතාව; කතෝලික ජනතාව බලාගෙන ඉන්න පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ වූ කණ්ඩායම ගෙන්වන්න බැරි ඇයි? මේකේ ප්‍රගතිය කියන්න. තමුන්නාන්සේලා ආයෙත් සැරයක් 2019දී වාගේම මේ රටේ ජනතාව රවට්ටලා තිබෙනවා.

මේකේ අමුතුවෙන් කරන්න දෙයක් නැහැ. පොලිස් ඉතිහාසයේ ප්‍රථම වතාවට, එදා CID එකේ හිටපු අධ්‍යක්ෂවරයාමයි පෙන්ෂන් ගියාට පස්සේ නැවත අධ්‍යක්ෂවරයා ලෙස පත්කර තිබෙන්නේ. ශානි අබේසේකර මහත්මයාව තමයි අධ්‍යක්ෂ කරලා තිබෙන්නේ. එදා CIDඑකේ හිටපු DIG තමයි අද පොලිසිය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා. මම මෙහි ප්‍රගතියක් දකින්නේ නැහැ. මට මතකයි, නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා -එදා මන්ත්‍රීතුමා- එදා ඇහුවා, "මේකට සම්බන්ධ සාරාව ඉන්දියාවෙන් ගෙනෙන්නේ නැත්තේ ඇයි?" කියලා. තමුන්නාන්සේලා ඉන්දියාව එක්ක ගිවිසුම් 7ක් අත්සන් කර තිබෙනවා. ඒ ගිවිසුම් හත තවම හෙළි කරලා නැහැ. අපි අහන්නේ, සාරාව ගෙන්වන්න තමුන්නාන්සේලා කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියලා. මොකක් හෝ මේක ඇතුළේ තිබෙනවා. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර සිද්ධියේදී දිවි නසාගත් ප්‍රධාන සැකකරුවන් දෙදෙනෙකුගේ පියා තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් මැතිවරණයකට තරග කළා. ඒ නිසාද මේ පාස්කු ඉරිදා සිද්ධිය තමුන්නාන්සේලා අනාවරණය කර ගන්නේ නැත්තේ?

දැන් මොකක්ද කරන්නේ? සැරෙන් සැරේට එක එක නාටක එනවා. බඩු මිල අඩු කරන්න බැරි වෙනකොට, ආර්ථිකය හදන්න බැරි වෙනකොට, උපාධිධාරීන්ට රක්ෂා දෙන්න බැරි වෙනකොට, විදුලි බිල අඩු කරන්න බැරි වෙනකොට, තෙල් මිල අඩු කරන්න බැරි වෙනකොට, එක එක නාටක එනවා. ඉස්සෙල්ලාම ගෙනාවා මත්ද්‍රව්‍ය අල්ලනවා කියලා එකක්. ඊට පස්සේ, අද වතු කම්කරු ජනතාවගේ පඩිය ගැන නාටකයක් ගෙන යනවා. මේ රටේ වතු කම්කරු ජනතාව පුරවැසිභාවය ලබද්දී අපේ පක්ෂය තමයි ඒකට ශක්තිය දුන්නේ.

වතු කම්කරු ජනතාවට පර්චස් 7ක ඉඩමක් දෙනකොට ඒ තීරණය ගත්තේ අපි. එහෙම නම් වතු කම්කරු ජනතාවට රුපියල් 200ක් නොවෙයි, ඒ වාගේ තුන් ගුණයක් දුන්නත් අපේ කැමැත්ත, අපේ ආශීර්වාදය ඒකට තිබෙනවා.

අනික් එක තමයි, ත්‍රිකුණාමලයේ සිද්ධිය. මම දැක්කා පත්තරේ තිබෙනවා, මහජන ආරක්ෂක ඇමතිතුමා කිව්වාය කියලා ඒ බුදු පිළිමය නැවත තිබුණු තැනම තැන්පත් කරන්න කියලා. මම ඇමතිතුමාගෙන් අහනවා, ඔබතුමා එවැනි නියෝගයක් දෙන්න හේතුව, ඒ බුදු පිළිමය අයින් කරන්න කියලා නියෝගය දුන්නේත් ඔබතුමා විසින්මද කියලා. අපි දැකලා නැහැ, මේ රටේ පොලිසිය බුදු පිළිම උස්සාගෙන යනවා. අපි මේ රටේ ජාතිවාදය අවුස්සන්න කැමැති නැහැ, ආගම්වාදය අවුස්සන්න කැමැති නැහැ. අපි උතුරට, නැඟෙනහිරට බලය දෙන්න යනකොට -බලය විමධ්‍යගත කරන්න යනකොට- 1987-88 කාලයේ පළාත් සභා ක්‍රමය ගේනකොට, "පළාත් සභා එපා, ජේආර් මරව්" කියලා තමුන්නාන්සේලා තමයි අපේ රටේ දහස් ගණනක් ජනතාව මරලා දැම්මේ, කාර්යාල දහස් ගණනක් ගිනි තැබුවේ. මේ රටේ ආර්ථිකය වැට්ටුවා. අද අපි තමුන්නාන්සේලාට කියනවා, මේ රටේ ආගම්වාදය ඇති කරන්න එපා කියලා.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

මට මතකයි, ප්‍රේමදාස ජනාධිපතිතුමා "ගම් උදාව" කරද්දී ආගමික සහජීවනය වෙනුවෙන්, ජාතික සමගිය වෙනුවෙන් හැම ගම් උදාවකම සර්ව ආගමික ස්ථානයක් පිහිටුවපු බව. බෞද්ධාගමිකයන්ට පන්සල තිබුණා, කතෝලිකයන්ටත් ඔවුන්ගේ ආගම අදහන්න පුළුවන් විධියේ ස්ථානයක් හැදුවා. ඉස්ලාම් ආගමටත් එහෙමයි, හින්දු ආගමටත් එහෙමයි. හරියට කතරගම වාගේ.

කතරගමට ගියාම කිරි වෙහෙරත් තිබෙනවා, දේවාලයත් තිබෙනවා, කතෝලික දේවස්ථානයත් තිබෙනවා, මුස්ලිම් දේවස්ථානයත් තිබෙනවා. තමුන්නාන්සේලා අද ජාතිවාදයට විරුද්ධ වුණාට, එදා අපි ජාතිවාදය නැති කරන්න ගියාම ඒක ඇති කරපු අය. මේ වාගේ ඉතිහාසයක් මේ රටේ නැවත වරක් ඇති කරන්න යනවාද කියලා අපට බයක් තිබෙනවා. මම මහජන ආරක්ෂක ඇමතිතුමාට කියනවා, නීතියේ ආධිපත්‍යය තිබෙන්නේ පොලීසියේ නොවෙයි, තමුන්නාන්සේලා නියෝග දෙන තැන නොවෙයි කියලා. ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමන්ලාට අධිකරණයට යන්න තිබුණා. ඒ ස්වාමීන් වහන්සේලාට කියන්න පුළුවන්කම තිබුණා, මෙන්න මේක ලියාපදිංචි කරපු දවස, මෙන්න ගොඩනැඟිලි හදපු දවස කියලා. තමුන්නාන්සේලා ඒකට අවස්ථාව දෙන්නේ නැතිව පිළිම වහන්සේ උස්සාගෙන ගිහිල්ලා ආපහු පැය කීපයකින් ගෙනැල්ලා එතැනම තැන්පත් කළා.

මේකම තමයි දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේත් සිදු වුණේ. එහි තිබුණු බුදු පිළිම වහන්සේ අයින් කළා. මට මතක් වනවා, මගේ මිත්‍රයා, බිමල් රත්නායක මැතිතුමා කිව්වා, -ඒ වීඩියෝ එකත් මා ළඟ තිබෙනවා- "පිළිම වන්දනාව ගෝත්‍රිකයි" කියලා. ඔබතුමා එහෙම කියලා තිබෙනවා. මා ළඟ ඒ වීඩියෝව තිබෙනවා. නලින් හේවගේ මැතිතුමා කිව්වා, "බෝ ගස්වලින් ප්‍රයෝජනයක් නැහැ" කියලා. සුනිල් හඳුන්නෙත්ති මහත්තයා කිව්වා, "ආගම රජයේ කටයුත්තක් නොවෙයි, ඒකෙන් අයින් වෙන්න ඕනෑ" කියලා. මේවාද දන්නේ නැහැ, මේ බුදු පිළිම උස්සාගෙන යන්න හේතුව. අපි ආගම්වාදී, ජාතිවාදී නැහැ. හැම ආගමක්ම ඇදහීමේ අයිතිය අපි ජනතාවට දීලා තිබෙනවා.

මට මතකයි, 2024 මාර්තු මාසයේ 9වැනි දා, -මෙතැන ද්‍රවිඩ මන්ත්‍රීවරුන් ඉන්නවා- වවුනියාවේ හින්දු කෝවිලක මහා ශිවරාත්‍රී පූජාව තිබියදී පොලීසිය ගිහිල්ලා තරුණයින් 7දෙනෙකුව අත්අඩංගුවට අරගෙන තිබුණා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපේ සහෝදර ද්‍රවිඩ මන්ත්‍රීවරුන් මේ සභාවේදී එදා ඒකට විරෝධය දැක්වුවා. මට මතකයි, සජිත් ප්‍රේමදාස මහතා එදා විපක්ෂ නායකයා විධියට කථානායකගෙන් ඉල්ලීමක් කළා, "මේ රටේ හැම ආගමිකයෙකුටම තමන්ගේ ආගම ඇදහීමේ නිදහස තිබෙන්න ඕනෑ, ඔබතුමා මේ තරුණයන් ගැන පොලීසියත් එක්ක කථා කරලා සහනක් ලබා දෙන්න, අපේ පක්ෂය හැම ආගමකටම ඒ අයිතිය දීලා තිබෙනවා, තමුන්නාන්සේලා තමයි ආගම බදාගෙන විනාශ කරන්න යන්නේ" කියලා. මට මතකයි, ද්‍රවිඩ මන්ත්‍රීවරයෙක් වන ෂාණක්කියන් මන්ත්‍රීතුමා එදා සජිත් ප්‍රේමදාස මැතිතුමාට ස්තුතිය ප්‍රකාශ කළ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි සිද්ධියක් ඇති, ලොකු දෙයක් වෙන්න. 83 ජූලි කලබලය ආවේ 7දෙනෙකු මැරුණාට පස්සේ. ඊට පසුව බොහොම පොඩි දෙයකින් අලුත්ගම සිද්ධිය ඇති වුණා. නුවර-දිගන සිද්ධිය ඇති වුණේ බොරු ප්‍රචාරයකින්. කරුණාකරලා මේ ආගම්වල සංහිඳියාව නැති කරන්න කටයුතු කරන්න එපා කියලා අපි ආණ්ඩුවට කියනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ පොලිස් නිලධාරින්ට වැඩියෙන්ම සලකා තිබෙන්නේ අපි. යහ පාලන ආණ්ඩුවේදී අපි හැම පොලිස් නිලධාරියෙකුගේම පඩිය සියයට 107කින් වැඩි කරලා, සියයට 40ක දීමනාවකුත් දුන්නා. රුපියල් 23,000ක් ගත් පොලීසියේ රාළහාමි රුපියල් 58,000ක් ගත්තා. දවසේ පැය 16ක්, 18ක් සේවය කරන අච්චේ ඉන්න, රට පින්නේ ඉන්න ඒ අයට තමුන්නාන්සේලා මේ අය වැයෙන් කිසිම සහනයක් දීලා නැහැ. තමුන්නාන්සේලා එකක් කරලා තිබෙනවා. බැටන් පොලු 3,000ක් ගන්න නම් සල්ලි වෙන් කරලා තිබෙනවා, මට ආරංචි විධියට. උද්ඝෝෂණ නවත්වන්නද දන්නේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හැප්පිලා බලමු.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපට ගහන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපට ගහන්නද දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. මම දැක්කා, මාර්ග අනතුරු වැඩියි, බීමත්කම නිසා අවුරුද්දකට 2,500ක් විතර මැරෙනවා, ඒ නිසා ඒවා වළක්වාගන්න මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි, වැඩියෙන්ම අනතුරු සිද්ධ වන්නේ බීමත් රියැදුරන් නිසා.

තමුන්නාන්සේලා කොච්චර කාර්යක්ෂමද කිව්වොත්, බීලා අහුවෙන කෙනෙකුට රාළහාමි කෙනෙක් ලවා පුම්බන්න දෙන බැලුන් පසුගිය මාස තුනක් තිස්සේ ලංකාවේ නැහැ. ඔන්න, තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව! පොලීසියේ රාළහාමිලා අද බීමත් රියදුරන් අල්ලන්නේ නැහැ. මොකද, බැලුන් නැහැ නේ පුම්බන්න. එතකොට ඔප්පු කරන්න බැහැ නේ. ඔන්න තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව. මට ආරංචියි, පොලීසියේ රාළහාමිලාට සපත්තු දෙක පොලිෂ් කරගන්න පොලිෂ් ටිකවත්, අනෙක් දේවල් ටිකවත් නැහැ කියලා. පොලීසියේ රාළහාමිලාට මීට වැඩිය සලකන්න. ඔවුන්ට උසස්වීම් ලබා දීමේදී ක්‍රමවේදයක් ඇතුව ඒවා සලසන්න. කොහේද, අද විනය? අපි දැක්කා, පොලීසියේ පහළ ඉන්න නිලධාරින්ට විනය ක්‍රියාත්මක වන්න ඉස්සෙල්ලා පොලීසියේ පළමුවැනියායි, දෙවැනියායි ගහගන්නවා. ඒක අද ප්‍රසිද්ධ කථාවක් වෙලා. DIG (Administration)යි, පොලිස්පතියි දෙදෙනා අතර ප්‍රශ්නයක් වුණා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - පරිපාලන එම තනතුරෙන් අයින් කරනවා. මෙහෙම දේවල් වෙන්න බැහැ, විනයක් තිබෙන පොලීසියක.

ඒ විතරක් නොවෙයි. අපි CID එකෙනුත් ඉල්ලීමක් කරනවා. CID එකේ මහත්වරුන් අද මේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඇති. CID එක පරීක්ෂණ කරනවා, සමහරුන් ඇතුළට දානවා. ඒ අය හොරු අල්ලන්නත් ඕනෑ, වැරදිකාරයෝ අල්ලන්නත් ඕනෑ. අපි අහන්නේ, කන්ටේනර් 323 ගැන CID එකෙන් කරන පරීක්ෂණවලට මොකක්ද වෙලා තිබෙන්නේ කියලායි. අපේ රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා ඊයේ පෙරේදාත් කිව්වා, ඒවා ඇතුළේ ආයුධ ඇවිල්ලා තිබෙනවා කියලා. එහෙම කියන්නේ අපි නොවෙයි, යාපනයේ මන්ත්‍රීවරයෙක්. ඒ සම්බන්ධව පරීක්ෂණ කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා. අද කථා කරපු නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, මේ ආණ්ඩුව යටතේ අද ක්‍රිකට් කණ්ඩායමට විජයකාන්ත් කෙනෙක් එකතුවෙලා ඉන්නවා කියලා. මම කියන්න කැමැතියි, මුත්තයියා මුරලිදරන්ව මේ

ලෝකයේ හොඳම පන්දු යවන්නා කළේ, ලෝක පූජිත ක්‍රීඩකයෙකු කළේ තමුන්නාන්සේලා නොවෙයි, අපේ රජයන් කියන එක. තමුන්නාන්සේලාට අපි කියනවා, මේ ආගම්වාදයට, ජාතිවාදයට අපි විරුද්ධයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා මගේ නම කියපු නිසායි මම අවස්ථාව ගන්නේ. අපි දන්නවා, මුත්තයියා මුරලිදරන් නම් St. Anthony's College එක වෙනුවෙන් play කළා කියලා. ඊට පස්සේ ඔහු 1st XI matches ගැහුවා, National Team එකට සෙල්ලම් කළා. දහම් පාසල් ක්‍රිකට් team එකකටවත් සෙල්ලම් කරපු කෙනෙක්ද දන්නේ නැහැ, මේ? *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩිවෙලා ඉන්න. මම අහන්න කැමැතියි, එච්චර පටු මට්ටමට දේවල් විග්‍රහ කරන එක සුදුසු නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කනගාටු වෙනවා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ වෙච්ච සිද්ධියක් ගැන. රටේ ඇති වන මෙවැනි සිද්ධි නිවන්න ඕනෑ. මේ මන්ත්‍රීතුමා බොහොම වැඩිහිටි දේශපාලනඥයෙක්. රටේ ඇති වන සිද්ධි නිවන්න කටයුතු කරනවා වෙනුවට ඒවා අවුළුවන අරමුණ, ඒ intention එක තමයි එතුමාගේ මුළු කථාවේම තිබුණේ. 83 කළු ජූලිය ඇති කරලා ගිනි තියපු අයට තව ගින්නක් එන එක වාසි බව ඇත්ත. නමුත් අපි කනගාටු වෙනවා, මේ මට්ටමේ පහත් දේශපාලනය ගැන.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල වටගල නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස මම යමක් කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම මෙතුමාගේ කථාව ඇතුළේ - *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මට මයික් එක දීලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මෙතුමාගේ කථාව ඇතුළේ දෙහිවල සිද්ධියක් ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේත් ඔක පැහැදිලි කළා. මේ දෙහිවල සිද්ධියට අදාළ බුදු පිළිමය වෙන තැනකට රැගෙන යාම අපේ වැඩක් නොවෙයි. ඒක අපි බලයට එන්න කලින් වෙච්ච වැඩක්. ඇත්තටම සමගි ජන බලවේගයෙන් තමයි ඒ වැඩේ කළේ. නමුත් යළිත් ඒක ගෙනැත් දෙන්න අපි ඉඩ තියලා තිබෙනවා. ත්‍රිකුණාමලයේ සිද්ධියයි, මේ සිද්ධියයි පාදක කරගෙන ආගම්වාදය අවුළුවන්න හදන ඉතාම පටු, මේ වාගේ පහත් පෙළේ ක්‍රියාවක් මේ වාගේ පරිණත දේශපාලනඥයකුගෙන් අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මේ සිද්ධිය අවුළුවන්නයි හදන්නේ. කොහේ සිද්ධියක්ද, දෙහිවල සිද්ධිය?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මහත්මිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය සහ මහජන ආරක්ෂාව පිළිබඳව කථා කරන මේ විවාදයේදී මම මුලින්ම මේ ගැන කියන්න කැමැතියි. සාමාන්‍යයෙන් පොලීසිය හෝ මහජන ආරක්ෂාව කිව්වාම, මේ දෙපාර්තමේන්තුවට තිබෙන වැඩ රාජකාරි ගැන පොදුවේ මහජනතාව විධියට අපි හිතන දේවල් හැරුණාම මෙතැනට මේක ලඝු කරලා වෙනත් කාරණා සම්බන්ධයෙන් කියනවා. නමුත් අපි දන්නවා, අපේ එදිනෙදා ජන ජීවිතයට මේකෙන් කොයි තරම් සේවාවක් සැලසෙනවාද කියලා. නිකම් බලලා අපි කියනවා, නීතිය හා සාමය රකින එක තමයි මේ අමාත්‍යාංශයේ රාජකාරිය කියලා. හැබැයි නීතිය හා සාමය රැකීමට අමතරව සමාජ විනය ඇති කිරීම, අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම, රථවාහන පාලනය කිරීම, මහජන ආරක්ෂාව සැලසීම, රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම ආදියත් මේ මඟින් සිදු වනවා.

මේ කථා වෙන බොහෝ දේවල්වලට යම් සම්බන්ධතාවක් මේ ආයතනවල තිබෙනවා. රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම, ආගමන හා විගමන කටයුතු, අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම ආදී විශාල පරාසයක විහිදෙන රාජකාරි සමූහයක් තිබෙන ආයතනයක් තමයි, මේ ආයතනය. හැබැයි, මේක ලඝු කරලා පෙන්වන්න යනවා, වෙන මොනවා හරි එකකට. එහෙම නැත්නම් මේක ජාතිවාදී අන්තයකට අරගෙන යන්න උත්සාහ කරනවා. මෙය ඉතාම වැදගත් ආයතනයක්. මහජනයාට එදිනෙදා තමන්ගේ ජීවිත ගත කරනකොට නිතරම යන්න ඕනෑ වෙන, ගැටෙන්න ඕනෑ වෙන ආයතනයක රාජකාරිය තමයි මෙහෙම වෙනත් අන්තයකට අරගෙන යන්න හදන්නේ. අපේ ගමේ ජනතාවට එදිනෙදා ජීවිතයේදී කොයි දෙයටද මේ ආයතනය අවශ්‍ය වෙන්නේ නැත්තේ? ලොකුම වරද මනුෂ්‍ය ඝාතනයක් කියලා අපි හිතලා බැලුවොත්, මිනී මැරීමේ වරදේ ඉඳලා ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර ඇති වන ආරවුල දක්වාමත් යන්න තිබෙන්නේ ගමේ පොලීසියට. කෙහෙල් කැන කැපුවොත් ගමේ මිනිස්සු දුවලා යන්නේ පොලීසියට. එහෙම නැත්නම් වත්තේ තිබෙන වැටක ආරවුලක් වුණත් දුවලා යන්නේ පොලීසියට. එහෙම බැලුවොත්, අපි හුස්ම ගන්න, ජීවත් වෙන හැම මොහොතකදීම අපට අවශ්‍ය වෙන ආයතනයක් තමයි, මේ ආයතනය. ඒ වුණාට අය වැයෙන් මුදල් වෙන් කරනකොට අපි මේ ආයතනයේ වටිනාකම ගැනවත්, මේ ආයතනයෙන් මේ තරම් සේවාවක් සැලසෙනවාද කියලාවත් හිතා බලා තිබෙනවාද කියලා සොයා බලන්න. ඔබතුමන්ලා කවුරුවත් කල්පනා කරලා තිබෙනවාද, මෙය මහජනතාවට මොන තරම් සේවයක් සලස්වන්න පුළුවන් ආයතනයක්ද කියලා? පසුගිය කාලය ගැන අපි කියනවා. දැන් මෙතැන ලොකුවට කථා කරනවා,

[ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය ]

මත්ද්‍රව්‍ය වැරදි ගැන. මත්ද්‍රව්‍ය භාවිතය වළක්වන්න විතරක් නොවෙයි, ඒ සඳහා පවතින ඉල්ලුම අඩු කරන්නත් අපි කටයුතු කරනවා. එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය භාවිත කරන අය සම්බන්ධයෙන් කොයි තරම් පියවර ගත්තත් එය නිවාරණය කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුනරුත්ථාපනය සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව, ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඇති කිරීමට සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් අපි සූදානම් කරනවා. අධි අවදානම් කලාප හඳුනා ගෙන ඒ සඳහා පිළියම් යොදනවා. අපි දන්නවා, අපට තිබෙන රසායනාගාර ඉතාම නොදියුණු මට්ටමේ ඒවා කියලා. මේ තරම් කාලයක් මේවා සම්බන්ධයෙන් කිසියම්ම හෝ පියවර ගැනීමක් සිද්ධ වෙලා නැහැ. දැන් එකවරම කොහොමද මේවා කරන්නේ කියලා ඇහුවාම කරන්න බැහැ. මත්ද්‍රව්‍ය යම් යම් ප්‍රමාණයන්ගෙන් තිබෙනවා. ඒ වාගේම අධිකරණවලට ගියාම ඒ කටයුතු කරගන්න අවශ්‍ය වෙන විද්‍යාත්මක පහසුකම් අපට නැහැ. ඒවා වැඩිදියුණු කරන්න අපි මුදල් වෙන් කරනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 52ක් වෙන් කරලා තිබෙනවා, මේ අය වැයෙන්. තරුණයින් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 8,264ක් පවත්වන්නත්, එයින් 3,264ක් පාසල් පාදක වැඩසටහන් වශයෙන් කරගෙන යන්නත් අපි කටයුතු කරනවා. එක්දහස් නවසිය අසූගණන්වල තමයි අපි මුල්වරට දැනගත්තේ මත්ද්‍රව්‍ය කියන දෙය නීති විරෝධීයි කියලා.

ඒ කාලයේ ඉඳලා අපි පොදුවේ දකින දෙයක් තමයි, විශේෂයෙන් නාගරික පළාත්වල රෑ 12.00, 1.00 වාගේ වෙනකොට පොලිස් කූඩු මත්ද්‍රව්‍ය භාවිත කරන අයගෙන් පිරී යාම. මත්ද්‍රව්‍ය භාවිත කරන තරුණ පිරිස ගෙනැල්ලා කූඩු කිරීම එක්දහස් නවසිය අසූගණන්වල ඉඳලා කරගෙන ආවා. හැබැයි, මත්ද්‍රව්‍ය ගෙන්වන අය, මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන්, මත්ද්‍රව්‍ය නිෂ්පාදකයින් අත්අඩංගුවට ගැනීම දැන් තමයි සිද්ධ වෙන්නේ. මෙච්චර කාලයක් ඒ දේවල් සිද්ධ වුණේ නැහැ. අපි දීර්ඝ කාලයක ඉඳලා දැකලා තිබුණා, තරුණයින් ගෙනැල්ලා කූඩුවලට දමනවා, නඩු දමනවා, පුනරුත්ථාපනය කරන්න උත්සාහ කරනවා. ප්‍රශ්නයට විසඳුම එතැනම තියාගෙන ප්‍රශ්නය විසඳීම මෙච්චර කාලයකට කරන්න බැරි වුණු හේතුව මොකක්ද කියලා හදවතට තට්ටු කරලා අහලා බලන්න. එතකොට හේතුව හෙළිදරව් වෙයි. දීර්ඝ කාලයක ඉඳලා තරුණයින් අත්අඩංගුවට අරගෙන මත්ද්‍රව්‍ය ග්‍රෑම් ගණනින් ගේනවා. ඒවා කිරන්න අවශ්‍ය පහසුකම් පොලිස් ස්ථානවල නැහැ. අපි දන්නවා, රත්‍රන් බඩු සාප්පුවලට ගිහිල්ලා තමයි ප්‍රමාණය කිරන්නේ කියන එක. දැන් කොහොමද? අද මහජන ආරක්ෂක ඇමතිතුමාත් මේ ගැන කිව්වා. මේ ආණ්ඩුව ආවාට පසුව අත්අඩංගුවට ගන්න ලැබී තිබෙනවා, මත්ද්‍රව්‍ය ටොන් ගණනින්. අන්න ඒ විධියටයි අපි වැඩකටයුතු කරගෙන යන්නේ.

මේ කියන කාරණාවලට අමතරව පොලිස් දෙපාර්තමේන්තුව විසින් තව වැඩ කටයුතු රාශියක් කරනවා. අපි පටන් ගත්ත තව කාරණාවක් තමයි, නීති විරෝධී වත්කම් විමර්ශනය. අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. රුපියල් කෝටි 70කට අධික දේපළ ප්‍රමාණයක් ක්‍රියා විරහිත කරන්න දැනටමත් කටයුතු කරලා තිබෙනවා. නීතියේ දැලෙන් බේරිලා යන්න කාටවත් ඉඩ සැලසෙන්නේ නැහැ. අපට කා සමඟවත් කිසිම සම්බන්ධතාවක් නැහැ. අපි කිසිම කෙනෙකුට විශේෂයෙන් සලකලාත් නැහැ.

දැන් කිව්වා, අපේ ආණ්ඩුවට සම්බන්ධ අයට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධකම් තිබෙනවා කියලා. ඒ අයව අල්ලලා කියලාත් කිව්වා. ඔව්, අල්ලලා තමයි. අපි කවුරුවත් ගියේ නැහැ, ඒවා වළක්වන්න. නීතිය ක්‍රියාත්මක කිරීම නතර කරන්න අපේ කිසිම කෙනෙක් උත්සාහ දැරුවේ නැහැ. නීතිය ක්‍රියාත්මක වෙනවා, කාටත් එක විධියට. කොයි පක්ෂයේද, කොහේද, ඒ පුද්ගලයා ඉන්නේ කොතැනද, කාත් එක්කද කියන ඒ කිසිම දෙයක් අදාළ වෙන්නේ නැහැ. ඒක ගමේ හැම කෙනෙක්මත් දන්න දෙයක්. වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ පුද්ගලයා නීතියට යටත්. නීතියට ඉහළින් ඉන්න කිසිම කෙනෙක් අපේ ආණ්ඩුවේ නැහැ. අපි ඒවා වෙනස් කරන්නම ආපු කට්ටිය තමයි. අපි ඒ උත්සාහය දරනවා. අපි ඒ සම්බන්ධයෙන් දිවා රෑ නොතකා එක විධියට ධෛර්යයෙන් වැඩකටයුතු කරගෙන යනවා.

පසුගිය කාලයේ අපේ රටේ සිදු වෙච්ච ඉතා විශාල අපරාධ සංඛ්‍යාවක් සම්බන්ධයෙන් දැනටමත් විමර්ශන සිද්ධ වෙමින් පවතිනවා. රගර් ක්‍රීඩාව ගැන කථා කරනකොට විනය අමතක කරන්න බැහැ. රගර් ක්‍රීඩකයෙක් වූ තාජුඩීන් ඝාතනය සම්බන්ධ විමර්ශන කටයුතු තවමත් සිද්ධ වෙමින් පවතිනවා. ඒවා දීර්ඝ කාලීනව යට ගහපුවා. ඒ වාගේම මාධ්‍යවේදී උපාලි තෙන්නකෝන් මහතාට පහර දීම සම්බන්ධයෙන් ගම්පහ මහාධිකරණයේ නඩු පවරා තිබෙනවා. මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගෙන යාම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු වෙනවා. එක්නැලිගොඩ ඝාතනය සම්බන්ධ නඩුව ත්‍රිපුද්ගල මහාධිකරණයේ විභාග වෙනවා. මේ ආකාරයට මේ කටයුතු සිද්ධ වෙනවා. ඒ සියලුම කටයුතු සිදු වෙමින් යන අවස්ථාවේදී පොලීසිය හෝ මේ දෙපාර්තමේන්තු කටයුතු කරන්නේ නැහැ කියලා කියන්න බැහැ.

ලසන්ත වික්‍රමතුංග ඝාතනය සහ රියැදුරා පැහැරගෙන යාමේ සිද්ධිය ගැන බැලුවොත්, පොත්වල කොළ කඩපු තැන ඉඳලා තමයි අපට විමර්ශන ආරම්භ කරන්න සිදු වෙලා තිබෙන්නේ. කෝ, මේවායේ ප්‍රගතිය කියලා අහන මහත්වරුන්ට අපට කියන්න තිබෙන්නේ ඒ කථාවයි. ප්‍රගතිය ගන්න නම් අපි මුල ඉඳලා වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ. මේවා හංගලා, වහලා, සාක්ෂි විනාශ කරන්න උත්සාහ දරලා තිබෙන්නේ. අපි ඒ සියල්ල හොයාගෙන යන්න ඕනෑ. ඇතැම් අවස්ථාවල අපට වෝහාරික පරීක්ෂණවලින් තමයි හොයා ගන්න සිද්ධ වෙන්නේ මේ අපරාධයේ මුල කොතැනද කියලා. හැබැයි, අපි ඒවා ගැන හොයනවා. ඒ කටයුතු කරනවා. අපි දිගටම මහජනතාව වෙනුවෙන් මේ සියලුම කාර්යයන් කරගෙන යනවා.

විශේෂයෙන්ම මහනුවර වැනි ජාතික සහ වාර්ගික විවිධත්වය ඇති දිස්ත්‍රික්කයක අපි එකාවන්ව ජීවත් වෙනවා. කොයි අවස්ථාවකදීවත් අපි අතරට සැකය ගේන්න බැහැ. අපිව ඒ වෙන් කරපු දේශපාලනය අවසාන කළා. මෙතෙක් කාලයක් වතු කම්කරු ජනතාව ඒ අයගේ දේශපාලනය විසින් එක්තරා පිලකට තල්ලු කරලා තිබුණු බව අපි දන්නවා. ඒ අය නියෝජනය කිරීම සඳහා කියලා වැජඹුණු පැළැන්තියක් හිටියා, ඒ අයගේ ඡන්දවලින් ඇවිල්ලා. වතුවල ජනතාව ඒ දේශපාලනය නිමා කළා. දැන් ඒ හැම කෙනෙක්ම පොදු දේශපාලන ප්‍රවාහයට එකතු වෙලා ඉන්නවා. හැම ජනතාවක්ම, හැම ජන කොටසක්ම නියෝජනය කරන ආණ්ඩුවක් අපි. අපි සියලු දෙනාම එකාවන්ව නැඟී සිටිනවා. මේක වෙනස් කරන්න, මේකට අකුල් හෙළන්න, මේකට විෂබීජ පොවන්න කවුරු හරි මොකක් හරි උත්සාහයක් දරනවා නම්, ඒකට අපි ඉඩ තියන්නේ නැහැ කියන එක අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලු දෙනා එකාවන්ව එකතු වෙලා කරන මේ වැඩ කටයුතුවලට වචනවලින් මෙහෙම

කියනවා නම්, ක්‍රියාවෙන් රට පුරා මොන තරම් උගුල් අටවනවා ඇද්ද; ජාතිවාදය, ආගම්වාදය ජනතාව අතරට කාවද්දන්න කොච්චර උත්සාහ කරනවා ඇද්ද? ඒකට කියන්න තිබෙන්නේ, අපි ඒකට නැහැ කියන එකයි. ජනතාවත් දැන් ඒවාට හසු වෙන්නේ නැහැ. ජනතාව දැන් ඒ කටයුතු අවසාන කරලා තිබෙනවා.

හුණු වටයේ කථාවේ අසඩක්ට, සයිමන් සෂාවා යෝජනා කරනවා, "බිලිබාන්න යමුද කියලා පණුවා කියනවා" කියලා. අන්න ඒ වාගේ තමයි, මේ චෝදනාවලට සම්බන්ධ අය කොයි අවස්ථාවකවත් ඒවාට විරුද්ධව කටයුතු කරන්න සූදානම් නැහැ. අපි එහෙම නොවෙයි කියමින් මම කථාව අවසාන කරනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.52]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරන්නේ මේ රටේ වැදගත්ම විෂයය සම්බන්ධයෙන්. ඒ තමයි, ජාතික ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව කියන විෂයය. ජාතික ආරක්ෂාව ගැන කථා කරලා වැඩක් නැහැ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමා මැතිවරණ කාලයේ ඇහුවා, "What is national security?" කියලා, පෝය දෙකයි, ඩෙස්ක් බංකු අරන් එන්න කිව්වා. අපි ඩෙස්ක් බංකු හදාගෙන බලා ගෙන ඉන්නවා, එතුමා lectures දෙන්න තවම ආවේ නැහැ. මාස 13යි. එතුමාගේ lectures බලාගෙන අපි ඉන්නවා, මාස 13යි, තවම එතුමාගේ lectures නැහැ. අපි ලී ඉරලා බංකු හැදුවේ. ඒ ගැන වැඩිය කථා කරලා වැඩක් නැහැ, මේ රටේ ජාතික ආරක්ෂාව ගැන එච්චරයි කියන්න තිබෙන්නේ. ඒක කවුරුත් දන්නවා.

ඊළඟට, අපේ විජේපාල මහත්මයාගේ මහජන ආරක්ෂාව ගැන කථා කරන්න ඕනෑ. මේ දවස්වල බලාගෙන ඉන්නවා, 21වැනි දා රැස්වීම ගැන. විජේපාල මහත්මයාගේ පොලීසිය, විජේපාල මහත්මයාගේ ත්‍රිකුණාමලයේ SSP ඇතුළු කණ්ඩායමක් ගිහිල්ලා, බුදු පිළිමය උස්සාගෙන ගිහිල්ලා, ඒක විපක්ෂයේ අහිංසක අපේ ඇඟට දමන්න හදනවා. විජේපාල මහත්මයා තමයි, 21වැනි දා රැස්වීමට අපිට support එක දීලා තිබෙන්නේ, බුදු පිළිමය උස්සලා. ඒකට අපිට කරන්න දෙයක් නැහැ. අපේ රැස්වීමට සෙනඟ එකතු වෙනවා. අපිට කාගෙන්වත් අපේ රැස්වීමට සෙනඟ ඕනෑ නැහැ. මම මාසයක් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ නැහැ, ලියලා තියා ගන්න, විසිදහසකට වැඩිය සෙනඟ එනවා. 21වැනි දාට ඇවිල්ලා බලාගන්න, ගණන් කර ගන්න, අපි ගෙනැල්ලා පෙන්වන්නම්. ඒක එදාට බලා ගනිමු.

ඊළඟ කාරණය මෙකයි. ආනන්ද විජේපාල මහත්මයා, ත්‍රිකුණාමලය ගැන මතක් කරනකොට මම එකක් කියන්නම්. ත්‍රිකුණාමලයේ පර්චස් 40ක ඉඩමක් තමයි, අපේ ආගමට, නැත්නම් අපේ පන්සලට තිබුණේ. ඒ, සුනාමියට ගිහිල්ලා ඉතුරු වෙච්ච පර්චස් 40. අනෙක් අය ඉඩම අල්ලා ගෙන, කමක් නැහැ. ඒ පර්චස් 40ත් ගන්නවා නම් ගන්න කියන්න. ඒකත් ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, ඒක හාමුදුරුවෝ දෙන්නේ නැහැ, ඒක ඔප්පුවක් තිබෙන ඉඩමක්. විජේපාල මහත්මයා, මම මේ වෙලාවේදී කියන්න ඕනෑ, ඔබතුමාගේ පොලීසියේ ලොක්කෙක් ගැන. කිලිනොච්චියේ HQI, මම ඔහුගේ නම කියලාම කියන්නම්. කිලිනොච්චියේ HQI මොහොමඩ් නජීබ් තමයි, පසුගිය කාලයේ ත්‍රිකුණාමලය පොලීසියේ ලොක්කාගේ ඉඩම බලා ගත්තේ. කිලිනොච්චියේ HQI කරන්න සුදුසුකම මොකක්ද දන්නවාද? ඔහු කිසිම OIC station එකක ඉඳලා නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා අහගන්න. ඔහු කිසිම HQI station එකක ඉඳලා නැහැ. ත්‍රිකුණාමලයේ DCDB, OIC විධියට හිටියා. DCDB, OIC විධියට ඉඳලාත් කිසිම වැටලීමක් කරලාත් නැහැ. හැබැයි, මේ උසස්වීමට එයාගේ සුදුසුකම මොකක්ද? පසුගිය කාලයේ පොලීසියේ ලොක්කාගේ ඉඩම බලා ගත්ත එකට එයාට promotion එකක් දීලා තිබෙනවා. එයා තමයි කිලිනොච්චියේ HQI. මොහොමඩ් නජීබ්. ඔන්න මම නම කියලාම කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කෙළින්ම කියනවා, පැමිණිලි තිබෙනවා නම් කියන්න කියලා. පතිනායක පොලීසියේ හිටපු දෙවැනියා. පොලීසිය භාර ඇමතිතුමනි, පොඩ්ඩක් මේ පැත්ත බලන්න. ඉස්සර හිටියා, Senior DIG (Administration). ඔබතුමා අහලා ඇති. දැන් එයා විශ්‍රාම ගිහින්. අපි පොලීසියේ ඉන්න කාලයේ කිව්වේ, වෙනත් නමක්. අද පොලීසියේ හදවත තමයි දෙවැනියා. පොලීසියේ හදවත විධියට තමයි, පතිනායක හිටියේ. පතිනායක කරපු වැරැද්දක් නැතුව, පතිනායක පොලීසියේ තිබෙන දූෂණය පෙන්වා දුන්නා කියලා, එතුමාව demote කරලා, මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස පත් කළා. එතකොට මේ ආණ්ඩුවට හොරු අල්ලා දුන්නත් වැරදියි, හොරු ඇල්ලුවේ නැතත් වැරදියි. ඒ මනුස්සයා කිව්වේ මොනවාද? ඒ දවස්වල "පප්පා බැනියම්" කියපු ඒවායෙන් කීයක්ද ගැහුවා කියලා. පොලීසියේ අය ඒවාට කියන්නේ "පප්පා බැනියම්" කියලා. එළියට යනකොට පොලීසියේ ඕනෑම එක්කෙනෙකුගෙන් අහන්න. පප්පා බැනියම්වලින් කීයක් දෝ ගැහුවා කියලා තමයි, පතිනායක කිව්වේ. හැබැයි, Senior DIG පතිනායක, ඒ කථාව කිව්වාට demote කරලා මාරු කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කිව්වේ එහෙම නොවෙයි නේ. කිව්වේ, තිබෙන හොරකම් අල්ලා දෙන්න කියලා. ඒක එක කාරණයක්. පොලීසිය භාර ඇමතිතුමා අපේ දිහා බලන්නේ නැහැ නේ, නියෝජ්‍ය ඇමතිතුමා නම් බලාගෙන ඉන්නවා. පොලිස් කොමිසමේ තිබෙනවා, SI above ෆයිල් 4,000කට වැඩිය. SI ඉඳලා Senior DIG දක්වා ෆයිල් තිබෙනවා, විනය පරීක්ෂණ වාගේ ඒවාට. පොලිස් කොමිසම පාලනය කරන්නේ කවුද කියලා ඔබතුමා දන්නේ නැතුව ඇති. ඔබතුමන්ලා දෙපළම දන්නේ නැතුව ඇති. අද පොලිස් කොමිසම යට වෙලා තිබෙන්නේ කාටද දන්නවාද? පොලිස් කොමිසම යට වෙලා තිබෙන්නේ නෙරන්ජලාට.

නෙරන්ජලා කියලා සහකාර අධ්‍යක්ෂ කෙනෙක් ඉන්නවා. ඒ නෙරන්ජලා මැතිනිය කියන විධියට තමයි ෆයිල් එක උඩට එන්නේ. අද සමහරු විශ්‍රාම ගිහිල්ලා හිටියත් ඔවුන්ට pension එක ගන්න බැහැ. අද pension එක ගන්න බැරිව ගොඩක් පොලිස් නිලධාරීන් ඉන්නවා. මොකද, විනය පරීක්ෂණයක් තිබ්බොත් pension papers බාර දෙන්න බැහැ. Inquiries අවසන් වෙනකම් pension එක දෙන්නේ නැහැ. එම නිසා inquiries අවසන් වෙනකම් අද ෆයිල් 4,000කට වැඩිය නෙරන්ජලා තියාගෙන ඉන්නවා. කොමිෂන් සභාවේ සභාපතිතුමාට වැඩේ තේරෙන්නේ නැහැ. කොමිෂන් සභාවේ සභාපතිතුමා බලාගෙන ඉන්නවා; නෙරන්ජලාගේ order එක නැතිව කෙරෙන්නේ නැහැ. ඒ නිසා පොලිස් කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම බාරව ඉන්නේ නෙරන්ජලා මිස් කියන එක මේ වෙලාවේ කියන්න ඕනෑ. මේවා කිව්වා කියලා පෞද්ගලිකව අපිත් එක්ක තරහා වෙන්න එපා.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

මෙතැන තිබෙනවා තවත් කේස් එකක්. පොලීසිය බාර ඇමතිතුමනි, මේක මගේ වට්ස්ඇප් එකට ආපු එකක්. සාමාන්‍යයෙන් මේ රටේ මිනිස්සු අපට මේවා එවනවා. මේ තිබෙනවා, කෑගල්ල එන්ටර්ප්‍රයිසස් කියලා වාහන බිස්නස් කරන ස්ථානයක්. මේකට පොලීසිය බාර ඇමති කෙනෙක් ගිහිල්ලා තිබෙනවා. මේ බිස්නස් එකට අදාළ කෙනාගේ නම මම කියන්නම්. කමක් නැහැ. මොහුගේ නම ක්‍රිෂාන්; මොහුගේ නම මැතිව්. මොහු මොකක්ද කරන්නේ? මොහු දැන් කැසිනෝකාරයෙක්. මහරගම කැසිනෝකාරයෙක්. හොඳට අහගන්න. මොහු මිනිසුන්ට ගෙවල් හදලා දෙනවා කියලා ඒ මිනිස්සුන්ගෙන් සල්ලි අරගෙන, පොලු තියලා තිබෙන මනුස්සයෙක්. මොහුගේ උත්සවයක් තිබුණා. මේ උත්සවයේ ඇමතිතුමා ඉන්නවා. මම නම කියන්නේ නැහැ. මෙතැන නම කිව්වොත් ඒක ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නම කියන්න, නම කියන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක නිසා ඇමතිවරුන්ට මම මේකත් කියන්න ඕනෑ. පොලීසිය බාර ඇමතිතුමනි, අපි ඇමතිවරු විධියට හිටපු කාලයේත් මිනිස්සු ඔය වාගේ ලණු දුන්නා. ඕවායින් බේරෙන්න. මේ පුද්ගලයා කැසිනෝ ගහනවා. මෙයාට දැන් වෙබ් අඩවියක් තිබෙනවා. මම මේ විස්තර ඔබතුමාට එවන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමාට මම පස්සේ එවන්නම් කෝ. ඔබතුමා ඊට පස්සේ ඒක බලාගන්න කෝ. හරිද? ඇමතිතුමා මේ website එක විවෘත කරන්න ගිහිල්ලා තිබෙනවා. මේවාට යන්න එපා, මේවා game. මේ වාගේ දේවල්වලින් පොලීසිය බාර ඇමතිවරු දෙදෙනා ආරක්ෂා වෙන්න ඕනෑ. අපට මේ පෞද්ගලික,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. අපට පෞද්ගලිකව ඔබ දෙපළත් එකක් කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක විතරක් නොවෙයි, ඔය දෙදෙනාත් එක්ක,- *[බාධා කිරීමක්]* මොකද, ආණ්ඩුවක් කරනකොට, පොලීසිය බාර ඇමතිකම කරනකොට තරහාකාරයෝ වැඩියි. ඒ මිනිහා මේ රට පුරාම ගෙවල් හදලා දෙනවා කියලා මිනිස්සුන්ගෙන් සල්ලි අරන් කැසිනෝ ගහන මනුස්සයෙක්. ඒ මනුස්සයා මිනිස්සුන්ගෙන් සල්ලි අරන් තිබෙනවා. ඒකත් මම මේ වෙලාවේදී කියන්න ඕනෑ.

ඊළඟ එක තමයි, ඔයගොල්ලන් රනිල් වික්‍රමසිංහ මහත්මයාව arrest කළේ රුපියල් ලක්ෂ 160ක් රජයට පාඩු කළා කියන එකට. රුපියල් ලක්ෂ 160කට ඔයගොල්ලන් එතුමාව arrest කළා. රුපියල් ලක්ෂ 160ක් පාඩු කළා කියන එක සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා arrest කරලා, ඊයේ-පෙරේදා ඔයගොල්ලන්ගේ නිලධාරීන් 5දෙනෙක් එංගලන්තයට ගිහිල්ලා තිබෙනවා ඒ සම්බන්ධයෙන් කටඋත්තරයක් ගන්න. මේක මහ යකාගේ වැඩක් නේ. UKවලට ටිකට් එකක් කීයද? UKවලට ටිකට් එකක් සාමාන්‍යයෙන් මම හිතන විධියට රුපියල් ලක්ෂ තුනහමාරක්, හතරක් විතර වෙයි. දවස් 5කට ගිහිල්ලා තිබෙන්නේ. හෝටල් බිල ඇතුළු අනෙකුත් වියදම් එක්ක බැලුවාම ගිහින් එනකොට රුපියල් ලක්ෂ 50ක් විතර වෙයි. හැබැයි, මේ inquiry එක අවසන් වෙනකොට රුපියල් ලක්ෂ 320ක් විතර ඉවර වෙනවා. අපේ රටට රනිල්ගෙන් පාඩු වුණේ ලක්ෂ 160යි. නමුත්, මේ අහිංසක පොලිස් දෙපාර්තමේන්තුවෙන් රුපියල් ලක්ෂ 320ක් විතර පාඩු වෙනවා. මම ගණන් හදලා කියන්නම්, මේ නඩුව අවසන් වෙනකොට අනිවාර්යයෙන්ම ආණ්ඩුවට එච්චර පාඩුවක් සිද්ධ වෙයි. ඔන්න ඕක තමයි වෙන්නේ. අපේ රටේ තනිකර කෙළින්නේ පිස්සු. අපේ රටේ මිනිස්සු තනිකර කෙළින්නේ පිස්සු කියලා තමයි අපට කියන්න වෙන්නේ. වෙන මොනවා කියන්න ද? ඒකත් මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* රනිල්ගේ නඩුව ගැන මම කථා කළේ.

ඊළඟට, පොලීසිය බාර ඇමතිතුමාට මම මේ කාරණයත් කියන්න ඕනෑ. 1987, 1988, 1989, 1990, 1991 සහ 1992 කාලවකවානුවල පොලීසියට බැඳුණු සියලුදෙනාම අවුරුදු 55, 60 අතරේ විශ්‍රාම යනවා. මම පොලීසියේ හිටියා නම් දැන් මට අවුරුදු 55යි. එහෙම නම් මම ලබන මාසයේ application බාර දෙනවා. මම පොලීසියේ හිටියා නම්, මගේ වයස අවුරුදු 55 සම්පූර්ණ නම් මම application බාර දෙනවා. මොකද, පොලීසියේ නිලධාරියෙක් අවුරුදු 60 වෙනකම් ඉන්නේ නැහැ. අවුරුදු 60 වෙනකම් මිනිහෙක් පොලීසියේ රාජකාරි කරන්නේ නැහැ; කරන්න බැහැ. තිබෙන තත්ත්වයත් එක්ක කරන්න බැහැ. හරිද? 1988, 1989, 1990, 1991 සහ 1992 කාලවකවානුවලදී පොලීසියට බැඳුණු අය සියලුදෙනාම වාගේ; 20,000ක් විතර මේ අවුරුද්දත්, ලබන අවුරුද්දත් ඇතුළත විශ්‍රාම යනවා. ඔබතුමා ඇමතිවරයා හැටියට ගණන් හදලා මට කියන්න, මේ චාමර සම්පත් කියපු එක ඇත්තක් ද, බොරුවක් ද කියලා. මේ අවුරුදු දෙකට 20,000ක් විශ්‍රාම යනවා. දැන් පොලිස් සේවයේ ලක්ෂයක් විතර ඉන්නවා. දැන් ලක්ෂයෙන් උඩ numbers නේ යන්නේ. අපේ කාලයේ අපි ගහගෙන හිටියේ විසිතුන්දහස්, විසිපස්දහස්, විසිහයදහස් ගණන් numbers නේ. දැන් ලක්ෂයේ numbers යන්නේ. දැන් ලක්ෂයේ numbers යන්නේ. ඉදිරියේදී පොලීසියේ 20,000ක් විශ්‍රාම යනවා.

ඒ 20,000 pension ගියාම මොකද වෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඔය ලයිට් එකට ගහමින් නේ කථා කරන්නේ; ලයිට් එක පරිස්සමින්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
හරි, හරි.

කළුතර PTS එකේ දැනට train වෙන්නේ, 340යි. හරිද? Driversලා train වෙන්නේ 50යි. තඹුත්තේගම, පහළගම පොලිස් අභ්‍යාස විද්‍යාලයේ train වෙනවා, දෙසිය ගණනක්. Train වෙන මුළු ගණන හයසිය ගණනක්. හයසිය ගණනක් train වෙනකොට 20,000ක arrears එකක් පොලීසිය cover කර ගන්නේ කොහොමද? දැනට තිබෙනවා, Welimada Training Centre එක. වැලිමඩ තිබෙනවා, පොලිස් අභ්‍යාස විද්‍යාලය. පොලිස් අභ්‍යාස විද්‍යාල ඔක්කෝම වහලා. ඇල්පිටියත් එහෙමයි. මේ ප්‍රමාදය දිගටම ගියොත් මොකද වෙන්නේ?

පොලීසිය භාර ඇමතිතුමනි, මේක අහගන්න. පොලිස් නිලධාරීන් උදේ 6.00ට එනවා රාජකාරියට. ඒ අය උදේ 6.00ට report කරනවා. පැය 12 duty එක අවසන් කරන්නේ හවස 6.00ට. ඔන්න එතකොට බදුල්ලේ HQI අරගෙන එනවා, order එකක්. පොලිස්පතිතුමා order එක ගහනවා. පොලිස්පතිතුමා order එක ගහනවා, SPට, DIGට. මේක හොඳට අහගන්න. Order එක හවස 5.00ට ගහනවා, "වැටලීම්වලට ලෑහැස්ති වෙන්න, එහෙම නැත්නම් roadblocksවලට ලෑහැස්ති වෙන්න" කියලා. අර පොලීසියේ රාළහාමි උදේ 6.00ට ඇවිල්ලා, හවස 5.00 වනකල් පාරේ duty කරලා, roadblocksවල duty ඇදලා, උසාවිවල duty ඇදලා එනකොට HQI හරි OIC හරි හවස 5.00ට order එකක් ගහනවා, හවස වැටලීම් කියලා. උදේ ඉඳන් පැය 12 ඇදපු

පොලීසියේ අර රාළහාමි ආයෙත් රෑ 12.00 වනකල් පාරේ. ඒ මිනිහා පාන් රත්තල් දෙකක්, බනිස් ගෙඩියක් අරගෙන හවස 6.00ට off වෙන්න හිටියේ ළමයා බලන්න යන්න; ගෙදර යන්න. ඒක කරන්න බැරි වෙනවා. එහෙම වෙන්න හේතුව මොකක්ද? අද මේ twelve-hour duty එකක් අදින්න සිද්ධ වෙලා තිබෙන හේතුව මොකක්ද? හේතුව තමයි, පොලීසියේ රාළහාමිලාගේ හිඟය. පොලීසියේ රාළහාමිලාගේ හිඟය මේ විධියට දිගටම ගියොත් මොකද වෙන්නේ? Pension යන lot එක නවත්වන්න බැහැ. මේ හිඟය දිගටම ගියොත්, පොලීසි වහන්න වෙනවා; පොලීසියේ duty කරන්න බැරි වෙනවා. ඔය ගොල්ලෝ අපේ MSD එක අරගෙන පොලීසිවලට දැම්මා. අපේ MSD එක අරගෙන පොලීසිවලට දැම්මා කියලා පොලීසියේ ප්‍රශ්න විසඳෙනවාද?

ඉස්සර යුද්ධය කාලයේත් වැඩ කළේ පැය 8යි. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් මතක ඇති. අනුරාධපුර Headquartersහි පැය අටේ duty එක අපි ඇද්දේ, පැය 24න්. අද පැය 12 duty එකක් අදින්නේ. එතකොට හවස 5.30ට, 6.00ට ගෙදර යන්න සූදානම් වෙලා ඉන්න රාළහාමිට පොලිස්පති හරි, SSP හරි, DIG හරි හවස 6.00ට order එක ගැහුවාට පස්සේ බණින්නේ කාටද? ඔයාගේ අම්මාට; නැත්නම් පොලිස්පතිගේ අම්මාට; නැත්නම් DIGගේ අම්මාට; නැත්නම් SSPගේ අම්මාට. ඇයි යකෝ, උදේ 6.00 ඉඳන් හවස 6.00 වනකල් duty කරලා, පාන් රාත්තල් දෙකක් හරි අරගෙන ගෙදර ගැනියි, දරුවනුයි බලන්න යන්න ඉන්න මිනිහා, ඒ. එයාට දානවා, order එක. HQI එය එවනවා, අන්න අහවල් රාළහාමි, අහවල් නොම්මරය දැන් duty පටන් ගන්න යවන්න කියලා. ඉතින් අර රාළහාමි ආයෙත් රෑ 12.00 වනකල් roadblocksවල duty අදින්න ඕනෑ; නැත්නම් වැටලීම්වලට යන්න ඕනෑ. වැටලීම් කරන්න ඕනෑ තමයි; roadblocksවල duty අදින්න ඕනෑ තමයි; ඒවාට පොලිස් නිලධාරින් දමන්න ඕනෑ තමයි. හැබැයි, මිනිහෙකුට සීමාවක් තිබෙනවා.

ගරු සභානායකතුමනි, ඊයේ පෙරේදා මම ගියා බදුල්ල රෝහල් පොලීසියට. තට්ටෙ තියෙන, බඩ තියෙන,- *[බාධා කිරීමක්]* තට්ටෙයි, බඩයි එන්නේ ඇයි? Belt එක දාලා, සපත්තු දාලා, uniforms අන්දලා, අව්වේ තියන කොට, පැය 12ක duty එකක් දැම්මාම මිනිහෙකුට ඉන්න පුළුවන්ද? ඊට පස්සේ ගෙන්වලා හවසත් duty කෙරෙව්වාම මොකක්ද කරන්නේ? ඒ රාළහාමි කියනවා, "වැඩක් නැහැ, මන්ත්‍රීතුමා, 60න් pension ගියාම 65න් මැරෙනවා" කියලා. ඒක හරි; 65න් මැරෙනවා. මොකද, පොලීසියේ කල්දේරම් බත කෙළලා, කෙළලා, තෙල් කාලා කාලා නේ ඉන්නේ. ඒවා නැහැ කියන්න බැහැ. මම මේ සියල්ල A to Z දන්නා හින්දයි මේ කියන්නේ. අද වෙනකොට පොලීසියේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මෙතැන කථා කරපු ආණ්ඩුවේ සමහර අය පොලීසිය ගැන විවිධ දේවල් කිව්වා. පොලිස්කාරයෝ කවදාවත් JVP එකට ඡන්දය දුන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තවත් චුට්ටක් කාලය දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
හරි, තවත් පොඩි වෙලාවක් දෙන්න. මේවා අහගන්න. ආණ්ඩු පක්ෂයේ අයත් අහගෙන ඉන්නවා. මොකද, මේවා වැදගත්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට තවත් විනාඩි 2ක් දෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඉස්සර පොලිස්කාරයෝ JVP එකට ඡන්දය දුන්නේ නැහැ. ඉස්සර පොලිස්කාරයෝ ඡන්දය දුන්නේ, UNP එකට; JVP එක දැක්කාම, අහක බලා ගත්තා. හැබැයි, මේ සැරේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව හදන්න පොලිස්කාරයෝ සියයට 80ක් ඡන්දය දුන්නා. හෙට අනිද්දාට පොලීසියෙන් වැඩක් ගන්නවා නම්, ඔය පොලිස්පතිතුමායි, DIGsලා හතරපස්දෙනෙකුයි විතරක් ඉඳලා බැහැ. මොකද, යට ඔක්කෝම ගැලවිලා යනවා. යට ගැලවිලා ගියොත්, සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. ඒක ඔබතුමන්ලා හොඳින්ම කල්පනා කර ගන්න. ඒ ගැන කල්පනාවෙන් බලන්න. මම කියන්නේ ඒකයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ plan එකක් තිබෙනවා, සිවිල් ආරක්ෂකයින් 10,000ක් දමන්න. නමුත් සිවිල් ආරක්ෂකයින් 10,000ක් දමන්න බැහැ. ඒගොල්ලෝත් 1988, 1989, 1990 කාලවල බැඳුණු අය. ඒ අයත් lot එකම pension යනවා. මම මේකට විසඳුමක් කිව්වොත්, "චාමර සම්පත්ගේ උපදෙස් අරගෙන නොවෙයි, අපි වැඩ කරන්නේ" කියලා කියාවි. ඉතින් අපි මේවා කියලා වැඩක් නැහැ නේ, විපක්ෂයේ ඉඳන්. අපි හොඳ දෙයක් කියපු ගමන් අහන්නේ, "චාමර කවුද අපිට කියන්න?" කියලායි. ඕනෑ නම් මෙහෙම කරන්න පුළුවන්. රැකියා විරහිත උපාධිධාරින් ඉන්නවා නේ. ඒ අයගෙන් 10,000ක් direct ගන්න, train නොකර. එහෙම අරගෙන ඒ අය office side එකට දමන්න; officeවල ඉන්න අය duty දමන්න. එහෙම නැතුව මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න බැහැ. මේක ලොකු ප්‍රශ්නයක්. ඔබතුමන්ලා හිතන්න එපා, මේක පොඩි ප්‍රශ්නයක් කියලා. පොලීසියේ 20,000ක් විශ්‍රාම යනකොට, 3,000ක් train කරලා කොහොමද, 17,000ක පුරප්පාඩුව නිසා ඇති වන ප්‍රශ්න විසඳා ගන්නේ? එහෙම විසඳා ගන්න බැහැ. ඒකට විකල්පයක් තවම පොලීසියෙන් කියලා නැහැ.

ආනන්ද විජේපාල මහත්මයා, ඔබතුමා එක්ක අපට ප්‍රශ්න නැහැ; අපට එහෙම පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. ඔන්න, කොටින්ම කියනවා නම්, ඔයා එක්ක එහෙම ප්‍රශ්නයක් නැහැ, මචෝ! එහෙම ප්‍රශ්නයක් අපට නැහැ. හැබැයි, අපි කියන්නේ මේකයි. අපට මේ ජීවිතේ හැම කෙනාගෙන්ම පොඩ්ඩ පොඩ්ඩ හරි ඉගෙන ගන්න තිබෙනවා. මගේ ජීවිතේ මම ගොඩක් අයගෙන් ඉගෙන ගත්තා, මෙතැනට එන්න. ඉස්සර හිටපු දක්ෂම කථිකයෙකු වෙච්ච සමරවීර වීරවන්නි මහත්මයා, බදුල්ල දිස්ත්‍රික්කයේ නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා, එඩ්වින් වික්‍රමරත්න මහත්මයා ආදි කී දෙනෙකුගෙන් දේශපාලනය ඉගෙන ගෙනද, මම මෙතැනට ආවේ. මම මේ දයාසිරි මහත්මයාගෙනුත් ඉගෙන ගත්තා. *[බාධා කිරීම්]* ඇයි හිනා වෙන්නේ? ඉන්න, මම කියන්නම්. දයාසිරි මහත්මයා පඩුවස්නුවර මොන නීතිඥවරයා ළඟද හිටියේ කියලා මතකද? ජයසේන රාජකරුණාගේ ගෝලයා මෙතුමා. මේවා අහගන්න. දහනැක්ගෙදර, ජයසේන රාජකරුණාගේ ගෝලයා මෙතුමා.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

*[බාධා කිරීම්]* ඔබතුමාත් කුරුණෑගල, අරයාත් කුරුණෑගල. මම හරිද? දහනැක්ගෙදර හිටියේ. මම මේ දයාසිරි ජයසේකර මැතිතුමාගෙනුත් ඉගෙන ගත්තා. එහෙම තමයි, හැමෝගෙන්ම ඉගෙන ගන්න දේවල් තිබෙනවා; අහගන්න දේවල් තිබෙනවා.

හිතුවක්කාර විදියට පොලීසිය නම් පාලනය කරන්න බැහැ. පොලීසිය යටතේ STF එක තිබෙනවා. STF එක ඔයගොල්ලන්ට උදවු කරනවා. STF එකේ අයටත් promotionsවල ප්‍රශ්නයක් තිබෙනවා. සාජන්ට්ලාගේ ප්‍රශ්නයකුත් තිබෙනවා. රාළහාමිලා පිරිසක් ඉන්නවා, SI යන්න බලාගෙන. බොහෝ අයට ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒවා එකින් එක කියන්න බැහැ, මට තිබෙන්නේ විනාඩි කිපයක් වන නිසා.

මම තවත් කෙනෙකු ගැනත් කියන්න ඕනෑ. මේක මම කලිනුත් කිව්වා. සහන් ගනේගොඩ කියලා YouTuber කෙනෙක් ඉන්නවා. එයාව හැමෝම අන්දනවා. ඔබතුමා එක්කත් හිතවත් වෙලා ලු. අන්න ඊයේ පෙරේදා ආයෙත් ඇතුළට දැම්මා. මම මේ පාර්ලිමේන්තුවේදී කියලා අවුරුද්දක් මිනිහාව ඇතුළට දැම්මා. සහන් ගනේගොඩ කියන්නේ පට්ට හොරෙක්, ගෙවල්වල කාන්තාවන් අමාරුවේ දමපු. තණමල්විල කෙනෙක්, army absentee කෙනෙක්. මම ගියා ගෙදර හොයාගෙන, මට ටෝක් එකක් දමලා. හැමෝටම ටෝක් දැම්මා; නාමල්ට, අරයාට, මෙයාට හැමෝටම ටෝක් දැම්මා. මම ගියා තණමල්විල ගෙදර හොයාගෙන. අම්මා දියතලාවේ ඉන්නේ. මම දියතලාවටත් ගියා. අන්න එයා ඊයේ පෙරේදා arrest කරලා තිබෙනවා. අන්න ඒ වාගේ අයට හසු වෙන්න එපා, ගරු ඇමතිතුමා. සහන් ගනේගොඩ ගැන මට කියන්න තිබෙන්නේ ඒකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් පොඩි වෙලාවක් දෙන්න; තවත් විනාඩියක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක කාලයක් වැඩිපුර දීලා තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඊළඟට කියන්න ඕනෑ, මහින්දානන්ද අලුත්ගමගේ ගැන. ඒ මනුස්සයා හිරේ ඉන්නේ. මේ ළඟදී කෙනෙක් කිව්වා, ඒ මනුස්සයාට නුවරඑළියේ අක්කර 10ක් තිබෙනවා කියලා. ඒ මිනිහාට අක්කර 10ක් නුවරඑළියේ තිබ්බොත්, මම පාර්ලිමේන්තුවෙන් අයින් වෙනවා. ඒ කියපු මහත්මයාට පුළුවන් නම් ඔප්පුව ගෙනැල්ලා පෙන්නන්න කියන්න. මිනිහෙක් අමාරුවේ වැටුණාට පසුව එහෙම කරන්න එපා; තැළෙන යකඩේ තළනවා වාගේ වැඩ කරන්න යන්න එපා; පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිකම් බොරු කියන්න එපා. ඒ මනුස්සයා මට හිර ගෙදරදී කිව්වා, "බලපන් බං, අපට අව්වු කරලා අවුරුදු 20කට. මට මෙහෙමත් චෝදනා කරනවා" කියලා. එහෙම ඒවා කියන්න එපා. මොකද, ඔය දේ කාටත් වෙන්න පුළුවන්. ඔයගොල්ලන්ටත් එකයි, අපටත් එකයි. මේ විපක්ෂයේ අය ආණ්ඩුවක් පිහිටෙව්වාම, ඔයගොල්ලන්ටත් වරදියි. ඒක අනිවාර්යයි. හරිද? එතකොට වරදිනවා. එතකොට ඔය ඉන්න ලොකු ලොක්කෝ ටික එළියට යයි. ඒ ලොකු ලොක්කෝම ඇවිල්ලා ඔයගොල්ලන්ගේ වැරදි අපට කියාවි. මම දන්නවා නේ. අපි මේවායේ හිටියා නේ. මම මහ ඇමති කාලයේ මාත් එක්ක හිටපු මිනිස්සු තමයි මට විරුද්ධව තිබෙන නඩු ටික සමන්තට ගිහින් දුන්නේ, "මෙන්න මූ මෙහෙමයි, මෙහෙමයි" කියලා. ඒවා මම දන්නවා. හරිද? අදත් මාත් එක්ක එක්කෙනෙක් උසාවියට නැග්ගා. කරන්න දෙයක් නැහැ. මගේ පරිප්පු උඹලාත් කාපල්ලා! නැද්ද? ඇතුළට ගියොත් කවුරුත් යනවා. කරන්න දෙයක් නැහැනේ. නිලධාරින් ගැන අපෙන් නම් අහන්න එන්න එපා. අපි හොඳට කාලා ඉන්නේ. ප්‍රාදේශීය සභා මන්ත්‍රී කියන තැන ඉඳලා තමයි මම මේ ඇවිල්ලා ඉන්නේ. අවුරුදු 30ක අත්දැකීමක්. අපි මේවා හොඳට කාලා තිබෙන්නේ. ඒ නිසා මේවා අහගෙන, පොලීසිය ගැන මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න. මම මුලින් සඳහන් කරපු කාරණා ටික හරියාකාරව සිදු වුණේ නැත්නම් අනිවාර්යයෙන් පොලීසිය අමාරුවේ වැටෙනවා; රාජකාරි කර ගන්න බැරි වෙනවා. ඒක ලොකු ප්‍රශ්නයක්, ගරු සභානායකතුමා. ඒක ආණ්ඩුවටත් ප්‍රශ්නයක්, රටටත් ප්‍රශ්නයක්, නීතිය හා සාමයටත් ප්‍රශ්නයක්.

සියලු දෙනාටම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 4.11]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යාංශයත්, ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයත් පිළිබඳව තමයි අද විවාද කරන්නේ. මේ, රටේ ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක්; කොච්චර ආර්ථික ශක්තිය තිබුණත්, අනෙකුත් අමාත්‍යාංශ කොතරම් ශක්තිමත්ව කටයුතු කළත් රටක ආරක්ෂාව සහ විශේෂයෙන් පොදු මහජනතාවගේ දෛනික ආරක්ෂාවට වැදගත් අමාත්‍යාංශ දෙකක්. සරලව ගත්තොත්, උදේ ගෙදරින් ගිහිල්ලා හවස ගෙදර එනකොට කරදරයක් නැතුව ගෙදර පවා තියෙයි කියලා විශ්වාසය හදන්න පුළුවන් අමාත්‍යාංශ දෙක තමයි මේ අමාත්‍යාංශ දෙක. ඒක නිසා මම හිතනවා, මේවා රටක

පැවැත්මට ඉතා අවශ්‍ය වන අමාත්‍යාංශ දෙකක් කියලා. විශේෂයෙන්ම මේවා විවිධ කාලවලදී, විවිධ බරපතළ චෝදනාවලට, බරපතළ අපහසුතාවලට පත් වෙච්ච අමාත්‍යාංශ දෙකක්. මා හිතන හැටියට මෑත භාගයේදී විශේෂයෙන්ම ජාතික ජන බලවේග පාලනයත් එක්ක සැලකිය යුතු පිළිගැනීමකට, ආකර්ෂණයකට මේ අමාත්‍යාංශ ලක් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඒකෙන් විශේෂයි. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව, අනෙකුත් පර්යේෂණ කටයුතු සම්බන්ධව මීට කලින් නොතිබුණු ආකාරයේ විනිවිදභාවයකින් එය කටයුතු කරනවා. තව අඩුපාඩුකම් නැතුවා නොවෙයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට තිබුණු තැනට සාපේක්ෂව නේ, අපට මේවා ගැන කථා කරන්න වෙන්නේ.

ආනන්ද විජේපාල ඇමතිතුමා පොලීසියට අලුතින් නිලධාරීන් බඳවා ගන්න තීන්දු කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒ අය තවම සේවයට ඇවිල්ලාද, නැද්ද කියලා. නැත්නම්, මේ හිටපු පොලීසියේම අය තමයි තවමත් ඉන්නේ. හිටපු පොලීසියේම අය තමයි අපි වෙනස් කරගෙන යන්නේ, හොඳ පැත්තට. අපි ඒක අගය කරනවා. ඒ වාගේම ඇමතිතුමා කථා කරද්දී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙච්ච කරුණු කිහිපයක් තිබෙනවා. වෙලාව මදි නිසා එතුමාට ඒවා ඉදිරිපත් කරන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය ඇල්ලීම ගැන කථා කළා. සමහර මන්ත්‍රීවරු හොඳ දේට හොඳයි කියන්න බැරි මට්ටමට වැටිලා තිබෙනවා. අවුරුදු 20ක්, 25ක් පාර්ලිමේන්තුවේ හිටියාම මම හිතනවා, හොඳ දේට හොඳයි කියන්න බැරි තරම් පහළ මට්ටමට වැටෙන්න ඕනෑ නැහැ කියලා. නමුත් සජබයේ ජ්‍යෙෂ්ඨයි කියන කට්ටිය, පොලීසිය මේ මාස කිහිපයේ ඔවුන්ගේ ජීවිත අනතුරත් නොසලකමින් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් කරද්දී, ඒ ගැන කිසිම ඇගයීමක් කරනවා අපි දැක්කේ නැහැ. ඒවා හැල්ලුවට ලක් කළා. හෙරොයින් වැටලීම් 66,704කදී කිලෝ 1,597ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මේ එක වැටලීමකදී අත කැඩෙනකල් ඒ සම්බන්ධ විස්තර ලියන්න ඕනෑ; ඒවා හොයන්න ඕනෑ. මේවා පික්පොකට්කාරයෝ හොයනවා වාගේ වැඩ නොවෙයි. අන්තර් ජාතික අපරාධ ජාලත් එක්ක සම්බන්ධ වෙච්ච ඒවා ගැන තමයි හොයන්න තිබෙන්නේ. පොලීසියේ ඉන්නේත් සාමාන්‍ය මිනිස්සු. දරුවෝ, නෝනලා, අම්මලා, තාත්තලා ඉන්න අය තමයි පොලීසියේත් ඉන්නේ. වැටලීම් 75,450කදී අයිස් කිලෝ 3,143ක් හොයාගෙන තිබෙනවා. වැටලීම් 65,111කදී ගංජා කිලෝ 15,612ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. 1,863ක් වැටලීම් කරලා හෂීස් කිලෝ 630ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. වැටලීම් 104කදී කොකේන් කිලෝ 33ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

එක මන්ත්‍රීවරයෙක් කිව්වා, කොකේන් ගහන්නේ සල්ලි තිබෙන කට්ටිය කියලා. ඒ අය ඒවා දන්නවා ඇති. කොකේන් ගණන් නිසා තමයි කොකේන් අත්අඩංගුවට ගත්ත ප්‍රමාණය අඩු වෙලා ඇත්තේ. මා හිතන හැටියට, කොකේන් කිලෝ 33ක් කියන්නේ ලොකු ගණනක් වෙන්න ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධව මේ රටේ පොදු මහජනතාව අතර -උතුරේ, නැඟෙනහිර, දකුණේ හැම තැනම- පොදු පිළිගැනීමක් තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක පිළිගන්න බැරි ඇයි කියලා. ගජේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා කියනවා, උතුරු පළාතේ, නැඟෙනහිර පළාතේ කුඩු, ගංජා, හෙරොයින් පාවිච්චි කරන්නේ පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව කියලා. ඇත්තටම උතුරේ තමයි වැඩියෙන්ම කසිප්පුවලින්, මත්ද්‍රව්‍යවලින් පීඩාවට පත් වෙලා තිබෙන්නේ. ඒ දුප්පත් ගම්මානවලට ගියාම දුප්පත් අම්මලා අඬ අඬා කියන්නේ ඒ දේ.

පොලීසිය, හමුදාව ඒ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම වෙනුවෙන් ඒ ප්‍රදේශවල පරීක්ෂා කටයුතු කරනවා. ජනාධිපතිතුමා මේ සභා ගර්භයේ එතුමාගේ පුටුවේ ඉඳගෙන ඇති තරම් කියලා තිබෙනවා, මත්ද්‍රව්‍ය ජාලයට සම්බන්ධ ආරක්ෂක අංශවල නිලධාරීන් යම් ප්‍රමාණයක් ඉන්න බව. අධිකරණ ක්ෂේත්‍රවලත් සමහර අය ඉන්න පුළුවන් බව ජනාධිපතිවරයා මෙතැන කියලා තිබෙනවා. උතුරු පළාතේ මුළු මහත් පොලීසිය, මුළු මහත් හමුදාව මත්ද්‍රව්‍ය ජාවාරමේ නැහැ. දකුණේ අයත් අල්ලන්නේ. අර පද්මේද කවුද කෙනා අල්ලාගෙන ආපු වෙලාවේ උතුරේ ඉහළ හමුදා නිලධාරියෙක් ඇල්ලුවා නේ.

ඒවා ජනාධිපතිවරයා කියපු දේවල්. අපි කනගාටු වෙනවා, ගජේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අඩු ගණනේ මේ වාගේ ප්‍රශ්නයකදීවත් උතුර, දකුණ එකතු කරන්න කල්පනා කරන්න බැරි වීම ගැන. ගජේන්ද්‍ර කුමාර්ලා ඇතුළු පිරිසක් ඉන්නවා, එතුමන්ලා වැඩිපුරම බය ජාතික සමඟියට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, එතුමන්ලාගේ දේශපාලනය පදනම් වෙලා තිබෙන්නේ ජාතිවාදය මත. දෙමළ ජාතිවාදී සමහර දේශපාලනඥයන්ගේ ජාතිවාදය පෙනුණේ නැහැ, දකුණේ තිබිච්ච ජාතිවාදය ප්‍රබල නිසා. මොකද, දකුණේ ජාතිවාදය හැම විටම ක්‍රියාත්මක වුණේ ආණ්ඩුවල නායකයන් හරහා. අද අපේ ආණ්ඩුවෙන් කිසිම ජාතිවාදයක් කරන්නේ නැහැ. ඒ නිසා අද වෙලා තිබෙන්නේ මොකක්ද? ජාතිවාදය, කුලවාදය, ප්‍රදේශවාදය මත පදනම් වෙච්ච දේශපාලනයක් තමයි අවුරුදු 50ක්, 60ක් තිස්සේ උතුරේ තනිකරම තිබුණේ. ඒක තමයි ඇත්ත. මම අහන්නේ, කුඩු ප්‍රශ්නයේදීවත් අපට උතුරයි, දකුණයි එකතු වෙන්න බැරි නම්, මොකකදීද අපට එකතු වෙන්න පුළුවන්? උතුර තමයි යුද්ධයෙනුත් ගුටි කාලා, කුඩුවලිනුත් ගුටි කන්නේ. උතුර තමයි යුද්ධයෙනුත් ගුටි කාලා කේරළ ගංජාවලිනුත් ගුටි කන්නේ. එතුමා තර්කයක් ගෙනාවා, එල්ටීටීඊ ප්‍රශ්න තිබුණු කාලයේ උතුරේ හෙරොයින් අඩුයි කියලා. වෙන්න පුළුවන්. මොකක්ද හේතුව? යුද්ධය තිබුණු කාලයේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ ඉඳලා බෝට්ටුවලින් ඒවා ගෙනාවේ නැහැ. මම විහිළුත් කරනවා අපේ ධීවර ඇමතිතුමාට ඒක කියලා. බැලුවාම වැඩිපුරම මේවා ගෙනැල්ලා තිබෙන්නේ මුහුදෙන්; ට්‍රෝලර්වලින්. මට පෙනෙන විදියට ට්‍රෝලර්වලින් තමයි ටොන් ගණන් ගෙනෙන්නේ. යුද්ධය තිබුණු කාලයේදී ඉන්දියානු බෝට්ටු ආවේ නැහැ. මොකද, යුද්ධය තිබුණු කාලයේ සීමිත ප්‍රදේශයක තමයි මාළු අල්ලන්න දුන්නේ. ඒ කාලයේ ඒකත් ප්‍රශ්නයක් තමයි. ඒ නිසා තමයි ඒ කාලයේ කුඩු ගෙනෙන්න බැරි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරුත් දන්නා දෙයක් තමයි එල්ටීටීඊ සංවිධානයේ සමහර නායකයෝ කුඩු බිස්නස් කළා කියන එක. ඒක බොරුවක් නොවෙයි නේ. ඔවුන්ගේ ව්‍යාපාරයේ දේවල් වෙනුවෙන් ඔවුන් කුඩු ව්‍යාපාරය කළා. ඒක බොරුවක් නොවෙයි. ඒ නිසා මම කියන්න කැමැතියි, උතුරයි දකුණයි එකතු කරන්න පුළුවන් තැනක් කියලා, මේ අවස්ථාව. ඒ නිසා මේක එහෙම පාච්චල් කරන්න එපා. උතුරේ ඉන්න පුළුවන් හමුදාවේ සමහර අය, පොලීසියේ අය මේවාට සම්බන්ධ. ඒක ජනාධිපතිතුමා මෙතැනදී කියලා තිබෙනවා. ඒ නිසා ඒක අමුතු සොයා ගැනීමක් නොවෙයි ගජේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමාගේ. අපි හොඳටම දන්නවා, ගංජා නිසා, කුඩු නිසා, කසිප්පු නිසා වැඩියෙන්ම දුක් විඳින්නේ උතුරේ දුප්පත් මිනිස්සු බව. අපි ආනන්ද විජේපාල ඇමතිතුමාට ඒවා කියලා තිබෙනවා ඇති තරම්. එතුමාත් උත්සාහ කරනවා. නමුත් ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා. කසිප්පු ජාවාරම්වලින් අල්ලස් ගන්න පොලීසිවල සමහර නිලධාරි මහත්වරු ඉන්නවා. ඒක බොරුවක් නොවෙයි. ඒක ඇත්ත. ඒක මේ රාජපක්ෂලා, වික්‍රමසිංහලා, ප්‍රේමදාසලා හදපු දුෂ්ට culture එක.

දැන් කථා කළා, මොනරාගල හිටපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[ගරු බිමල් රත්නායක මහතා]

1989දී. ඒ පෞද්ගලික වධකාගාර තිබ්බේ කවිද? මේ, අමු වධකයෝ. 1983දී ගිනි තියද්දීත් මම හිතන්නේ එතුමන්ලාගේ තාත්තලා, බාප්පලා, මස්සිනාලා, සීයලා ඔක්කෝම පාර්ලිමේන්තුවේ. ඒ නිසා මේ යුදඇන්පීයට ජාතිවාදය, ගිනි තියපු ඒවා, දෙමළ මිනිසුන්ගේ ඉඩම් අල්ලපු ඒවා, කඩවල් අල්ලපු ඒවා, දෙමළ මිනිස්සු දහස් ගණනක් ගහලා ලංකාවෙන් පන්නපු ඒවා අමුතු දේවල් නොවෙයි. මැරිලා ඉපදිලාද අද මේ කථා කරන්නේ? 1981දී පුස්තකාලය ගිනි තියපු කට්ටිය නේ මේ ඉන්නේ ඉස්සරහා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බටලන්ද වාර්තාවේ මොකක්ද තිබෙන්නේ? බටලන්ද වාර්තාවේ තිබෙන විධියට, කැලණිය පොලීසියට - මට මතක විධියට කැලණිය හෝ පැලියගොඩ පොලීසිය වෙන්න ඕනෑ - කවුද ගහන්නේ? එක්සත් ජාතික පක්ෂයේ තගාලා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
බියගම.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

බියගම පොලීසියද? මොකක් හරි. ඒ පොලීසියට ගහන්නේ කවුද? බටලන්ද වාර්තාවට අනුව එක්සත් ජාතික පක්ෂයේ තගාලා තමයි ගහන්නේ. ඒ වාර්තාවේ මේවා තිබෙන්නේ. ඒ රනිල් වික්‍රමසිංහගෙන් සම්මාන ගත්තු කට්ටිය! ඒ නිසා මේ අමු වධකයෝ, අමු ජාතිවාදී අය අද ඇවිල්ලා කථා කරන්නේ කොහොමද?

ලංකාවේ අපේ පාලනයෙන් තොරව ඕනෑ තරම් සමාජ සිදුවීම් වෙනවා. ඒවාට සම්පූර්ණයෙන්ම අද කථාව සම්බන්ධ කරනවා. අද සම්පූර්ණ කථාව මොකටද හැදුවේ? ඒ හැදුවේ මුස්ලිම් මිනිහාට, දෙමළ මිනිහාට විරුද්ධව සිංහල මිනිහා අවුළුවන්නයි. කිසිම තෙතමනයක්, ඒ ගින්න නිවන්න වුවමනාවක් නැහැ. ඒකෙන් ඡුන්ද ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ අපි පමණක් නොවෙයි, මේ රටේ ජනතාවත් අද ජාතිවාදය පරාජයට පත් කරලා තිබෙන්නේ. ඊයේ පෙරේදා වෙච්ච සිද්ධිය වුණත් ඔබතුමන්ලා බලන්න. ඒවායින් ඡුන්ද වෙලා තිබෙන්නේ සුළු පිරිසයි. අපි සතුටු වෙනවා ඇත්තටම ජනතාවගේ හැසිරීම ගැන.

ඒ වාගේම මහජන ආරක්ෂාව ගැන කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ජනාධිපතිකම් කළා, අගමැතිකම් කළා, පක්ෂයේ ප්‍රධාන තනතුරු දැරුවා. එතකොට පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ කොහොමද? එතරම් තොරතුරු තිබෙද්දී, ජාතික ආරක්ෂාව පැත්තකට දමලා මොකක්ද කළේ? ඊට කලිනුත් ජාතිවාදය හදාගෙන හදාගෙන එද්දී පොල් ගෑවාද සජිත් ප්‍රේමදාසලා, රනිල් වික්‍රමසිංහලා?

ඒ වෙලාවේ පොලීසිය භාර ඇමති කවුද? ඇල්ලුවාද? පාස්කු ඉරිදා ප්‍රහාරය ඇති කරලා අද මෙතැන ඉඳගෙන කෑගහනවා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සේ එම ප්‍රහාරය නිර්මාණය කරපු අයගේ ආණ්ඩුවක් තිබුණු බව ඔබතුමා දන්නවා. ඒගොල්ලන් පරීක්ෂා කරපු නිලධාරීන් මාරු කළා, ශානි අබේසේකරව හිරේ දැම්මා; ඒගොල්ලන් හිරේ දැම්මා. ඒක තමයි ඇත්ත. පරීක්ෂණ යට ගහපු, සාක්ෂිකාරයෝ මරපු, රටින් පන්නපු ඒවා තමයි අපි දැන් ඉතා අමාරුවෙන් ගොඩ දමන්න උත්සාහ කරන්නේ. පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු කළ කාලයේ තමන්ම තනතුරු දරලා, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සෙත් අවුරුදු එකහමාරක් ආණ්ඩුවේ ඉඳලා, තොරතුරු තිබෙද්දී බුද්ධි වාර්තා ඔක්කොම පැත්තකට දාලා කටයුතු කරලා, "ආ, ඇල්ලුවාද?" කියලා අද අපෙන් අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේකයි. මේ, අමු ජාතිවාදය හදපු කට්ටිය. ලංකාවට ගිනි තියන දේශපාලනය, 1983 කළු ජූලිය ගෙනාපු කට්ටිය, මේ. 1983 කළු ජූලිය සිදු වුණේ හමුදා සොල්දාදුවන් 13දෙනෙකු මරපු නිසාය කියලා අපි හිතමු. එතකොට 1981දී යාපනය පුස්තකාලයට ගිනි තිබ්බේ කවුරු මරපු නිසාද? 1981දී යාපනය පුස්තකාලය ගිනි තිබ්බා. ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මහත්මයලා සහ මේ සමහරු ලජ්ජා වෙන්න ඕනෑ. එවැනි ජාතිවාදයක් කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමයි පසුගිය ජනාධිපතිවරණයේදී සුමන්තිරන් මහත්මයා ඇතුළු මේගොල්ලන් සන්ධාන ගහලා ඡන්දය දුන්නේ. අපි එහෙම කරලා නැහැ; අපි එහෙම කරලා නැහැ.

ඊළඟට, පොලීසිය ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 මැයි 19වැනි දා "ලංකාදීප" පුවත් පත මම **සභාගත*** කරනවා.

"ඕ.අයි.සී.ලා 184න් 182ක්ම දේශපාලන පත්වීම්. පොලිස්පති අමාත්‍යාංශ ලේකම්ට ලිපියකින් දන්වයි" කවුද මේ කියන්නේ? හිටපු පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහත්මයා. අපට හිටියේ තුන්දෙනායි. මේගොල්ලන්ගේ හිටියා නේ, 100ක් විතර. මේගොල්ලනුත් එක්ක තමයි කළේ. මම හෙට අනිද්දාට අදාළ ලේඛන හැන්සාඩ්ගත කරන්නම්. 2003දී නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විපක්ෂයේ හිටියේ. මේගොල්ලන්ගේ ජෝන් අමරතුංග පොලිස් ඇමති ලෙස කටයුතු කළ කාලයේ - 2001-2003 කාලයේ - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මිනිස්සුන්ව දඩයම් කළේ කොහොමද කියලා මම කියන්නම්. 3,500ක් arrest කළා. නිමල් සිරිපාල ද සිල්වා ජීනිවාවලට ගිහිල්ලා පැමිණිලි කළා. ගිනි අවි දාලා අත්අඩංගුවට ගත්තේ. එහෙමයි, අද මේ කථා කරන අයගේ ඇත්ත තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසිය භාර අමාත්‍යාංශය ගැනත් කියන්න ඕනෑ. මට තව විනාඩි දෙක තුනක් දෙන්න, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ඔබතුමා දන්නවා, අපි පත් වෙලා තවම කෙටි කාලයයි කියලා. හරියටම ගත්තොත්, මේ 21වැනි දාට තමයි අවුරුද්ද පිරෙන්නේ. මේ බලන්න, විවිධ පාතාල නායකයන්ගේ දේපළ තහනම් කරපුවා. ඊට කලිනුත් මේවා කරලා ඇති. නමුත්, අවුරුද්දක් ඇතුළත අපි මෙච්චර දේවල් ප්‍රමාණයක් කළා. යම් කිසි අනුරාගයකින්, උනන්දුවකින්, හැම පැත්තම සම්බන්ධ කරගෙන කරන්නා වූ උත්සාහයක් මේකෙන් පෙනෙන්නේ නැත්නම්, මේක දේශපාලන අන්ධවීමක් වෙන්න එපායැ.

මම විස්තර කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ලේඛනයේ තිබෙනවා, එක එක අයගේ නම්. ගයාන් ධනුෂ්ක ඔබේසේකර, හතුරුසිංහ, දිල්හානි ප්‍රියදර්ශනි ආදී වශයෙන් විවිධ පාතාල කණ්ඩායම්වල

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

98දෙනෙකුගේ බිලියන 4.3ක් වටිනා දේපළ තහනම් කර තිබෙනවා, පොලීසිය භාර අමාත්‍යාංශය. ඔබතුමා හිතන්නේ, මේවා declare කළාට පස්සේ තහනම් කළා කියලාද? නැහැ. මේ, එකින් එක හොයලා, හොයලා තමයි කරලා තිබෙන්නේ. ඒක අගය කරන්න බැරිද? කවුද කිව්වා, පොලීසියේ පඩි වැඩි කළේ නැහැ කියලා. පොලීසිය රජයේ දෙපාර්තමේන්තුවක්. රජයේ නිලධාරින්ට පඩි වැඩි වෙනකොට පොලීසියටත් පඩි වැඩි වෙනවා නේ. "යන්නේ කොහෙද මල්ලේ පොල් වාගේ" මොනවා හරි දෙයක් ඇවිල්ලා කියවනවා.

මම ප්‍රවාහන ඇමතිවරයා නිසා රථ වාහන පොලීසියට ස්තුති කරන්න ඕනෑ. පොලිස්පතිතුමා එක්ක අපි ගොඩක් වැඩ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා අපි onlineවලින් දඩ ගෙවන්න පුළුවන් ක්‍රමයක් පටන් ගත් බව. දැන් ඒක කරගෙන යනවා. අපි බලාපොරොත්තු වනවා, මේ අවුරුද්දේ දෙසැම්බර් 31 වනකොට මුළු ලංකාවේම රථ වාහන දඩ onlineවලින් ගෙවන්න අවස්ථාව සලසා දෙන්න. ඒ වාගේම අපි ඒක GovPay සේවාව හරහා demerit system එකට සම්බන්ධ කරලා, ලබන අවුරුද්දේ මැද වනකොට driversලා කරන වැරදි සම්බන්ධයෙන් කටයුතු කරන්න demerit system එක හඳුන්වා දෙන්න බලාපොරොත්තු වනවා. රිය අනතුරු සම්බන්ධයෙන් 2025 ජනවාරි 01 සිට ජනවාරි 30 දක්වා රුපියල් බිලියන 6.5ක් රජය අත්පත් කරගෙන තිබෙනවා. ඊට කලින් අවුරුද්දේ පළමුවෙනි මාස 9 තුළ රුපියල් බිලියන 3යි. අපි කැමැති නැහැ, රියැදුරන්ට දඩ ගහ ගහා ආණ්ඩුවට සල්ලි වැඩි කර ගන්න. එහෙම කරන්න අපට කිසිසේත්ම වුවමනා නැහැ. නමුත්, යම්කිසි ශික්ෂණයක් ගෙනෙන්න නම් දඩ පැනවීම අවශ්‍යයි. පොලිස් දෙපාර්තමේන්තුව ගැන ඔය කාරණා ටික තමයි මට කියන්න තිබුණේ.

ඊළඟට, ජාතික සමගිය ගැන කථා කරන්න ඕනෑ. ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි, අපි බලයට ආවාට පස්සේ මන්නාරම් දිස්ත්‍රික්කයේ සහ වන්නි පළාතේ කොච්චර හමුදා කඳවුරු අලුතෙන් දාලා තිබෙනවාද? එහෙම නැත්නම් ඉවත් කරගෙන තිබෙනවාද? මගෙන් තත්පර 10ක් අරගෙන ඔබතුමා උත්තර දෙන්න. சொல்லுங்க!

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நீக்கப்பட்டவை பற்றி தெரியாது. ஆனால், புதிதாக camp அமைக்கப்படவில்லை.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා මුත්තියන්කට්ටුව දන්නේ නැද්ද? ඔබතුමා මුත්තියන්කට්ටුවල මැරුණු ළමයාගේ මළ ගෙදර ගියේ නැද්ද? හොඳයි, ඔබතුමා දන්නවා නේ මැදවච්චිය හා මන්නාරම ගැන. මැදවච්චියේ ඉඳලා මන්නාරමට අලුතෙන් කීයක් දාලා තිබෙනවාද? එකක්වත් දාලා නැහැ. තිබුණු කඳවුරු අයින් කර ගන්න තීන්දු කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, වාදයකට ගියොත් කාලය ප්‍රමාණවත් නැති වෙයි.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
அங்கு புதிதாக camp அமைக்கப்படவில்லை. அதை நான் -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක නේ. එතුමා පක්ෂ නායකයෙක්. තිස් අවුරුද්දක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. අලුතෙන් කඳවුරු දාලා නැහැ. තිබෙන ඒවාත් අයින් කරගෙන තිබෙනවා.

මම දන්නවා, මඩුකැලේ තිබුණු ඒවා එහෙම අයින් කර ගන්න කියලා හමුදාව කියලා තිබෙනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැන ඇත්තටම මට විවේචනයකුත් තිබෙනවා. ඒකේ වැට ගහ ගන්න සල්ලි නැහැ කියලා භාර ගන්නේ නැහැ. පරිසර විෂය භාර ඇමතිතුමාටත් මම දහවතාවක් විතර කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙන්න, ඔබතුමා මම වැඩිපුර වෙලාව ගන්න එක ගැන concerned කියලා මම දන්නවා. දැන් මේක ජාතික, දේශපාලන ප්‍රශ්නයක් නේ. ආණ්ඩුවට කිසිම අවශ්‍යතාවක් නැහැ, කැලෑ අල්ලා ගන්න. හමුදාවට පිස්සු නැහැ කැලෑ අල්ලන්න. හමුදාව කියනවා, ගන්න කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට නිසි ගෞරවය ඇතිව කියන්නේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියනවා, ඒකේ වැට ගහ ගන්න සල්ලි නැහැ ආදී දේවල්. මෙතැන ඊට වඩා burning ප්‍රශ්නයක්, දේශපාලන ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා එක්ක මම මැදිහත් වුණා Army camps 16ක් අයින් කරන්න; commandersලා තීන්දු කරලා තිබෙනවා ඒවා අයින් කරන්න. ඒක ඒගොල්ලන්ගේ තීරණයක්. පසුගිය කාලයේ එම 16න් යාපනයේ 04ක් අයින් කළා. තව ගොඩක් අයින් කළා. මුත්තියන්කට්ටුව තිබුණු ඒවා අයින් කළා. ඒගොල්ලන් තව අයින් කරනවා. හැබැයි, මෙහෙමයි. කවුරු හරි හිතනවා නම් උතුරු පළාතේ තිබෙන සියලු හමුදා කඳවුරු අයින් වෙන්න ඕනෑ කියලා, එහෙම නම් ඒක වෙනම තත්ත්වයක්. එහෙම නම්, ලංකාවේ තිබෙන හමුදා කඳවුරු අයින් වෙන්න ඕනෑ. ලංකාවට හමුදා කඳවුරු අවශ්‍ය නැති වෙන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා, මම සාක්ෂියි. මම නම කියන්නේ නැහැ, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ හිටපු නායකතුමාගේ. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ එම පක්ෂයේ නායකයෝ පාර්ලිමේන්තුවේදී කිව්වා, උතුරේ හමුදා කඳවුරු අයින් කරන්න එපා කියලා. හමුදා කඳවුරු අවශ්‍ය ප්‍රමාණයට වඩා තිබෙනවාද, නැද්ද කියන එක ගැන කථා කරන්න පුළුවන්. නමුත්, හමුදා කඳවුරු ආණ්ඩුව අඩු කරගෙන යනවා.

ඒ වාගේම මම තව ඉල්ලීමක් කරනවා. දැන් හැම වෙලාවේම කියනවා, -

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I have no time; I have already exceeded my time.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හමුදාව කරන එක හොඳ දෙයක්වත් පෙනෙන්නේ නැද්ද? හමුදාවෙන් ඕනෑ තරම් අඩුපාඩුකම් වෙලා තිබෙනවා. ඒක අපට විරුද්ධවත් සිදු වෙලා තිබෙනවා. ජනතාවට විරුද්ධවත් සිදු වෙලා තිබෙනවා. හැබැයි,

[ගරු බිමල් රත්නායක මහතා]

හමුදාවෙත් ඉන්නේ මිනිස්සු. ඒගොල්ලෝ උතුරේ කරන එක හොඳ දෙයක්වත් නැද්ද? බොරු කිව්වා. Navy checkpoints තිබෙනවා කිව්වා, කිලෝමීටර දෙකෙන් දෙකට. ගජේන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමාට මම ride එකක් දෙන්න කැමැතියි, කොක්කුතුඩුවායි ඉඳලා නයාරු පැත්තෙන් මුලතිව්වලට කොච්චර camps තිබෙනවාද කියලා බලන්න. මේ බොරු කියන්නේ. ඒ වාගේම මම ඉල්ලා සිටිනවා Sri Lanka Army එකෙන්, - *[බාධා කිරීමක්]* Okay. මට හම්බවෙලා තිබෙනවා. හැම දාම කියනවා, හමුදාව උතුරේ salons දානවා, හමුදාව shops කරනවා, හමුදාව නිසා උතුරේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හමුදාවට camps ඇතුළේ canteens, shops ආදිය තිබෙනවා. නමුත්, සාමාන්‍ය සිවිල් ජනතාවට තිබෙන ප්‍රමාණය කොච්චරද? මුළු වන්නි දිස්ත්‍රික්කයේම තිබෙන්නේ tailor shops දෙකයි, salon එකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වන්නි දිස්ත්‍රික්කයටම කොණ්ඩය කපන එක salon එකක් දාපු නිසා වන්නියේ salonsවල ආර්ථිකය වැටිලාද? Cafeterias 06ක් තිබෙනවා. මම නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාට කිව්වා, මේවා හමුදාව කඳවුරුවලින් එළියේ කරන්න ඕනෑ නැහැ කියලා. මොකද, ඒ පැත්තේ මිනිස්සු දුප්පත්. මම පිළිගන්නවා. ඇත්තටම ඔබතුමන්ලා ළඟ තිබෙන restaurant equipment පවා ඒ මිනිස්සුන්ට දෙන්න. මේ, බොරු මතයක් හදන්නේ. වන්නි දිස්ත්‍රික්කයටම දාලා තිබෙන්නේ cafeterias 06යි, welfare shops 03යි, tailor shops 02යි, salon 01යි. ඒ නිසා මේ propaganda එක නවත්වන්න. ජීනිවාවලට කථා කළාට කමක් නැහැ. මේවා ලංකාවේදීත් කථා කරන්න ඕනෑ. මේවා බොරු - பொய்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කාලය ගන්න කැමැති නැහැ. අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. උතුරේ දෙමළ ජනතා පදනම විශාල වශයෙන් තිබෙන පක්ෂය ජාතික ජන බලවේගයයි. සමහරුන්ට ඉතිහාසය අමතක වෙලා. තවම කථා කරන්නේ, උතුරේ දෙමළ ජනතාව - *[බාධා කිරීමක්]*

ගජේන්ද්‍රකුමාර්ලා එක්කෙනෙක් වෙනකොට ඉලංකුමාරන්ලා, රාමලිංගම්ලා තුනක් එවලා තිබෙනවා, යාපනයෙන් විතරක්. ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මහත්තයලා අවුරුදු 70ක් යාපනයේ දේශපාලනය කරලාත් තවම එක්කෙනායි. මම හිතන විධියට, ගිය පාර දෙන්නෙක් හිටියා, කජේන්ද්‍රන් හිටියා. වන්නියෙන් විතරක් අපට ඇවිල්ලා තිබෙනවා, ඒ ගාණ. උතුරේ අපේ මන්ත්‍රීවරුන් 7ක් ඉන්නවා. අපට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 150ක් ඉන්නවා. ගජේන්ද්‍රකුමාර් මහත්තයාට ඉන්නේ 81යි, මට මතක විධියට. ඒ නිසා උතුර, දකුණ, නැඟෙනහිර, බටහිර කියන ඔක්කෝම එක රටක් ලෙස කල්පනා කරන්න.

උතුරේ ඉන්න අනෙක් පක්ෂවල මන්ත්‍රීවරුන්ට අපි ගරු කරනවා. ඔබතුමාට historical සම්බන්ධයක් තිබෙනවා. අපි කියන්නේ කරුණාකරලා ජාතික සමගියට භය වෙන්න එපා කියලායි. ඔබතුමන්ලා මෙහේ ජාතිවාදය තිබෙන කාලයේ ජාතිවාදයෙන් දේශපාලනය කරලා උඩට ආවා. ඒක ඇත්ත. දැන් පොහොට්ටුවට ඇඩ්‍රස් නැති වෙලා තිබෙන්නේ. ජාතිවාදයෙන් ඇවිල්ලා ජාතිවාදය නැති වුණාම මොකක් හරි සිද්ධියක් මවාගෙන දවසක ආතල් එකක් ගන්නවා. ඒකම තමයි වෙලා තිබෙන්නේ. අපි කියන්න කැමැතියි, අද ජාතික සමගියට වැඩියෙන්ම භය වෙලා තිබෙන්නේ උතුරේ ඉන්න සමහර මන්ත්‍රීවරුන් කියලා. අපි කටයුතු කරන්නේ ජාතික සමගියට පක්ෂව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් කොහොමත් කථාව දික් කරගෙන තිබෙන්නේ, මේ, අවසානය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැනට විනාඩි 8ක කාලයක් ගිහින් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, මම දන්නවා.

නිමල් සිරිපාල ද සිල්වා හිටපු ඇමතිතුමා - අපේ චාමර සම්පත් මන්ත්‍රීතුමාගේ වීරයා - 2002 අප්‍රේල් 09වෙනි දා කළ කථාව හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. මම Indexing Officersලාට ස්තුතිවන්ත වනවා, කියපු සැනින් ඒ හැන්සාඩ් වාර්තාව සොයා දීලා තිබෙනවා. එතුමා එදා කියන්නේ මොකක්ද? ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, මේ කියන්නේ සජබ පාලනයට. මේ රනිල් වික්‍රමසිංහ අගමැති කාලයේ කළ වධදීම්, අත්අඩංගුවට ගැනීම් ගැන කියන්නේ. මොකක්ද, නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 අප්‍රේල් 09 දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1276හි නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ කථාවේ මෙසේ සඳහන් වනවා:

> "අද කිසිම නඩුවක් දැමීමට තරම් කරුණු නැති අවස්ථාවලදී, පොලීසිය පාවිච්චි කර 'බී' වාර්තා වරින් වර වෙනස් කරමින් ඉදිරිපත් කර උසාවියට ගෙනැවිත් විශේෂයෙන් පීඩාකාරී ආයුධ පනත යටතේ නඩු පවරා, අපේ අය මාස හය, හත රිමාන්ඩ් භාරයේ තබා ගෙන සිටින බව අපි පැහැදිලිවම කිව්වා. ද.මු. දසනායක ගරු මන්ත්‍රීතුමාට විරුද්ධව මහ ලොකුවට නඩුවක් දැමුවා. ප්‍රචාරය දුන්නා."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2002 අප්‍රේල් 09 දින හැන්සාඩ් වාර්තාවේ ඉහත උපුටා ගැනීම ද ඇතුළත් නිමල් සිරිපාල ද සිල්වා මහතා කළ කථාව ඇතුළත් පිටු දෙක -තීරු අංක 1275 සිට 1278- මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

එහෙම අය තමයි ඉස්සෙල්ලා කථා කළේ, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා. අපි ජාතික සමගිය වෙනුවෙන් පෙනී ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හොඳ දේ කරන පොලීසියේ සහ හමුදාවේ ඒ කටයුතු වෙනුවෙන් අපේ කැමැත්ත ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Point එකක් නැතිව මම කවදාවත් මේ පාර්ලිමේන්තුවේ කථා කරලා තිබුණේ නැහැ. ස්ථාවර නියෝග 92(2) අනුවයි මම අවස්ථාව ඉල්ලන්නේ. ඒක ඉංග්‍රීසි පිටපතේ සඳහන් වෙන්නේ 91 (h) ලෙස. මට කථා කරන්න පුළුවන්ද කියන්න?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරණය කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you. මට විනාඩියක් දෙන්න, හරියටම විනාඩිය calculate කරන්න. අපි අපේ දෙවියන්ට, 'දෙවියෝ" කියන මිනිස්සු. ඒ වාගේ සිංහල ජනතාවගේ දරුවන්ට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විස්තරයක් නැතිව ඔබතුමා කාරණය කියන්න

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

තත්පරයක් ඉන්න. ඉවර කරන්න දෙන්න. *[බාධා කිරීමක්]* කෑ ගහන්න එපා, කෑ ගහන්න එපා. ඒ වාගේම මැරිච්ච සිංහල රණ විරුවන්ට, 'රණ විරුවෝ" කියපු මිනිස්සු අපි. මම ***කොටි*** වෙලා, මගේ තාත්තා ***කොටි*** වෙලාත් - *[බාධා කිරීමක්]* තත්පරයක් ඉන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. කාලය පිළිබඳව ප්‍රශ්නයකුත් තිබෙනවා. *[බාධා කිරීමක්]* Point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාවට විනාඩි 12ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

[අ.භා. 4.35]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් මාතෘකා කිහිපයක් පිළිබඳව අපි විවාද කරනවා, විශේෂයෙන්ම රටේ ආරක්ෂාව පිළිබඳව. මේ රටේ ජනතාවගේ ආරක්ෂාව, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම වර්තමාන රජයේ වගකීමක් වනවා. එවැනි තත්ත්වයක් යටතේ තමයි දිගින් දිගටම පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව මේ ගරු සභාවේ අදහස් දැක්වුයේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔව්, අපි පිළිගන්නවා, එදා යහ පාලන ආණ්ඩුව සමයේ 2019දී පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය සිදු වුණු බව. හැබැයි ඒ අවස්ථාවේදී ඒ තොරතුරු ලැබිලා තිබුණේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, පොලීසියට, හමුදාවේ බුද්ධි අංශවලට, SIS එකට. මේ තොරතුරු ලැබිලා, මේ තොරතුරු හරියට විමර්ශනය කරලා මේ ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකළා කියන චෝදනාව ප්‍රධාන වශයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දෙවෙනි කාරණය මෙයයි. ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව කියෙව්වොත් ඔබට පැහැදිලිව පෙනෙනවා, තහවුරු වනවා, බුද්ධි අංශ, SIS එකේ යම් යම් කණ්ඩායම්වල නිලධාරින් මේ තොරතුරු දැනගෙන හිටියා, මේ තොරතුරු වසන් කළා කියන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු මේ කණ්ඩායමට අදටත් බැරිවෙලා තිබෙනවා, පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරු කවුද කියන එක පිළිබඳව රටට හෙළිදරව් කරලා, රටේ නීතිය ක්‍රියාත්මක කරලා, වැරදිකරුවන්ට දඬුවම් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි අපි පැහැදිලිවම රටේ ජනතාවට කිව්වේ, මේ ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කිරීම සඳහා කටයුතු කරන්නට අවශ්‍යයි කියලා. එහෙම තිබියදී මේ රටේ කතෝලික ජනතාවට පොරොන්දු දීලා වර්තමාන ආණ්ඩුව මේ රටේ බලය ලබා ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, අතිඋතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් සමඟ වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මහත්මයා කටුවාපිටිය දේවස්ථානයට ආවා. එතුමා එලෙස එතැනට ආවේ ජනාධිපති වුණාට පසුව. තවදුරටත් කියනවා නම්, පාර්ලිමේන්තු මැතිවරණය කැඳවා තිබෙනකොට තමයි එතුමා කටුවාපිටිය දේවස්ථානයට ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කටුවාපිටිය දේවස්ථානයට ඇවිල්ලා අල්තාරයට නැඟලා පොරොන්දු වුණා, මේ ප්‍රහාරයේ මහ මොළකරු අප්‍රේල් 21වැනි දාට කලින් හෙළිදරව් කරනවා කියලා. ඒ පිළිබඳව එතුමාට තොරතුරු තිබෙන බවත් කිව්වා. ඒ පිළිබඳව පරීක්ෂණ කරන බවත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද වෙනකල් අවම වශයෙන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශවත් ක්‍රියාත්මක කරන්න මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා; බැරිවෙලා තිබෙනවා. මේක තමයි ඇත්ත. හැබැයි, දේශපාලන වශයෙන් තමන්ගේ මැතිවරණ වේදිකාවේ මේ පාස්කු ප්‍රහාරය පිළිබඳව පුළුවන් තරම් කථා කරලා ජනතාවට පොරොන්දු දුන්නා. නමුත්, දැන් ඒ පොරොන්දු ඉෂ්ට කරගන්න බැරිව තටම තටම ඉන්නවා. එහෙම තිබියදී තමයි මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මහත්මයා මේ පාර්ලිමේන්තුවේ High Posts Committee එකට ඇවිල්ලා කියන්නේ, මේ ප්‍රහාරය එල්ල කරපු මහ මොළකරු හඳුනාගෙන තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම හඳුනාගෙන තිබෙනවා නම්, ඇයි මේ පරීක්ෂණ පිළිබඳව ප්‍රගතිය වාර්තා කර නැත්තේ; ගරු අධිකරණයට කරුණු වාර්තා කර නැත්තේ?

මේ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයේ ගැටලුව කාලයේ වැලි තලාවෙන් යටපත් වෙනකල්ද ඉන්නේ කියා අපි අහනවා. මොකද වර්තමාන ජනාධිපතිතුමා කිව්වා, කාලයේ වැලි තලාවෙන් මේක යටපත් වෙන්න දෙන්නේ නැහැ කියලා. හැබැයි දැන් සිදු වෙමින් පවතින්නේ ඒ දෙය නොවෙයිද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? High PostsCommittee එකේ Minutes මා ළඟ තිබෙනවා. එහි තිබෙනවා, "In response to a question raised by Hon. Member of Parliament regarding the progress of investigation into the Easter Sunday attack, Mr. Seneviratne revealed that the Criminal Investigation Department has almost identified the perpetrators. They will be brought to justice very soon" කියලා. මොකක්ද මේ කියන්නේ? ඒගොල්ලන් හඳුනාගෙන තිබෙනවා කියනවා, මේ මහ මොළකරු, එහෙම නැත්නම් මේ අපරාධය කරපු අය. එහෙම හඳුනාගෙන තිබෙනවා නම් ඇයි, ඒ

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

හඳුනාගෙන තිබෙන කෙනාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක නොකරන්නේ? එම කටයුත්ත තත්පරයක් හෝ ප්‍රමාද වනවා කියන්නේ මේ රටේ ජනතාවට යුක්තිය ඉටුවීම ප්‍රමාද වීම නොවේද කියන ප්‍රශ්නය අපි අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අතේ තිබෙනවා, National Catholic Committee for Justice to Easter Sunday Attack Victims එකෙන් නිකුත් කළ ලිපියක්. මම මේක මීට කලිනුත් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. මේ ලිපිය කාදිනල් හිමිපාණන් වාගේම රදගුරු වහන්සේලාත් අත්සන් කර තිබෙනවා. පැහැදිලිවම ඒ අය අවධානය යොමු කර තිබෙන කාරණා ගණනාවක් මෙහි තිබෙනවා. අබු හින්ද් කියන්නේ කවුද කියන එක මෙහිදී ප්‍රශ්න කරනවා. මෙහි සඳහන් වනවා, "2:3 සහරාන්ට ඉහළින් පුද්ගලයෙක් පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් හෙළිදරව්කොට තිබේ. -ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ 7468 පිටුව" යනුවෙන්. එතකොට මේ කවුද? එතුමා අද මේ අමාත්‍යාංශයේ ලේකම්. එතුමාට පුළුවන්, මේ පිළිබඳව ප්‍රසිද්ධියේ බැරි නම්, ගරු අධිකරණයට, නීතිපතිවරයාට තොරතුරු දෙන්න. තුන්සියයකට ආසන්න පිරිසක් මැරිලා, පන්සිය ගණනක් තුවාල වෙලා, සංචාරකයින් මරණයට පත් වෙලා, අපි වැඳුම් පිදුම් කරන කතෝලික දේවස්ථාන කුඩුපට්ටම් වෙන්න එදා බෝම්බ ගැහුවා.

රවී සෙනෙවිරත්න මොකටද මේක හංගාගෙන ඉන්නේ? මහ මොළකරු දන්නවා නම් ඇයි ඉදිරිපත් කරන්න බැරි? අපිට ඇඟිල්ල දිගු කරනවා, අපේ ආණ්ඩුව තිබුණු කාලයේ බෝම්බ පිපිරුණා කියලා. අපේ දේශපාලන අධිකාරියේ හිටපු ජනාධිපතිවරයාට, පොලිස්පතිවරයාට, ඒ කණ්ඩායම්වලට අද නීතිය ක්‍රියාත්මක වෙලා ඉවරයි. ඇයි, මහ මොළකරුට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ? ඇයි, මහ මොළකරු ආරක්ෂා කරන්නේ? මොකක්ද, මහ මොළකරු එක්ක තිබෙන ඩීල් එක? ඊබ්‍රාහිම් මහාජීගේ කවුරු හරිද? මොකක්ද, මේ ප්‍රශ්නය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කතෝලික මන්ත්‍රීවරු හැටියට අපි පාර්ලිමේන්තුවේදී උගුර කැඩෙනකන් කෑ මොරසන් දීලා කියලා තිබෙනවා, මේ වෙනුවෙන් යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා. මේ NPP ආණ්ඩුව බලයට ආවේ කතෝලික ජනතාවගේ ඡන්දවලින්. ඒක මතක තියා ගන්න. එහෙම තිබියදී කතෝලික ජනතාවට මේ කරන අපහාසයට අපි විශ්වාස කරන දෙවියන් වහන්සේගේ බලයෙන් මේ අයට අත්වෙන ඉරණම පිළිබඳවත් කල්පනා කරලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන්ට මේ මහ මොළකරු අද හංගන්න පුළුවන්, හැබැයි, යුක්තිය, සාධාරණත්වය දෙවියන්ගෙන් ඉෂ්ට වෙන එක නතර කරන්න බැහැ. මේ මහ මොළකරු කවුරු වුවත් කවදා හෝ ඒක හෙළිවෙනවා. ඒ නිසා අපි එතුමාට කියනවා, කරුණාකරලා මේක පිටුපස හිටපු මහ මොළකරු ඔබතුමා දන්නවා නම් භය නැතුව කියන්න කියලා. හංගාගෙන ඉන්න එපා. මේ ආණ්ඩුවටත් අයිතියක් නැහැ, මහ මොළකරු හංගාගෙන ඉන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අපි අහනවා, 27F8/U5, Windsor Avenue, Dehiwala කියන ලිපිනයේ රුපියල් මිලියන 30ක apartment එකක් අරගෙන තමුන්ගේ පුතා වැඩ කරන ආයතනයත් එක්ක ගෙන ගිය සම්බන්ධය මොකක්ද කියලා. ඒ නිසා මේ පාස්කු ප්‍රහාරය හංගන්න උත්සාහ ගන්න එපා. අපි පැහැදිලිව මේ පාස්කු ප්‍රහාරයෙන් පීඩාවට පත් වින්දිතයින්ට යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට වෙනකන් සටන් කරනවා. මේ අයට මේ ප්‍රශ්නය වැලිතලාවේ යට ගහන්න දෙන්නේ නැහැයි කියන එකත් මම කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේගොල්ලන් තමයි එදා අපිට තොරතුරු දුන්නේ. ශානි අබේසේකරලා, රවී සෙනෙවිරත්නලා තමයි එදා අපිට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න තොරතුරු දුන්නේ. මම විශ්වාස කරනවා, මේ ලිපි ගොනුව හදන්න එතුමන්ලා තමයි තොරතුරු දුන්නේ කියලා. සොනික් සොනික්ලා ගැන, එහෙම නැත්නම් අබු හින්ද්ලා ගැන අපිට තොරතුරු දුන්නේ මෙතුමන්ලා. මෙතුමන්ලා අපේ වැඩසටහන්වලට ඇවිල්ලා, අපේ කාර්යාලවලට ඇවිල්ලා අපිට තොරතුරු දුන්නා. හැබැයි, අපිට තොරතුරු දීලා මෙතුමන්ලා දැන් හැංගිලා ඉන්නවා. මේ රටේ මිනිස්සු ඝාතනයට ලක් කරලා, මේ රටේ මිනිස්සුන්ගේ ලේ මහ පොළොවට හෙළෙන්න හැරලා, තමුන් ඒ තනතුරේ සිටියදී බෝම්බය පුපුරලා, දැන් තනතුරට ඇවිල්ලා තවමත් කවුද මහ මොළකරු කියලා හොයන්න බැරි නම් මොකක්ද යුක්තිය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? කොහේද යුක්තිය තිබෙන්නේ? මම අහන්නේ මේකයි. මේකේ තනිකරම පිටුවක් පිටුවක් ගණනේ තිබෙන්නේ ශානි අබේසේකර මහත්තයාගේයි, රවී සෙනෙවිරත්න මහත්තයාගේයි තොරතුරු. එහෙම නම්, ඇයි මේවා හංගාගෙන ඉන්නේ කියලා අපි අහනවා. හංගන්න පුළුවන්. හැබැයි, හැම දාම හංගන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැම දාම මේ ආණ්ඩුවේ අය මොකක්ද කරන්නේ? Lists ඉදිරිපත් කරනවා නේ, අරයාගේ list එක, මෙයාගේ list එක කියලා. ඉඩම් ගත්තා, අරක ගත්තා, මේක ගත්තා කියලා lists ඉදිරිපත් කරනවා. මම කියන්නම්, NPP එකේ කුඩු list එක. පළමුවෙන්ම එන්නේ කවුද? පුවක්දණ්ඩාවේ සනා. දෙවැනියට, එප්පාවල විදුහල්පති; NPP එකේ දිස්නා මන්ත්‍රීතුමියගේ ස්වාමි පුරුෂයා කුඩු කිලෝග්‍රෑම් එකක් සමඟ අහු වුණා. ඊළඟට, කුමාර හේවගේ තිළිණ කියන university student කෙනෙක්. ඊට පස්සේ ටෝනි; NPP එකේ දෙහිවල - ගල්කිස්ස සංවිධායක.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අන්තර් විශ්වවිද්‍යාලයේ. කලින් අන්තරේ හිටියා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මුජිබුර් මන්ත්‍රීතුමා දන්නවා ඒවා. අන්තරේ හිටියා ලු. මම නම් ඒ ගැන දන්නේ නැහැ. එතකොට මේගොල්ලන්ගේම කට්ටිය නේ. හරිද? මෙන්න, කුඩු list එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියන්නේ ඒකයි. මේගොල්ලන් එක පැත්තකින් කවුරුන් හෝ ඇඟිල්ල දිගු කළාම කුඩු ගෙනෙනවා කියලා ඒ පුද්ගලයාට චෝදනා කරනවා, පක්ෂය කියනවා, ඊට පස්සේ ඒ කෙනාට දේශපාලන කථා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද ඒගොල්ලන්ට මොකද වෙලා තිබෙන්නේ? අද ඇඟිල්ල දිගු වෙලා තිබෙන්නේ ඒ අයට; අද ඒ අයට ඇඟිල්ල දිගු වෙලා තිබෙන්නේ. ඒගොල්ලන් ඇල්លුවේ නැහැ, පොලීසියෙන් ඇල්លුවේ. පොලීසියෙන් ඇල්ලුවාම, ඒ අයව නිදහස් කරන්න කියලා පොලීසියට ගිහිල්ලා කියා තිබුණා. කළුතර එක්කෙනෙකුත් එහෙම කියලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපේ කට අවුස්සා ගත්තොත් එහෙම ඒවා කියන්න වෙනවා. ඒ ගැන තොරතුරු තිබෙනවා. හරිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේගොල්ලන්ට රිදිලා තිබෙන්නේ. අපි වධකාගාර කරගෙන ගිය අය ළඟ හිටියා, අරකේ හිටියා, මේකේ හිටියා කියලා අපේ පක්ෂයට ඇඟිල්ල දිගු කළා නේ. ඔය පැත්තේ අයත් හිටියා. ඒ නිසා දේශපාලනමය වශයෙන්

අඩුවැඩි විධියට අපි ඇඟිල්ල දිගු කර ගත්තොත් ප්‍රශ්න විසඳන්න බැහැ. හැබැයි, ප්‍රශ්න විසඳනවා නම්, යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කිරීම සඳහා එකට වැඩ කරන්න, හරියට වැඩ කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පොඩි ඇරියස් එකක් තිබෙනවා. මගේ කථාව පටන් ගන්න කලින් මම ඒක ඉවර කරගෙන ඉන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கடைசியாக இந்தச் சபையில் பேசியபொழுது, எங்களுடைய அன்பார்ந்த தோட்டத் தொழிலாளர்கள் சம்பந்தமான ஒரு விடயத்தைக் குறிப்பிட்டு இருந்தேன். அதனைச் சில நபர்கள் தமக்குச் சாதகமாகப் பயன்படுத்தி, அரசியல் இலாபம் பெற முயற்சித்தார்கள். நான் இங்கு list ஒன்றை வாசிக்க விரும்புகின்றேன். நிறையப் பேர் நினைத்துக்கொண்டு இருக்கிறார்கள், தோட்டத் தொழிலாளர்கள் இது சம்பந்தமாக விளங்கக்கூடியவர்கள் அல்லர் என்று. என்னிடம் நிறையப் பேர் சொன்னார்கள், "உங்களுடைய வாதங்களை அவர்களால் விளங்கிக்கொள்ள முடியாது. ஆகவே, அவ்வாறு சொல்ல வேண்டாம்" என்று. நான் சொல்கின்றேன், அவர்களுக்கு நன்றாக விளங்கிக்கொள்ளக்கூடிய அறிவும் ஆற்றலும் இருக்கின்றது என்று.

මම ගිය වතාවේ කරපු කථාව ගැන කියලා ඉවර වෙලා මේ subject එකට එන්නම්. මමත් පොඩි list එකක් කියවන්න තමයි කල්පනා කරන්නේ The Thalawakelle Tea Estates' recorded profit before tax was Rs. 3.29 billion. Thalawakelle Tea Estatesக்குக் கிடைக்கப்பெற்ற ஆதாயம் 3.29 பில்லியன் ரூபாய். அதாவது, ஏறத்தாழ 329 கோடி ரூபாய். With regard to Bogawantalawa Plantations, it was Rs. 1.04 billion. Bogawantalawa Plantationsஇன் ஆதாயம் ஏறத்தாழ 100 கோடி ரூபாய். Agalawatte Plantationsஇன் ஆதாயம் ஏறத்தாழ 50 கோடி ரூபாய். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்படி பாரிய இலாபத்தைப் பெறுகின்ற கம்பனிகளின்கீழ் தொழில்புரிகின்ற தோட்டத் தொழிலாளர் களுக்கு அரசாங்கத்தால் ஒதுக்கப்பட்ட 5,000 மில்லியன் ரூபாயிலிருந்து குறித்த கொடுப்பனவைக் கொடுக்காமல், அந்தக் கம்பனிகளின் ஆதாயத்திலிருந்து கொடுக்க வேண்டும் என்றுதான் நான் சொல்லியிருந்தேன்.

මට මතකයි, ජනාධිපතිතුමා එක සැරයක් කියලා තිබුණා, තමන්ගේ වතු කම්කරු සේවකයන්ට වැඩිපුර වැටුපක් දෙන්න බැරි සමාගම් රජයට පවරා ගන්නවා කියලා. ඒ ගැන නොවෙයි, මම දැන් කියන්නේ. අධික ලාභ ලබා ගත් සමාගම් තුන -තවත් එවැනි සමාගම් ඇති. විස්තර හැම එකක්ම හරියට මා ළඟ නැහැ. ඒ අය හරහා මට ගන්න බැරි වුණා- ඒගොල්ලන්ගේ වතු කම්කරුවන්ට ලබා දෙන වැඩි කළ රුපියල් 400 වැටුපට, රුපියල් 200ක් රජයෙන් වියදම් කරන්න අවශ්‍ය නැහැ කියන එකයි මම කිව්වේ. එතකොට මොකක්ද වෙන්නේ? එතකොට අපට පුළුවන් වෙයි, ඒ රුපියල් බිලියන 5න් යම්කිසි මුදලක් ඉතුරු කරගෙන ඒ මුදලින් තවත් රුපියල් 50ක්, නැත්නම් රුපියල් 100ක් නැවත ඒ වතු කම්කරුවන්ට වැඩිපුර දෙන්න.

தோட்டத் தொழிலாளர்களுக்கு அரசாங்கத்தால் ஒதுக்கப் பட்ட 5 பில்லியன் ரூபாயில் ஒரு ரூபாயைக்கூட நீங்கள் திரும்பவும் எடுக்கக் கூடாது. அதை அவர்களுக்கே கொடுக்க வேண்டும். அதிக இலாபம் பெறுகின்ற பெருந்தோட்டக் கம்பனிகளே தங்களுடைய தொழிலாளர்களுக்கு அந்த அதிகரித்த சம்பளத்தைக் கொடுக்க வேண்டும். அவ்வாறு கொடுக்கும்போது, மிகுதியாகின்ற இந்தப் பணத்தை அரசாங்கம் மீண்டும் அதே தோட்டத் தொழிலாளர்களுக்கு மாதம் 50 ரூபாய் அல்லது 100 ரூபாய் என்ற வகையில் உயர்த்திக் கொடுக்க வேண்டும் என்பதே என்னுடைய வாதமாகும். எந்த அரசாங்கமாக இருந்தாலும், இலாபம் ஈட்டுகின்ற தோட்டக் கம்பனிகளுக்கு இந்தக் காசை வழங்கக் கூடாது. அந்தத் தொழிலாளர்களுக்கு சம்பளத்தை அதிகரித்துக் கொடுக்கும் முழுப் பொறுப்பையும் அந்தக் கம்பனிகளே ஏற்க வேண்டும்.

ඇත්ත වශයෙන්ම මේක හරි වැදගත් ප්‍රශ්නයක්. මොකද, වතු කම්කරුවන් වෙනුවෙන් ලබා දෙන මුදල ඔවුන්ටම ලබා දිය යුතුයි. නමුත් අධික ලාභ ලබන සමාගම්, ඒගොල්ලන්ගේ කම්කරුවන්ට වැඩි කළ සම්පූර්ණ වැටුප දෙන්න ඕනෑ. ලාභ නොලබන වතු සමාගම් -පෞද්ගලික වතු සමාගම් සහ රජයට අයිති වතු සමාගම්- තිබෙනවා. ඒවායේ වැඩ කරන වතු කම්කරුවන්ට අනිවාර්යයෙන්ම ඒ මුදල ලබා දිය යුතුයි.

ඒ විතරක් නොවෙයි, තවත් කාරණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ තිබෙන ඉඩම් කාගේද? ඒවා රජයේ. ඒවා ඒ සමාගම්වලට අයිති ඒවා නොවෙයි. ඒවායේ තිබෙන වැවිලි කාගේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? බොහොමයක්ම රජයේ. පොඩි ප්‍රතිශතයක් හැරෙන්නට ඒවා ඒගොල්ලන් ගෙනැල්ලා ඇති කර ගත් ඒවා නොවෙයි. "ශ්‍රී ලංකා තේ" කියන කීර්ති නාමය ඔය කොම්පැනිවල අයගේ අම්මාගේ, තාත්තාගේ නොවෙයි, රජයේ සහ ජනතාවගේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
රෝහිණී මන්ත්‍රීතුමියගේ පැත්තට තව එක් කෙනෙක් ඉන්නවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ඒක තමයි. ඔයගොල්ලෝ උත්සාහ ගන්නවා, ඒක පොඩ්ඩක් කරකවා ගන්න. ඒක ඉස්සෙල්ලාම කිව්වේ මම. මම කියන එක පොඩ්ඩක් හරියට අහගන්න. රෝහිණී මන්ත්‍රීතුමිය කියන්න ඉස්සෙල්ලා තමයි මම කිව්වේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා කලබල වෙනවා කියලා මම දන්නවා. "ශ්‍රී ලංකා තේ" කියන කීර්ති නාමය කාටද අයිති? ලංකාවට. ඒ කීර්ති නාමය අයිති වෙන්නේ, මේ රජයට සහ ජනතාවට. ඉඩම අයිති වෙන්නේ රජයට සහ ජනතාවට. එතකොට ඒකේ තිබෙන infrastructure කාටද අයිති වෙන්නේ? ජනතාවට. ඒ ඔක්කෝම අධික ලාභ ලබන සමාගම්වලට දීලා තිබෙනවා. ඒගොල්ලෝ බිලියන ගණන් ලාභ ලබනවා. ඒ සමාගම්වල සිටින වතු කම්කරුවන්ට, ලංකාවේ අපට අය වැයෙන් වෙන් කරපු සල්ලිවලින් වැටුප් වැඩි කරන්න අවශ්‍ය නැහැ. මොකද, ඒගොල්ලෝ ඒ මුදල්වලින් වතු කම්කරුවන්ට රුපියල් 400ක් ලබා දිය යුතුයි. මම කියන්නේ, ඒ මුදල අරගෙන මේ වතු කම්කරුවන්ට තවත් රුපියල් 50ක්, නැත්නම් රුපියල් 100ක් වැඩි කර දෙන්න කියලායි. ගරු සභාපතිතුමනි, රජය හිතාගෙන ඉන්නවා ඇති, දේශපාලනයෙන් මොකක් හරි දෙයක් කරලා මේක කර ගන්න පුළුවන් කියලා. එහෙම නොවෙයි. உண்மையில், தோட்டத் தொழிலாளர்கள் இவற்றை விளங்கிக் கொள்ள முடியாத சமூகம் என்றும் எதனையும் சொல்லிவிட்டு அதைத் தனக்குச் சாதகமாகப் பயன்படுத்திக் கொள்ளலாம் என்றும் இந்த அரசாங்கம் நினைத்துக்கொண்டு இருக்கின்றது. ஆனால், தோட்டத் தொழிலாளர்கள் தங்களுடைய உரிமைகள் பற்றி சரியாக விளங்கிக்கொண்டு இருக்கிறார்கள்.

ඊළඟට මම කථා කරන්නම්, අද සාකච්ඡා කරන වැය ශීර්ෂ පිළිබඳව. ගරු සභාපතිතුමනි, ආරක්ෂක අමාත්‍යාංශය පිළිබඳව අපි දිගින් දිගටම කථා කළා. ගරු සභාවේ මේ වෙලාවේ නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා කියලා මම හිතනවා. ඔව්, එතුමා ඉන්නවා. ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයින් ඉන්නවා. අවාසනාවකට, කවුරු හරි පක්ෂ නායකයින් පිළිබඳව විස්තර පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා බැලුවොත්, මගේ පක්ෂය වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන පක්ෂ නායකත්වය පිළිබඳ තොරතුරු ඒකේ නැහැ. Tamil Progressive Alliance එකේ පක්ෂ නායකත්වය පිළිබඳවත් තොරතුරු නැහැ. හැබැයි, Manthri.lk ඒකේ තිබෙනවා. එතැන සිදුවෙලා තිබෙන්නේ මෙයයි. සමගි ජන සන්ධානයේ සන්ධානගත පක්ෂවල නායකයින් පිළිබඳව, එතුමන්ලාගේ අනන්‍යතාව පිළිගැනීම පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ කාරණය අද මතු කරන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, දශක දෙක තුනකට වැඩි කාලයක් දේශපාලනය කරපු පක්ෂ නායකයින්ට අනිවාර්යයෙන්ම ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද ඒ ප්‍රශ්නය? තමන් නියෝජනය කරන ප්‍රදේශවල සහ අනෙකුත් ප්‍රදේශවල දේශපාලන කටයුතු කරගෙන යනකොට එදිරිවාදිකම් තිබෙන දේශපාලන පක්ෂත් එක්ක, එදිරිවාදිකම් තිබෙන දේශපාලන කණ්ඩායම් එක්ක හැප්පෙන්න සිදු වෙනවා. එතකොට අනිවාර්යයෙන්ම ඔවුන්ට ආරක්ෂාව පිළිබඳව විශාල ප්‍රශ්නයක් මතු වෙනවා. අද පොලිස්පතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇති. ඒ නිසා තමයි මේ ගැන දැනුවත් කිරීමක් කරන්න ඕනෑ කියලා මම හිතුවේ. පක්ෂ නායකයින්ට ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ඔවුන් ඉල්ලීමක් කළොත්, ඒ පිළිබඳ විශේෂ තක්සේරුවක් ලබා ගන්න අවශ්‍ය නැහැ. මොකද, පක්ෂ නායකත්වය ලබා ගැනීම හරහා සහ දශක දෙක තුනක් දේශපාලනයේ නිරත වීම හේතු කොටගෙනම ඔවුන්ට ආරක්ෂාව සම්බන්ධව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ලබා දිය හැකි අවම ආරක්ෂාව හෝ ඒ සියලුම පක්ෂ නායකයින්ට ලබා දෙන්න කියලා මම ඉතාම යටහත් පහත්ව ඉල්ලා සිටිනවා.

ඊළඟට පොලිසිය සම්බන්ධයෙනුත් මට අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන්න තිබෙනවා. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමාත් මේ ගැන කිව්වා. 2010දී, නැත්නම් 2012ට පස්සේ, I am subject to correction, පොලිස් සාජන්ට්ලාගේ උසස්වීම් පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ ගැන නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා ඇති. මම හිතන විධියට, ඒකට නඩුවකුත් දමලා තිබෙනවා. අවුරුදු 12ක් සේවය කරපු,- නැඟෙනහිර පළාතේ සේවය කරන පොලිස් සාජන්ලා හාසිත් මන්ත්‍රීතුමා හරහා මට මේ විස්තර ලබා දුන්නා පාර්ලිමේන්තුවේදී කියන්න කියලා. මොකද, එතුමාට මේ අවස්ථාව නොලැබෙන නිසා.

අවුරුදු 12කට වැඩි කාලයක් ඒ සේවයේ යෙදී සිටින පොලිස් සාජන්ට්ලා පිරිසක් ගැනයි මේ කියන්නේ. පොලිස් සාජන්ට් කියන්නේ හරිම වැදගත් නිලයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පොලිස් ස්ථානයක අධිකරණ කටයුතු පිළිබඳව මනා නිපුණත්වයක් සහ දැනුමක් තිබෙන පුද්ගලයා තමයි පොලිස් සාජන්ට් කියන්නේ. ඒගොල්ලන්ට තිබෙන ඊළඟ උසස්වීම තමයි උප පොලිස් පරීක්ෂක - Sub Inspector - තනතුර. ඔවුන්ගේ එම උසස්වීම් සම්බන්ධයෙන් හරි වැඩ පිළිවෙළක්, ක්‍රියාමාර්ගයක් නැහැ. මොකද, ඒ ප්‍රශ්නය ගැන අභියාචනාධිකරණයේ එක සැරයක් කථා වුණා. ඒගොල්ලන්ට හරි තීන්දුවක් ලැබුණේ නැහැ. මේ උසස්වීම් සම්බන්ධ ප්‍රශ්නය 2012 වසරේ ඉඳලා, මා හිතන විධියට අවුරුදු 12ක්, 13ක්, 15ක් වාගේ දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ට තිබෙනවා. ඒ ප්‍රශ්නය නිරාකරණය කර දෙන්න කියලා ඉල්ලා සිටින්නත් මම මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා.

ගරු සභාපතිතුමනි, අද විවාදයට ගැනෙන වැය ශීර්ෂ යටතේ පාර්ලිමේන්තු කටයුතු විෂය පිළිබඳවත් සාකච්ඡාවට ගැනෙන නිසා තවත් වැදගත් කාරණයක් ගැන කථා කරන්න ඕනෑ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සම්බන්ධයෙනුත් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මම ඒක මේ කථාවට එකතු කිරීමට විශේෂ හේතුවක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. මොකද, යන්ත්‍රෝපකරණ සහ වාහන ලබා ගැනීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියන 12.5ක් වෙන් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමාගේ කථාව අනුව, ඒකෙන් යම්කිසි ප්‍රමාණයකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඔවුන්ගේ ධුර කාලය ඇතුළත භාවිත කරන්න ඩබල් කැබ් ලබා ගැනීමේ අවස්ථාව ලබා දීලා තිබෙනවා. මා හිතන විධියට, සම්පූර්ණයෙන්ම රුපියල් බිලියන 12.5ක මුදලක් යන්ත්‍රෝපකරණ සහ කැබ් රථ ඇතුළු අනෙකුත් වාහන ආනයනය කිරීම සඳහා වෙන් කර තිබෙනවා. මේ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. අපට කරදරයි තමයි. මම ඒක පිළිගන්නවා.

අපි බොහොම අමාරුවෙන් අවුරුද්දක් ගැට ගහගෙන ආවා. "අපි" කිව්වාට, පෞද්ගලිකව මම නොවෙයි; සභාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ඉංජිනේරුවරුන්, එක එක දෙපාර්තමේන්තුවල ඉන්න ඉහළ නිලධාරින්. අපි තවත් අවුරුද්දක් ගැට ගහගෙන යමු මෙහෙම. මම කියන්න හදන්නේ මේකයි. ඔබතුමන්ලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ *parate* execution ප්‍රශ්නය නිසා distress loan එකක් ලබා දීම සඳහා රුපියල් මිලියන 5,000ක් පමණ වෙන් කර තිබෙනවා. පරාටේ නීතිය නිසා හිර වෙලා තිබෙන ඔවුන්ගේ ව්‍යාපාර නැවත කරගෙන යෑමට අවශ්‍ය ආධාර උපකාර ලබා දීම සඳහා තමයි ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ. ඒ වෙන් කර තිබෙන මුදල ඔබතුමන්ලා හඳුන්වා තිබෙන්නේ "Rs. 5,000 million for defaulting SMEs with revival potential" කියලායි. ඔවුන්ට නැවත ඒ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා ආධාර, උපකාර කිරීමට රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. මම කියන්නේ, යන්ත්‍රෝපකරණ සහ වාහන ගෙන්වන්න වෙන් කරපු රුපියල් බිලියන 12.5ක මුදලින් බිලියන 7.5ක් අරගෙන අර රුපියල් මිලියන 5,000ට එකතු කරලා, ඒ මුදල රුපියල් මිලියන 12,500ක් දක්වා වැඩි

කරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට දෙන්න කියලායි. අපිට පුළුවන්, තව අවුරුද්දක් හරි මෙහෙම ගැට ගහගෙන අමාරුවෙන් ඉන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අනෙක් මන්ත්‍රීවරුනුත් මා සමඟ එකඟ වෙයි. එය මේ අවුරුද්දේත් නොලැබුණා කියලා අපට ලොකු ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම අත්‍යවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ අලුත්වැඩියාවක්වත් කරලා පාවිච්චි කරන්න බැරි වාහන තිබෙන පුද්ගලයන්ට පමණක් අවශ්‍ය වාහන ටිකක් ගෙන්වා ගෙන, වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා වෙන් කරපු මුදලින් සියයට 50ක් විතර කපලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබා දෙන්න. මම එහෙම කියන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක්, ගැටලුවක් දැන් මතු වී තිබෙන නිසායි. ඔය *parate* execution moratorium එක ගැන ඔබතුමාත් දන්නවා ඇති නේ; අපට දිගටම නඩු එන්නේ ඒවාට නේ. ඒක දැන් ඉවත් කරලා. උසාවි ගාණේ ගිහිල්ලා ඒ ඉවත් කිරීම නවත්වා ගන්න -අතුරු තහනම් නියෝගයක් ගන්න- අපි ලැස්ති වෙනවා. උසාවියත් ඒක ලේසියෙන් දෙන්නේ නැහැ. දැන් පරාටේ *parate* execution පටන් ගන්නවා. මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අයිති සියලුම ගිණුම් CRIB එකේ වැටිලා තිබෙන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ඔබතුමන්ලා ඔය දීලා තිබෙන රුපියල් මිලියන 5,000 ඒගොල්ලන්ට පාවිච්චි කරන්න බැහැ. මොකද, ඒවාත් යන්නේ බැංකු හරහා. බැංකුවකින් නැවත කිසිම ණය පහසුකමක් ලබාගන්න බැහැ, ඒ මිනිසුන්ට. මොකද, ඒගොල්ලන්ගේ නම් CRIB එකේ තිබෙනවා.

இன்று சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்கள் பாரிய கஷ்டத்தில் இருந்துகொண்டு இருக்கின்றார்கள்; தங்களுடைய கடன்களை அடைக்க முடியாமல் இருக்கின்றார்கள். அதனால் அவர்களுடைய ஆதனங்களை வங்கிகள் ஏலத்தில் விடுவதற்குத் தயாராகிக்கொண்டு இருக்கின்றன. அதாவது, *parate* execution. இந்தச் சூழ்நிலையில், அவர்களை இந்தப் பிரச்சினையிலிருந்து காப்பாற்றுவதற்காக அரசாங்கம் 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. உண்மையிலேயே இந்தத் தொகை போதாது. இதைக்கூட அவர்கள் வங்கி ஊடாகத்தான் பெற்றுக்கொள்ள வேண்டும். அவர்களுடைய பெயர் CRIBஇல் இருக்கும்போது, எப்படி அவர்கள் வங்கி ஊடாக அதைப் பெற்றுக்கொள்வது? எனவே, அவர்களால் அதைப் பெற்றுக்கொள்ள முடியாது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, altogether, I have 22 minutes. I have been allotted the time of the Hon. Rauff Hakeem as well.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Your time ends at 5.07 p.m.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I think it has not been brought to your attention, Sir, that the Hon. Rauff Hakeem's 10 minute has also been given to me.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
I will check it.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Okay, Sir.

இவ்வாறு சிறிய, நடுத்தர தொழில்முயற்சியாளர்கள் பாரிய பிரச்சினைக்கு முகங்கொடுக்கின்றார்கள். அவர்களை அதிலிருந்து மீட்டெடுக்க எடுக்க வேண்டும் என்றால், அவர்களுக்கு மீண்டும் வங்கியூடாக ஏதாவது நிவாரணம் கொடுக்க வேண்டும். ஆனால், அவர்களால் வங்கிக்குப் போக முடியாது. ஏனென்றால், அவர்களுடைய பெயர் CRIBஇல் இருக்கின்றது. நான் இந்த விடயத்தை எப்படிப் பார்க்கின்றேன் என்றால், "குயில புடிச்சி கூண்டில் அடச்சி கூவச் சொல்லுகிற உலகம்" போன்றுதான். சிறிய மற்றும் நடுத்தர தொழில் முயற்சியாளர்களின் நிலைமையானது, எப்படி இருக்கின்ற தென்றால், "உங்களுக்கு மீண்டும் கொஞ்சம் பணம் தருகின்றேன், இந்தப் பிரச்சினையில் இருந்து மீள்வதற்காக" என்று சொல்லிவிட்டு -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your 20 minutes will end by 5.07 p.m.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
How many minutes more do I have, Sir?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
You have only one more minute.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Have I already utilized 19 minutes?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I did not realize that. Thank you. I will try to sum up quickly.

எனவே, இந்த வேலையைச் செய்யக் கூடாது. எங்களுக்கு வழங்கப்பட இருக்கின்ற cabs மற்றும் ஏனைய திணைக்களங் களுக்குக் கொடுக்க இருக்கின்ற வாகனங்களுக்காக Budgetஇல் ஒதுக்கப்பட்டுள்ள 12.5 பில்லியன் ரூபாயில் அரைவாசியையாவது சிறிய, நடுத்தர தொழில்முயற்சி யாளர்களுக்கு நிவாரணம் கொடுப்பதற்கு ஒதுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Please give me half a minute, Sir. I am summing up.

நான் Easter Sunday attacks பற்றி பேச வேண்டுமென நினைத்திருந்தேன். அது பற்றி கௌரவ கவிந்த ஹேஷான் ஜயவர்தன அவர்கள் பேசியதால் நான் பேசவில்லை. சந்தர்ப்பம் கிடைக்கும்போது, அது சம்பந்தமாகப் பேசுவேன் எனக் கூறி, விடைபெறுகின்றேன்.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Ramanathan Archchuna. You have 12 minutes.

[பி.ப. 5.07]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
දැන් මේ සිද්ධිය වුණාට පස්සේ දිසාපති කාර්යාලයේ සාකච්ඡාවක් තිබුණා. දිසාපති කාර්යාලයේ සාකච්ඡාවේදී එකඟතාවකට ආවා, නියමිත මිනින්දෝරුවෙකු මෙතැනට දාලා, මේ ඉඩම හරියටම මැනුම් කටයුතු කරලා, මේ ඉඩම බෙදලා වෙරළ සංරක්ෂණ ආයතනයට අයිති කොටස කෝකද, ඒක ඒ ආයතනයට නම් කරලා දෙන්නත්, පන්සලට අයිති භූමිය නම් කරලා දෙන්නත්. එහෙම සාකච්ඡාවකට ආවා, ඊයේ. නමුත් ඒ සාකච්ඡාවේදී තමයි අර පරණ නඩුවත් එක්ක අධිකරණයේ නියෝගය ආවේ. අධිකරණය දැන් දීලා තිබෙන නියෝගය තමයි අලුත් ඉදි කිරීම් කිසිවක් කරන්න එපා, තිබෙන ඉදි කිරීම් ඉවත් කරන්නත් එපා, අධිකරණයෙන් තීන්දුවක් ලබා දුන්නාට පසුව, - අපිත් ඉන්න ස්ථාවරය- පන්සලට හිමි භූමිය වෙන් කරලා දුන්නාට පස්සේ ඒකේ ඒ අදාළ වැඩකටයුතු කරන්න පුළුවන් කියන එක. *[බාධා කිරීමක්]* ඔව්. හැබැයි, දැන් තිබෙන්නේ මොකක්ද? ඇත්තට ගත්තොත්, දැන් මේ ප්‍රශ්නය අවසන්. අධිකරණයෙන් නියෝගයක් ලබා දීලා තිබෙනවා, බුදු පිළිම වහන්සේ වැඩම ඉන්න එතැන නැවත අලුත් ඉදි කිරීම් කරන්න එපා, ඊට පස්සේ නිරාකරණය කරලා මේ දේ බේරලා දෙන්නම් කියලා. දැන් තවත් නටන්නේ ඇයි?*[බාධා කිරීමක්]* නැහැ, මම මේ කියන්නේ දැන් නටන්නේ මොකටද? මේක තමයි තිබෙන ප්‍රශ්නය.

මේකේ අවශ්‍යතාව තිබුණේ මොකක්ද? අර ජාතිවාදී කණ්ඩායම්වලට අවස්ථාවක් මතු වුණා. ගිනි තියන්න පුළුවන්, හනුමා වලිගයට ගිනි තියා ගත්තා වාගේ. නේද? පොඩි හනුමා ගිහිල්ලාද කොහේද. ගිහිල්ලා දැන් මොකද කරන්නේ? මේක කිය කියා හැම තැනම ගිනි තිය තියා යනවා. මේකයි ඇත්ත කථාව. ඒ නිසා අපි ඉතාම ශක්තිමත් ස්ථාවරයක ඉන්නවා. මම පසුවත් කියන්නම්. මේ ජාතිවාදයට නම් ඉඩ දෙන්නේ නැහැ. ඒක හැම මහත්තයාම තේරුම් ගන්න. මම නොවෙයි, මේ රටේ බෞද්ධ ජනතාව ඉඩ දෙන්නෙත් නැහැ. මේ රටේ හින්දු, කතෝලික, මුස්ලිම් පොදු ජනතාව ජාතිවාදයට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා කවුරු හරි උත්සාහ කරනවා නම්, නැවත පැරණි ජාතිවාදී නාඩගම් මේ රටේ ඇති කරන්න, ඒක ඉතිහාසයම විතරයි. මේ මහත්වරු හොඳට තේරුම් ගන්න ඕනෑ, ඒක වර්තමානයත් නොවෙයි, ඒක අනාගතයත් නොවෙයි. අපේ රටේ අනාගත දේශපාලන න්‍යාය පත්‍රය ජාතිවාදය මත ලියවෙන්නෙත් නැති බව, වර්තමාන දේශපාලන න්‍යාය පත්‍රය ජාතිවාදයෙන් ලියවෙන්නෙත් නැති බව ඒ මහත්වරු තේරුම් ගන්න ඕනෑ. ඒක තමයි ඒ සිද්ධිය.

විශේෂයෙන් මම මේ අවස්ථාවේදී මූලික වශයෙන් අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩකටයුතු පිළිබඳ යම් කරුණු කිහිපයක් කියන්න ඕනෑ. අපි තේරුම් අරගෙන තිබෙනවා, අපේ ඕනෑම ආරක්ෂක හමුදාවක් සූදානම් වෙන්නේ අපට කවර ආකාර තර්ජනයක් මතු විය හැකි වේද කියන උපකල්පන මත බව. කවර තර්ජනයක්ද, අපට තිබෙන්නේ? අපි වර්තමානයේ අපේක්ෂා කරනවා, ලංකාව තුළ දිගු කාලයකට යළි සිවිල් යුද්මය තත්ත්වයක්, අභ්‍යන්තර විශාල සිවිල් යුද්මය තත්ත්වයක් පැන නඟින්නේ නැහැ කියා. ඒක හරි පැහැදිලියි. ඊළඟට, අපි හිතනවා නම්, මෑත කාලයේ කවර හෝ බටහිර කොහේ හෝ රාජ්‍යයක් විසින් අපිව ආක්‍රමණය කරයි කියලා, එහෙම නම් එයට සූදානම්වීම සඳහා අපි හමුදාවක් නිර්මාණය කරගත යුතු වෙනවා. මම හිතනවා, එහෙම තත්ත්වයකුත් නැහැ. එතකොට විශාල සිවිල් යුද්ධයකට අවශ්‍ය වන හමුදා උපක්‍රම හෝ අපේ රට ආක්‍රමණය කරයි කියලා හෝ හමුදා උපක්‍රමයකට අපි හමුදාව සූදානම් කරන්න ඕනෑ නැහැ, මේ වෙලාවේ තිබෙන පුරෝකථන එක්ක. අපි මේ වෙලාවේ අපේ හමුදා යන්ත්‍රණය සකස් කරන්නේ, අපට තිබෙනවා, ප්‍රධාන වශයෙන් මේ තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති වන තර්ජන. සයිබර් අවකාශයේ, ඒ වාගේම අලුත් තාක්ෂණ මෙවලම් හරහා ඇති විය හැකි තර්ජනයක්; අපේ ජාතික ආරක්ෂාවට එල්ල විය හැකි තර්ජනයක් අපි හඳුනාගෙන තිබෙනවා.

ඊළඟට, අපේ මුහුදු සීමාවේ ආරක්ෂාව පිළිබඳව අපට වගකීමක් තිබෙනවා. එතැන තර්ජනයක හැඩ රුවක් අපි හඳුනාගෙන තිබෙනවා. ඊළඟට, අපට අපේ ගුවන් සීමාවේ ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා තර්ජනයේ ස්වභාවයට අනුව තමයි අපේ හමුදාව අපි සූදානම් කරන්නේ. ඒ නිසා නූතන තාක්ෂණික මෙවලම්වලින් සමන්විත හමුදාවක් ගොඩනැඟීම තමයි අපේ ඉලක්කය බවට පත් වෙලා තිබෙන්නේ. එක තමයි අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය. හොඳ හමුදාවක්. එහිදී විශේෂයෙන් මම කියන්න කැමැතියි පසුගිය කාලයේ අපේ හමුදාව ප්‍රවර්ධනය කිරීමට ජාත්‍යන්තර සහයෝගය විශාල වශයෙන් ලැබිලා තිබෙනවා කියන එක. මම ඔවුන්ට ගෞරවයක් වශයෙන් එය කියන්න කැමැතියි. විශේෂයෙන් ඉන්දියාවෙන් අපට ජීප් රථ 70ක් පමණ ලබා දීලා තිබෙනවා; විවිධ තාක්ෂණික උපකරණ ලබා දීලා තිබෙනවා. අපේ හමුදාව තාක්ෂණික සහ ඉතා හොඳ නිපුණතාවක් සහිත හමුදාවක් බවට පත් කරන්න අවශ්‍ය වන ඇකඩමියක් සඳහාත්; අපට ඒ සඳහාත් ආධාර ලබා දෙන්න ඔවුන්ගේ යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම ගත්තොත්, ඇමෙරිකා එක්සත් ජනපදය TH-57 වර්ගයේ හෙලිකොප්ටර් 10ක් 2026දී ආධාරයක් ලෙස ලබා දෙන්න එකඟතාව පළ කර තිබෙනවා. ඒ වාගේම C-130 වර්ගයේ ගුවන් යානා 2ක් ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව 2026 සහ 2027 වර්ෂවලදී අපට ආධාර වශයෙන් ලබා දෙන්න එකඟතාව පළ කර තිබෙනවා. මම හිතනවා, C-130 කියන ගුවන් යානය අපේ ගුවන් හමුදාවට ඉතාම වැදගත් කියලා. අපට ඒ වර්ගයේ ගුවන් යානා 2ක්, 2026 සහ 2027 වසරවලදී ආධාර ලෙස ඕස්ට්‍රේලියාවෙන් සහ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම Beechcraft King Air 360 aircraft එකත්, Beechcraft King Air 350 aircraft එකත් ඇමෙරිකාවෙන් සහ ඕස්ට්‍රේලියාවෙන් මේ වන කොටත් අපට ලබා දීලා තිබෙනවා, ආධාර ලෙස.

අපේ හෙලිකොප්ටර් බල ඇණියත් සැලකිය යුතු ප්‍රමාණයකින් දුබල වෙලා තිබෙන්නේ. අපට අලුතින් හෙලිකොප්ටර් 10ක් ලැබෙනවා. අපට තිබෙන හෙලිකොප්ටර් ටිකත් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා සියල්ල සකස් කර තිබෙනවා. ඒ ආකාරයට අපි ඉතාම හොඳ, නූතන, කාර්යක්ෂමතාවකින් යුත් හමුදාවක් ඇති කරනවා. ඒක අපේ වගකීම කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, සංහිඳියාව පිළිබඳ ප්‍රශ්නය ගැනත් මම කියන්න කැමැතියි. අපි මේක අදියර 4කින් එකිනෙකට අන්තර් සම්බන්ධතාව සහිතව ක්‍රියාත්මක කරමින් තිබෙනවා. එකක් තමයි සත්‍ය ගවේෂණය, මොකක්ද, සිද්ධ වුණේ කියලා සොයා බැලීමේ වගකීම අපට තිබෙනවා. ඒ නිසා අපේ විදේශ කටයුතු ඇමතිතුමාත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් සමුළුවේදී ප්‍රකාශයට පත් කළා, සත්‍ය ගවේෂණය කිරීම සඳහා

අවශ්‍ය වන යන්ත්‍රණය ශක්තිමත් කිරීමට; මොකක්ද, සිද්ධ වුණේ කියලා සත්‍ය ගවේෂණය කිරීමට අපි එකඟයි කියන කාරණය.

ඊළඟ එක තමයි, යුක්ති ගවේෂණය. ඒ කියන්නේ, යුක්තිය ඉටු කිරීම පිළිබඳ කාරණය. අපි ඒකට කිසිසේත් පැකිළෙන්නේ නැහැ. අපි අපරාධයන්ට විරුද්ධව යුක්තිය ඉටු කරනවා. අපි ඒක කරනවා. හැබැයි, මම දන්නවා, යුක්තිය ඉටු කිරීමේදී බොහෝ විට අර පැරැණි ආකාරයට "රණවිරු දඩයම" වාගේ සාකච්ඡා යළි එන්න ඉඩ තිබෙන බව. ඕක නේ වෙන්නේ.

මම නිශ්චිත ලෙස ප්‍රශ්නයක් අහනවා. අපේ රටේ සිසුන් 11දෙනෙකු පැහැර ගෙන ගොස් ඝාතනය කිරීම පිළිබඳව නාවික හමුදාවේ යම් යම් නිලධාරින්ට චෝදනාවක් එල්ල වී තිබෙනවා. දැන් අපි මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? අපේ රටේ පැවැති යුද්ධය අවසන් කිරීමේදී නාවික හමුදාව පූර්ණ වශයෙන් විශාල කාර්යභාරයක් කළා. හැබැයි, ඒ හා කිසිසේත්ම සම්බන්ධ නොවුණු, ළමයින් 11දෙනෙකු පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම පිළිබඳව චෝදනාවක් එල්ල වී තිබෙනවා. දැන් අපි රටක් හැටියට කරන්න ඕනෑ ඒ චෝදනාවට සමස්ත නාවික හමුදාවම බිලි දෙන එකද, එහෙම නැත්නම් ඒ චෝදනාවට නිසි වරදකරුවන් වන අය හඳුනාගෙන දඬුවම් දීමද? අපි කියනවා, නාවික හමුදාවේ කීර්තිය ආරක්ෂා කිරීම වෙනුවෙනුත් ඒ ළමයින් 11දෙනා අතුරුදහන් වීම පිළිබඳව පරීක්ෂණ කරලා වැරැදිකරුවන් නීතිය හමුවට ගෙන එනවා කියලා. ඒක කළ යුතුයි. නාවික හමුදාවට ආදරය කරන, දීර්ඝ කාලයක් නාවික හමුදාවේ වැඩ කටයුතු කළ කිසිදු නාවික හමුදා නිලධාරියෙකු මේකට විරුද්ධ වෙයි කියලා මම හිතන්නේ නැහැ. මෙය කළ යුතුයි. පරීක්ෂණ කර තිබෙනවා. එතකොට සමහර අය අහන්න පුළුවන්, ඇයි ප්‍රමාද කියලා. ප්‍රමාදයි තමයි. ඇයි, ප්‍රමාද වෙන්නේ? අපි දන්නවා, ඒ ක්‍රියාවලියේම සමහර ඒවායේ ප්‍රමාද වෙන ලක්ෂණ තිබෙන බව. සමහර අයට පුළුවන්, ගිහිල්ලා තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන රිට් ආඥා ගන්න. අපි ඒවාට ඉඩ දෙනවා. මොකද, බලහත්කාරයෙන් කටයුතු කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. එම චූදිතයාටත් ඒ තිබෙන නීතිමය රැකවරණය, ආරක්ෂාව පිණිස අධිකරණයට යන්න පුළුවන්, අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝග ගන්න පුළුවන්, රිට් ආඥා ගන්න පුළුවන්. අපි ඒවාට ඉඩ දෙනවා. එසේ ඉඩ දෙමින් වුණත්, අපි ඉතාම පිරිසිදු ලෙස පරීක්ෂණ පවත්වා දඬුවම් දෙනවා. ඒ නිසා එය නාවික හමුදාවේ රණවිරු දඩයමක් ලෙස කිසිසේත් අර්ථකථනය කරන්න එපා කියලා මම කියනවා. මොකද, එය කළ යුතු දෙයක්.

ඒ වාගේම අපි දන්නවා, සමහර ඝාතන පිළිබඳව හමුදාවේ බුද්ධි අංශවලට චෝදනා එල්ල වෙලා තිබෙන බව. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. එහෙම චෝදනා එල්ල වෙලා තිබෙනවා. දැන් අපි කරන්න ඕනෑ මොකක්ද? ඒ චෝදනා එහෙමම තියාගෙන අපේ හමුදාවේ බුද්ධි අංශයට කළු පැල්ලමක් එකතු කරන එකද? ඒ චෝදනා සත්‍යදැයි සොයා බලා, ඒ චෝදනාවලට අදාළ කාරණාවලට අදාළව යම් කණ්ඩායමක් යෙදී තිබෙනවා නම් ඒ අයට දඬුවම් දෙන එකද? මොකක්ද, යෝග්‍ය? රටක ක්‍රියාවලිය තුළ සාමාන්‍යයෙන් හමුදා යන්ත්‍රණ, පොලිස් යන්ත්‍රණ තිබෙනවා. හැබැයි, ඒවා සාමාන්‍ය කාර්ය පරිපාටි. එතැනින් පරිබාහිරව රටක් ඇතුළේ සිදු වන සිදුවීම් තිබෙනවා. ඒවා රාජ්‍යයක ආරක්ෂාව වෙනුවෙන් ඉතා හොඳින් වාර්තා වෙන්න ඕනෑ, ඉතා හොඳින් සොයා බලන්න ඕනෑ. ඒකට ශක්තිමත් බුද්ධි අංශයක් පැවතිය යුතුයි. ශක්තිමත් බුද්ධි අංශයක් අපට තිබෙන්න ඕනෑ. හැබැයි, ඒ බුද්ධි අංශයේ කීර්තිය පිළිබඳව, ගෞරවය පිළිබඳව විශ්වාසයක් ඇති වෙන්න ඕනෑ පොදු ජනයා තුළ. නමුත් පසුගිය කාලයේ පළ වුණු මාධ්‍ය වාර්තා දෙස බැලුවොත්, පසුගිය කාලයේ සිදු වුණු බොහෝ සිදුවීම් දෙස බැලුවොත්, සමහර ඝාතන පිළිබඳව ඔවුන්ට චෝදනා එල්ල වී තිබෙන බව පෙනෙනවා. ඔවුන් කිහිප දෙනෙකුට චෝදනා එල්ල වී තිබෙනවා.

අපි ඒ බව පිළිගන්න ඕනෑ. මම මේවා නොකියා හිටියා කියලා, මම මේවා හංගාගෙන හිටියා කියලා, රට හෝ සමහර ජාත්‍යන්තර සංවිධාන නොදන්නා දේවල් නොවෙයි මේවා. ඒක නිසා අපේ වගකීම තමයි ජාත්‍යන්තරය ඉදිරියේත්, පොදු ජනතාව ඉදිරියේත්, එම ආයතන ඉදිරියේත් මේවා පිරිසිදු, කීර්තිමත් ආයතන බවට පත් කරන එක. ඒ නිසා අපි පරීක්ෂණ දියත් කර තිබෙනවා. ලසන්ත ඝාතනයේ පරීක්ෂණ දියත් කර තිබෙනවා. ඇත්තටමයි මම කියන්නේ, ඒ ඝාතනය සිදු වන අවධියේ අපේ ආණ්ඩුව නම් තිබුණේ, දැනුත් ඒ අපරාධකරුවන් අත්අඩංගුවේ. ඒ ඝාතනය සිදු වන කොට අපේ ආණ්ඩුව නොවෙයි නේ තිබුණේ. දැන් අපි හොයන්නේ 2008 ඝාතනයක් ගැනයි; අවුරුදු 17කට පස්සේ හොයන්නේ. ඒකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. හැබැයි, අපි හොයනවා. අවුරුදු 17කට පස්සේ හොයන එක ලේසි නැහැ. නමුත් අපි හොයනවා. ඒ ඇයි? මේ හමුදාවන්ට අවශ්‍ය ගෞරවය, ඔවුන්ගේ විනය, ඔවුන්ගේ කීර්තිය, ඔවුන්ගේ වෘත්තීමයභාවය යළි මේ රට තුළ ස්ථාපිත කිරීම තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ වගකීම. ඒ නිසා අපි ඒක කළ යුතුව තිබෙනවා.

ඊළඟ විශේෂම කාරණය, තාජුඩීන්ගේ ඝාතනයයි. පරීක්ෂණයේ කෙළවර වෙලා තිබෙන තැන තිබෙනවා. නාවික හමුදාවේ සමහර නිලධාරින්ගෙන් ප්‍රශ්න කළ යුතුව තිබෙනවා. ප්‍රශ්න කරන්න ඕනෑ. අපි වැරැදිකරුවන් හොයන්න ඕනෑ නැද්ද? මම මෑතකදී අපේ පරීක්ෂණ නිලධාරින් ගෙන්නලා නිශ්චිත වශයෙන් ඇහුවා, "මේක ස්වාභාවිකව සිදු වුණු අනතුරක්ද, ඝාතනයක්ද කියන එක ගැන මට ඔබතුමන්ලාගේ ස්ථාවරය කියන්න" කියලා. මොකද, ඉස්සෙල්ලාම අපට විශ්වාසයක් තිබෙන්න ඕනෑ, එය ස්වාභාවික අනතුරක්ද, ඝාතනයක්ද කියන එක ගැන. අපේ **මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා** ඇතුළු ඒ පරීක්ෂණ නිලධාරින් කිව්වා, "මේක ඝාතනයක්. මේක ඝාතනයක් බව මහේස්ත්‍රාත්වරු තහවුරු කරලා තිබෙනවා" කියලා. අධිකරණ වාර්තාවල තහවුරු වෙලා තිබෙනවා, එය ඝාතනයක් බව. ඒ නිසා ඒක ඝාතනයක්. ඒක ස්වාභාවික මරණයක් නොවෙයි. දැන් අපට වගකීමක් නැද්ද, ඒ ඝාතනයේ වගඋත්තරකරුවන් හොයන්න? දැන් අපි ඒක කරනවා. ඒක කරන කොට කවුරු හරි අහු වුණොත් "රණවිරු දඩයම" කියන්න එපා. ඒක, යළි අපේ රටේ හමුදාවන්ට වෘත්තීමයභාවයත්, කීර්තියත්, ගෞරවයත් ස්ථාපිත කිරීමේ කාර්යයයි. අපි ඒක කරනවා. අපි තවත් පරීක්ෂණ දියත් කරලා තිබෙනවා. ලසන්තගේ ඝාතනය, තාජුඩීන්ගේ ඝාතනය, එක්නැළිගොඩගේ පැහැර ගැනීම ආදිය ගැන හොයන්න ඕනෑ. ඒ වාගේමයි පාස්කු ඉරු දින ප්‍රහාරය.

පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන මෙතැනදී ගොඩක් කථා කරනවා මම දැක්කා. ඒ ක්‍රියාවලිය දියත් කරලායි තිබෙන්නේ. පරීක්ෂණ සිදු වෙමින් තිබෙනවා. ඒ පරීක්ෂණවලදීත් අර ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. මොකක්ද? යම් කෙනෙකු අත් අඩංගුවට අරගෙන-නැත්නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එන්න කිව්වාට පස්සේ, එයා ගිහිල්ලා අධිකරණයෙන් රිට් ආඥාවක් ගන්න පුළුවන්. ඒකට එයාට අයිතියක් තිබෙනවා. මේ ඇතැම් මන්ත්‍රීවරුනුත් එහෙම කළේ. දැන් මෙතැනත් ඉන්නවා නේ කීප දෙනෙක්, රිට් ආඥා එහෙම අරගත්තු. එක්කෝ රට පනිනවා; නැත්නම් රිට් ආඥා ගන්නවා. එතකොට කටයුතු ප්‍රමාද වෙනවා. ඒ ප්‍රමාදය තිබෙනවා. හැබැයි ඒක තමයි යුක්තිය පසිඳලීමේ සාධාරණ ක්‍රියාවලිය. මොකක්ද මේ කරන්නේ? මේ කරුණු අධිකරණයකදී තහවුරු කළ යුතුයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

පොලිසිය භාර අමාත්‍යාංශයේ ලේකම්තුමා කිව්වා- [*බාධා කිරීමක්*]

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
එතුමා ඉතා පැහැදිලිව- *[බාධා කිරීමක්]* අවශ්‍ය වන සාධක මොනවාද? අධිකරණයේදී නඩුවක් ගොනු කළ යුතුයි. නඩුවක් ගොනු කරන්න ප්‍රකාශ විතරක් මදි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නීතිඥ මහත්මයෙක් නේ. උසාවි යනවා නේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
යනවා, යනවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඉතා පැහැදිලිව මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? එය අධිකරණයේදී තහවුරු කිරීම සඳහා වන සාධක අපට අවශ්‍යයි. ඒක තමයි පරීක්ෂණය කරන්නේ. ඒවා තමයි එකතු කරන්නේ. අධිකරණයට ගිහිල්ලා නිකම් කියන්න බැහැ. දුරකථන විශ්ලේෂණයන් අවශ්‍යයි. ඔවුන්ගේ සබඳතාවන් පිළිබඳ තොරතුරු අවශ්‍යයි. ඝාතකයා මහ මොළකරුවා නොවෙයි නේ. ඝාතකයා වෙන කෙනෙක්. හඳුනා ගන්නා මහ මොළකරුවා කවුරු වුණත්, එයා නොවෙයි නේ ඝාතකයා. ඝාතකයා වෙන කෙනෙක්. ඝාතකයා සහ සැලසුම්කරුවන් අතර තිබෙන සබඳතාව තහවුරු කරන්න ඕනෑ. ඒවා පරීක්ෂණ ක්‍රියාවලින්.

මම දැක්කා, එක මන්ත්‍රීවරයෙක් නැඟිටලා පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කියමින් හයියෙන් කෑ ගැහුවා. මම හිතුවා, එතුමාට මොකක් හරි වෙයි කියලා. 2019 අප්‍රේල් මාසයේ 21වැනි දා පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වෙලා නොවැම්බර් මාසය වනකල් මාස 6කට ආසන්න කාලයක් එතුමන්ලා බලයේ සිටියා. උණු උණුවේ ප්‍රශ්නය තිබුණු වෙලාවක ඒක විසඳා ගන්න බැරි වුණා. ඊට පස්සේ මොකක්ද වුණේ? ඝාතනය කළා යැයි සැක හිතෙන කණ්ඩායම අතට බලය ගියා. ඒ අය අතට බලය ගියාට පස්සේ මොකද වුණේ? ගොඩක් සාක්ෂි වහලා තිබෙන්නේ; හංගලා තිබෙන්නේ; කොළ ඉරලා තිබෙන්නේ. කොළ ඉරලායි තිබෙන්නේ, පොත්වල. මතක තියාගන්න. එතකොට මොකක්ද වෙන්නේ? ගිය සතියේ සිදු වෙච්ච දෙයක් නම් සැකකරුවන් මේ සතියේ අල්ලන්න පුළුවන්. අපි ඒවා කරලා තිබෙනවා නේ. ලංකාවේ මෑත කාලයේ සිදු වෙච්ච හැම ඝාතනයකම සැකකරුවන් අපි දින තුනක් යන්න මත්තෙන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

උසාවියේ ඝාතකයා, ඒ ඝාතකයා පුත්තලමට මෙහා තැනකදී අත්අඩංගුවට ගත්තා. වැලිගම ඝාතකයා දින තුනෙන් අත්අඩංගුවට ගන්නවා කියලා අපේ ඇමතිතුමා කිව්වා; ගත්තා, උණු උණුවේ. එතකොට සාධක තිබෙනවා. දුරකථන සබඳතා ගැන තොරතුරු තිබෙනවා. ගමන් කරපු තැන් ගැන තොරතුරු තිබෙනවා. සම්බන්ධතා ගැන තොරතුරු තිබෙනවා. ඒ ආයුධ ගෙනාපු කෙනා ඉන්නවා. ඒ ඔක්කෝම අත්අඩංගුවට අරගෙන තිබෙනවා. හැබැයි ඒවා පැරණි ඒවා. පැරණියි විතරක් නොවෙයි, ඒ වරදකරුවන් අතට බලය ගියා. බලයට ආපු හැටියේ, ලංකාවේ පළමුවැනි වතාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ 500කට ආසන්න නිලධාරින් පිරිසකට රට ගමන් තහනමක් ගත්තා. ඔක්කෝම අයින් කළා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්. ශානි අබේසේකර මහත්මයා ගෙනිහිල්ලා හිරේ දැම්මා. ඒ අය පරීක්ෂකයෝ. පරීක්ෂකයෝ අරගෙන ගිහිල්ලා හිරේ දමලා, පරීක්ෂණ ආයතන බිඳ වට්ටලා, පරීක්ෂණවල හිටපු නිලධාරින් මාරු කළා. අවුරුදු පහක් එහෙම ගියාම පරීක්ෂණයක් දියත් කරන එක අමාරුයි. හැබැයි, මම අපේ පරීක්ෂණ කණ්ඩායම කෙරෙහි විශාල විශ්වාසයක් තබා තිබෙනවා. ඔවුන් ඒ පරීක්ෂණය විධිමත්ව කරලා, වරදකරුවන් නීතිය හමුවට පමුණුවන බව මා දන්නවා. ඒ නිසා මම කියන්නේ මෙච්චරයි. යුක්තිය පසිඳලීම පිළිබඳ ප්‍රශ්නය කිසිසේත්ම දඩයම් කිරීමක් ලෙස ගණනය කරන්න එපා. අපි ඒ හැම කෙනාටම සාධාරණය ඉටු කරමින් තමයි පරීක්ෂණ කරගෙන යන්නේ. ඒ මිස, කිසි කෙනෙකුට බලපෑම් කරමින් නොවෙයි. ඒ නිසා අධිකරණයට ගිහිල්ලා රිට් ආඥාවක් ගැනීමේ හැකියාව තිබෙන්නේ. අපි අධිකරණයට කියන්නේ නැහැ ඒක දෙන්න එපා කියලා. ඒක එයාගේ අයිතිය, පරීක්ෂණයකදී. හැම කෙනාටම, චූදිතයාටත් සාධාරණය ඉටු කරමින් තමයි අපි පරීක්ෂණ කරන්නේ.

ගරු සභාපතිතුමනි, පළමුවැනි එක මා කිව්වා, සත්‍යය ගවේෂණය. දෙවැනි එක, යුක්තිය ගවේෂණය. අපි ඒක හරියට කරනවා. දැන් මෑතකදී මිනී වළවල් දෙකක් හම්බ වුණා චෙම්මනි ප්‍රදේශයේ නේද? අපි මොකක්ද කරලා තිබෙන්නේ? වෙන දා නම් ඒකට මොකද කළේ? කොමිෂන් පත් කරනවා; කල් අදිනවා. අපි එහෙම නොවෙයි. නිසි පරිදි අධිකරණ නියෝග මත පරීක්ෂණ කණ්ඩායම් පත් කරලා ඒ පරීක්ෂණ කරගෙන යනවා. කාට හරි කියන්න පුළුවන් ද ඒ පරීක්ෂණ වැරදියි කියලා? ලංකාවේ පළමුවැනි වතාවට මෙහෙම සිද්ධ වෙන්නේ. අපට අවශ්‍යයි යුක්තිය පිළිබඳව හඬ. ඒ හඬට අවශ්‍ය වන පණ ලබා දෙන්න අපට අවශ්‍යයි. අපි එහෙම වැඩ කරනවා. හැබැයි ඔබතුමන්ලා දන්නවා, වෙන පාලනයක් තිබුණා නම් මේවාට මොනවාද වෙන්නේ කියලා. අපි සාධාරණයි. සත්‍යය ගවේෂණය, එක. යුක්තිය ගවේෂණය, දෙක.

තුන, හානිපූරණය. හානියක් සිදු වෙලා තිබෙනවා නම්, ඒ හානියට වන්දි ගෙවීම අපි කරමින් තිබෙනවා. මෑතකදී බුද්ධි අංශ සතුව තිබිලා අපට රත්‍රන් තොගයක් ලබා දුන්නා. අපි උපරිම උත්සාහ කළා ඒවා කාගේද කියලා හොයලා දෙන්න. නමුත් දෙන්න බැහැ. මොකද, කාගේද කියලා හොයා ගන්න බැහැ. හැබැයි අපේ අපේක්ෂාවක් තිබෙනවා, අඩුම ගණනේ ඒ රත්‍රන් තොගය මුදල් බවට පරිවර්තනය කරලා, ඒකෙන් ඒ පළාතේ - උතුරේ - මිනිසුන්ට වැඩ කරන්න ඕනෑ කියලා. ඇයි? ඒකට සාධාරණය ඉටු කරන්න ඕනෑ. හානිපූරණය සඳහා වන කාර්යාලයක් පිහිටුවා තිබෙනවා. ඒකට අවශ්‍ය වන යන්ත්‍රණය, පහසුකම් අපි ලබා දීලා තිබෙනවා. හානිපූරණය තමයි තුන්වැනි එක.

හතරවැනි එක? නැවත එවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. නැවත එවැනි තත්ත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේ අපි විතරයි. ඒ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබෙන්නේ අපට විතරයි. අපි ඒක කරනවා. නැවත අපේ රටේ ජාතිවාදී ගැටුමක් කිසිසේත්ම ඇති වෙන්න දෙන්නේ නැහැ. ඒ වාගේම එම ජනතාවට සාධාරණ ලෙස දේශපාලනයට මැදිහත් වීමට තිබෙන අයිතිය, ඒ ප්‍රදේශවල සාධාරණ ලෙස බලය ක්‍රියාත්මක කිරීමට තිබෙන අයිතිය අපි පිළිගන්නවා. අපි ඒකට ලෑස්තියි. මොකක්ද අපි මේ කරන්නේ? ජාතිවාදී ගැටුම් විසින් අවුළවන ලද රටක්, මේක. වතුර දමලා ගිනිමැලයක් නිවනවා වාගේ නිවන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි මේ තිබෙන්නේ. දීර්ඝ කාලයක් තිස්සේ ජනතාව අතර කෝන්තරය, වෛරය, සැකය තිබෙනවා. දේශපාලන කඳවුරු විවිධ උවමනා මත ඒවා ගොඩනහලා තිබෙන වෙලාවක්. හැබැයි අපි ඉතාම සංයමයෙන්, වරද්දා ගන්නේ නැතුව කටයුතු කරනවා. අපි දන්නවා මෙතැන තිබෙන ප්‍රශ්නය. සමහර තත්ත්ව තිබෙනවා, මහා වැරදි කළත් තත්ත්වයට බලපෑමක් වෙන්නේ නැහැ. හැබැයි මෙතැනදී අපි දන්නවා, කුඩා වැරැද්දක් වුණත් අතිශය බරපතළ විනාශයක් ගෙන දෙනවා. ඒ නිසා අපේ ප්‍රවේශය මොකක්ද? කිසිසේත්ම කුඩාවත් වැරැද්දක් සිද්ධ වෙන්නේ නැතුව ජාතික සමඟිය, සංහිඳියාව අපි ගොඩ නඟනවා. විශේෂයෙන්ම ජාතික

සමගිය සංකේතවත් කිරීම සඳහා ලබන දෙසැම්බර් 11, 12 දිනවල අපි ලැස්ති කරලා තිබෙනවා, "ශ්‍රී ලාංකික දිනය". මම විශේෂයෙන්ම අපේක්ෂා කරනවා, මේ සභාව නියෝජනය කරන සිංහල, දෙමළ, මුස්ලිම් මන්ත්‍රීවරු සියලුදෙනා හමු වෙන්න, පාර්ලිමේන්තුවේදී. හමු වෙලා, ඒ වැඩ පිළිවෙළ පිළිබඳව පැහැදිලි කරන්න. ඒ වේදිකාව මුළුමනින්ම දේශපාලනය පැත්තකින් තියපු වේදිකාවක් කරමු, අපි ඔක්කෝම එකතු වෙලා. අපේ සංස්කෘති, අපේ අනන්‍යතා එකට ප්‍රදර්ශනය කරන තැනක් බව පත් කර ගැනීමේ අරමුණින් අපි වැඩ කරනවා. මම දැක්කා ඒකටත් කවුරු හරි කියා තිබෙනවා, "තිබ්බොත් බලාගෙනයි" කියලා. මම එයාට කියනවා, "ආවොත් බලාගෙනයි" කියලා. ඒක මතක තියා ගන්න කියන්න එයාට. මම දැක්කා එහෙම කියලා තිබෙනවා.

මෙහෙම විහිළු කරන්න බැහැ. අපේ රටේ උතුරේ ජනතාවගේ සහ දකුණේ ජනතාවගේ සංස්කෘතිය පිළිබඳ හුවමාරුවක්, ඔවුන්ගේ ආහාර රටා, ඔවුන්ගේ විලාසිතා, ඔවුන්ගේ සංගීතය, ඔවුන්ගේ භාවිතා අතර මිශ්‍රභාවයක් හදන්න ඕනෑ, අපි. ඒකට දිනයක් අපි නම් කර තිබෙනවා. ඒ සඳහා මම සියලුදෙනාම වෙනම මුණ ගැහෙන්නත් අපේක්ෂා කරනවා. විශේෂයෙන්ම අපේ දෙමළ, මුස්ලිම් මන්ත්‍රීවරුන් සහ නායකයන් මුණ ගැහිලා මේ පිළිබඳ පැහැදිලි කරලා මේකයි අපේ වැඩසටහන, ඔයගොල්ලන්ගේ යෝජනා මොනවාද කියලා අහන්න ඕනෑ. මොකද, අපි එකතු වෙලා මේක කරන්න ඕනෑ. ඒ නිසා මම කියනවා, අපේ හමුදාවත්, අපිත් ජාතික සමගිය ගොඩ නැඟීමටත්, රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමටත් විශාල වැඩ කොටසක් කරමින් තිබෙන බව.

ඊළඟට, අපේ පොලිස් දෙපාර්තමේන්තුව -ශ්‍රී ලංකා පොලීසිය- මහජන ආරක්ෂක අමාත්‍යාංශය ගැන කථා කරමු. මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඉතාම හොඳින් වැඩ කරන එක පිළිබඳ අපට විශ්වාසයක් තිබෙනවා. මම දන්නවා, චෝදනාවට ලක් වෙලා ඉන්න කිහිපදෙනෙක් ඉන්නවා. මම දැක්කා, මහජන ආරක්ෂක අමාත්‍යතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා කියලා තිබෙනවා. එතුමා වූදිතයෙක් වෙන්නේ ඇයි? එතුමා අපේ රටේ මත්ද්‍රව්‍ය සහ පාතාලය මර්දනය කිරීම සඳහා දිවා රෑ නොබලා වැඩ කරනවා. එතුමා ජනතාවගේ මිතුරෙක්. සතුරා කාගේද? මෙතැන මේ ඉන්න අය නම් නොවෙයි. ඒ අදාළ කෙනා නැහැ. ඒ අයගේ සතුරෙක්.

ඊළඟට කවුද? මා දැක්කා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, රවී සෙනෙවිරත්න මැතිතුමාට විශාල ලෙස පහර එල්ල කරනවා. මම අද කියන්නම්. මද්දුම බණ්ඩාර රවී සෙනෙවිරත්නගේ ගෙදර ගිහිල්ලා පැය කීයක් වාඩි වෙලා හිටියාද? ඒක මට කියන්න කියන්න. සජිත් ප්‍රේමදාස රවී සෙනෙවිරත්න මැතිතුමාට දුරකථන ඇමතුම් කොච්චර ප්‍රමාණයක් ගත්තාද? Missed calls කීයක් තිබෙනවාද රවීගේ phone එකේ? මට කියන්න. සාගල රත්නායක ජීප් එකක් එවලා ගෙනිච්චේ නැද්ද? රවීට භයයි. ඇයි, රවීට භය? අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, - මේ රවීට නොවෙයි. මේ රවීට භය මහ බැංකුව. Sorry, sorry! ඇයි රවී සෙනෙවිරත්නට භය? භය, එතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දීර්ඝ කාලයක් වැඩ කරපු කෙනෙක් නිසා. මේ ගොඩක් අයගේ දේවල් එතුමා දන්නවා. අපි දේශපාලනය කරන කොට අසාධාරණයට විරුද්ධව එතුමා අපිත් එක්ක හිටියා. අපිත් එක්ක ඉන්න එකට භය වුණා. සාගල ජීප් එකක් එවලා ගෙදර ගෙනිච්චා, වළක්වන්න ඕනෑ කියලා. එහෙමයි කළේ. මද්දුම බණ්ඩාර ගිහිල්ලා පැය 6ක්ද කොහේද ඒ ඉස්තෝප්පුවේ වාඩි වෙලා හිටියා. සජිත් ප්‍රේමදාස ගත්ත දුරකථන ඇමතුම් ප්‍රමාණය ගණන් කරන්න බැරි තරම්. මම මේ දන්න ඒවා කියන්නේ. ඉතින්, අද කොහොමද එතුමා වූදිතයෙක් වෙන්නේ? අද එතුමාට පහර දෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒක වැරදියි. ඒගොල්ලන් කවුරුත් පිළිගන්න නිලධාරින්. එතුමා මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධවලට විරුද්ධව නිර්භීතව කටයුතු කරනවා සහ ඝාතන අපරාධ සොයන්න නිර්භීතව කටයුතු කරනවා. එතකොට ඒගොල්ලන් වට්ටන්න හදනවා. රවී සෙනෙවිරත්න ලේකම්තුමාට ගහනවා කියන්නේ, අපරාධකරුවෝ පැත්තෙන්, දූෂිතයන් පැත්තෙන්, සංවිධානාත්මක අපරාධ කල්ලි පැත්තෙන්. ඒකයි ඇත්ත කථාව. නැත්නම් මේ අය සතුරන් වෙන්නේ කොහොමද?

ඊළඟට ශානි අබේසේකර සතුරෙක් වෙන්නේ කොහොමද? මම දන්නා විධියට ශානි කරපු හැම පරීක්ෂණයකම වූදිතයන් අධිකරණයේදී වැරදිකරු වෙලා තිබෙනවා; වැඩි ප්‍රමාණයකට මරණ දඬුවම ලැබිලා තිබෙනවා. මා ළඟ වාර්තාවක් තිබෙනවා. මේ ඔක්කොම දන්න අය තමයි මේ. උඩතලවින්න ඝාතන සිද්ධියට අදාළ පස්දෙනෙකුට මරණ දඬුවම ලැබුණා. රාජගිරිය, රෝයල් පාර්ක් නිවාස සංකීර්ණයේ කාන්තාවක් ඝාතනය කළ පුද්ගලයාට මරණ දඬුවම ලැබුණා. පස්සේ ඒ වූදිතයා මෛත්‍රී නිදහස් කළා. ඒක වෙනම එකක්. හැබැයි, ඒ වූදිතට මරණ දඬුවම දුන්නා. මේ වාගේ විශාල පරීක්ෂණ කරපු නිලධාරියෙක්, මේ. ඒ වාගේ අත්දැකීම් තිබෙන නිලධාරින් අපට අවශ්‍යයි අලුත් අය පුහුණු කරන්න. ඒ, කිසි දෙයකට යටත් නොවුණු මිනිස්සු. තේරුම් ගන්න, පැවති ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ඔහුව රිමාන්ඩ් කළා; අවුරුදු එකහමාරකට වැඩි කාලයක් ඔහු හිරේ හිටියා; ඒකෙදී heart attack එකක් හැදුණා; bypass surgery එකක් රිමාන්ඩ් එකේ ඉඳලා කරන්න සිද්ධ වුණා; කොවිඩ් හැදුණා; එයාගේ නැගණිය මට කථා කරලා ඇඬුවා, අයියා මැරෙන්න යන්නේ කියලා. එහෙම මිනිස්සු, මේ. Surgery එක කරලා දවස් දෙකෙන් ආයෙත් හිරේට යැව්වා. ඒ මිනිස්සු රට වෙනුවෙන් කරපුවාට තමයි එහෙම කළේ. ඒ මිනිස්සු ද තමුන්නාන්සේලාගේ වූදිතයන් වෙන්නේ? ශානි කවුද, ශානි කවුද කියලා මෙතැන කෑ ගහන්නේ? කවුද මේ මිනිස්සු? ඒ මිනිස්සු ජීවිතය නොතකා, මේ රටේ නීතිය සහ සාමය ස්ථාපිත කිරීම සඳහා මහන්සි වෙච්ච මිනිස්සු. ඒ මිනිස්සු අපි රකිනවා. එහෙම කරන්න ඕනෑ නැද්ද? හැබැයි, අද වූදිතයෙක් වෙන්නේ ඇයි? අද වූදිතයෙක් වෙන්නේ, තමන් දිශාවට පරීක්ෂණ එනකොට අන්න ශානි අබේසේකර අපරාධකාරයෙක් වනවා.

ඊළඟට තමුන්නාන්සේලාගේ චෝදනාවට ලක් වන්නේ කවුද? මම දැක්කා පසුගිය කාලයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ රංග දිසානායකට විශාල ලෙස චෝදනා කරනවා. එතුමා එහි අධ්‍යක්ෂ ජනරාල්. එතුමාට කාලයක් පහර ගැහුවා. මොකක්ද මේ කරන්නේ? අපට අවශ්‍යයි, මේ රටට නිර්භීත රාජ්‍ය සේවයක්. අද නිර්භීත රාජ්‍ය සේවයක් සඳහා එම නිලධාරින් මැදිහත් වනවා. මොකක්ද පාර්ලිමේන්තුවක වගකීම? පාර්ලිමේන්තුවක වගකීම තමයි, මුළු පාර්ලිමේන්තුවම එකතු වෙලා එම නිලධාරින්ව රකින එක. ඒකයි පාර්ලිමේන්තුවක වගකීම. රටක ජාතික වගකීම එතැන තිබෙන්නේ. හැබැයි, මෙතැන මොකක්ද කරන්න හදන්නේ? නිර්භීතව වැඩ කරනවා නම්, විනයානුකූලව වැඩ කරනවා නම්, දූෂණවලට සම්බන්ධ වෙලා නැත්නම්, ඒ නිලධාරින් බිඳ වට්ටන එක තමයි මෙතැන අභිප්‍රාය. එහෙම නම් මොකක්ද මෙතැනට සිද්ධ වෙලා තිබෙන්නේ? මම කියන්නේ, පාර්ලිමේන්තුව පොදු සාමූහික ක්‍රියාවලියකට එන්න ඕනෑ කියලා. එවැනි දක්ෂ, නිර්භීත නිලධාරින් අපට අවශ්‍යයි. එවැනි රාජ්‍ය සේවයක් අපට අවශ්‍යයි. එම නිලධාරින් රකින එක තමයි අපේ කාර්යභාරය බවට පත් වෙන්න ඕනෑ. අපි ඒක කරනවා. මම එතුමන්ලාටත් කියලා තිබෙනවා, "ඔබතුමන්ලා වැඩේ හරියට කරන්න. රාජකාරියේ ඉන්න කාලයේත්, රාජකාරියේ නැති කාලයේත් ඔබතුමන්ලාගේ ආරක්ෂාව වෙනුවෙන් අපි හැම දාම පෙනී සිටිනවා" කියලා. ඇයි? අපි එහෙම රාජ්‍ය සේවයක් හදන්න ඕනෑ.

ඊළඟට ඔබතුමන්ලාගේ චෝදනාවට ලක් වන්නේ කවුද කියලා මම කියන්නම්. දැනට ඒ සඳහා භාගෙට ලක් වෙලා

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඉන්නවා, අපේ පොලිස්පතිතුමා. ඊළඟට එන්නේ, CID එකේ කරව්ට මහත්මයා. මම කියලා යන්නම් අද. ඊළඟට, කරව්ටගේ මොකක් හරි අරගෙන එයි. ඇයි? තමුන්නාන්සේලා කළ වංචා, දූෂණ, අපරාධ පිළිබඳව පරීක්ෂණ තමුන්නාන්සේලා පස්සේ හඹාගෙන එනකොට දන්නවා, - *[බාධා කිරීමක්]* දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පොඩි ගණනක් තිබෙන්නේ; ලක්ෂ එකහමාරක් වාගේ. ගණන් ගන්න දෙයක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට ලක්ෂ එකහමාරක් දුන්නාද?

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ලක්ෂ එකහමාරක් තිබෙනවා. ඇයි, අර ලක්ෂ පහෙන් -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ. ඒක වැරදියි.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
නැහැ, මේකයි වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* හරි, හරි. කමක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගෙවපු බිල් පරීක්ෂා කරන්න. කරුණාකරලා ඒ බිල් එක පරීක්ෂා කරන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
මෙහෙමයි. මට සමහර ඒවා - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ලක්ෂ පහක් අරගත්තා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ලක්ෂ පහෙන් තුනහමාරක් විතර වියදම් කළා. එකහමාරක් විතර බැංකුවේ දා ගත්තා. එහෙම නැහැ නේද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ බිල් එක ඔබතුමන්ලා ළඟ තිබෙනවා නේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
පහේ බිල් එක තමයි මගේ ළඟ තිබෙන්නේ.

ලක්ෂ පහේ එක මා ළඟ තිබෙනවා. ලක්ෂ තුනහමාරක් hospital එකට ගෙවලා ලක්ෂ එකහමාරක් බැංකු පොතට දා ගත්තා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, ලක්ෂ පහම බැංකුවට දා ගත්තා. බිල් එක තිබෙනවා, මා ළඟ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
හොඳයි.

මම මේ කියන්න හදන්නේ මේකයි. අපරාධ, දූෂණ පිටුපස හඹාගෙන එනකොට දැන් දූෂිතයන්, අපරාධකරුවන් කරන්නේ එම නිලධාරින් පිටුපස හඹා ගෙන යන එක. ඒක නතර කරන්න කියලා මම ඉල්ලනවා. ඒක කරන්න එපා.

ඊළඟට, මත්ද්‍රව්‍ය උවදුර. මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ ප්‍රශ්නය අපි දන්නවා. අපි දන්නවා, මීට දශක හතරකට, පහකට විතර කලින් - 70 දශකයේ අග සහ 80දශකයේ මුල - සාමාන්‍යයෙන් ගම්වල චණ්ඩි හිටියා. ඒගොල්ලන් තනි චණ්ඩි. එහෙම නැත්නම් ගම්වල නීති විරෝධී මත් පැන් පෙරන, ගංජා වාගේ අළෙවි කරන කට්ටිය හිටියා. ඔවුන් හුදු සාමාන්‍ය මත්ද්‍රව්‍ය වෙළෙන්දෝ. එහෙම තමයි තිබුණේ. චණ්ඩියා හිරේට ගියාම ඒ ගමම නිදහස්. ඊට පස්සේ මුකුත් ක්‍රියාකාරකමක් නැහැ. මත්ද්‍රව්‍ය අළෙවි කරන්න ගියාම විරෝධයක් නැහැ, අවසන්. ඇයි? සමාජයෙනුත් ඒගොල්ලන්ට පිළිකුලක් තිබුණා. සාමාන්‍යයෙන් අපේ ගම්වල කථාවක් තිබුණා, දූෂිතයා දකුණු පැත්තෙන් ආවොත් පාරේ වම් පැත්තට මාරු වෙන්න කියලා. එහෙමයි තිබුණේ. මඟුල් ගෙදරක්, උත්සවයක් කියන්නේ නැහැ. එයා සමාජයෙන් කොන් වුණු කෙනෙක් බවට පත් වුණා. ඒ නිසා අපරාධකරුවන්ට, විස මත්ද්‍රව්‍ය අළෙවි කරන්නන්ට විරුද්ධව සමාජ මතයකුත් තිබුණා. ඒක තනි, හුදෙකලා සිදුවීමක්. හැබැයි, ඒ චණ්ඩින්ට ඊට පසුව ඕනෑ වුණා දේශපාලනයට එන්න. ඒගොල්ලන්ට තමයි බලය තිබෙන්නේ. ඒගොල්ලන්ට ඕනෑ වුණා දේශපාලන බලය පතුරන්න. කාලයක් දේශපාලන බලය පැතිරෙව්වේ ප්‍රජාතන්ත්‍රවාදීව නොවෙයි, බලහත්කාරයෙන්. එතකොට බලය ඕනෑ. විශේෂයෙන්ම 1977දී බිහි වුණු UNP ආණ්ඩුව කළ දේ තමයි, UNP ආණ්ඩුවේ හැම මන්ත්‍රී කෙනෙකුම එයා ළඟට තදයෙක් හදා ගත්තා. හැම කෙනාම. එතකොට එයාට දේශපාලන රැකවරණය ලැබෙන්න පටන් ගත්තා. එතකොට එයා තවදුරටත් අර ගමේ හිටපු හුදු "පොඩි විජේ" හරි, එහෙම නැත්නම් "මරු සිරා" හරි නෙවෙයි. එයා දේශපාලන රැකවරණය සහිත ගණන්කාරයෙක්, චණ්ඩියෙක් බවට පත් වුණා.

ඊට පස්සේ දේශපාලන රැකවරණයෙන් මෙයාලා ඉස්සෙල්ලාම කොන්ත්‍රාත්වලට බැස්සා. ඉස්සෙල්ලාම කුඩුවලට බැස්සේ නැහැ. ඔය ගොඩක් අය කොන්ත්‍රාත්වලට බැස්සා. "සොත්ති උපාලි" ගිහින් ගම් උදාවේ පස් පිඩලි අල්ලනවා, ඔය වාගේ කොන්ත්‍රාත්වලට ආවා. "බැද්දගානේ සංජීව" පොඩි පොඩි කොන්ත්‍රාත් කරන්න පටන් ගත්තා. ඒ විධියට මුදල් උපයන්න පටන් ගත්තා.

ඊට පස්සේ ලෝකයේ විශේෂ මත්ද්‍රව්‍ය ජාලයක් සහ විශාල බෙදා හැරීමේ ජාලයක් නිර්මාණය වුණා. මේගොල්ලන් මත්ද්‍රව්‍ය ජාලයට ඇතුළු වුණා. දැන් දේශපාලන බලය තිබෙනවා, මත්ද්‍රව්‍යවලට ඇතුළු වෙනවා, මත්ද්‍රව්‍යවලින් විශාල ලෙස මුදල් උත්පාදනය වෙන්න පටන් ගන්නවා. මේ මුදල් උත්පාදනය විසින්

මොකද කළේ? ඒගොල්ලන්ට රාජ්‍ය යන්ත්‍රණය මිලදී ගන්න පුළුවන්කම ලැබුණා. මුදල් විසින් සමාජයේ ගෞරවය නිර්මාණය වෙන්න පටන් ගත්තා. ගමේ කරන ලොකු උත්සවයක් තිබෙනවා නම් උත්සවයේ ප්‍රධානියා බවට පත් වෙනවා, ධනය තිබෙන කෙනා. අර, නීති විරෝධී ලෙස ධනය උපයා ගත්ත කෙනා. එතකොට සමාජ රැකවරණයක් තිබෙනවා. වෙන දා තිබුණු සමාජ කොන් කිරීම, සමාජ රැකවරණයක් බවට පරිවර්තනය වෙනවා. දැන් සමාජයත් මොකද කළේ? නීති විරෝධීව මුදල් උපයා ගන්නා කෙනා තවදුරටත් ප්‍රතික්ෂේප කරන තැනට පත් වුණේ නැහැ. ධනය විසින් ඔහුට වෙන බලයක් නිර්මාණය වුණා. ඊට පස්සේ ඒ අය සමහර වැඩ කර ගන්න මොකද කළේ? ඒගොල්ලන් ළඟ තිබෙන සල්ලි නිසා රාජ්‍ය යන්ත්‍රණයට ඇතුළු වුණා. පොලීසියේ නිලධාරින්ට පගා ගෙවන්න පටන් ගත්තා, MTD එකට පගා ගෙවන්න පටන් ගත්තා. ඊට පස්සේ Immigration and Emigration Department එකට පගා ගෙවන්න පටන් ගත්තා, Sri Lanka Customs එකට සල්ලි දෙන්න පටන් ගත්තා. එතකොට රාජ්‍ය යන්ත්‍රණයත් එයට ඒකාබද්ධ වුණා. ඊට පස්සේ මේ හා සම්බන්ධ ව්‍යාපාරික යන්ත්‍රණයක් ඇති වුණා. මේගොල්ලන් සල්ලි ආයෝජනය කරන්න පටන් ගත්තා. එක එක ව්‍යාපාරිකයන් හරහා ආයෝජනය කරන්න පටන් ගත්තා. එතකොට මුදල් මත ගෙඩ නැඟුණු විශාල ව්‍යාපාරික ජාලයකුත් හැදුනා. ඊට පස්සේ, සමහර ව්‍යාපාරිකයන් මාධ්‍යවලට සල්ලි ආයෝජනය කරන්නත් පටන් ගත්තා. දැන් මොකද වුණේ? මේක හුදු වණ්ඩියාගේ සිට cartel එකක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. දේශපාලන අධිකාරිය, කුඩු ව්‍යාරිකයා, සන්නද්ධ අපරාධකරුවා, දූෂිත රාජ්‍ය නිලධාරියා සහ මාධ්‍ය ජාලය. මම හිතන විධියට මේ මාධ්‍ය ජාලයට තිබෙන සබඳතා ටික ඉතා ඉක්මනින් අපේ බුද්ධි අංශවලින් අපට හෙළිදරවු වෙයි, කොතැනද කොතැනද කියලා. මේක එක cartel එකක් බවට පත් වුණා. දැන් එතකොට මේක හුදු මත්ද්‍රව්‍ය වෙළෙන්දෙක් හෝ හුදු වණ්ඩියෙක් නොවෙයි. මේක දැන් සංවිධානාත්මක දෙයක්. සමහර සංවිධානාත්මක ක්‍රියාකාරකම් ජාත්‍යන්තරයත් එක්ක සබඳතාව ඇති කරගෙන තිබෙනවා.

අපි ඉතිහාසය දැකලා තිබෙනවා. හයිටියේ ජනාධිපතිවරයා ඝාතනය වුණාට පස්සේ තොරතුරු හෙළිදරවු වෙන්නේ මත්ද්‍රව්‍යවලට එරෙහිව කළ ඝාතනයක් කියලා. මෙක්සිකෝවේ ජනප්‍රිය ජනාධිපති අපේක්ෂකයෙක් ඝාතනය කරනවා; ඒ තරමට ප්‍රබල වෙනවා. සමහර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධ දේශපාලනඥයන් අත්අඩංගුවට ගත්තාට පස්සේ උද්ඝෝෂණ නිර්මාණය කරනවා, පාතාල සල්ලිවලින්. ඒ නිසා ජාත්‍යන්තර වශයෙන් ගත්තත්, දේශීය වශයෙන් ගත්තත් මේක වෙන තැනකට වර්ධනය වෙලා තිබෙනවා. දැන් තිබෙන්නේ අර හුදු ගමේ වණ්ඩියා කියන තැන නොවෙයි. සංවිධානාත්මක අපරාධ කල්ලි; මේ ඔක්කෝම ගොඩ නැඟුනා. අපි අර්ථකථනය කරන විධියට මේක වෙෘර වළල්ලක් බවට පත් වෙලා තිබෙනවා. දැන් අත්අඩංගුවට ගැනීම් විශාල ප්‍රමාණයක් සිද්ධ වෙනවා. හැබැයි අත්අඩංගුවට ගත්තාට, වැඩේ යම් ප්‍රමාණයකින් තවම යනවා. වෙන දා ගමේ වණ්ඩි ටික අත්අඩංගුවට ගත්තාම එතැනින් වැඩේ ඉවර වෙනවා. දැන් ඉවර වෙන්නේ නැත්තේ, මේකට ඉතාම සංවිධානාත්මක ජාලයක් තිබෙන නිසායි.

දැන් මොකක්ද කරන්න ඕනෑ? මේකෙ වෙලා තිබුණු දේ තමයි, ආණ්ඩුවේ ආශිර්වාදය සහිතව මේ ජාලය මෙහෙයවුවා; ජාලය ක්‍රියාත්මක වුණා. රාජ්‍ය යන්ත්‍රණයට ඕනෑ වුණා ගමේ බලය තියාගෙන යන්න, මිනිස්සු භය කරන්න. මම දන්නවා, සමහර කුමාරවරු රැස්වීමේ කථා කරනකොට ආරක්ෂාවට සිටියේ "ජුලම්පිටියේ අමරේ". එළියේ ආරක්ෂාවට තියා ගත්තා පාතාල නායකයෝ. ඒ වාගේම තමයි අපේ නලින්ද ජයතිස්ස සහෝදරයා කටුවන රැස්වීම තියනකොට ඒ රැස්වීමට වෙඩි තැබුවා. දෙදෙනෙක් ඝාතනය වුණා. මතක තියා ගන්න, ඉතිහාසය. කවුද? ජුලම්පිටියේ අමරේ. එතකොට ජුලම්පිටියේ අමරෙට නලින්දත් එක්ක ප්‍රශ්නයක් තිබුණාද, නලින්දගේ දේශපාලනයත් එක්ක ප්‍රශ්නයක් තිබුණාද? කවුද මෙහෙයවූයේ? කටුවන රැස්වීමේදී දෙදෙනෙක් ඝාතනය වුණා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී - [ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் மேலும் ஆராயப்பட்டது. - [மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee. - [THE HON. SPEAKER in the Chair.]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජනාධිපතිතුමා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
මම කියමින් සිටියේ, මේ පාතාලය උපයෝගි කරගත් ආකාරය ගැනයි. මේක සැඟවුණු දෙයක් නොවෙයි. බැද්දගානේ සංජීව හිටපු ජනාධිපතිතුමිය ළඟ හිටපු එක රහසක් ද? DIGලා, ASPලා transfer කරන එකට කථා කළේ බැද්දගානේ සංජීවට. ඔහු තමයි උසස්වීම් දුන්නේ, ඔහු තමයි පොලීසියේ මහත්වරු transfer කළේ. මෙහෙම තත්ත්වයක් නිර්මාණය වුණා. ඇමතිකම් ගන්න සොත්ති උපාලි ළඟට ගිය එක බොරුවක් ද? ප්‍රේමදාසගේ ආණ්ඩුවේ ඇමතිවරුන් කවුද කියලා තීරණය කළේ සොත්ති උපාලි. මේගොල්ලන් මෙහෙම අනුහස් සහිත බලයක් නිර්මාණය කළා. එවැනි බලයක් නිර්මාණය කරලා මොකද වුණේ? කුඩු ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තිබෙනවා, විවිධ සමාජ විරෝධී ක්‍රියාකාරකම් වැඩි වෙලා තිබෙනවා, සන්නද්ධ අපරාධ කල්ලි නිර්මාණය වෙලා තිබෙනවා. මේක තමයි දැන් තිබෙන තත්ත්වය. මේක දැන් 'තත්ත්වයක්' වෙලා. මේක සිද්ධියක් නොවෙයි, 'තත්ත්වයක්'. අලුත් තත්ත්වයක්. දැන් මේක සිද්ධියක් නොවෙයි. අලුත් තත්ත්වයක් නම් දැන් මොකද කරන්න ඕනෑ? ඒ තත්ත්වය අපි පරාද කරන්න ඕනෑ. තත්ත්වයකදී එක් කෙනෙක් අත්අඩංගුවට ගත්තාය කියලා අවසන් වෙන්නේ නැහැ; තත්ත්වයකදී තැනකදී වෙඩි තැබුවාය කියලා අවසන් වෙන්නේ නැහැ; තැනකදී වෙඩි තබපු කෙනා අත්අඩංගුවට ගත්තාය කියලා අවසන් වෙන්නේ නැහැ. මේක දැන් තත්ත්වයක්. දැන් මේක පරාද කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවෙන් දැන් අපි අහනවා, මේක

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මේ විධියටම යන්න දෙනවාද, එහෙම නැත්නම් අපි මේක පරාද කරනවාද කියලා. අපි තීරණය කරනවා, මේක පරාද කරන්න. මම ඒක ඉතා පැහැදිලිව කියන්නම්.

ඊළඟට, ඒගොල්ලන් දේශපාලන පක්ෂ හදන්න ලැහැස්ති වෙලා සිටියා. කළුතර ස්වාධීන කණ්ඩායම් ලැහැස්ති කළා, මැතිවරණයට ඉදිරිපත් කරලා මනාපවලින් එක් කෙනෙක් හරි පාර්ලිමේන්තුවට එනවා කියලා. දැන් මේ අය දේශපාලන බලයට එනවා. හොයලා බලන්න, ඇත්තටම වැලිගමදී මොකක්ද වුණේ කියලා. පක්ෂ පැත්තකින් තබා හොයලා බලන්න. වැලිගමදී මොකක්ද වුණේ? මේ අය දේශපාලන බලයට අවතීර්ණ වනවා. සමහර අපරාධ කල්ලි නායකයින්ගේ නංගිලා ප්‍රාදේශීය සභා නියෝජනය කරනවා. පක්ෂවලට කිට්ටු වෙලා පක්ෂවල අනුහසින් මේ අය සිටියා. දැන් පාර්ලිමේන්තුව, පළාත් සභාව, ප්‍රාදේශීය සභාව දක්වා ඒමේ ප්‍රවණතාවක් ගොඩනැඟිලා තිබෙනවා. එතකොට එතැනට ගියොත් මොකක්ද වෙන්නේ? ඒ නිසා අපේ රජය තීරණය කර තිබෙනවා, අනිවාර්යයෙන් මේක පරාද කරනවා කියලා. සැකයක් තියාගන්න එපා.

යාපනයේ මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඒ තරුණ තරුණියන් විශාල ගොදුරු බවට පත්වෙලා. යාපනයට ගියාම අපට ඉදිරිපත් කරන්නේ මොකක්ද? මේකෙන් බේරා දෙන්න කියලා දැන් ඉල්ලන්නේ. උතුර, නැඟෙනහිර, දකුණ කියා භේදයකින් තොරව මුළු සමාජයම මෙහි ගොදුරු බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපට අවශ්‍ය වන්නේ ජාතික මෙහෙයුමක්. මේක මේ ආණ්ඩු ක්‍රියාවලියක් නොවෙයි. කවුරු හරි ආණ්ඩු කරන්න. හැබැයි, කවුරු ආණ්ඩු කළත් මේ මත්ද්‍රව්‍යයත්, ඒ හා බැඳුණු සන්නද්ධ අපරාධ කල්ලිත් අපි විනාශ කළ යුතුමයි. ඒවා තබාගෙන අපේ රටේ ආණ්ඩු කරන්න නොවෙයි, යහපත් ආර්ථිකයක්වත් හදන්න බැහැ. මේවා තබාගෙන කොහොමද යහපත් ආර්ථිකයක් හදන්නේ? ඉඩම් අල්ලනවා බලෙන්. කොළඹ ඉඩම් බෙදුවේ පාතාල නායකයෝ නොවෙයිද? ඒගොල්ලන් ඉඩම් අල්ලනවා නේ, ඉඩම් අල්ලා බෙදනවා නේ. LRC එක බය කරලා, UDA එක බය කරලා ඉඩම් අල්ලනවා. ඒකට ගැළපෙන්න මර්වින් සිටියා, බෙදුවා ඉඩම්. මේවා ඇත්ත කථා. ඒ නිසා තවදුරටත් අපි හිතනවා, මේක අපි වර්ධනය වෙන්න දෙන්නේ නැහැ, මේක අපි පරාද කරනවා කියලා. මේක පරාද කිරීම සඳහා අපේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ හා බැඳුණු ආයතන සියල්ල වැඩ කරනවා. ඒ නිසා තමයි මම කියන්නේ මේ නිලධාරින් අපි රකින්න ඕනෑය කියලා. වැරදි තිබෙන අය ඉන්නවා. දැන් අපි විශාල පිරිසකගේ වැඩ තහනම් කර තිබෙනවා, එළියට දාලා තිබෙනවා. වැරදි තිබෙන අය ඉන්නවා. ඔවුන්ට කියලා වැඩක් නැහැ, මේක කාලාන්තරයක් තිස්සේ ගොඩනැඟුණු එකක්. මේක කාලාන්තරයක් තිස්සේ ගොඩනැඟිලා මේගොල්ලන් වැරදි කරන අය බවට පත් වෙලා තිබෙනවා. Immigration and Emmigration Department එකේ මෙවැනි යම් පිරිසක් ඉන්න බව අපි දන්නවා. ඒ වාගේම මෙවැනි පිරිස් RMV එකේත් ඉන්නවා, Sri Lanka Customs එකේත් ඉන්නවා, පොලීසියේත් ඉන්නවා. මේවා බොරු නොවෙයි. හැබැයි මේක මෙතැනින් නතර කිරීමත්, ඒ අය අත්අඩංගුවට අරගෙන පරීක්ෂණවලට ඉදිරිපත් කිරීමත් අපේ වගකීමක් වනවා. මෙතැනින් එහාට මේක බිඳ වට්ටනවා මිසක් වර්ධනය වෙන්න ඉඩ දෙන්නේ නැහැ; ආපහු එක අඟලක් වර්ධනය වෙන්නේ නැහැ. දවසින් දවස මේක බිඳ වැටෙනවා.

මම දන්නා විධියට අදත් මුහුදේ කුඩු පාවෙනවා. මට දැනගන්න ලැබුණා, බෑග් 3ක්, කිලෝග්‍රෑම් 100ක් වාගේ සොයාගෙන තිබෙනවා කියලා. ඒවා මුහුදේ පාවෙනවා. අද මේවා ගොඩබිමට ගේන්න බයවෙලා තිබෙනවා. අපට අවස්ථා 3ක් හමුවුණා, මුහුදේ කුඩු පාවෙන. ඒ කියන්නේ මොකක්ද? අපේ මෙහෙයුම් ටික යනවා. අපි ඒ සඳහා ආයතන ඒකාබද්ධ කර තිබෙනවා. අපේ නාවික හමුදාව, අපේ බුද්ධි අංශ, Sri Lanka Army, අවශ්‍ය වෙලාවට ගුවන් හමුදාව, පොලීසිය මේ සියල්ල ඒකාබද්ධව මේ කටයුතු මෙහෙයවනවා. ඒ හැම අමාත්‍යාංශයකම ඒ කාර්යභාරයේ යෙදී සිටින නිලධාරින් මේ සඳහා විශාල කැප කිරීමක් කරනවා. ඔවුන් ජීවිත තර්ජන නොතකා මේ වැඩ කරමින් ඉන්නේ මොකක් වෙනුවෙන්ද? ඔවුන් රැකියාව කරලා pension යයි. හැබැයි, රටක් වෙනුවෙනුයි ඔවුන් මේ වැඩ කරන්නේ. අපි ඒ යන්ත්‍රණය හදලා තිබෙනවා. ඒ යන්ත්‍රණය තුළ ඒගොල්ලන් විශාල වෙහෙසක් දරමින් තිබෙනවා.

අපේ ඊළඟ සැලැස්ම මේකයි. විශාල මහජන ව්‍යාපාරයක් ගොඩනඟන්න අපි කටයුතු කරමින් ඉන්නවා. මොකද, මේ සඳහා විශාල මහජන ව්‍යාපාරයක් අපට අවශ්‍යයි. ජනතාව මේ මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව පෙළ ගැහෙන්න ඕනෑ. ඒ නිසා අපි මේ සම්බන්ධව මහජනතාව විශාල වශයෙන් දැනුවත් කරනවා. දැන් අපට මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අහුවෙන්න පටන් අරගෙන තිබෙනවා. දැන් අපට මේ සම්බන්ධව තොරතුරු එන්න පටන් අරගෙන තිබෙනවා. ඉස්සර කිව්වේ නැහැ, බයයි. කිව්වාම, කිව්ව කෙනාගේ ගෙදරට හවසට ඇවිල්ලා තර්ජනය කරන තැනට පත් වෙලා තිබුණා. ඒ නිසා තොරතුරක් දෙන්න බයයි. තොරතුරු දුන්නාම තොරතුරු දෙන එකත් ජීවිත අනාරක්ෂිත වීමක් බවට පත් වුණා. දැන් එහෙම නැහැ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් තොරතුරු වේගයෙන් ලබා දෙනවා. අපේ ඇමතිතුමාට සෘජුව තොරතුරු ලබා දෙනවා, පොලිස්පතිතුමාට තොරතුරු ලබා දෙනවා, අපේ මහජන ආරක්ෂක ලේකම්තුමාට තොරතුරු ලබා දෙනවා, "1818" කියන පොදු දුරකථන අංකයට තොරතුරු ලබා දෙනවා. මේ අනුව මහජන පැමිණිලි විශාල ප්‍රමාණයක් දැන් ඉදිරිපත් කරනවා. ඒ නිසා දැන් මහජනතාව අප කෙරෙහි විශ්වාසය තබා පියවරක් ඉදිරියට ගිහින් තිබෙනවා.

හැබැයි, විරුද්ධ පක්ෂයේ දේශපාලකයින් ඒකට එරෙහිව වැඩ කරමින් සිටිනවා. මම කියන්නේ මේකයි. මේ ක්‍රියාදාමයට එරෙහිව වැඩ කරන කිසිදු දේශපාලන පක්ෂයකට මේ රටේ මහජනතාව ඉඩ ලබා නොදේවි කියන විශ්වාසය අපට තිබෙනවා. මොකද, මේ ක්‍රියාදාමය බිඳ වට්ටන්න ඉස්සෙල්ලා මේ දේශපාලන යන්ත්‍රණය බිඳ වට්ටන්න ඕනෑ. ඒක තිබෙන්නේ ආණ්ඩුව අතේ නොවෙයි, මහජනතාව අතේ. ඒක මහජනතාවගේ වැඩක් නේ. හැබැයි මම හිතනවා, මහජනතාව මෙතෙක් කාලයක් ආශීර්වාදය, අනුග්‍රහය දක්වපු දේශපාලන යන්ත්‍රණය මහජනතාව විසින් ම බිඳ වට්ටලා තිබෙනවා කියලා. ඒක හරි නේ. දැන් අපේ වගකීම මොකක්ද? යළි එවැනි වර්ගයේ දේශපාලන ව්‍යාපාරයකට හිස එසවීමට ඉඩ නොතැබීම, විනාශකාරිත්වය සඳහා බලය අත්පත් කර ගන්න ඉඩ නොදීම තමයි අපේ අභිප්‍රාය. අපි ඒ වැරදි දේවල් වළක්වනවා. එතකොට හොඳට සුද්ද වෙලා නේද? මම දන්නේ නැහැ, කිරි කළ හතකින් නෑව්වත් සුද්ද කරන්න පුළුවන් වෙයිද කියලා, ඒ මහත්වරුන් කරලා තිබෙන අපරාධ. ලැහැස්ති නම් ලැහැස්තියි. අපි ඒක පිළිගන්න ලැහැස්තියි. හැබැයි, මේ තිබෙන සංස්කෘතියම නම් ඉස්සරහට ගෙනියන්නේ, කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය ව්‍යාපාරයේ, පාතාලය හා ගොඩනැඟුණු පැරණි සංස්කෘතියේ නියෝජිතයන් හැටියට නම් මේ අය ඉදිරියටත් එන්නේ අපි ඒ තත්ත්වය පරාජයට පත් කළ යුතුයි. මං මෙය ගන්නේ ආණ්ඩුවක් වශයෙන් නොවෙයි, දේශපාලන ව්‍යාපාරයක් ලෙස. අපි ඒකත් පරාද කරනවා. කිසිසේත්ම අපි ආණ්ඩු බලය ඒ සඳහා උපයෝගී කර ගන්නේ නැහැ, අප සතුව දේශපාලන බලයක් තිබෙනවා. අපි මහජනතාව එක්ක වැඩ කරනවා; මහජනතාව දැනුවත් කරනවා; මහජනතාව හමුව වනවා; හමුව වෙලා කියනවා, මේ දේශපාලනය ප්‍රතික්ෂේප කරන්න කියලා. මහජන බලය හරහා ඒ මහජනතාව ඒක පරාද කරනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ සන්නද්ධ අපරාධ යන්ත්‍රණය බිඳ හෙළන්න පොලීසිය හා හමුදාව -මා කලින් කියපු යන්ත්‍රණය- ඉතා යුහුසුලුව වැඩ කරනවා. ඔවුන් මේ දේවල්වලට යන්නේ ජීවිත අනතුරු නොතකා. ජීවිත අනතුරු නොතකා ගිහිල්ලා අත්අඩංගුවට ගැනීම් කරනවා. සමහර ස්ථානවලට ඔවුන් වෙස් වලාගෙනත් යනවා. සමහර වෙලාවට ඒගොල්ලන්ගේ ජාලයට මේ නිලධාරින් ඇතුළු වෙලා ඒවායේත් ඉන්නවා. ඒ ජාලය ඇතුළෙන් යම් යම් සම්බන්ධතා ගොඩනඟා ගෙනත් තිබෙනවා. ඒ අයත් එක්ක වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා. එහෙමයි අපි මේ උවදුර මර්දනය කරන්නේ. ඒ, මොකක් වෙනුවෙන්ද? මේ උවදුර මර්දනය කරන්න ඕනෑය කියන අධිෂ්ඨානය සහ චේතනාව අපි ඔවුන්ට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ව ආරක්ෂා කරන වගකීමත් අපි භාර අරගෙන තිබෙනවා. අද ඔවුන් වැඩ කරනවා, මේ යන්ත්‍රණය පරාජය කරන්න.

මේ ක්‍රියාදාමය හා ගැට ගැහුණු කළු සල්ලි තිබෙනවා. දැනට මම හිතන විධියට, අපි රුපියල් බිලියන ගණනක් වටිනා මුදල් සහ දේපළ තහනම් කරලා තිබෙනවා. දැනටමත් රුපියල් මිලියන 4,200ක දේපළ තහනම් කරලා තිබෙනවා. මේ, කුඩු සහ වෙනත් අපරාධ හරහා හොයා ගත් ධනය. අපි තවත් දේපළ හොයාගෙනත් තිබෙනවා. ඒවාත් තහනම් කරන්න ඕනෑ. ඒවා ස්ථිරවම තහනම් කිරීම සඳහා වූ අධිකරණ ක්‍රියාමාර්ගවලට අපි යන්න ඕනෑ. දැනට අපි තාවකාලිකව ඒ දේවල් තහනම් කරලා තිබෙනවා. මේවා අපි ස්ථිරවම තහනම් කරන්න ඕනෑ. ඒ නිසා පණිවුඩයක් දෙන්න ඕනෑ, මොන තරම් අපරාධවලින්, කුඩුවලින් මුදල් උපයා ගත්තාට වැඩක් නැහැ, ඒ දේපළ මේ ආණ්ඩුව යළි පවරා ගන්නවා කියන එක සම්බන්ධව. මේ වනකොට රුපියල් මිලියන 4,200ක දේපළ පවරා ගෙන තිබෙනවා. ඒ වාගේම දූෂණයෙන් උපයා ගත් දේපළත් අපි පවරා ගෙන තිබෙන්නේ. දැනටමත් මල්වානේ ගෙදර පවරා ගෙන තිබෙනවා, කතරගම ගෙදර පවරා ගෙන තිබෙනවා. අපි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරුවා, කතරගම ගෙදර. ඒවා අයිතිකරුවෙක් නැති ගෙවල්. ගෙවල් නොවෙයි ඒවා මන්දිර. දැන් මේ දේපළ අපි පවරා ගන්නවා. ඒ සඳහා ඉතාම හොඳ ශක්තිමත් පනතක් අපට අධිකරණ ඇමතිතුමා ප්‍රමුඛ අධිකරණ අමාත්‍යාංශයයි, පාර්ලිමේන්තුවයි මැදිහත් වෙලා සකස් කර දීලා තිබෙනවා. ඒක ඉතාම හොඳ ශක්තිමත් පනතක්. මොන ආකාරයෙන් නීති විරෝධී දේපළ උපයා ගත්තත්, අපේ ආණ්ඩුව හැම විටම එම දේපළ පවරා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම විශාල දේපළ ප්‍රමාණයකුත් පවරා ගෙන තිබෙනවා.

ඊළඟට, මේ හා බැඳුණු මාධ්‍ය ජාලයත් ජනතාව තේරුම් ගන්න ඕනෑ. මේ සාමාන්‍ය කථාවක්; ඇත්ත කථාවක්. ඒක මිනිස්සුත් දන්නවා, අපිත් දන්නවා. ඒ නිසා තවදුරටත් මේ අපරාධකරුවන් පොලඹවන, අපරාධකරුවන් උඩට ගෙනෙන, මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට යටින් උදව් කරන කිසි කෙනෙකුට පවතින්න බැහැ, ඒ පුද්ගලයා මාධ්‍ය රැකවරණය ගත්තත්, තව මොන ආකාරයක රැකවරණයක් ගත්තත්, ඒකට නම් ඉඩ දෙන්නේ නැහැ. අපි ඒ පිළිබඳවත් පරීක්ෂණ කරනවා.

අපට අවශ්‍යයි, මේ රාජ්‍යය ශුද්ධ කරන්න. මේ රට පිරිසිදු රාජ්‍යයක් කරන්න ඕනෑ. ඊට පස්සේ අපේ දරුවෝ -අපේ ඊළඟ පරම්පරාව- ඉතා හොඳ රටක් පාලනය කරයි. අපට ලැබී තිබෙන ලෙඩ රාජ්‍යය වෙනුවට හොඳ රාජ්‍යයක් ලැබෙයි. මේක ලෙඩ රාජ්‍යයක්. ඒ වාගේම අපරාධවලින් පිරුණු රාජ්‍යයක්. ලෙඩ රාජ්‍යයක් වෙනුවට සුව රාජ්‍යයක් අපේ දරුවන් වෙනුවෙන් පාලනය කරලා දෙන්න ඕනෑ නැද්ද? අපේ වර්තමාන පරම්පරාව කියන්නේ මොකක්ද? මේ ලෙඩ රාජ්‍යය අවසන් කරන්න ඕනෑ. හොඳ සුපිරිසිදු රාජ්‍යයක් ඇති කරලා, අපේ රටේ අනාගත පරම්පරාවට නිදහසේ සිනහ වෙවී තමන්ගේ දැනුම එකතු කරගෙන මේ රට පාලනය කළ හැකි තත්ත්වයට පත් කිරීම තමයි අපේ අපේක්ෂාව සහ වගකීම. ඒ වැඩේ අපි කරනවා.

ඒ අතරතුර මම වංචා සහ දූෂණ ගැනත් කියන්න කැමැතියි. මම කියන්නේ එක දෙයයි. කවුරුවත් හැංගෙන්න හදන්න එපා, නීතියෙන් රිංගන්න එපා, කරුණාකරලා නීතියට අවනතව වැඩ කරන්න කියලා මම ඒගොල්ලන්ගෙන් ඉල්ලා සිටිනවා. හිටපු එක ප්‍රබල අමාත්‍යවරයෙක් දැන් නඩුවට එන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිටපු මුදල් ඇමතිවරයෙක්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඔව්, හිටපු මුදල් ඇමති. හිටපු මුදල් ඇමති නඩුවට එන්නේ නැහැ. ලබන 21වැනි දාටත් නඩුව තිබෙනවා, බලමු, මොකක්ද වෙන්නේ කියලා. එතුමා ඇවිල්ලා නඩුවට මුහුණ දෙන්න ඕනෑ. වැරදි නැත්නම් යන්න පුළුවන්. කිසිදු අධිකරණයකට, කිසිදු විනිසුරුවරයෙකුට බලපෑම් කරන්න අපේ අපේක්ෂාවක් නැහැ. විනිසුරුවරුන්ට අපි එළියේ ඉඳලා අපේ ආදර්ශය දීලා තිබෙනවා. ඔවුන්ට නීතිය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිදහස් පරිසරය හදලා දීලා තිබෙනවා. මා දැක්කා, මෙතැනදී විනිසුරුවන් පිළිබඳව චෝදනාවක් එල්ල වෙනවා. ඒ කිසිවක් අපේ කාර්යයන් නොවෙයි. ඒ සඳහා අධිකරණ ව්‍යුහය තුළම තවත් ව්‍යුහයක් තිබෙනවා. මම දන්නවා, ඒ ව්‍යුහය ඇතුළේ සමහර සිදුවීම් තිබෙනවාය කියන එක. අධිකරණ සේවා කොමිෂන් සභාව ප්‍රශ්නය ගැන කියලා, මේකට මොකක්ද කරන්නේ කියලා සමහර විනිසුරුවරුන්ගෙන් ඇහුවාම, ඒ විනිසුරුවරයා කියනවා, "එහෙම නම් මම ඉල්ලා අස්වෙන්නම්" කියලා. එහෙමයි වෙලා තිබෙන්නේ. ප්‍රශ්නය කියනකොටම සමහර අය ඉල්ලා අස්වෙන්න එකඟතාව පළ වෙනවා. ඒගොල්ලන් දන්නවා, ප්‍රශ්නයේ තිබෙන බරපතළකම. එහෙමයි මේක සිදුවෙලා තිබෙන්නේ. මේවා දේශපාලන සිදුවීම් නොවෙයි. අධිකරණ පද්ධතිය පිළිබඳව ජනතාව තුළ යම් අවිශ්වාසයක් ඇතිවෙලා තිබුණා. ඒ වාගේම අකාර්යක්ෂමතාව පිළිබඳවත්, සමහර සිදුවීම් පිළිබඳවත් ජනතාව තුළ යම් අවිශ්වාසයක් තිබුණා.

ඉතින්, අධිකරණ පද්ධතියත් ඒ නිසි වගකීමට ගොඩනැඟීම සඳහා වර්තමානයේ කටයුතු කරමින් තිබෙනවා. නමුත්, සමහර අය තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරනවා. අමුතු පාර්ලිමේන්තු විපක්ෂයක් මෙතැන ඉන්නේ. දැන් මෙතැන ඉන්නේ, හැම වෙලාවේම දූෂිතයා වෙනුවෙන් කථා කරන, කුඩු ව්‍යාපාරිකයා වෙනුවෙන් කථා කරන, වැඩ කරන නිලධාරින්ට බණින, වැඩ කරන නිලධාරින් චෝදනාවට ලක් කරන විපක්ෂයක්. ඒ නිසා මම කියන්නේ, අපි මේ හැම ක්ෂේත්‍රයක්ම නිසි පරිදි යථාවත් කරන්න ඕනෑ කියන එකයි. එම ආයතන පිහිටුවීමේ අරමුණ, ඒ ආයතනවලට නීතිමය වශයෙන් පවරා දී තිබෙන වගකීම් ඉටු කිරීමට සමත් වන රාජ්‍යයක් අපි ගොඩනඟනවා. ඒ සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයත්, ඒ වාගේම ආරක්ෂක අමාත්‍යාංශයත් විශාල වැඩ කොටසක් කරනවා. එහි නිලධාරින් දිවා රෑ නොබලා විශාල වැඩ කොටසක් කරන්නේ. සමහර අවස්ථාවල අලුත් සිදුවීමක් ඇති වුණාම අපි පාන්දර 1.00, 2.00 වෙනකල් එකට එකතුවෙලා කථා කරනවා. පාන්දර 1.00, 2.00 වෙනකල් එකතුවෙලා අපි සාකච්ඡා කරලා තමයි සමහර සිදුවීම් වළක්වා ගන්නේ. එහෙම වැඩ කරන මිනිස්සු ඉන්නවා, මතක තියාගන්න. 4.00ට ගෙදර යන, 5.00ට ගෙදර යන සංස්කෘතිය අවසන් වෙලා තිබෙනවා, වැඩ කරන අය ඇතුළේ.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අරුගම්බේ සිද්ධිය ඇති වුණු වෙලාවේ අපි රෑ 1.00ට ආරක්ෂක කවුන්සලය කැඳෙව්වා. ඊට පස්සේ උදේ 7.00ටත් ආරක්ෂක කවුන්සලය කැඳෙව්වා. දවසට දෙවතාවක් ආරක්ෂක කවුන්සලය කැඳෙව්වා. අපි Zoom හරහා ඒක කැඳෙව්වේ. මම දඹුල්ලේ ඉඳගෙන අපේ ආරක්ෂක කවුන්සලයට සම්බන්ධ වුණා. තොරතුරු ඔක්කෝම ආවා. ඒ නිසා අරුගම්බේ ඇති වීමට ගිය සිද්ධිය වළක්වන්න අපට පුළුවන්කම ලැබුණා. ඒක වළක්වන්න යනකොටත් කියනවා, "ඇයි අරයා අත්අඩංගුවට ගත්තේ, ඇයි මෙයා අත්අඩංගුවට ගත්තේ" කියලා. ඒක වළක්වන්නයි අත්අඩංගුවට ගත්තේ. ඒක සිද්ධ වුණා නම් කියන්නේ මොකක්ද? වළක්වා ගන්න අසමත් වුණාය කියනවා. ඇත්තටම අරුගම්බේ එවැනි සිද්ධියක් සිදු කරන බවට සාක්ෂි තිබුණා, වාර්තා වෙලා තිබුණා, සැලසුමක් තිබුණා. ඒ සැලසුම මුළුමනින්ම අඩපණ කරන්න අපේ ආරක්ෂක කවුන්සලය සමත් වුණා. ඒක අගයන්න ඕනෑ.

දැන් සමහර තැන්වලදී ඊශ්‍රායල ජාතිකයන් කේන්ද්‍ර කරගෙන ප්‍රහාරයක් එල්ල වෙනවා. අපි සලකන්නේ ඒ සංචාරකයා කුමන රටේද කියන එක නොවෙයි. ලංකාවට සංචාරකයෙක් ආවා නම්, ඒ සංචාරකයා ආරක්ෂා කිරීම අපි කරනවා. ඒ පුද්ගලයා කවුද කියන එක නොවෙයි වැදගත්. මෙතැන ඒකටත් කෑ ගහනවා. මම දන්නේ නැහැ, මේ විපක්ෂය මොනවාද මේ කරන්නේ කියලා. අපට හැම සංචාරකයෙකුගේම ආරක්ෂාවයි ඕනෑ. අපි එය සැලකිල්ලට භාජන කරනවා. ඒ වාගේම අපි ඒ පිළිබඳව අවබෝධයෙන් ඉන්නවා. ඒක මතක තබා ගන්න.

ඒ වාගේම, අපි පුරෝකථනයන් කරනවා. ආරක්ෂක අංශ සහ බුද්ධි අංශ අනතුරු ඇති විය හැකි තැන් පිළිබඳව පුරෝකථනය කරලා තිබෙනවා. මොන වාගේ අනතුරක් විය හැකිද, මොන වාගේ කඩාකප්පල් ක්‍රියාවක් විය හැකිද කියලා පුරෝකථනය කරලා තිබෙනවා. ඒ පුරෝකථනයන්ට අවශ්‍ය වන සැලසුම් අපි සකස් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ වෙලාවේදී සංචාරක කර්මාන්තය තුළ කවර හෝ කෙනෙකු කඩාකප්පල්කාරී ක්‍රියාවක් කිරීමේ, ආණ්ඩුව අපහසුතාවට පත් කිරීමේ, සංචාරක කලාප කේන්ද්‍ර කරගෙන යම් සිදු වීමක් ඇති කිරීමේ අනතුරක් තිබෙනවා.

ඒක අපේ බුද්ධි අංශවලට වාර්තා වෙනවා. අපි ඒවා මුළුමනින්ම මැඩ පවත්වනවා. එවැනි දෙයක් සැලසුම් කරන්න, ක්‍රියාත්මක කරන්න කවුරු හරි උත්සාහ කරනවා නම් ඒ හැම කෙනෙක්වම නීතිය ඉදිරියට ගෙනැල්ලා අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දෙන බව මතක තබා ගන්න. එහෙම යන්ත්‍රණයක් මේ තිබෙන්නේ. ඒ නිසා අපි පුරෝකථනය කරනවා, අනතුර තිබෙන්නේ කොතැනද කියලා. ඒ පුරෝකථනය අනුව සැලසුම් හදන නිලධාරි යන්ත්‍රණයක් අද අපට ඉන්නවා. අපි ඔවුන් කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා එවැනි නිලධාරියෙක්. පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙක්, ඕනෑම වෙලාවක -රෑ 11.00ට, 12.00ට, පාන්දර 1.00ට, 2.00ට- එතුමාට කථා කරලා බලන්න. එතුමා ඕනෑම වෙලාවක කථා කරනවා. එහෙම ආරක්ෂක ලේකම්වරු අපේ රටේ හිටියාද? අපේ රටේ ආරක්ෂක ලේකම්වරු හිටියා; ඇමතිවරු ගිහිල්ලා දණ ගහපු ආරක්ෂක ලේකම්වරු හිටියා. එහෙම තිබුණු රටක්, මේ. විපක්ෂයේ වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන් අද ඕනෑම කෙනෙකුට ආරක්ෂක ලේකම්තුමාට call එකක් ගන්න පුළුවන් ඕනෑම රැයක. එතුමා කථා කරලා අවශ්‍ය කටයුතු සඳහා මැදිහත් වෙනවා. එහෙමයි මේ නිලධාරින් වැඩ කරන්නේ. පොලිස්පතිතුමාට call එකක් ගන්න. ඒගොල්ලන් හැම වෙලාවේදීම වැඩ කරනවා. එහෙම වැඩ කරන අය මේගොල්ලන්. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේත්, රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශයේත් නිලධාරින් විශාල වෙහෙසක් දරනවා, මේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන්නත්, මහජන ආරක්ෂාව තහවුරු කරන්නත්. ඒ නිලධාරින් ඒ වෙනුවෙන් විශාල වෙහෙසක් දරනවා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා, පොලිස්පතිතුමා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇතුළු අනෙකුත් සියලුම නිලධාරින් සහ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා, ත්‍රිවිධ හමුදාපතිවරුන් හා අමාත්‍යාංශයේ ඉන්න සියලුම නිලධාරින් මේ කරන කාර්යය සාර්ථක කර ගැනීම සඳහා විශාල වෙහෙසක් දරන බව. ඒ වෙහෙස පිළිබඳව අපට ඇගැයීමක් තිබෙනවා. අනෙක් හැම රාජකාරියකටම වඩා ඔවුන්, ඔවුන්ගේ ජීවිතය අනතුරට හෙළමින් තිබෙනවා. ඔවුන් කාගේ හෝ පළිගැනීමකට ලක් වේ දැයි කියන සැකයකින් වැඩ කරන්නේ. ඔවුන්ට තමන්ගේ විශ්‍රාම දිවිය මේ ලංකාව තුළ ගත කරන්න පුළුවන්ද කියන සැකයකින් වැඩ කරන්නේ. ඒ, ඇයි? ඔවුන් ඒ තරමම අසීරුතා තිබෙන රැකියාවල නිරත වෙන නිසා. අපි ඒ හැමදෙනාටම කියනවා, අපි ඔබව ආණ්ඩුවක් ලෙසත් රකිනවා කියලා. අපි ආණ්ඩුවේ නැතත් හැමදාම ඒ අයව ආරක්ෂා කරන බවට සහතික වෙනවා. විශේෂයෙන්ම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යතුමාත්, ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමාත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් විශාල වෙහෙසක් දරනවා, අපේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්නත්, මහජන ආරක්ෂාව තහවුරු කරන්නත්, පාතාලය, අපරාධ, දූෂණය නතර කර යහපත් රාජ්‍යයක් බවට මේ රට පත් කර ගැනීමටත්. ඒ දරන වෙහෙසට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

## ආරක්ෂක අමාත්‍යාංශය
## பாதுகாப்பு அமைச்சு
## MINISTRY OF DEFENCE

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 395,000,000,000 |
| මූලධන | රු. 60,000,000,000 |

**ගරු ආනන්ද විජේපාල මහතා**
**(மாண்புமிகு ஆனந்த விஜேபால)**
(The Hon. Ananda Wijepala)

ගරු සභාපතිතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, ආරක්ෂක අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 12 සහ 13 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | |
|---|---|
| 'පුනරාවර්තන | රු. 370,513,000,000 |
| මූලධන | රු. 61,922,000,000' " |

**ගරු සභාපතිතුමා**
**(மாண்புமிகு தவிசாளர் அவர்கள்)**
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
**(மாண்புமிகு உறுப்பினர்கள்)**
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 370,513,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 61,922,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 370,513,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 61,922,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 370,513,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 61,922,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ 103 - ආරක්ෂක අමාත්‍යවරයා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Chairman, I call for a Divison on Head 103. May I also say that I do not want to call for a Division on every Head. The Division I call for on Head 103 would also apply to Heads 222, 223 and 224; it could be taken as a Division on all the Heads together because I will be voting in the same way on those as well. So, I call for a Division on Head 103, but may it be recorded that this Division also stands for Heads 222, 223 and 224.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
So, you would not call for a Divison on each and every Head, is it?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Yes, that is what I am saying. I will call for a Division only on Head 103, but let the result of the Division be recorded as a Vote on the other Heads as well.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Your objection will be recorded.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Okay, Sir.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
